# 01 සමාජ විද්‍යාව හැඳින්වීම

## 1.1 සමාජ විද්‍යාව නිර්වචන ආශ්‍රිත ව හඳුනා ගැනීම

19 වන සියවසේ දී මානව සමාජය වඩාත් විද්‍යාත්මක ව හදාරන එළඹුමක් ලෙස සමාජ විද්‍යාව බිහි විය. එද සිට අද වන තෙක් මෙම විෂය නිර්වචනය කිරීම සඳහා විවිධ සමාජ විද්‍යාඥයින් උත්සාහ ගෙන ඇත. නමුත් මේ පිළිබඳ ව තවමත් නිශ්චිත නිර්වචනයක් බිහි වී නැත. මෙයට මූලික ම හේතුවක් වන්නේ බොහෝ සමාජ විද්‍යාඥයින් තම විෂය පරිචය සහ මතවාද ඔස්සේ සහ තමන් අනුදත් සමාජ විද්‍යා විෂය පථයේ පිහිටා සමාජ විද්‍යාව යනු කුමක් ද යන්න විග්‍රහ කිරීමට උත්සුක වීමයි. එසේ ම සමාජ විද්‍යාවට පුළුල් පරාසයක පැතිර ගිය විෂය ක්ෂේත්‍රයක් පැවතීම ද විෂය නිර්වචනය කිරීමේ පවතින ගැටළුවක් වේ. එසේ වුව ද සමාජ විද්‍යාඥයින් විසින් මෙම විෂය නොයෙකුත් ආකාරයෙන් නිර්වචනය කර තිබේ. එම නිර්වචන ආශ්‍රයෙන් සමාජ විද්‍යාව යනු කුමක් ද යි හඳුනා ගත හැකි ය. එම නිර්වචන කීපයක් පහත දැක්වේ.

කිංස්ලි ඩේවිස් (Kinsley Davis) නමැති සමාජ විද්‍යාඥයා විසින් "Human Society" නම් ග්‍රන්ථයෙ හි සමාජ විද්‍යාව මෙසේ නිර්වචනය කර ඇත.

"සමාජ විද්‍යාව යනු සමාජය පිළිබඳ ව ප්‍රධාන විද්‍යාවයි"

මෙම නිර්වචනය තුළින් සමාජ විද්‍යාව යනු සමාජය විද්‍යාත්මක ව අධ්‍යයනය කරනු ලබන ප්‍රධාන විෂය ක්ෂේත්‍රය යන අදහස ගෙන දෙයි. එහෙත් සමාජයේ කුමන කොටස නැතිනම් කුමන ස්වභාවයන් අධ්‍යයනය කරන්නේ ද යන්න එයින් ප්‍රකාශ නොවේ.

එච්.පී. ෆෙයාචයිල්ඩ් (H.P. Fairchild) නමැති සමාජ විද්‍යාඥයා විසින් "General Sociology" නමැති කෘතියේ සමාජ විද්‍යාව මෙසේ නිර්වචනය කර ඇත.

''මානව පරිසරය, මිනිසා හා ඒ සියල්ල අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව පිළිබඳ ව හදරන විෂය සමාජ විද්‍යාව වේ''

මෙම නිර්වචනයෙන් මිනිසා, මිනිස් සමාජය හා ඒ අතර පවතින සම්බන්ධතාව අධ්‍යයනය කිරීම සමාජ විද්‍යාව ලෙස දැක්වේ.

ඒ. ඩබ්ලිව්. ස්මෙල් (A.W. Small) ගේ "General Sociology" නමැති ග්‍රන්ථයේ දී "සමාජ විද්‍යාව සමාජ සම්බන්ධතා (Social Relation) පිළිබඳ විද්‍යාව" යනුවෙන් නිර්වචනය කර ඇත.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

මෙම නිර්වචනයෙන්ද මිනිස් සමාජ සබඳතා විද්‍යාත්මක ව හදාරන විෂය ක්ෂේත්‍රය සමාජ විද්‍යාව ලෙස හඳුන්වයි.

රොබට් පාර්ක් (Robert Park) ට අනුව "සමාජ විද්‍යාව යනු සාමූහික චර්යාව (Collective Behaviour) පිළිබඳ ව අධ්‍යයනය" වේ. මිනිස් සමාජයේ ප්‍රධාන ලක්ෂණයක් වන සාමූහික හැසිරීම පිළිබඳ ව අධ්‍යයනය සමාජ විද්‍යාව ලෙස ඔහු නිර්වචනය කර ඇත.

"සමාජ විද්‍යාව සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳ විද්‍යාවයි" යනුවෙන් එමිල් ඩුර්ක්හයිම් නම් සමාජ විද්‍යාඥයා (Emile Durkheim) අර්ථ කථනය කර ඇත. එමගින් පැහැදිලි වන්නේ සමාජීය පරිසරය පවත්වා ගෙන යාමට හා සමාජයේ මධ්‍යගත අවශ්‍යතා ඉටු කිරීමට සමාජ සංස්ථාවල ඇති වැදගත් කමයි. මිනිසා සමාජ සත්ත්වයකු බවට පත් කිරීමටත් ඔහුගේ පැවැත්ම තහවුරු කිරීමටත් සමාජ සංස්ථා කෘත්‍යමය බලපෑමක් ඉටු කරයි. ඒ අනුව සමාජ සංස්ථා විද්‍යාත්මක ව අධ්‍යයනය කරන විෂයක් ලෙස සමාජ විද්‍යාව හඳුන්වා ඇත.

විද්‍යාත්මක අධ්‍යයනවල දී කිසියම් ගැටළුවක් සුවිශේෂී ව අධ්‍යයනය කරනු ලබයි. අධ්‍යයනය තුළින් ගැටළුවේ ස්වභාවය හා ඊට බලපානු ලබන හේතු සාධක තේරුම් ගත හැකිවේ. සමාජ විද්‍යාඥයා ද අධ්‍යයනය කරනු ලබන්නේ සමාජයේ පවත්නා ගැටළුවකි. උදහරණයක් ලෙස බාලාපරාධ ඇතිවන්නේ ඇයි ද යන ගැටළුව සමාජ විද්‍යාඥයින් විසින් අධ්‍යයනය කරනු ලබයි. එසේ අධ්‍යයනය කිරීම තුළින් සමාජ විරෝධී චර්යා ඇති වීමට බලපාන පවුල් පරිසරය හා ඒ හා බැඳී පවතින වෙනස් සමාජ සාධක තේරුම් ගත හැකි වන අතර එම අනිසි බලපෑම් වළකා ගැනීමට සමාජය සංවිධානය කළ හැකි වේ.

## 1.2 සමාජ විද්‍යාව විෂයයක් ලෙස සංවර්ධනය වූ ආකාරය

සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමේ විධිමත් ක්‍රමයක් ඔස්සේ සමාජ විද්‍යාව විෂය ගොඩනැගී සංවර්ධනය වූයේ බටහිර සමාජය තුළ ය. ඒ සඳහා සමාජ විද්‍යාඥයන් රාශියක් අධ්‍යයනයෙන් හා මතවාදයෙන් දායක විය. ඒ අතුරින් කැපී පෙනෙන දායකත්වය දැක්වූ ඔගස්ට් කොම්ට්, හර්බට් ස්පෙන්සර්, එමිල් ඩුර්ක්හයිම්, මැක්ස් වේබර්, කාල් මාක්ස්, ආදීන්ගෙන් ලැබුණු දායකත්වය පිළිබඳ ව මෙහි දී විමසා බැලිය යුතු වේ.

ඔගස්ට් කොම්ට් (Auguste Comte - 1798-1857) නමැති සමාජ දාර්ශනිකයා විසින් 19 වන සියවසේ මැද භාගයේ පමණ මෙම විෂය හඳුන්වා දෙන ලදී. ඔහු විසින් රචිත "යථානුභූත දර්ශනය" (Positive Philosophy)



නොමිලේ බෙදා හැරීම සඳහා ය

නමැති ග්‍රන්ථයෙන් සමාජ භෞතික විද්‍යාව (Social Physics) යනුවෙන් මෙම විෂය හඳුන්වා දී ඇත. එම පදයට එතරම් රුචියක් නොදක් වූ ඔහු පසුව සමාජ විද්‍යාව (Sociology) යනුවෙන් හඳුන්වා දුන්නේ ය. ඒ නිසා ඔහු සමාජ විද්‍යාවේ පියා ලෙස හඳුන්වනු ලැබේ.

ඔගස්ට් කොම්ට් සමාජය විද්‍යාත්මකව හැදෑරීමේ දී අංශ දෙකක් පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බව පැවසී ය. එනම්

1. සමාජ ස්ථිතිකත්වය (Social Statics)
2. සමාජ ගතිකත්වය (Social Dynamics)

සමාජ ස්ථිතිකත්වය හැදෑරීම තුළින් සමාජ ගතිකත්වය තේරුම්ගත හැකි බව පෙන්වා දුන් කොම්ට් සමාජ පරිණාමයද අවධි 3 ක් යටතේ විග්‍රහ කළේ ය. දේවවාදී අවධිය, පාරභෞතික අවධිය හා යථානුභූත අවධිය වශයෙන් ඒවා නම් කළ අතර සමාජය මෙම යුග ඔස්සේ අනුක්‍රමයෙන් වෙනස් වන බව ඔහුගේ අදහස විය.

සමාජ විද්‍යාවේ වර්ධනය පිණිස දායක වූ ප්‍රධාන පෙළේ සමාජ විද්‍යාඥයකු ලෙස ප්‍රංශ ජාතික එමිල් ඩුර්ක්හයිම් (Emile Dukheim 1858-1917) නමැති සමාජ විද්‍යාඥයා හැඳින්විය හැකි ය. 1882 දී දර්ශනය පිළිබඳ ව උපාධිය ලබාගත් ඔහු පාසල් ගුරුවරයකු වශයෙන් කටයුතු කරන අතර සමාජ විද්‍යාව විෂය පිළිබඳ ව ද උනන්දුවක් දක්වීය. ඒ අනුව ජර්මනියට ගිය ඔහු ආර්ථික විද්‍යාව, මානව විද්‍යාව, සහ ජන චර්යා යන විෂයයන් හදරනු ලැබීය. අනතුරුව ප්‍රංශයේ Bardeaux විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ව කථිකාචාර්යවරයකු ලෙස සේවය කරමින් ප්‍රංශයට සමාජ විද්‍යාව නමැති විෂය හඳුන්වා දීමට ක්‍රියා කළේ ය. 1881 දී ඔහු එම විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා මහාචාර්යවරයා බවට ද පත් වූයේ ය.

සමාජ විද්‍යාවේ ඉතිහාසය හදරන විට ප්‍රංශය හා එමිල් ඩුර්ක්හයිම් අමතක කළ නොහැකි ය. සමාජ විද්‍යාව නමැති විෂය වර්ධනය කිරීම සඳහා ප්‍රංශය තුළ එමිල් ඩුර්ක්හයිම් විසින් කර ඇති සම්මාදම ඉතා වැදගත් වීම එයට හේතුව යි. ඩුර්ක්හයිම්ට පෙර කිසිම සමාජ විද්‍යාඥයකු විසින් සමාජ විද්‍යාවට අධ්‍යයන ක්‍රම වේදයක් හඳුන්වා දී නොතිබිණි. සමාජ විද්‍යාව දර්ශනයෙන් මුදවා විද්‍යාත්මක විෂයයක් ලෙස ව්‍යාප්ත කිරීමට එමිල් ඩුර්ක්හයිම් උත්සාහ

ගන්නා ලදී. එමෙන් ම සමාජ පරිණාමය, ආගම, අධ්‍යාපනය, සියදිවි නසා ගැනීම් ආදිය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයන් රාශියකින් ද ඔහු සමාජ විද්‍යාවට දායක විය. ඔහුගේ අධ්‍යයනයන් මෙසේ දැක්විය හැකි ය.

1. The rules of sociological method - 1895 සමාජ විද්‍යා තර්ක ක්‍රමවේදයේ නීති
2. The division of labour in society - 1893 සමාජයේ ශ්‍රම විභජනය
3. The elementary forms of religious life - 1912 ආගමික ජීවිතයේ හරය
4. Suicide - 1897 ආත්ම ඝාතනය
5. Professional ethics and civic morals - 1897 ආචාර ධර්ම හා පුරවැසි අගනාකම්

1864 අප්‍රේල් 21 දින ජර්මනියේ උපත ලැබූ මැක්ස් වේබර් මූලික අධ්‍යාපනයෙන් පසු 1882 දී නීතිය පිළිබඳ ව උපාධියක් ලබා ගත්තේ ය. ඉන්පසු විවිධ විශ්ව විද්‍යාලවලින් උපාධි ලබාගත් ඔහු විශ්ව විද්‍යාල ගුරුවරයෙකු, සමාජ විද්‍යාඥයෙකු, ක්‍රියාකාරී දේශපාලන නායකයෙකු, ආර්ථික විද්‍යාඥයෙකු හා හමුදා නිළධාරියෙකු ආදී වශයෙන් ක්ෂේත්‍ර ගණනක කටයුතු කර ඇත.

සමාජ විද්‍යාව විෂය වර්ධනය සඳහා ද වේබර් විසින් දක්වා ඇති දායකත්වය විශේෂිත ය. ඔහුගේ ඉගැන්වීම් වෙබේරියානු සමාජ විද්‍යාව (Weberian Sociology) නමින් හැඳින්වේ. ඔහුගේ සමාජ විද්‍යාත්මක දායකත්වය ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ පැතිර පවතී. ඒවා අතර පහත සඳහන් ක්ෂේත්‍ර ප්‍රමුඛ වේ.

- සමාජ ක්‍රියා න්‍යාය
- සමාජ විද්‍යාවේ ක්‍රමවේදය
- ප්‍රොතෙස්තන්ත්‍ර ආචාරධර්ම හා ධනවාදයේ සාරය
- ආධිපත්‍යය වර්ගීකරණය
- නිලබල ක්‍රමය

මැක්ස් වේබර් විසින් සමාජ විද්‍යාව සඳහා කරනු ලබන සේවය පසුකාලීන සමාජ විද්‍යාඥයින් කෙරෙහි ද බලපෑම් කර ඇත.

සමාජ විද්‍යාවේ මූලික සංකල්ප වෙනස් මාවතකට යොමු කළ අයෙකු ලෙස කාල්මාක්ස් හඳුන්වා දිය හැකි. 1818 මැයි 5 දින ජර්මනියේ ට්‍රීර් (Trier) නගරයේ කාල් මාක්ස් උපත ලැබී ය. ළමාවියේ සිට අධ්‍යාපනය කෙරෙහි යොමු වූ මාක්ස් තරුණ විය වන විට දර්ශනය පිළිබඳ ව මුල් උපාධිය ලබා ගත්තේ ය. අනතුරුව නීතිය පිළිබඳ ව ද උපාධිය ලැබූ ඔහු ආචාර්ය

උපාධිය දක්වා අධ්‍යයන කටයුතු කරනු ලැබී ය. අධ්‍යාපනයෙන් ලත් දැනුම හා පර්යේෂණ ඥානය ඔහුගේ නව අර්ථකථන ඉදිරිපත් කිරීම කෙරෙහි හේතු විය.

මාක්ස්ගේ විග්‍රහයන් නීතිය, ඉතිහාසය, දර්ශනය හා ආර්ථික විද්‍යාව හා සම්බන්ධ වේ. එම නිසා ඔහු සමාජීය විද්‍යාඥයකු ලෙස සලකනු ලැබේ. නමුත් මාක්ස් විග්‍රහයන් තුළ සමාජ විද්‍යාත්මක පදනමක් පවතින බැවින් ඔහු සමාජ විද්‍යාඥයකු ලෙසද සලකනු ලැබේ. මාක්ස්ගේ විග්‍රහයන් සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා බලපෑම් කර ඇත. එනම්

මාක්ස්ට අනුව සමාජ ඉතිහාසය යනු පංති සටන් පිළිබඳ ඉතිහාසය යි. එනම් සමාජ ඉතිහාසයේ සෑම යුගයක ම පාහේ පටන් සටන් පැවත ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සමාජය ඉදිරියට ගමන් කරයි. පංති යනු නිෂ්පාදන ක්‍රියාවලියට දක්වන සම්බන්ධතාවයි. සමාජ පරිණාමය පංති සටන්වලට අනුව සිදු වූ ආකාරය ඔහු පැහැදිලි කර ඇත.

## 1.3 සමාජ විද්‍යා දැනුම සමාජීය ව්‍යවහාරවල දී උපයෝගි කරගත යුතු ආකාරය

ඕනෑම විෂය ක්ෂේත්‍රයක් වඩාත් වැදගත් වන්නේ මූලික කරුණු දෙකක් පදනම්ව ය. එනම්,

I. දැනුම් පරාසය
II. දැනුමේ උපයෝගිතාව

සමාජ විද්‍යාවේ දැනුම් පරාසය විද්‍යාත්මක ක්‍රමවේදයක් තුළ ගොඩනගා ඇත. ඒ අනුව සමාජ විද්‍යාව ඊට ආවේණික වූ ගති ලක්ෂණයන්ගෙන් සමන්විත වේ. සමාජය පිළිබඳ ව දැනුම විද්‍යාත්මක පදනමක් මත ගොඩනගා තිබේ. එහි මූලික ලක්ෂණය වන්නේ අගති විරහිත (Bias Less) බව යි. සමාජ විද්‍යාඥයා සමාජය අධ්‍යයනය කිරීමේ දී ඒ සම්බන්ධ ව කිසි ම අගතියකට පත් නොවෙයි. සමාජ යථාර්ථය පවතින ආකාරයෙන් අධ්‍යයනය කරන ලබයි. මෙහි දී යහපත් හා අයහපත් ආදී වශයෙන් සාරධර්ම විනිශ්චයක් සිදු නොකරයි. පුද්ගලයා සමාජයේ හැසිරෙන්නේ කෙසේද යන්න විශ්ලේෂණය කරයි. විවිධ සමාජ, ආර්ථික, දේශපාලනික, ආගමික දර්ශන අනුගමනය කරනු ලබන මිනිසුන්ගේ චර්යාවන් අධ්‍යයනය කරයි. ඒ අනුව සමාජය අධ්‍යයනය කිරීමේ හා සමාජය පිළිබඳ ව ප්‍රශස්ත විද්‍යාත්මක දැනුමක් ලෙස සමාජ විද්‍යාත්මක දැනුම භාවිත කළ හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

සමාජ විද්‍යා දැනුමේ පවතින තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ මිනිසාගේ සමාජ ජීවිතය (Social Life) සමස්ත ලෙස අධ්‍යයනයට යොමුවීමය. අනෙකුත් සමාජීය විද්‍යාවන් තම විෂය පථය මත පිහිටා අධ්‍යයනය කරයි. එනම් මිනිසාගේ සමාජ ජීවිතය කෙරෙහි බලපානු ලබන යම් සාධකයක් කෙරෙහි අවධානය යොමු කරමින් සමාජය හැදෑරීමයි. උදහරණයක් ලෙස දේශපාලන විද්‍යාව බලය (Power) යන සාධක මත පිහිටා සමාජය අධ්‍යයනය කිරීම දැකිය හැකි ය. නමුත් සමාජ විද්‍යාව මිනිසාගේ සමාජ ජීවිතය කෙරෙහි බලපාන විවිධ සාධක ගැන පොදුවේ අධ්‍යයනය කරනු ලැබේ. ඒ අනුව සමාජ විද්‍යාවේ දැනුම අනිකුත් සමාජීය විද්‍යාවන්ගේ දැනුමට වඩා මිනිසාගේ සමාජ ජීවිතය වඩාත් පුළුල් ලෙස තේරුම් ගැනීමට හා විග්‍රහ කිරීමට උපයෝගී කර ගත හැකි ය.

සමාජ විද්‍යාව සංස්කෘතික ම ය වශයෙන් පවත්නා මානව අන්තර්ක්‍රියාවන් ද අධ්‍යයනය කරනු ලබයි. එහි දී එක් සංස්කෘතියක් තවත් සංස්කෘතියකට අසමාන බව තේරුම් ගැනේ. එක් එක් සමාජ තුළ ජීවත් වන අය තම සංස්කෘතිය ශ්‍රේෂ්ඨතම යැයි ආත්ම කේන්ද්‍රීයව සිතති. (Ego Centric) එසේ සිතීමෙන් තමන් අන්‍යයන්ට වඩා සුපිරි වර්ගයක් යැයි සිතිය හැකි ය. එය සමාජ ගැටුම් සඳහා ඉවහල් විය හැකි ය.

නමුත් සමාජ විද්‍යාඥයින් සංස්කෘතිකමය වෙනස්කම් තුළ සිරවී සමාජය උස් පහත් වශයෙන් බෙදිය නොහැකි බව පෙන්වා දෙයි. ඊට හේතු ලෙස ඔවුන් දක්වන මතය වන්නේ සංස්කෘතික වෙනස කෙරෙහි වඩාත් බලපෑම් කර ඇත්තේ පාරිසරික, දේශගුණික හා ජානමය සාධක බවයි. ඒ අනුව සමාජ සංස්කෘතික රාමුව යථාර්ථ වශයෙන් වටහා ගැනීමට සමාජ විද්‍යා දැනුම උපයෝගි කරගත හැකි ය. එමගින් සමාජ සාමය සඳහා මග හෙළි කළ හැකි ය.

සමාජ විද්‍යා දැනුමේ උපයෝගිතාව නූතන සමාජය තුළ ඉතා ඉහළ අගයක් පෙන්නුම් කරයි. නූතන සමාජය තුළ සමාජ ප්‍රශ්න එන්න එන්නම වැඩි වෙමින් පවතී. එමනිසා සමාජය විසංවිධානය වී ඇත. සමාජ අර්බුද විද්‍යාත්මක ව නිරීක්ෂණය කර එහි පොදු පැවැත්ම සමාජ විද්‍යාව මගින් විග්‍රහ කෙරේ. දුගීකම, අපරාධ, අපචාර ආදී නොයෙකුත් සමාජ ප්‍රශ්න උද්ගත වීම කෙරෙහි බලපානු ලබන සමාජීය සාධක සමාජ විද්‍යාව පැහැදිලි කරයි. සමාජ ගැටලු සඳහා බලපානු ලබන සාධක විශ්ලේෂණය කර ගැනීම තුළින් සමාජ ප්‍රශ්නවලට බලපානු ලබන හේතුන්ට පිළියම් සෙවිය හැකි ය.

සමාජ සංවර්ධනය වඩාත් වේගවත් ව ඉදිරියට ගෙන යාමට ජාත්‍යන්තර සමාජය උත්සුක වේ. මෙහි දී සංවර්ධනය වූ හා සංවර්ධනය වෙමින් පවත්නා රටවල ස්වභාවය සැලකිල්ලට ගැනේ. විශේෂයෙන් ම සංවර්ධනය එක් කෝණයකට පමණක් සීමා වී ඇති බව සමාජ විද්‍යාඥයින් පෙන්වා දී ඇත. එනම් ආර්ථික සංවර්ධනය පමණක් නූතන සංවර්ධන ඉලක්කය වී ඇති බව පෙන්වා දෙන අතර එය හුදෙක් ම සමාජ පැවැත්ම කෙරෙහි නිශේධනාත්මක බලපෑම් එල්ල කරන බව සමාජ විද්‍යාඥයින්ගේ මතය වී ඇත. සමාජ පැවැත්ම තහවුරු කිරීම කෙරෙහි සංවර්ධනය සමාජයේ අනිකුත් සාධක සමග ගැළපිය යුතු බවද සමාජ විද්‍යාව පෙන්වා දෙයි. එනම් සමාජීය අධ්‍යාපනික, දේශපාලනික හා සාරධර්මීය වශයෙනි. ඒ අනුව සංවර්ධනය සඳහා සමාජය සැලසුම්කරණයේ දී සමාජ විද්‍යා දැනුම වඩාත් උපයෝගී වී ඇත.

සමාජයක් යනු කුමක් ද? එහි ක්‍රියාකාරිත්වය කෙබඳු ද? සමාජය පවත්වාගෙන යාම සඳහා කුමන කොටස් කුමන කාර්යයන් ඉටු කරයි ද? සමාජය වෙනස් වීම හා වෙනස් වීම කෙරෙහි බලපානු ලබන සාධක කවරේද යන්න ගැන සංකල්පීය හා න්‍යායාත්මක ව අධ්‍යයනය කරනු ලබන්නේ සමාජ විද්‍යාව තුළිනි. මෙවැනි සමාජ ස්වභාවයන් පිළිබඳ ව න්‍යායාත්මක හා සංකල්පීය අවබෝධයක් ලබා ගැනීම සඳහා සමාජ විද්‍යා දැනුම උපයෝගී වේ.

## 1.4 බෞද්ධ සමාජ විද්‍යාව විෂයයක් ලෙස හඳුනා ගැනීම

බුදු දහම ආගමික දර්ශනයක් වන බැවින් එහි සමාජ විද්‍යාත්මක පදනමක් පවතී ද යන්න පිළිබඳ ව විවිධ මතවාද පවතී. නමුත් මේ පිළිබඳ ව අවධානය යොමුකළ ප්‍රාමාණික දැනුමක් ඇති විද්‍යාර්ථීන් බුදු දහම තුළ විද්‍යාත්මක පදනමක් පවතින බව පැහැදිලි කර තිබේ. ඒ අතර මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න මහතා විසින් බුදු දහම විද්‍යාත්මක පදනමක් මත ගොඩ නගා ඇති බව පෙන්වා දෙයි.

"ධර්මය විද්‍යාත්මක පදනමක් උඩ ගොඩ නගා තිබේ. යම් කිසිවක් පිළිබඳ ව ක්‍රමානුකූල පරීක්ෂාවක් කොට එයින් උද්ගත වන දෙය කරුණු සහිත ව පිළිගැනීම හෝ ඉවතලෑම විද්‍යාත්මක ක්‍රමයට අනුකූල වූවකි." (බෞද්ධ දර්ශනය හා චරණය) එනයින් බලන විට බුදු දහමේ විද්‍යාත්මක ලක්ෂණ මනා ලෙස පිහිටා ඇති බව ඔහුගේ මතයයි.

බුදු දහමේ සමාජ විද්‍යාත්මක පදනමක් ද පිහිටා ඇත. මේ පිළිබඳ ව කෙරී ඇති අධ්‍යයනයන් අතර මහාචාර්ය නන්දසේන රත්නපාල මහතාගේ "බෞද්ධ සමාජ විද්‍යාව" (Buddhist Sociology) නමැති කෘතිය වැදගත් වේ. එම කෘතියේ බුදු දහමේ සමාජ විද්‍යාත්මක න්‍යායික හා සංකල්පීය පදනම පැහැදිලි කර ඇත. තවද ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතා විසින් රචිත "බෞද්ධ සමාජ පාලනය" නමැති කෘතිය ද බුදු දහමේ සමාජ මානව විද්‍යාත්මක පදනම මැනවින් පැහැදිලි වන අධ්‍යයනයක් ලෙස හැඳින්විය හැකි ය. නමුත් ඇතැම් සමාජ විද්‍යාඥයින් බුදු දහමේ සමාජ විද්‍යාත්මක පදනමක් නොමැති බවට කරුණු ඉදිරිපත් කර ඇත.

මැක්ස් වේබර් විසින් Religion in India නැමති කෘතියේ දී බුදු දහම, සමාජ හා දේශපාලන විරෝධී ආත්මාර්ථය පදනම් කරගත් ආගමක් ලෙස හඳුන්වයි. ඔහු විසින් මෙම මතය පළකර ඇත්තේ මුල් බුදු දහම ගැන අවබෝධයකින් තොරව බව නූතන විද්වතුන්ගේ මතය වේ. ඒ අනුව මැක්ස් වේබර් දක්වා ඇති මතය පිළිගත නොහැකි ය. බෞද්ධ සමාජ විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ දෙකක් හඳුනාගත හැකි වේ.

I. න්‍යායාත්මක (සංකල්පීය) පදනම
II. ව්‍යවහාරික පදනම

බුදු දහමේ න්‍යායාත්මක පදනම පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී සූත්‍ර පිටකය වැදගත් වේ. යමක් විද්‍යාත්මකව අධ්‍යයනය කරනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳ ව එහි පැහැදිලි කර ඇත. කාලාම සූත්‍රය, චුල්ල හත්ථි පදෝපම සූත්‍රය වැනි සූත්‍ර දේශනාවල යමක් විද්‍යාත්මක ව අධ්‍යයනය කළ යුතු අයුරු විස්තර කරයි. යමක් පිළිගන්නේ ද නොපිළිගන්නේ ද යන්න තීරණය කළ යුත්තේ න්‍යායට, තර්කයට, සම්ප්‍රදායට ගරු කිරීමට ආදී ආත්මීය ලක්ෂණයන්ට අනුව නොව එහි සාධනීය ලක්ෂණයන්ට අනුව බව කාලාම සූත්‍රය පැහැදිලි කරයි. විද්‍යාවේ දී ද අගති විරහිත ව යමක් අධ්‍යයනය කරනු ලබන්නේ ද එකී ආකාරයට ය. චුල්ලහත්ථිපදෝපම සූත්‍රයේ මහ ඇතා දැකීම හෙවත් ඇත් පා උපමාව අනුව එක් සාධකයක් මත පමණක් තීරණවලට එළඹිය යුතු නොවන බවත් තව තවත් සාධක සොයා බලා අවසන් තීරණයට එළඹිය යුතු බවත් දක්වයි. විද්‍යාත්මක අධ්‍යයනයක දී ද එක් සාධකයක් මත තීරණවලට නොබසී. විවිධ සාධක සොයා යමින් කරුණු තහවුරු වනතෙක් අධ්‍යයනය කර අවසානයේ දී තීරණවලට එළඹෙනු ලැබේ.

බුදු දහම පුද්ගලයා හා සමාජය පිළිබඳ ව සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් විග්‍රහ කරයි. සමාජයේ කුඩා ම අංශුව පුද්ගලයා බව පෙන්වා දෙන බුදු දහම පුද්ගලයාගේ ස්වරූපය මැනවින් පැහැදිලි කරයි. පුද්ගලයා යනු සංකීර්ණ චර්යාවන්ගෙන් යුක්ත වූවෙකි. මිනිසාගේ හැසිරීම සමස්ත ලෙස විද්‍යාත්මක ව හැදෑරිය නොහැකි බව සමාජ විද්‍යාඥයෝ ද පිළිගනිති. මෙම මතය බුදු දහම මෙසේ පැහැදිලි කරයි.

"නවණ්ණ රූපේන නරෝ සුජානෝ"

මිනිසාගේ ස්වරූපය අනුව ඔහුගේ හැසිරීමේ ස්වභාවය තේරුම් ගත නොහැකි බව එයින් පැහැදිලි වේ. එමෙන් ම බුදු දහම සාමාන්‍ය පුද්ගලයා "පෘථග්ජනයා" ලෙස හඳුන්වයි.

පෘථග්ජන යන වචනයෙහි වෙන්වීම යන අර්ථය ගෙන දෙයි. ඒ අනුව සාමාන්‍ය මිනිසා පෘථග්ජන දෝෂයෙන් යුක්ත වූ කල සමාජයෙන් වෙන් වේ. එවිට ආත්මාර්ථකාමී චර්යාවෙන් යුක්ත වේ. ආත්මාර්ථකාමීත්වය සමාජ උචිත හැසිරීමක් කෙරෙහි හෝ සාමූහික හැඟීම් කෙරෙහි හෝ ප්‍රතිජනනාත්මක ලෙස බල නොපායි. බෞද්ධ සාහිත්‍යයේ එන ඉල්ලීස ජාතකය, අදින්න පුබ්බක කථාව වැනි කථා පුවත් මගින් වඩාත් පෘථග්ජන වූවන්ගේ චරිත විග්‍රහ කරයි.

බුදු දහමේ සමාජ විද්‍යාත්මක න්‍යායට අනුව සමාජය පරිණාමයට පත්වේ. සමාජ පරිණාමය දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ මැනවින් විග්‍රහ කර ඇත. මෙහි එන පරිණාමවාදය මානව විද්‍යාවේ පරිණාමවාදය හා එන අදහස් හා සැසඳේ. පරිණාමවාදීන්ට අනුව ඒක සෛල සත්ත්වයකුගේ පරිණාමය තුළින් සත්ත්ව සන්තතිය හටගෙන තිබේ. අග්ගඤ්ඤ සූත්‍රයේ එන ආභස්සර නම් සත්ත්වයා ද (සූත්‍රයේ විස්තර අනුව) ඒක සෛලීය සත්ත්වයකු ලෙස සැලකිය හැකි ය. මෙම සූත්‍රයේ සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය සම්බන්ධව දක්වන අදහස සමාජ පරිණාමයේ වැදගත් අදහසකි. බුදුදහම, සාරධර්ම පදනම කරණ කොට ගෙන පවුල, ආර්ථිකය, විවාහය, ආගම, දේශපාලනය ආදී සමාජ සංස්ථා ඇති වූ බව පැහැදිලි කරයි. ඒ අනුව බෞද්ධ පරිණාමවාදය දේවවාදී හෝ නිර්මාණවාදී දෘෂ්ටි කෝණයන්ගෙන් මිදී ඇත.

බෞද්ධ සමාජ අන්තර් ක්‍රියාවාදය, සමාජ අනුකලනයක් මනාව ඇතිකර පුද්ගලයා තුළ මනා සමාජ පෞරුෂයක් ගොඩනැගීමට හේතු වී ඇත. ඒ තුළින් සමාජ පැවැත්ම තහවුරු කර තිබේ. සිගාලෝවාද සූත්‍රයේ එන සදිසා සංකල්පය පුද්ගලයා සමාජය සමඟ පවත්වා ගත යුතු සම්බන්ධතාව පැහැදිලි කරයි. පවුල, විවාහය, මිත්‍ර කණ්ඩායම්, ආර්ථිකය, ආගම, අධ්‍යාපනය, දේශපාලනය ආදී සෑම සංස්ථාවක් සමඟ ම පුද්ගලයා අන්තර් සම්බන්ධතාවය පවත්වාගෙන යා යුතු වේ. එය පුද්ගලයා හා සමාජය අතර ගොඩනගනු ලබන සමාජමය සම්බන්ධතාව වේ. මෙහිදී යුතුකම් හා අයිතිවාසිකම් ලෙස එම සබඳතා පවත්වා ගත යුතු වේ. පුද්ගලයා විසින් සමාජය වෙත යුතුකම් ඉටුකිරීම ද සමාජය වෙතින් පුද්ගලයාගේ අයිතිවාසිකම් තහවුරු කිරීමද සිදු විය යුතු ය. මෙම අංශය බෞද්ධ ව්‍යවහාරික සමාජ විද්‍යා අංශය ලෙස හඳුනාගත හැකි ය.

සමාජ වෙනස්වීම පිළිබඳ ව සිද්ධාන්තය ද බුදු දහමේ අඩංගු ය. බුදු දහමට අනුව සියල්ල වෙනස් වේ. එය අනිත්‍යය යනුවෙන් හැඳින්වේ. ඒ අනුව සමාජය ද වෙනස් වේ. සමාජය වෙනස්වීම පිළිබඳ ව සිද්ධාන්ත මූලික වශයෙන් අග්ගඤ්ඤ, චක්කවත්ති සීහනාද වැනි සූත්‍රවල දැකිය හැකි ය. මුසාවාදය හෙවත් අසත්‍ය කරුණු පැවසීම මගින් සමාජය තුළ අපරාද ඇතිවේ. සමාජ ක්‍රමය බිඳ වැටේ. සමාජ ක්‍රමයෙහි වෙනස්කම් ඇතිවේ. නූතන සමාජයෙහි මිනිසුන් තුළ ඇතිවන චර්යාත්මක හර පද්ධතියෙහි වෙනස්වීම තුළින් අනාගත සමාජයෙහි ඇතිවන සමාජ වෙනස්කම් සමාජ විද්‍යාඥයින් පවසන්නේ යම් සේද එසේ ම මහා සුපින ජාතකය ද අනාගත සමාජ වෙනස්වීම ගැන අනාවැකි පවසයි.

සමාජ විද්‍යාව තුළ කේන්ද්‍රීය සංකල්පයක් ලෙස සමාජ පාලනය හැඳින්විය හැකි ය. සමාජ පාලනය බිඳ වැටීමට හේතු වන්නේ සම්මත සමාජ හැසිරීමෙන් පිටත යෑම හෙවත් අපරාධ හා අපචාර ක්‍රියාවල නිරතවීමයි. සමාජයේ යම් පිරිසක් එසේ සමාජ සම්මත හැසිරීමෙන් පිටත යෑම සමාජ පාලනය බිඳ වැටීමට හේතු වේ. බෞද්ධ සමාජ පාලනය ද එකී මූලධර්මය මත පිහිටා ඇත. බුදු දහම පුද්ගලයා හා සමාජය වෙත පුඤ්ඤ/පාප, කුසල/ අකුසල යන සංකල්ප ඉදිරිපත් කරයි. එයින් පින් හා කුසල් සම්මත චර්යාවන් බවට පත් කරයි. සම්මත ක්‍රියාවන්හි නිරත වීමෙන් මනා සමාජ පාලනයක් ගෙන යා හැකි ය.

හේතුඵල වාදය බුදු දහමේ කේන්ද්‍රීය සංකල්පයක් වන අතර විද්‍යාත්මක චින්තනයෙහි හේතුඵල වාදය න්‍යායික පදනමක් වේ. බෞද්ධ හේතුඵල වාදයට අනුව පුද්ගලයාත් ලෝකයත් හේතුඵල සම්බන්ධතාවට අනුව ම ක්‍රියාත්මක වේ. මෙම අදහස සමාජ ප්‍රශ්න විසඳීම සඳහා ද උපයෝගී කරගත හැකි ය. දුගීකම ලොව ප්‍රධාන සමාජ ප්‍රශ්නයක් වේ. මෙම ප්‍රශ්නය කෙරෙහි බලපානු ලබන සාධක හේතුඵලවාදී න්‍යායට අනුව තේරුම් ගත හැකි ය. එහි දී දුගීකම සඳහා බලපානු ලබන සාධක කීපයක් දැකිය හැකි ය. ඒවා නම් නූගත්කම, සුරාපානය, සූදුව ආදී අපචාරයන්ට ඇබ්බැහි වීම, මූල්‍ය ආයතන හා සම්බන්ධ නොවීම ආදියයි.

මෙතෙක් සාකච්ඡා කරන ලද කරුණු අනුව බෞද්ධ සමාජ විද්‍යාවක් ගොඩනැගීමට අවශ්‍ය සමාජ විද්‍යාත්මක පදනමක් බුදු දහම තුළ අඩංගු බව ඉතා පැහැදිලි ව පිළිගත හැකි ය.

**අභ්‍යාසය**

1. සමාජ විද්‍යාව යනු කුමක් දැයි නිර්වචන ඇසුරින් හඳුන්වන්න.
2. සමාජ විද්‍යා විෂය සංවර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක වූ සමාජ විද්‍යාඥයන් නම් කරන්න.
3. සමාජ විද්‍යා විෂය සමාජ විමසුම සඳහා දායක කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
4. බුදු දහමේ හා නූතන සමාජ විද්‍යාවේ පොදුවේ හඳුනාගත් සමාජ විද්‍යාත්මක සංකල්ප සැකෙවින් විස්තර කරන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය

# 02 සමාජ පරිණාමය

## 2.0 හැඳින්වීම

සමාජ පරිණාමය සමාජ විද්‍යාවේ ආරම්භක අවධියේ සිට ම සමාජ විද්‍යාඥයින් විසින් සිය අවධානය යොමු කරන ලද විෂය ක්ෂේත්‍රයකි. වෙනස්වීම සර්වකාලීන, සර්ව සාධාරණ සිද්ධාන්තයකි. ඒ නිසා වෙනස්වීම හෙවත් පරිණාමය ලෝකයේ සෑම විටම දැක ගත හැකි සත්‍යයකි. ආගමික ශාස්තෘන් වහන්සේලාගේ ඉගැන්වීම් අනුව ද ලොව පවතින සියලු පද්ධතීන් වෙනස්වන බවට කරුණු දක්වා ඇත. බුදු දහමේ දැක්වෙන අනිත්‍ය සංකල්පය ඊට නිදසුනක් ලෙස දැක්විය හැකි ය.

වෙනස්වීම නම් ක්‍රියාවලිය ආකාර තුනක් ඔස්සේ විස්තර කළ හැකි ය.

1. ස්වාභාවික වෙනස්වීම
2. ජීව විද්‍යාත්මක වෙනස්වීම
3. සමාජීය වෙනස්වීම

ස්වාභාවික වෙනස්වීම් යටතේ භෞතික පරිසරයේ සිදුවන වෙනස්වීම් දැක්විය හැකි ය. ජීව විද්‍යාත්මක වෙනස්වීම් යන්නෙන් අදහස් කෙරෙන්නේ සත්ත්වයන් හා ගහකොළ ආදියෙහි සිදුවෙන වෙනස්වීම් ය. මෙහි දී අපට වඩා වැදගත් අදහස වන්නේ "සමාජය වෙනස්වීම" නම් සංකල්පය යි. එය පුළුල් සංකීර්ණ සංකල්පයකි. සමාජය වෙනස්වීම ක්ෂණයෙන් සිදුවන්නක් නොවේ. එසේ ම එකවර සිදු වී අවසන් වන්නක් ද නොවේ. දිගු කාලයක් තුළ අඛණ්ඩ ව සිදුවන වෙනස්වීම් සමුදායකි. සමාජයෙහි වෙනසක් සිදු වූ බව දැකිය හැකි වන්නේ කාලයක් ගත වූවාට පසුව ය. සමාජයෙහි පැවතුණු එක් අවස්ථාවකට සාපේක්ෂ ව තවත් අවස්ථාවක් සංසන්දනය කිරීම මගින් සමාජයෙහි වෙනසක් සිදු වී ඇති බව හඳුනාගත හැකි ය.

සමාජයක ජීවත්වන පුද්ගල සමූහයක් කාලය පදනම් කර ගෙන එම සමාජයේ පවත්නා වූ ස්වභාවය හා එහි ප්‍රමාණය මෙන් ම පුද්ගලයන්ගේ තත්ත්වය හා කාර්යභාරයන්හි ද සිදුවන වෙනස්වීම සමාජ වෙනස්වීම ලෙස සරල ව දැක්විය හැකි ය. සමාජය වෙනස්වීම සමාජ සංස්කෘතියෙහි වෙනස්කම් ඇති කරලීමට ද ඉවහල් වේ. සමාජගත සාරධර්ම මෙන් ම අගනාකම් පද්ධතියෙහි ද ඇතිවෙන වෙනස්වීම තුළින් සංස්කෘතියෙහි වෙනසක් විද්‍යමාන වේ.

## 2.1 සමාජ පරිණාමය යනු කුමක්ද ?
## (සමාජ විද්‍යාඥයින්ගේ නිර්වචන ඇසුරෙන්)

සමාජ පරිණාමය පිළිබඳ ව සමාජ විද්‍යාඥයින් හා මානව විද්‍යාඥයින් විසින් බොහෝ අධ්‍යයන සිදුකොට ඇත. සමාජ චලනය පිළිබඳ සිදුකළ අධ්‍යයන හේතු කොට ගෙන අදාළ සමාජයන්හි ප්‍රගමනයක් ද සිදුවිය. ප්‍රංශය, ජර්මනිය, එංගලන්තය වැනි යුරෝපා සමාජවල ජීවත් වූ සමාජ විද්‍යාඥයින් විසින් සිය සමාජ ඇසුරින් සමාජ වෙනස්වීම පිළිබඳ විවිධ න්‍යායයන් ඉදිරිපත් කොට තිබේ. ඔවුන් අතරින් සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් කිහිප දෙනෙකු ඉදිරිපත් කළ න්‍යායයන් ඇසුරින් සමාජ පරිණාමය පිළිබඳ ව සාකච්ඡා කිරීම මෙම පරිච්ඡේදයෙන් සිදු කෙරේ.

සමාජ විද්‍යාව ආරම්භක අවධියේ ජීවත් වූ සමාජ විද්‍යාඥයින් කිහිප දෙනෙකුගේ අදහස් විමසා බැලීම සමාජ පරිණාමය පිළිබඳ සංකල්පය අවබෝධ කර ගැනීමෙහිලා වැදගත් වේ. ඔවුන් අතරින්,

- ඔගස්ට් කොම්ට්
- එමිල් ඩුර්ක්හයිම්
- හර්බට් ස්පෙන්සර්
- මැක්ස් වේබර්
- කාල්මාක්ස්

යන සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් විසින් සමාජ පරිණාමය පිළිබඳ ව දැක්වූ අදහස් විමසා බැලිය හැකි ය.

### ඔගස්ට් කොම්ට්

සමාජය අධ්‍යයනය කරනු ලබන මෙම විෂය හැඳින්වීම සඳහා සමාජ විද්‍යාව යන නම මුලින් ම භාවිත කළ ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයා වූයේ ඔගස්ට් කොම්ට් ය. එබැවින් ඔහු "සමාජ විද්‍යාවේ නියමුවා" "සමාජ විද්‍යාවේ පියා" යන විරුදාවලී ලබා ඇත. ලිබරල් චින්තනය අගය කළ ඔහුගේ දාර්ශනික අදහස් වර්ධනය වීම සඳහා ඔහුගේ ගුරුවරයෙකු වූ සෙන්ට් සිමොන් (Saint Simon) ගේ ආභාසය ලැබී තිබේ.

සමාජය අධ්‍යයනය කිරීම සඳහා ඔහු නිර්මාණය කළ විෂය පද්ධතිය සමාජ භෞතික විද්‍යාව (Social Physics) ලෙස මුල දී හඳුන්වා දුන් අතර පසුව එය සමාජ විද්‍යාව නමින් හැඳින්විය. සමාජය අධ්‍යයනය කිරීම සඳහා කොම්ට් විසින් පුළුල් සංකල්ප දෙකක් උපයෝගී කර ගන්නා ලදී.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

I. සමාජ ස්ථිතිකත්වය - (Social Static)
II. සමාජ ගතිකත්වය - (Social Dynamic)

සමාජ ස්ථිතිකත්වය යනුවෙන් සමාජයක පවත්නා ස්ථාවර ස්වභාවය දක්වයි. ගතිකත්වය යනුවෙන් දක්වන්නේ සමාජය වෙනස් වීමේ ස්වරූපයයි. ගතිකත්වය මත සෑම සමාජයක් ම සරල තත්ත්වයේ සිට සංකීර්ණ තත්ත්වයක් දක්වා වෙනස් වන බව කොම්ට් විසින් දක්වා ඇත. සාම්ප්‍රදායික සමාජානුබද්ධ විශ්වාස නවීන සමාජය ඉදිරියේ බිඳවැටෙන බව දුක්වූ ඔහු "සමාජය තැනිය යුත්තේ දෙවියන් විසින් නොව මිනිසා විසින් යයි" සඳහන් කළේ ය. මිනිසා ස්වභාවයෙන් ම නව දැනුම සොයා යන්නෙකු බව දක්වන ඔගස්ට් කොම්ට් සමාජ ප්‍රතිසංස්කරණයේ පදනම වන්නේ මිනිසා විසින් නව දැනුම සොයා යාම බව සිය "යථාභූත දර්ශනය" (Positive Philosophy) නමැති කෘතියෙන් දක්වා ඇත.

මිනිසා විසින් නව දැනුම ග්‍රහණය කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස අභිවෘද්ධිය කරා පිය නගයි. සරල සාම්ප්‍රදායික සමාජයක සිට සංකීර්ණ නූතන සමාජය කරා මිනිසා පැමිණ ඇත්තේ ඔහු විසින් අත්පත් කරගනු ලැබූ නව දැනුම නිසා ය. මෙලෙස සාම්ප්‍රදායික සමාජයේ සිට නූතන සමාජය දක්වා මානව සමාජයේ සිදු වූ පරිණාමය නැතහොත් ප්‍රගතිය අවධි තුනක් ඔස්සේ සිදු වී ඇති බව ඔගස්ට් කොම්ට් සඳහන් කරයි. එනම්,

I. දේවවාදී අවධිය - (Theological stage)
II. පාර භෞතික අවධිය - (Metaphysical stage)
III. යථානුභූත අවධිය - (Positive stage)

මානව ශිෂ්ටාචාරයේ පැවති වර්ධන අවස්ථා අනුව යුග බෙදා තිබීම මේ වර්ගීකරණයේ ඇති විශේෂත්වයකි. මේ අවධි තුන සැබැවින් ම මානව ශිෂ්ටාචාරයේ වර්ධනය පෙන්වන සමාජ ක්‍රම තුනක් ලෙස ද සැළකිය හැකි ය.

සමාජ පරිණාමය පිළිබඳ ව අදහස් දක්වමින් ඔගස්ට් කොම්ට් විසින් මානව සමාජයේ පැවති මූලික ම අවධිය දේවවාදී අවධිය ලෙස හඳුන්වා ඇත. මිනිසා සාම්ප්‍රදායික ජීවිතයක් පවත්වා ගෙන ගිය මේ අවධියේ සරල සමාජ ක්‍රමයක් පැවතිණි. තමා අවට පරිසරයේ දක්නට ලැබෙන වැස්ස, අව්ව, විදුලිය, සුළඟ ආදී ස්වාභාවික සංසිද්ධීන් අධි ස්වාභාවික බලවේගයන් විසින් එනම් දේව බලයක් මඟින් සිදු කරනු ලබන බව මේ සමාජයේ සිටි ජනයා විශ්වාස කළහ. මුළු පරිසරය ම ගුප්ත අධි ස්වාභාවික බලවේගයන් විසින්

මෙහෙවනු ලබන බව අවිචාරයෙන් පිළිගත්හ. ඒ බැවින් එම බලවේගයන් කෙරෙහි බිය මුසු ගෞරවයක් ඇති වී තිබිණි.

සමාජ පරිණාමයේ දෙවන අවධියේ ලෙස ඔගස්ට් කොම්ට් විසින් දක්වා ඇත්තේ පාරභෞතික අවධිය යි. දේවවාදි අවධියේ දී දේවත්වයෙන් පිළිගත් ගුප්ත බලවේගයන් මේ යුගයේ දි ප්‍රශ්න කිරීමට ලක් වේ. දේවත්වෙහිලා සැලකූ බොහෝ බලවේගයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට සමත් වූ යුගයක් ලෙස මේ යුගය හැඳින්විය හැකි ය. මේ නිසා තම දැනුම තුළින් ප්‍රගතිය සොයා ගිය අවධියක් ලෙස මේ අවධිය සැලකේ. දේවවාදි ඉගැන්වීම් මත පදනම් වූ මානසික බැඳීම් වෙනස් වූ ආකාරය මෙහි දී දක්නට ලැබේ. දේවවාදි සමාජය තුළ පැවති සාම්ප්‍රදයික සමාජ සම්බන්ධතා බිඳ වැටීමත්, නිෂ්පාදන බලවේගයන්ගේ නව වෙනසක් ඇති වීමත්, තම දැනුම මත කටයුතු කිරීමේ අවස්ථාව ලැබීමත් නිසා නිෂ්පාදනය ඉහළ ගොස් නිෂ්පාදනයේ අතිරික්තයක් ඇති වේ. ප්‍රගතිය කරා යන ගමන ඇරඹෙන්නේ ඒ මගිනි.

සාම්ප්‍රදයික සමාජයේ පැවති සීමිත පෞද්ගලික සම්බන්ධතා වෙනුවට රට හෝ ජාතිය පදනම් කරගත් සාමූහික පර්යායට ආදරය කරන සමාජයක් බිහිවීම ද දක්නට ලැබේ. අධ්‍යාපනික වශයෙන් දියුණුවක් ඇති කරගත් මේ යුගයේ සිට පෞද්ගලික අයිතිවාසිකම් පිළිබඳ හැඟීමකින් ක්‍රියාත්මක වන ආකාරය ද දක්නට ලැබේ. වහල්භාවය සම්පූර්ණයෙන් ම ඉවත් වීම, ඡන්ද බලය ලැබීම ආදි දේශපාලන පරිවර්තනයන් තුළින් ද මානව ප්‍රගතිය සංකේතවත් වන යුගයක් දක්වා මෙම යුගය සංවර්ධනය වේ.

පාරභෞතික යුගයේ දී පුද්ගල සමාජයෙහි ඇති වූ විචාරාත්මක බව, දැනුම වර්ධනය වීම හේතුවෙන් වඩා දියුණු තෙවැනි යුගයක් කරා සමාජය පරිණාමය වූ බව කොම්ට් විසින් දක්වා ඇත. සමාජ ප්‍රගතියේ අවධිය ලෙස හැඳින්වෙන මේ අවධියේ දී තාර්කික සමාජ සම්බන්ධතා පදනම් කර ගත් කාර්මික සමාජයක් ගොඩනැගේ. මේ සමාජයේ ප්‍රධාන අරමුණ නිෂ්පාදනය වන බව ඔගස්ට් කොම්ට් දක්වයි. එය නිෂ්පාදනය මගින් ලාභ ලැබීමේ මූලික අරමුණක් පැවති යුගයකි. දියුණු තාක්ෂණයක් යොදා ගැනීම තුළින් වේගවත් නිෂ්පාදන ක්‍රියාවලියක් සිදු වූ අතර දියුණු නාගරික ලක්ෂණ මේ සමාජයේ බහුලව දක්නට ලැබුණි.

පෞද්ගලික සීමිත සම්බන්ධතා වෙනුවට පුළුල් විශ්වීය සම්බන්ධතා මේ යුගයේ දී නිර්මාණය වන අතර මනුෂ්‍යත්වය පිළිබඳ හැඟීම පුළුල් වූ බවත් දක්වා ඇත. මානව සම්බන්ධතාවන් හි නෛතික පදනම තවදුරටත් ශක්තිමත් වීම ද මෙම යුගයේ දී දක්නට ලැබේ. සමාජය හා එහි පවත්නා තත්ත්වයන් විෂය මූලික ව අවබෝධ කර ගැනීමට පුද්ගලයා සමත්වන අතර විද්‍යාත්මක අතින් විශාල වර්ධනයක් අත්කරගත් මේ අවධිය මානව සමාජ ප්‍රගතියේ "උසස් ම අවධිය" ලෙස ද දැනුවත් බවේ උසස් ම අවධිය ලෙස ද වැඩිදුරටත් හඳුන්වා දී ඇත.

මේ ආකාරයෙන් ඔගස්ට් කොම්ට්ගේ සමාජ පරිණාමයේ අවධි තුන පිළිබඳ න්‍යාය ඉදිරිපත් වී ඇත. එය සමාජ පරිණාමයේ විශේෂ ස්ථානයක් ලබා ගන්නා න්‍යායකි. ඊට හේතුව එම අවධි තුන පිළිබඳ සංකල්පය මානව ශිෂ්ටාචාරයේ වැදගත් අවස්ථාවන් හා සම්බන්ධව ඉදිරිපත් කොට තිබීම යි. ප්‍රාථමික යුගයේ සිට එනම් දේවවාදී යුගයේ සිට පාර භෞතික අවධිය හරහා යථානුභූත අවධිය දක්වා නැතහොත් වත්මන් සමාජය දක්වා සමාජය විකාශනය වූ ආකාරය මේ න්‍යාය මඟින් පැහැදිලි කොට ඇත. ඔහු දක්වන යථානුභූත සමාජය 19 වන සියවසෙන් පසුව දක්නට ලැබෙන කාර්මික සමාජයන් ය.

## සමාජ පරිණාමය පිළිබඳ එමිල් ඩුර්ක්හයිම්ගේ අදහස්

උපතින් යුදෙව් ජාතිකයෙකු වූ එමිල් ඩුර්ක්හයිම් ප්‍රංශයේ ජීවත් වූ සමාජ විද්‍යාඥයෙකි. සෙන්ට් සිමෝන් (Saint Simon), ඔගස්ට් කොම්ට් (Auguste Comte) වැනි සමාජ දාර්ශනිකයන්ගේ ආභාසය ඔහුගේ අදහස් පෝෂණය වීම කෙරෙහි බලපා ඇති බැවින් ඔවුන් ඩුර්ක්හයිම්ගේ ගුරුවරුන් ලෙස සැලකේ. ප්‍රංශ විශ්ව විද්‍යාල පද්ධතියට සමාජ විද්‍යාව හඳුන්වා දුන්නේ ද එසේ ම එම ගුරු කුලයේ නිර්මාතෘවරයා බවට පත්වූයේ ද ඔහු ය.

විද්‍යාවේ දියුණුවත් ප්‍රංශ ආණ්ඩු විප්ලවයත් හේතු කොට ගෙන යුරෝපීය සමාජය සාම්ප්‍රදායික තත්ත්වයෙන් මිදී නව කාර්මික සමාජයක් කරා වෙනස් වූ බව ඩුර්ක්හයිම් කියයි. සමාජ පරිණාමය ලෙස ඔහු දක්වන්නේ එම වෙනස් වීමයි. මෙසේ සරල තත්ත්වයක පැවති සමාජය සංකීර්ණ තත්ත්වයකට පරිණාමය වීම සඳහා ප්‍රධාන සාධක දෙකක් හේතුවන බව ඔහු පවසයි. එනම්,

I. ජනගහන වර්ධනය
II. ශ්‍රම විභජනය

යන කරුණු දෙකයි.

ජනගහනය වර්ධනය වීම නිසා ඔවුන් අතර පවතින අන්තර් ක්‍රියා බහුල වීම හා සංකීර්ණ වීම සිදුවේ. එම සමාජයේ සදාචාර ඝනත්වයක් (Moral Density) ඔහු දක්වයි. සදාචාර ඝනත්වය යනු පැමිණෙන ජනගහනයට සරිලන සම්ප්‍රදාය, නීති රීති හා ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීම ලෙස ඔහු දක්වයි. සරල සමාජය සංකීර්ණ වීම සඳහා එම තත්ත්වය බලපානු ලැබේ.

සමාජ වෙනස්වීම සිදුකරනු ලබන දෙවන සාධකය ලෙස ඔහු දක්වා ඇත්තේ ශ්‍රම විභජනය යි. ඩුර්ක්හයිම්ගේ එම අදහස් ''සමාජයේ ශ්‍රම විභජනය'' (The Division of Labour) නමැති කෘතියෙන් ඉදිරිපත් කොට ඇත. ඔහුගේ අදහස වන්නේ සෑම සමාජයක කිසියම් ඒකාබද්ධතාවක් ඇති බවයි. එමිල් ඩුර්ක්හයිම් සමාජ ඒකාබද්ධතාවන් දෙකක් පිළිබඳ කරුණු දක්වා ඇත.

I. යාන්ත්‍රික ඒකාබද්ධතාව - (Mechanicl Solidarity)
II. ඓන්ද්‍රිය ඒකාබද්ධතාව - (Organic Solidarity)

යාන්ත්‍රික ඒකාබද්ධතාව නම් ලක්ෂණය දක්නට ලැබෙන්නේ ශ්‍රම විභජනය පහළ මට්ටමක පැවති පැරණි සමාජවල බව ඔහු කියයි. එම සමාජයේ ජීවත්වන මිනිසුන් අතර බොහෝ සමානතා විද්‍යමාන වේ. පුද්ගල අදහස් උදහස් මෙන් ම ගති පැවතුම් ද බොහෝ සෙයින් ඒකාකාරී වේ. ආහාර පාන, ඇඳුම් පැළඳුම්වල පවා ඇත්තේ මේ සමානතාවයි. පැරණි සමාජවල පවත්නා මේ සමානතාව හේතු කොට ගෙන යාන්ත්‍රික ඒකාබද්ධතාවක් නිර්මාණය වන බව එමිල් ඩුර්ක්හයිම්ගේ අදහස් වේ.

යාන්ත්‍රික ඒකාබද්ධතාව සහිත පැරණි සමාජයේ සියලු කාර්යයන් ඉටු කිරීම කෙරෙහි සියලු දෙනා සාමූහිකව බැඳී සිටිති. මේ තත්ත්වය මත පැරණි සමාජයේ තනි පුද්ගලයාට වඩා සමූහය වැදගත් වේ. සියලු පුද්ගලයන් එකට එකතු කළ සාමූහික සම්බන්ධතා එම පැරණි සමාජයේ පැවතිණි. මේ සබඳතා ඉතා ශක්තිමත් ඒවා වන බැවින් පැරණි සමාජයේ සාමූහික විඥ්ඥාණයක් ක්‍රියාත්මක වූ අතර හුදෙකලාව තම අවශ්‍යතා ඉටුකර ගැනීමට වඩා එක්සත්ව අවශ්‍යතා ඉටුකර ගැනීමත් ඒ සඳහා එකිනෙකා අතර අන්‍යෝන්‍ය යැපීමක් ද ප්‍රකට විය.

මෙලෙස සාමූහික විඥ්ඥාණය මත පදනම් වී සරලව පැවති සමාජය ශ්‍රම විභජනයේ තීව්‍රතාව හේතු කොට ගෙන වෙනස් වෙමින් සංකීර්ණ ස්වභාවයට පත්වේ. එම සංකීර්ණ සමාජය ඓන්ද්‍රිය ඒකාබද්ධතාව සහිත සමාජයක් ලෙස ඩුර්ක්හයිම් හඳුන්වා දෙයි. මෙවැනි සංකීර්ණ සමාජවල දක්නට ලැබෙන එක් වැදගත් ලක්ෂණයක් වන්නේ ශක්තිමත් සාමූහික බැඳීම් විරල වීමයි. සමාජයේ අන්තර් පුද්ගල සම්බන්ධතා ගිවිසුම් හෝ සම්මුතිවල ස්වරූපයක් ගනී. සමාජය කාර්මීකරණයට ලක්වීමත්, මුදල් භාවිතය වැඩි වීමත් නිසා බොහෝ සම්බන්ධතා ආර්ථිකමය හා නෛතික ස්වරූපයක් ගනියි.

නූතන සමාජවල ඉහළ සංකීර්ණ ශ්‍රම විභජනයක් දක්නට ලැබේ. සමාජයක පවතින විවිධ කාර්යයන් විවිධ අයවලුන් විසින් ඉටු කරනු ලැබේ. වෛද්‍යවරුන්, ගුරුවරුන්, ඉංජිනේරුවරුන්, ලිපිකරුවන්, දේශපාලකයන්, ව්‍යවසායකයන් ආදි ලෙස විවිධ වෘත්තීන්හි නියැලෙන පිරිසක් දක්නට ලැබේ. ඔවුන් එකිනෙකා විසින් ඉටු කරනු ලබන කාර්යයන් සමාන නොවේ. එහෙත් සමාජයේ පැවැත්ම සඳහා මේ සියලු ම දෙනාගේ කාර්යභාරයන් එකසේ වැදගත් වේ. නූතන සමාජයේ පුද්ගලයා සමස්තය ම නිපදවන්නේ නැත. එසේ ම සමස්ත ක්‍රියාවලියකට සම්බන්ධ වන්නේ ද නැත. එම සමස්තයෙන් එක් සුවිශේෂී කොටසක් වඩා හොඳ මට්ටමකින් ඉටු කරයි. ඒ තත්ත්වය ''විශේෂ ප්‍රාගුණ්‍යය'' යනුවෙන් හඳුන්වයි. මේ අනුව නූතන සමාජවල සංකීර්ණ ශ්‍රම විභජනයක් පවතින බව පැහැදිලි වේ.

නූතන සමාජවල පුද්ගලයන් අතර පෞද්ගලිකත්වය පිළිබඳ හැඟීම වැඩි ය. පොදු සාමූහික සම්බන්ධතා වෙනුවට නෛතික හෝ මූල්‍යමය හෝ සම්බන්ධතා වැඩි වීම මෙවැනි තත්ත්වයක් ඇති වීමට හේතු වී ඇත. නූතන සමාජය නිෂ්පාදනය, බෙදා හැරීම, වෙළෙඳාම වැනි තත්ත්වයන්ගෙන් සමන්විත වූවකි. මේ නිසා ලාභය, සමාජය මෙහෙයවනු ලබන ප්‍රධාන සංකල්පයක් බවට පත් විය. ලාභ අපේක්ෂාව මුල් කර ගෙන සිය කාර්යභාරයන් සිදු කිරීම තුළින් මූල්‍ය සම්බන්ධතා ප්‍රබල වේ. සිරිත විරිත හෝ සම්ප්‍රදායයන්වලට වඩා නීත්‍යානුකූල බව කෙරෙහි වැඩි සැළකිල්ලක් දක් වූ බව ඩුර්ක්හයිම් ගේ අදහසයි. නූතන සමාජය තුළ තාර්කික නීතියක් දක්නට ලැබෙන බවත් නීතිය ඉදිරියේ තර්කානුකූල ව කටයුතු කිරීමට හැකියාව ලැබෙන බවත් ඔහු කියයි. ඒ නිසා පැරණි සමාජයේ මෙන් අනිවාර්ය ලෙස දඬුවම් ලැබීමක් නූතන සමාජවල සිදු නොවන බව ඩුර්ක්හයිම් දක්වා ඇත.

## හර්බට් ස්පෙන්සර්ගේ සමාජ පරිණාමවාදී න්‍යාය

ලිබරල්වාදී චින්තකයකු වූ හර්බට් ස්පෙන්සර් චාල්ස් ඩාවින් ගේ පරිණාම වාදී අදහස් බෙහෙවින් අගය කළ අයෙකි. ඔහු ඔගස්ට් කොම්ට්ගේ සමකාලීනයෙකි. සමාජ විද්‍යාවේ දී සමාජ විකාශනය (Social Evolution) පිළිබඳ ව හැදෑරිය යුතු බව ඔහුගේ අදහස වේ. හර්බට් ස්පෙන්සර් සමාජ විකාශනය පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කළ නිසා ඔහු සමාජ පරිණාමවාදියකු ලෙස සැළකේ. ඒ තත්ත්වය යටතේ ඔහු විසින් රචනා කරන ලද සමාජ පරිණාමය පිළිබඳ ව නීතිය (Law of Evolution) නමැති ග්‍රන්ථය ඉතා වැදගත් නිර්මාණයක් ලෙස බොහෝ දෙනාගේ පිළිගැනීමට ලක් වී ඇත.

"පරිණාමය යනු ද්‍රව්‍යයන් එකට එක්වීම හා ඒ සමාන ම බලයක් ඇති කරමින් විසිරීමේ ස්වභාවයයි" යනුවෙන් පරිණාමය පිළිබඳ ව අදහස් දක්වමින් ස්පෙන්සර් කියයි. එක ස්වරූපයකින් පැවති දෙයක් වෙනස්වීම පරිණාමය ලෙස ඔහු හඳුනාගත් ආකාරය මේ අදහස අනුව පැහැදිලි වේ. ලොවෙහි පැවති භෞතික වස්තූන් සේ ම මිනිසාගේ හැඟීම්, දැනීම්, අදහස් උදහස් ආදීය ද පරිණාමයට පත්විය. එහිදී සරල (Simple) තත්ත්වයක සිට සංකීර්ණ (Complex) තත්ත්වයක් දක්වා වෙනස්වීම සිදුවන බව හර්බර්ට් ස්පෙන්සර්ගේ අදහස විය.

සමාජ පරිණාමය අදියරයන් දෙකක් ඔස්සේ සිදු වී ඇති බව ඔහුගේ අදහසයි.

I. රණකාමී සමාජය - (Military Society)
II. කාර්මික සමාජය - (Industrial Society)

ඒකාධිපති පාලකයෙකු යටතේ පැවති සාම්ප්‍රදායික සමාජයක් 'රණකාමී සමාජයක්' ලෙස ස්පෙන්සර් හඳුන්වා දී ඇත. සමාජය පැවති ආර්ථිකය ප්‍රාථමික තත්ත්වයේ පැවතිණි. ඒ මත සාමූහික ව කටයුතු කිරීමට සමාජය තුළින් ම පෙළඹවීමක් ඇති වී තිබේ. එබැවින් සම්ප්‍රදායානුකූල පොදු ජීවන ක්‍රමයක් මේ යටතේ දක්නට ලැබෙන බව ඔහු දක්වයි. මෙසේ පැවති සාම්ප්‍රදායික සමාජයේ දැනුම් රටාව වර්ධනය වීම නිසා සමාජ, ආර්ථික මෙන් ම දේශපාලනික ස්වරූපයන් ද වෙනස් වේ. මේ වෙනස නිසා ගොඩනැගෙන සමාජ ක්‍රමය කාර්මික සමාජය ලෙස ඔහු හඳුන්වා ඇත. තාක්ෂණයේ දියුණුවත් කාර්මික සංවර්ධනයත් මෙහි දක්නට ලැබේ. දේශපාලන නිදහස මෙන් ම සාමාජීය නිදහස ද අගය කරන මේ සමාජයේ නූතන ප්‍රජාතාන්ත්‍රවාදී පාලන

ක්‍රමයක් ක්‍රියාත්මක වේ. සාම්ප්‍රදායික සමාජයේ පැවති සාමූහිකත්වය වෙනුවට පෞද්ගලිකත්වය මතු වී තිබීම මේ සමාජයේ ලක්‍ෂණයක් ලෙස ද දක්වා ඇත.

## සමාජ පරිණාමය පිළිබඳ මැක්ස් වේබර්ගේ අදහස්

ජර්මන් ජාතිකයකු වන මැක්ස් වේබර් නීතිවේදියකු, ආර්ථික විද්‍යාඥයකු, සමාජ විද්‍යාඥයකු මෙන් ම ඉතිහාසඥයකු වශයෙන් ද ප්‍රකට දාර්ශනිකයෙකි. ඔහු විසින් ඉදිරිපත් කරන ලද සංකල්ප රාශියක් මගින් සමාජ විද්‍යාව පෝෂණය වී ඇත.

I. සමාජ ක්‍රියා න්‍යාය
II. ආධිපත්‍ය පිළිබඳ න්‍යාය
III. සමාජ ස්තරායණය පිළිබඳ විග්‍රහය
IV. නිලබල ක්‍රමය පිළිබඳ විග්‍රහය

වැනි සංකල්ප ඊට බෙහෙවින් දායක වී ඇත. සමාජ පරිණාමය පිළිබඳ ව මැක්ස් වේබර්ගේ අදහස් ඉදිරිපත් වන්නේ ආධිපත්‍යය සංකල්පය තුළ ය. සමාජයක් සාම්ප්‍රදායික තත්ත්වයේ සිට නවීන කාර්මික යුගය දක්වා පරිණාමය වීමේ දී ඒ ඒ යුගවල පැවති දේශපාලන ආධිපත්‍යයේ ස්වරූපය බලපානු ලබන බව වේබර්ගේ අදහසයි. ප්‍රජාව පාලනය කළ හැකි ආධිපත්‍ය රටාවක් එම සමාජය තුළින් ම ගොඩනැගේ. කාලානුරූපව සමාජයේ පැන නැගෙන වෙනස්කම්වලට අනුකූල වූ ආධිපත්‍ය රටාවක් ද ගොඩ නැඟෙන බව වේබර් දක්වයි.

රේඛීය දිශානතියක් ඔස්සේ සමාජය පරිණාමය වන බව පැහැදිලි කරන මැක්ස් වේබර් තුන් ආකාරයක ආධිපත්‍යයක් පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.

I. සාම්ප්‍රදායික ආධිපත්‍යය - (Traditional Authority)
II. අනුහාසාත්මක ආධිපත්‍යය - (Charismatic Authority)
III. නෛතික ආධිපත්‍යය - (Legal Authority)

සාම්ප්‍රදායික සමාජය ප්‍රාථමික ලක්ෂණවලින් යුතු එකක් වේ. එම සමාජය තුළ විධිමත් පාලනයක් දක්නට නොලැබේ. එම සමාජය පාලනය වන්නේ සාම්ප්‍රදායික වශයෙන් සමාජය පුරුදු පුහුණු කරනු ලැබූ අවිචාරවත් සම්මුතීන්, පිළිගැනීම් හා සම්ප්‍රදායයන් මඟිනි. එම සමාජයේ සම්ප්‍රදායයන් විසින් පිළිගනු ලැබූ ආධිපත්‍යයක් ගොඩ නැගේ. පරම්පරාවෙන් බලය ලබා ගන්නා රජෙකු මේ සමාජයේ ආධිපත්‍යය දරයි. එම සාම්ප්‍රදායික ආධිපත්‍යය


නොමිලේ බෙදා හැරීම සඳහා ය

හා නායකත්වය එම සමාජය විසින් අවිවාදයෙන් පිළිගන්නා ලදී. පාලකයා අදෘශ්‍යමාන දෙවියෙකු විශ්වාස කළේ ය. පාලකයා විසින් පිළිගන්නා ලද දේවත්වයේ තීරණ පුරවැසියා ද අවිවාදයෙන් පිළිගන්නා ලද බව වේබර් සඳහන් කර ඇත. මෙලෙස සම්ප්‍රදාය මුල් කොටගත් පාරම්පරික ව පැමිණි ආධිපත්‍යය සාම්ප්‍රදායික ආධිපත්‍යය නමින් හැඳින්වීය.

පසු කාලීනව සමාජය තුළ සමාජීය, ආර්ථිකමය හා දේශපාලනමය වශයෙන් විපර්යාසයන් පහළ විය. ඒ සමඟ මෙතෙක් අවිවාදයෙන් පිළිගනු ලැබූ සාම්ප්‍රදායික මෙන් ම පාරම්පරික නායකත්වය ද විවේචනයට ලක් විය. එසේ ම ඊට ප්‍රතිවිරුද්ධ උද්ඝෝෂණ ආරම්භ වූ බව මැක්ස් වේබර් සඳහන් කරයි. ඥාතිත්වය ලේ උරුමය වැනි සාම්ප්‍රදායික බැඳීම් මත පැවති නායකත්වය ඒ සමඟ ම බිඳ වැටෙන බව ද ඔහු දක්වයි. මේ තත්ත්වය මත සමාජයෙහි අර්බුදකාරී පසුබිමක් නිර්මාණය වන බවත් ඒ හේතු කොට ගෙන සමාජය විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දෙන බවත් ඔහු දක්වයි. මේ තත්ත්වය යටතේ සාම්ප්‍රදායික නායකත්වය මඟින් ක්‍රියාත්මක වූ සමාජමය කාර්යභාරයන් අක්‍රිය වීම සමාජයේ පැවැත්මට බාධාකාරී වන බව සඳහන් කරයි. මෙසේ බිඳ වැටෙන සමාජය ආරක්ෂා කර ගැනීම සඳහා සමාජය තුළින් ම නව නායකත්වයක් ගොඩ නැගේ. එමගින් පැවති සාම්ප්‍රදායික සමාජගත ලක්ෂණයන් විවේචනය කරමින් නව ආධිපත්‍යයක් ගොඩ නැගෙන බව වේබර් සඳහන් කරයි.

මෙලෙස නිර්මාණය වන නායකත්වය ආකර්ෂණීය එකක් වන අතර එම පාලකයා කැරිස්මා බලයෙන් හෙවත් අනුභාසාත්මක ආධිපත්‍යයකින් හෙබි අයකු වන බවත් වේබර් දක්වයි. මේ ආකර්ෂණීය නායකත්වය අයෝමය බලයක් සහිත පාලකයෙකු වූ බව ද ඔහු දක්වා ඇත. අයෝමය අනුහස වටා සංවිධානය වූ ශක්තිමත් පාලන ව්‍යුහයක් මේ යුගයේ දී නිර්මාණය වේ. අනුභාසාත්මක ආධිපත්‍යය සහිත පාලන යුගයක් හෝ යුග කිහිපයක් ශක්තිමත් ලෙස පවතින බව වේබර් පෙන්වා දෙයි. අනුභාසාත්මක ආධිපත්‍යය ක්ෂණික ව පහළ වී ආවේගශීලී ව කටයුතු කරන එකකි. පාලකයා නිතර ම බලය රැක ගැනීමට මෙන් ම වර්ධනය කර ගැනීම සඳහා ද උත්සුක වන බව වේබර්ගේ අදහසයි.

මේ අතර සමාජය තුළ දැනුම අලුත් වීමත් තාක්ෂණය වර්ධනය වීමත් ආර්ථික ක්‍රියාවලිය මෙන් ම සමාජ හා දේශපාලන තත්ත්වයන් ද විපර්යාසයන්ට ලක් වීමත් සිදුවේ. එම වෙනස්කම් මත අනුභාසාත්මක ආධිපත්‍යය ද ප්‍රශ්න කිරීමට ලක් වේ. නව සමාජ ආර්ථික තත්ත්වයන් ඔස්සේ ඉදිරියට යන

සමාජයට අනුභාසාත්මක පාලකයාගේ අයෝමය බලය පෙරළා පීඩනයක් ඇති කරනු ලබයි. එබැවින් ඊට විරුද්ධ ව සමාජය ඇසුරින් ම බලපෑමක් ඇති වන බව වේබර් කියයි.

මේ තත්ත්වය මත සමාජයෙහි ඇතිවෙන අස්ථාවර තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා නීතිමය ආධිපත්‍යයක් සහිත නව ධනවාදී පාලන ක්‍රමයක් බිහි කර ගන්නා බව සඳහන් කරයි. නව පාලන ක්‍රමය තුළ පුරවැසියා අවනත විය යුත්තේ සාම්ප්‍රදායික ප්‍රභූත්වයකට හෝ අයෝමය බලය සහිත පුද්ගලයෙකුට නොවේ. විශේෂයෙන් අපෞද්ගලික වූ නීති පද්ධතියකට ය. මෙහි දී පුද්ගලයා පාලනය කරනු ලබන්නේ නීති පද්ධතියක් මඟිනි. එය නිලබල රටාවක් නැතහොත් ධූරාවලි ක්‍රමයක් මත ක්‍රියාත්මක වන්නක් බව වේබර් කියයි.

මැක්ස් වේබර්ගේ සමාජ පරිණාමය සම්බන්ධ ආධිපත්‍ය සංකල්පය තුළින් පැරණි සාම්ප්‍රදායික සමාජය නූතන නෛතික ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් දක්වා අවධි තුනක් ඔස්සේ වර්ධනය වූ ආකාරය දක්වයි. කිසිම විටක බලය රහිත ව සමාජයක් නොපවත්නා බවත් සමාජයේ ක්‍රියාකාරීත්වය මත ගොඩ නැගෙන නව තත්ත්වයන් හමුවේ බලය වෙනස් වෙමින් ඉදිරියට යන බවත් ඔහු සඳහන් කරයි. යුරෝපීය සමාජයේ සිදු වූ මෙම වෙනස් වීම කවර සමාජයක වුව ද පරිණාමය සම්බන්ධයෙන් වලංගු වන බව ඔහුගේ අදහස වේ.

## සමාජ පරිණාමය පිළිබඳ කාල් මාක්ස්ගේ අදහස්

සමාජ පරිණාමය පිළිබඳ ව අදහස් දක්වන කාල් මාක්ස් ප්‍රධාන න්‍යායයන් දෙකක් මුල් කරගෙන සිය අදහස් ඉදිරිපත් කර ඇත. ද්වන්ද්වාත්මක භෞතික වාදය හා ඓතිහාසික භෞතික වාදය එම න්‍යායය දෙකයි. සමාජයක් සංවිධානය වී ඇති ආකාරය නිෂ්පාදන ක්‍රමයක් වශයෙන් විග්‍රහ කිරීම ද්වන්ද්වාත්මක භෞතික වාදය වන අතර ඓතිහාසික භෞතික වාදය ලෙස හැඳින්වූයේ සමාජ පරිණාමය, නිෂ්පාදන ක්‍රමය හා එහි වෙනස් වීමට අනුරූප වන ආකාරයයි. කාල් මාක්ස් සමාජ පරිණාමය තර්කානුකූල ව පැහැදිලි කිරීම සඳහා ඓතිහාසික භෞතික වාදය උපයෝගි කර ගෙන ඇත. සමාජ වෙනස් වීම සිදුවන්නේ ආර්ථික ව්‍යුහය තුළ බලවේගයන් දෙකක් අතර ගැටුම නිසා බව ඔහු කියයි. නිෂ්පාදන බලවේගයන් හා නිෂ්පාදන සබඳතා මේ ගැටුම්වලට හේතු වූ අතර එම නිසා සමාජය වෙනස් වේ. සමාජය වෙනස්වීම සඳහා ආර්ථික සාධකය මුල් වන බවත් නිෂ්පාදන අතිරික්තය



නොමිලේ බෙදා හැරීම සඳහා ය

මෙහිලා විශේෂ බලපෑමක් සිදු කළ බවත් ඔහු කියයි.

සමාජය පරිණාමය වූ ආකාරය මාක්ස් විසින් අවධි කිහිපයකට බෙදා දක්වා ඇත.

01. ප්‍රාථමික කොමියුනිස්ට් අවධිය (Primitive Communism)
02. වහල් යුගය (Slavery stage)
03. වැඩවසම් යුගය (Feudalisim)
04. ධනවාදී අවධිය (Capitalism)
05. සමාජවාදී අවධිය (Socialism)
06. සුපිරි කොමියුනිස්ට් අවධිය (Super Communism)

සමාජ පරිණාමයේ මූලික අවධිය වශයෙන් මාක්ස් විසින් හැඳින්වූයේ ප්‍රාථමික කොමියුනිස්ට් අවධිය නමිනි. දේපල පිළිබඳ පොදු අයිතියක් තිබූ මේ අවධියෙහි සමාජ ස්තරායණ රටාවක් නොවීය. සමාජ අවශ්‍යතා මත සංකීර්ණ නොවූ සාධාරණ ශ්‍රම විභජනයක් පැවතිණි. මේ සමාජයෙහි ආර්ථික දුෂ්කරතා පහළ වීම නිසා සමාජය වෙනස් වන බව මාක්ස් විසින් සඳහන් කර ඇත. මේ සමාජයෙහි භාවිත වූ නොදියුණු ශිල්ප ක්‍රමයක් නිසා වේගවත් වර්ධනයක් සිදු කිරීම අපහසු විය. අනෙක් අතට ජනගහනය වේගයෙන් වර්ධනය වීමත් සමඟ සමාජයෙහි ආර්ථික ගැටලු මතු විය. මේ තත්ත්වයෙන් මිදීමට උත්සුක වීමේ ප්‍රතිඵලයක් ලෙස තාක්ෂණය දියුණු වූ බවත් ඒ නිසා නිෂ්පාදන ධාරිතාව වැඩි වූ බවත් මාක්ස් සඳහන් කරයි. මේ තත්ත්වය මත අතිරික්ත නිෂ්පාදනයක් බිහි වේ. එම නිෂ්පාදන අතිරික්තය කිහිප දෙනෙකු අයිති කර ගැනීම නිසා සමාජයේ සුළු පිරිසක් බලවත් විය. ඔවුහු අන් අයගේ ශ්‍රමයේ අධිකාරය තමන් වෙත රඳවා ගැනීමටත් සිය කැමැත්ත මත පාලනය කිරීමටත් උත්සහ දැරූහ. මේ මත අලුත් ස්තරායණ ක්‍රමය ගොඩනැගුණ අතර පූර්ව කොමියුනිස්ට් යුගය අවසන් විය.

අලුත් ආර්ථික වාතාවරණය යටතේ ගොඩනැගෙන්නේ වහල් යුගයක් බව මාක්ස් කියයි. ආර්ථික ශක්තිය ඇති පන්තිය දුබලයාගේ කායික මානසික ශක්තිය සූරා ගැනීම නිසා මෙම සමාජය බිහි වේ. මුලින් ම සමාජයෙහි පන්ති භේදය ආරම්භ වූයේ මේ යුගයේ දී බව මාක්ස්ගේ අදහසයි. වහලා සහ වහල් හිමියා යන පන්ති දෙක මේ සමාජයේ දක්නට ලැබිණි. යුගයේ නිෂ්පාදන, සබඳතා නිරූපණය කරන ලද්දේ මේ පන්ති දෙක මඟිනි. මේ සමාජයේ සිටි කුඩා ඉඩම් හිමියන්ගේ ඉඩම් මහ ඉඩම් හිමියන් විසින් කොල්ලකෑම

නිසා මහ ඉඩම් හිමි පන්තියක් බිහිවීමත්, නිෂ්පාදනය වර්ධනය කර ගැනීමේ අරමුණින් වහල් හිමි රාජ්‍යයන් අතර පැවති යුද්ධ ආදියත් හේතුවෙන් සමාජයෙහි ව්‍යාකූල බවක් ඇතිවෙන බව මාක්ස් පැහැදිලි කරයි. මිනිස් ශ්‍රමයේ වටිනාකම වඩාත් වැඩියෙන් දැනුණු මේ සමාජයෙහි ශ්‍රම සංචලතාවක අවශ්‍යතාවක් තිබිණි. මේ අවශ්‍යතාව හා සමාජ ව්‍යාකූලත්වය මත සමාජයෙහි වහල් ක්‍රමය බිඳ වැටුණු බව මාක්ස් සඳහන් කර ඇත.

ප්‍රවේණිදාස භාවයේ මූලික පදනම සකස් වන්නේ වහල් ක්‍රමය බිඳ වැටීමත් සමඟ ය. මහ ඉඩම් හිමියන් රදළයන් පිරිසක් බවට පත්වීම හා වහලුන් වඩා නිදහසක් ලබා ප්‍රවේණිදාසයන් බවට පත්වීම හේතුවෙන් වැඩවසම් යුගයක් උදාවන බව මාක්ස් දක්වයි. වැඩ වසම් සමාජයේ ප්‍රධාන නිෂ්පාදන බලවේගය වන්නේ ඉඩම් ය. රදළයා හා ප්‍රවේණිදාසයන් අතර නිෂ්පාදන සම්බන්ධතා ගොඩනැගේ. ප්‍රවේණිදාසයා රදළයාගේ ඉඩම්වල කටයුතු ද ගෘහීය කටයුතුවල ද නිරත වේ. එම සේවය සඳහා රදළයා විසින් ප්‍රවේණිදාසයන්ගේ ජීවිත පවත්වා ගැනීමට අස්වැන්නෙන් කොටසක් හෝ කුඩා ඉඩම් කොටසක් ලබා දී තිබිණි.

වැඩවසම් ආර්ථිකය තුළ ප්‍රවේණිදාසයා හා රදළයා අතර නිෂ්පාදන හුවමාරුවක් සිදුවෙන බව මාක්ස් කියයි. රදළ සමාජයේ අවශ්‍යතා මත කාර්මික නිෂ්පාදනයන් සඳහා ප්‍රවේණිදාසයා යොමු වීමෙන් ග්‍රාමීය සුලු කාර්මාන්ත ආරම්භ වේ. එදිනෙදා ජීවිතයට අවශ්‍ය උපකරණ මෙන් ම රදළ සමාජයට අවශ්‍ය සුඛෝපභෝගී භාණ්ඩ ද මේ කර්මාන්ත ඇසුරින් නිපදවන ලද බව කාල්මාක්ස් පෙන්වා දෙයි. සුලු කර්මාන්ත වශයෙන් ඇරඹි කාර්මික නිෂ්පාදන ක්‍රමය මහා පරිමාන කර්මාන්ත දක්වා ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ සමාජය ද ඊට සමගාමී ව පරිණාමය වූ බව ඔහු කියයි. කාර්මික නිෂ්පාදන ක්‍රමය ප්‍රබල වීමත් වෙළෙඳපොළ ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වීමත් හුවමාරු මාධ්‍යයක් ලෙස හා වටිනාකම් රැස් කිරීමේ මාධ්‍යයක් ලෙස මුදල් පැමිණීමත් සමඟ වැඩවසම් සම්බන්ධතා ඉවත්වී වාණිජවාදී ලක්ෂණ සහිත සමාජයන් වර්ධනය වූ ආකාරය දක්වා ඇත. කාර්මික ආර්ථිකයට අවශ්‍ය පරිදි සියුම් ශ්‍රම විභජනයක් ද සමාජයෙහි වර්ධනය විය. අලුත් ආර්ථික තත්ත්වය යටතේ ගොඩ නැඟුණු සමාජය මාක්ස් විසින් ධනවාදී සමාජය ලෙස නම් කර ඇත. එම සමාජයේ සම්බන්ධතා ධනය පදනම් කරගෙන ක්‍රියාත්මක වූ බවත් ධනය ම පදනම් කරගෙන ධනපති හා නිර්ධන යනුවෙන් පන්ති දෙකක් පහළවන බවත් මාක්ස් කියයි. කර්මාන්තයන්හි හෝ විශාල ගොවිපලවල

අයිතිය ලැබූ විශාල ලාභයක් රැස්කරගත් සුළු පිරිසක් ධනපති පන්තියට අයත්ය. එම ආයතනවල වැටුපට ශ්‍රමය විකිණූ බහුතර නිර්ධන පිරිසක් සමාජයේ දක්නට ලැබිණි. ධනපතියා සිය ලාභය වඩාත් වර්ධනය කර ගැනීම සඳහා නිර්ධන පන්තිය පීඩනයට ලක් කිරීම දිගින් දිගටම සිදු වූ අතර ඒ තත්ත්වය මත ධනපති හා නිර්ධන පන්ති දෙක අතර ගැටුමක් හට ගැනිනි. ඒ ගැටුමේ ප්‍රතිඵලය වූයේ නිර්ධන පන්තිය විසින් ධනවාදී සමාජ ක්‍රමය බිඳ දැමීම ය.

ධනවාදී සමාජ ක්‍රමය බිඳ දමා නිර්ධනයන් විසින් ගොඩ නගා ගත් සමාජ ක්‍රමය සමාජවාදී සමාජය ලෙස මාක්ස් විසින් නම් කර ඇත. එම සමාජයේ පන්ති භේදයක් දක්නට නොලැබේ. පොදු දේපල ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර සමාජයේ අවශ්‍යතාව මත සාධාරණ වූ ශ්‍රම විභජනයක් ක්‍රියාත්මක වේ. සියලු දෙනාට අයිතිවාසිකම් ලැබෙන මේ සමාජ ක්‍රමය ජනතා බලවේගයන් මගින් ආරක්ෂා කොට ක්‍රියාත්මක කරනු ලබන්නක් බව මාක්ස් කියයි.

සමාජවාදී සමාජ ක්‍රමය කොමියුනිස්ට් සමාජයක් බිහිවීමේ මුල් පියවරයි. සමාජය තුළ සමාජවාදය තහවුරු වීමෙන් අනතුරුව කිසිම ආඥා දායකත්වයක් හෝ පාලනය කිරීමක් අවශ්‍ය නොවන බව දක්වා ඇත. පුද්ගලයාගේ පූර්ණ සංවර්ධනය සහතික කරනු ලබන මානවයාගේ ඉහළ ම වර්ධනය පෙන්වන අවධියක් ඉන් පසුව ඇතිවෙන බව මාක්ස්ගේ අදහසයි. එම සමාජය සුපිරි කොමියුනිස්ට් සමාජය ලෙස ඔහු විසින් හඳුන්වා දී ඇත. එය දේශපාලන ස්වරූපයක් නොමැති රාජ්‍යයක් හෝ රාජ්‍ය පාලනයක අවශ්‍යතාවක් නැති ස්වයං පාලනයක් සහිත සමාජයකි. එම සමාජය සමාජ පරිණාමයේ උච්චත ම අවස්ථාව ලෙස කාල් මාක්ස් සිය න්‍යාය මගින් පෙන්වා දී ඇත.

## අභ්‍යාසය

1. සමාජ පරිණාමය යනු කුමක් ද යි හඳුන්වා දෙන්න.
2. "ඔගස්ට් කොම්ට්" විසින් පෙන්වා දුන් සමාජ ප්‍රගතියේ අවධි තුන නම් කොට ඒ පිළිබඳ කෙටි සටහන් ලියන්න.
3. මැක්ස් වේබර් ගේ ආධිපත්‍ය සංකල්පයේ වැදගත්කම සාකච්ඡා කරන්න.
4. පහත සඳහන් මාතෘකාවලට කෙටි සටහන් ලියන්න.

I. ශ්‍රම විභජනය
II. යාන්ත්‍රික ඒකාබද්ධතාව
III. වැඩවසම් සමාජය
IV. සමාජවාදී සමාජය
V. සමජාතීය සමාජය

5. සමාජ පරිණාමය පිළිබඳ ව අදහස් දක්වා ඇති සමාජ විද්‍යාඥයින් ගේ අදහස්වල ඇති සමානතා හා අසමානතා පිළිබඳ සංසන්දනයක් කරන්න.

## 2.2 නූතන සමාජ වෙනස්වීම

- කෙටි කාලීන ව සමාජය වෙනස්වීම
- දිගු කාලීන ව සමාජය වෙනස්වීම

ඇතැම් සාධකවල බලපෑම නිසා සමාජයක සුළු වෙනස්කමක් කෙටි කාලයක් තුළ ඇති වී නැවත සකස් වීම කෙටි කාලීන සමාජ වෙනස් වීම යනුවෙන් හැඳින්වේ. ඇතැම් සාධකවල බලපෑම මත සමාජයක් තුළ ස්ථාවර වූ කල්පවත්නා වෙනස්කම් ඇති වේ. දිගු කාලීන ව සමාජය වෙනස්වීම ලෙස හඳුන්වන්නේ එම තත්ත්වය යි.

### කෙටි කාලීන ව සමාජය වෙනස්වීම

යම් යම් අවස්ථා අනුව කෙටිකාලයක් තුළ ක්‍රියාත්මක වී සමාජයේ කිසියම් වෙනස් වීමක් හෝ වෙනස් වීමේ ප්‍රවනතාවක් හෝ ජනිත කරනු ලබන බලවේගයන් කෙටි කාලීන ව සමාජය වෙනස් කරනු ලබන සාධක ලෙස හැඳින්විය හැකි ය. සමාජයෙහි නිර්මාණය වී ඇති විවිධ ව්‍යාපාර කෙටි කාලීන ව සමාජය වෙනස් කිරීම සඳහා ඉවහල් වේ. සංස්කෘතික සහයෝගිතා ව්‍යාපාර, දේශපාලන විරෝධතා ව්‍යාපාර, මෝස්තර ව්‍යාපාර ආදිය ඊට උදහරණ ලෙස දැක්විය හැකි ය.

සංස්කෘතික සහයෝගිතා ව්‍යාපාරවල තේමා බවට පත්ව ඇත්තේ සමාජ සුභසාධනය පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම, විවිධ ඉල්ලීම් ඉදිරිපත් කිරීම නැතහොත් යම් යම් කරුණු සඳහා සමාජය දැනුම්වත් කිරීම වැනි ඒවා ය. අමද්‍යප ව්‍යාපාරය, තරුණ සංවිධාන, කාන්තා සංවිධාන, ළමා අපචාර පිටුදැකීමේ ව්‍යාපාර, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහි සංවිධාන,


නොමිලේ බෙදා හැරීම සඳහා ය

සංස්කෘතික පුනර්ජීවන ව්‍යාපාර ආදිය මේ යටතේ දැක්විය හැකි ය. මෙවැනි ව්‍යාපාරවල පැවැත්මෙහි ස්ථාවර බවක් දක්නට නොලැබේ. කාලීන අවශ්‍යතා අනුව මතු වී ක්‍රියාත්මක වන අතර පසුව නිහඬ වන හෝ අහෝසි වී යන තත්ත්වයන් මේවායේ දක්නට ලැබේ. දිගුකාලීන පැවැත්මක් මේවාට නැත. කෙසේ නමුත් මෙම ව්‍යාපාර ක්‍රියාත්මක වන කාලය තුළ සමාජයෙහි කිසියම් පිබිදීමක් නැතහොත් උද්දමයක් ඇති කරලීමට සමත් වෙයි.

සමාජයක ගොඩනැගෙන ඇතැම් ගැටලුවලට සංවේදී නොවන නැතහොත් ප්‍රතිචාර නොදක්වන කණ්ඩායම් මෙවැනි සංස්කෘතික ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වය නිසා සක්‍රිය වී ප්‍රතිචාර දැක්වීමට පෙළඹේ. ඒ තුළින් අදාළ ගැටලුවට විරුද්ධ රැල්ලක් නැතහොත් බලවේගයක් සමාජය තුළ ගොඩනැංවීම පිණිස මෙවැනි ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වය බලපානු ලැබේ. එමගින් සමාජය තුළ කෙටි කාලීන ව කිසියම් වෙනසක් මතු වීම සිදු වේ.

දේශපාලන විරෝධතා ව්‍යාපාර ද කෙටි කාලීන ව සමාජයෙහි කිසියම් වෙනසක් ඇති කරලීමට සමත් වේ. සංස්කෘතික සහයෝගිතා ව්‍යාපාරවලට වඩා දේශපාලන විරෝධතා ව්‍යාපාරවල වෙනස්කම් කිහිපයක් දක්නට ලැබේ. දේශපාලන විරෝධතා ව්‍යාපාරවල අරමුණු ඉතා පැහැදිලි ය. හොඳින් සංවිධානය වූ පැහැදිලි නායකත්වයක් මේවාට ඇත. ආරම්භක අවස්ථාවේ දී බොහෝ විට උද්ඝෝෂණ ව්‍යාපාරවලට පමණක් සීමා වී පවතින මේ දේශපාලන විරෝධතා ව්‍යාපාර ක්‍රමානුකූල ව සංවිධානය වෙමින් සමාජයේ ස්ථාවර ධාරාවක් ලෙස සකස් වන ආකාරය ද දක්නට ලැබේ. සමාජ අසාධාරණය, අසහනය වැනි තත්ත්වයන් දුරු කර ගැනීම සඳහා බලපෑම් කණ්ඩායමක් ලෙස ආරම්භ වී එවැනි තත්ත්වයන් දුරුකර ගැනීම සඳහා සමාජයට මඟ පෙන්වීමත්, නායකත්වය දීමත්, පාලක පක්ෂයට බලපෑම් කිරීමත් මෙමගින් සිදු වේ. මෙවැනි දේශපාලන ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වය නිසා සමාජයෙහි පිබිදීමක් මෙන් ම නව ප්‍රවණතාවන් ද ගොඩනැගේ. ඒ මගින් ද සමාජයේ කෙටි කාලීන වෙනසක් නිර්මාණය වේ.

මෝස්තර ව්‍යාපාර ද කෙටි කාලීන ව සමාජය වෙනස් කිරීමට බලපානු ලැබේ. මෙහි දී ජනමාධ්‍ය ආයතන හා වෙළඳ ප්‍රචාරක ආයතන විශාල කාර්යභාරයක් සිදු කරනු ලබයි. සමාජයේ කැපී පෙනෙන චරිතයන්, තත්ත්වයන් හෝ ගුණාංගයන් උපයෝගී කොටගෙන ඍජුව ම සමාජයේ එක් කොටසක් ආමන්ත්‍රණය කිරීම මෙහි දී සිදු වේ. විවිධ විලාසිතා හුරු පුරුදු ආදිය සමාජගත කරලීම මෝස්තර ව්‍යාපාර තුළින් සිදු වේ.

තරුණ - තරුණියන්, නළු - නිළියන්, ක්‍රීඩක - ක්‍රීඩිකාවන් වැනි යුගයේ කැපී පෙනෙන චරිත උපයෝගී කරගෙන සිදු කරනු ලබන ප්‍රචාරණය මත සමාජයෙහි විවිධ ඇඳුම් - පැළඳුම්, ආහාර - පාන හෝ විවිධ චරිතාංග කෙරෙහි උනන්දුවක් සමාජය තුළ ඇති වේ. එම භාණ්ඩ පරිහරණය කිරීමට යාමෙන් හෝ එම චරිත අනුකරණය කිරීමට යාමෙන් සමාජයේ තාවකාලික රැල්ලක් ඇති වේ. ඒ ඇසුරින් සමාජය තුළ කෙටිකාලීන වෙනසක් ඇති වෙන ආකාරය දක්නට ලැබේ. සමාජය විවිධ ඇඳුම් විලාසිතාවලට ඇබ්බැහිවීම, ව්‍යවහාරික භාෂාවේ ඇතැම් අලුත් වචන හා යෙදුම් කලින් කලට ඉදිරියට පැමිණීම මෙවැනි මෝස්තර ව්‍යාපාර නිසා සිදු වේ. ඇතැම් කෘත්‍රිම ආහාර සඳහා සමාජය තුළ විශේෂ ලැදියාවක් හා විශ්වාසයක් ඇති වීමට ද මෙවැනි මෝස්තර ව්‍යාපාර බලපෑම් කරන ආකාරය පෙනේ.

මෙසේ ගොඩනැගෙන නව තත්ත්වයන් කෙටි කලක දී නැවත වෙනස් වී යාමක් දක්නට ලැබෙන අතර වෙනස් ආකාරයක ප්‍රචාරණයක් නැවත ඉදිරියට පැමිණෙන ආකාරය ද පෙනේ. මෙලෙස මෝස්තර ව්‍යාපාර හා ඒ සම්බන්ධ ප්‍රචාරණ ව්‍යාපාර නිසා සමාජය තුළ කෙටි කාලීන වෙනස්කම් බිහිවෙන ආකාරය පැහැදිලි ය.

## දිගු කාලීන ව සමාජය වෙනස් වීම

සමාජය තුළ අලුත් වෙනසක් ඇති කරමින් සමස්ත සමාජය ම වෙනස් මඟකට යොමු කරලීමට සමත් වන සාධක දිගු කාලීන ව සමාජය වෙනස් කරන බලවේග ලෙස හැඳින්වේ. මෙවැනි බලවේග හතරක් සමාජ විද්‍යාඥයින් විසින් දක්වා ඇත.

1. නවීකරණය - (Modernization)
2. නාගරීකරණය - (Urbanization)
3. බටහිරකරණය - (Westernization)
4. කාර්මීකරණය - (Industriaization)

මේ සාධක පිළිබඳ වැඩි විස්තර ඉදිරි පාඩමේ දී ඉදිරිපත් කෙරෙන අතර මෙහි දී විමසා බැලෙන්නේ මෙම සාධක මඟින් සමාජය වෙනස් වන ආකාරය පමණි.

## නවීකරණය

සමාජය ඒ වන විට පැවති තත්ත්වයෙන් වඩා වෙනස් වූ තත්ත්වයකට වෙනස් කරලීම නැතහොත් හැඩගැස්සවීම නවීකරණය යනුවෙන් සරලව දැක්විය හැකි ය. නවීකරණයෙන් සිදුවන්නේ සමාජයක් සාම්ප්‍රදායික නොදියුණු තත්ත්වයක සිට දියුණු නවීන තත්ත්වයක් කරා වෙනස් කරලීමයි. සාම්ප්‍රදායික ව පවතින නොදියුණු යැයි සම්මත සමාජයන් නවීන සමාජයක පවත්නා සමාජ, ආර්ථික, දේශපාලන තත්ත්වයන් ආදේශ කිරීම මගින් එම සමාජය ද දියුණු කරලීම නවීකරණයෙන් බලාපොරොත්තු වේ.

නවීකරණය මගින් සමාජයෙහි දිගු කාලීන වෙනසක් සිදුවන ආකාරය සමාජ විද්‍යාඥයින් විසින් පෙන්වා දී ඇත. නවීකරණය නිසා පුද්ගලයා වෙත පැවරී ඇති කාර්ය කොටස් සුවිශේෂ වූ ආයතනයන් හෝ විශේෂ දැනුමක් සහිත පුද්ගලයන් වෙත පවරා දීම සිදු වේ. සමාජ විද්‍යාඥයින් විසින් මේ තත්ත්වය "ව්‍යුහීය ප්‍රභේදය" යනුවෙන් හඳුන්වයි. ව්‍යුහීය ප්‍රභේදය නිසා කාර්යයන්හි වඩා කාර්යක්ෂම මෙන් ම ගුණාත්මක බවක් ඇති වේ.

දියුණු රටවල පවතින දියුණු තාක්ෂණය මෙන් ම දියුණු ආර්ථික සම්පත් ආදිය නොදියුණු සමාජවලට යොමු කරලීමෙන් එම සමාජයන් දියුණු කිරීමට නවීකරණය මගින් හැකිවන බව දෙවැනි අදහස යි. වර්තමානයේ බොහෝ රටවල විදෙස් ආයෝජන වශයෙන් සිදු කෙරෙන්නේ දියුණු රටවල නවීකරණ ලක්ෂණ නොදියුණු සමාජවලට හුරු පුරුදු කරමින් සමාජය වෙනස් කිරීමට උත්සාහ දැරීම යි. මේ තුළින් දියුණු සමාජවල පවතින ප්‍රාග්ධනය, සමාජය හා ව්‍යවසායකත්වයන් ලැබීම නිසා නොදියුණු සමාජ තුළ දිගු කාලීන වෙනසක් ඇති කෙරේ.

නවීකරණය මගින් සමාජ සංස්කෘතියෙහි ද වෙනසක් ඇති කෙරේ. මෙතෙක් සාමූහික ව කටයුතු කළ පුද්ගලයා නවීන තාක්ෂණය ලැබීමත් නව ආර්ථික ශක්තියක් ගොඩනගා ගැනීමත් මත අලුත් පෞරුෂයක් ගොඩනගා ගනී. ඒ මත තනි ව නැගී සිටීමට උත්සාහ දරයි.

මෙතෙක් සාම්ප්‍රදායික සමාජයෙහි වූ විවිධ බැඳීම් මත හිර වී සිටි පුද්ගලයා නවීකරණය වීම නිසා ගොඩනැගෙන අලුත් සමාජ වාතාවරණය යටතේ ලබන පෞද්ගලික නිදහස මත අලුත් කණ්ඩායම් සමග අලුත් සම්බන්ධතා ඇති කර ගනී. ඒ මත අලුත් ක්‍රියාකලාපයන් බිහි වේ. එහි දී

පුද්ගලයාට සමාජයේ ඉහළ නැගීම හා පහළ බැසීම සඳහා ඇති හැකියාව වැඩි වේ. සමාජ විද්‍යාඥයින් විසින් "සමාජ සංචලතාව" ලෙස හඳුන්වන මේ තත්ත්වය නිසා ද සමාජයේ දිගු කාලීන වෙනසක් ඇති වේ.

## නාගරීකරණය

නාගරීකරණය යනුවෙන් හැඳින්වෙන්නේ නගර බිහි වීම මෙන් ම ජන ඝනත්වය වැඩි වීමත්, සංක්‍රමණිකයන්ගේ පැමිණීම තීව්‍ර වීම, උප නගර බිහි වීම ආදී සාධක මත වඩා සංකීර්ණතාවට පත්වීමක් ය. නාගරීකරණයේ දී දියුණු ශ්‍රම විභජනයක් ඇති වීම, මුදල් හුවමාරුව ඉහළ යාම හා ලාභයට මුල් තැන ලැබීම, විධිමත් පාලන සංවිධාන රටාවක් ගොඩනැගීම, පොදු පහසුකම් වැඩි දියුණු වීම වැනි ලක්ෂණ ඇති වේ.

ජන ඝනත්වය ඉහළ යාම සංක්‍රමණිකයන් පැමිණීම නිසා සිදු වේ. මේ තත්ත්වය සමාජය තුළ සංකීර්ණ තත්ත්වයක් ඇති කරයි. සාම්ප්‍රදායික ව පැවති සමාජ සම්බන්ධතා වෙනස් වී අලුත් සමාජ සම්බන්ධතා ජාලයක් නිර්මාණය වීම තුළින් සමාජයේ දිගු කාලීන වෙනසක් ජනිත වේ. නාගරික සමාජය තුළ ජනිත වන ශ්‍රම විභජනය හා මුදලට වැඩි තැනක් ලැබීම නිසා ද සමාජ ආර්ථික ක්ෂේත්‍රය තුළ අලුත් වෙනසක් ඇති වේ. අලුත් ආකල්ප පහළ වන අතර ඊට අනුකූල සංකීර්ණ හැසිරීම් රටාවක් ගොඩනැගේ. එම තත්ත්වය දිගු කාලීන සමාජ වෙනසක් ඇති කරයි.

සමාජයෙහි සම්පත් බහුල වීම හෝ පහසුකම් වර්ධනය වීම දියුණු සංවිධානාත්මක ආයතන ව්‍යුහයක් සකස් වීම වැනි දිගුකල් පවත්නා වටිනාකම් නාගරීකරණය නිසා ඇති වේ. එසේ ම ගණිකා වෘත්තිය, මත්ද්‍රව්‍ය, මුඩුක්කු නිවාස, දුගීබව වැනි දුබලතා රැසක් ද නාගරීකරණය නිසා ඇති වේ. මේ ප්‍රබලතා හෝ දුබලතා මූලික කොටගෙන නාගරික සමාජය තුළ ජීවත් වන පුද්ගලයින් ගේ ආර්ථිකයෙහි මෙන් ම අදහස් හෝ ආකල්පවල ද, සාරධර්ම හා අගනාකම්වල ද කල් පවත්නා වෙනසක් ඇති වේ.

## කාර්මීකරණය

නාගරීකරණය වීම සඳහා කාර්මීකරණය ද බලපෑමක් සිදු කරයි. 18 - 19 සියවස්වල එංගලන්ත සමාජයේ සිදු වූ කාර්මික සංවර්ධනය ලොව පුරා

ප්‍රචලිත වීමෙන් කාර්මිකත්වයට නැඹුරු සමාජ පරිසරයක් නිර්මාණය විය. ශ්‍රමය මත පදනම් වූ නිෂ්පාදන ක්‍රියාවලිය කාර්මීකරණයේ ප්‍රතිඵලයක් ලෙස යාන්ත්‍රීකරණයට ලක් විය. සුළු කර්මාන්ත වෙනුවට මහා පරිමාණ කර්මාන්තශාලා බිහි වීම සඳහා මේ තත්ත්වය හේතුවක් විය. එක් අතකින් යාන්ත්‍රීකරණයේ ප්‍රතිඵල නිසා ගොවිබිම් අහිමි වීමත් අනෙක් අතින් මහා පරිමාණ කර්මාන්ත ශාලාවල විශාල රැකිරක්ෂා ප්‍රමාණයක් බිහිවීමත් නිසා ග්‍රාමීය ජනතාව නගර කරා සංක්‍රමණය විය. පොදු පහසුකම් හා විධිමත් පාලන ආයතන සහිත ව නගර බිහිවීම සඳහාත්, සමාජයේ සංකීර්ණත්වය පාලනය කිරීම අපහසු වී අපගාමී චර්යා පහළ වෙමින් සංකීර්ණ නාගරීකරණයක් සිදුවීම සඳහාත් කාර්මීකරණය හේතු විය.

විශේෂයෙන් නාගරික ප්‍රදේශවල දී ශ්‍රමය වෙනුවට යන්ත්‍ර ආදේශ වීම නිසා විශාල රැකියා වියුක්තියක් ඇති විය. එම තත්ත්වය සමාජය තුළ අපරාධකාරී උප සංස්කෘතියක් බිහි වීමට හේතු වන ආකාරය පෙන්වා දිය හැකි ය. ඊට අමතර ව ජනතාව අතර ගොඩනැගී තිබුණු සාම්ප්‍රදායික සංස්කෘතික සම්බන්ධතා බිඳ වැටීමට කාර්මීකරණය බලපෑවේ ය. අන්තර් පුද්ගල සම්බන්ධතා, අන්තර් පුද්ගල සහජීවනය වැනි ලක්ෂණද යාන්ත්‍රීකරණයේ ප්‍රතිඵල ලෙස බිඳ වැටිණි. දිගු කාලීන ව සමාජයේ වෙනසක් ඇතිකරලීම සඳහා යාන්ත්‍රීකරණය ද මේ ආකාරයේ බලපෑමක් සිදු කර ඇත.

## බටහිරකරණය

බටහිර කාර්මික සමාජවල බලපෑමෙන් අනෙක් ප්‍රදේශයන් හි සමාජ දිගුකාලීන වෙනසකට ලක් වී ඇත. විශේෂයෙන් බටහිර ප්‍රබල රටවල් විසින් ගොඩනගා ගත් යටත් විජිතයන් හි බටහිර සිරිත් අනුකරණ කිරීම නිසා ඇති වී තිබෙන සමාජීය තත්ත්වය බටහිරකරණය යනුවෙන් හැඳින්වේ. දිගු කලක් යටත් විජිතයන් ලෙස පැවතීම නිසා යටත් විජිත මව් රාජ්‍යන් හි සිරිත් විරිත්, භාෂාව, ආගම වැනි සංස්කෘතික යටත් විජිත සාධකයන් ද, ඇතැම් විට ආර්ථික මෙන් ම දේශපාලන ක්‍රමවේදයන් ද අනුකරණය කිරීමට කැමැත්තක් යටත් විජිතයන් හි සමාජවල ඇති වේ. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් ව තිබීම නිසා ඉංග්‍රීසි භාෂාව සම්බන්ධීකරණ භාෂාවක් වූවාට වඩා තත්ත්වය, තරාතිරම ප්‍රකාශ කරන මෙවලමක් ලෙස යොදා ගැනීම දක්නට ලැබේ. බටහිර සිරිත් ඉතා වැදගත් කොට සැලකීම ද එසේ ය. දේශපාලනික වශයෙන් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය බටහිරින් ලැබෙන එකකි. එසේ ම



නොමිලේ බෙදා හැරීම සඳහා ය

විවෘත ආර්ථික සංකල්පය ද එලෙස ලැබුණු එකකි. මේ ආකාරයෙන් බටහිර සිරිත හෝ බටහිර න්‍යායන් වඩා උසස් ය, නිවැරදි ය, යන ආකල්පයෙන් විචාරයෙන් හෝ අවිචාරයෙන් අනුකරණය කිරීම බටහිරකරණය ලෙස හැඳින්වේ. ඒ තත්ත්වය සමාජයේ දිගු කාලීන වෙනස් කම් බිහි කරලීම සඳහා හේතු වී ඇති ආකාරය ශ්‍රී ලංකික සමාජය තුළින් ද පැහැදිලි වේ.

## 2.3 සමාජ පරිණාමය කෙරෙහි බලපාන සාධක

සමාජ වෙනස්වීම පිළිබඳ කරුණු අධ්‍යයනය කරනු ලබන සමාජ විද්‍යාඥයින් විසින් ප්‍රාග් කාර්මික යුගයේ සිට කාර්මික යුගය දක්වා ලෝකය වෙනස්වීම සමාජ වෙනස්වීම යනුවෙන් දක්වයි. ඒ වෙනස සාර්ව මට්ටමින් තේරුම් ගැනීම සඳහා සමාජ විද්‍යාඥයන් විසින් යොදාගත් ප්‍රධාන සංකල්ප තුනක් තිබේ. එනම්

1. නවීකරණය (Modernization)
2. කාර්මීකරණය (Industrialization)
3. නාගරිකරණය (Urbanization)

එම සංකල්ප තුනයි.

නවීකරණය යනු සමාජයක් පැවති තත්ත්වයට වඩා අලුත් තත්ත්වයකට අනුව හැඩ ගැසීමයි. සාම්ප්‍රදයික නොදියුණු සමාජයක් ආර්ථික වර්ධනයත් සමග ම දේශපාලන ස්ථාවරත්වයක් ඇතිකර ගනිමින් දියුණු තත්ත්වයකට පරිවර්තනය වීම නවීකරණය ලෙස අර්ථ දැක්විය හැකි බව "විල්බට් මුවර්" නම් සමාජ අර්ථ ශාස්ත්‍රඥයා විසින් ප්‍රකාශ කර ඇත.

සමාජය නවීකරණයට ලක්වීමට බලපෑ හේතු තුනක් සමාජ විද්‍යාඥයන් විසින් දක්වා ඇත. ඉන් පළමුවැන්න වන්නේ මධ්‍යකාලීන යුරෝපයේ ඇති වූ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය යි. කතෝලික පල්ලියේ ආධිපත්‍යයට එරෙහි ව මාටින් ලූතර් (Martin Luther) විසින් ගෙන ගිය ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය හා ජෝන් කැල්වින් ( John Celvin) විසින් ගෙන ගිය "ප්‍රොතෙස්තන්ත්‍ර" ව්‍යාපාරයත් සමඟ ආගමේ දැඩි බලපෑමෙන් සමාජය මිදී ගියේ ය. මේ තත්ත්වය යුරෝපයේ නැගී ආ ධනවාදී ආර්ථිකයට හොඳ අවස්ථාවක් උදා කළේ ය. මැක්ස් වේබර් විසින් ලියන ලද "ප්‍රොතෙස්තන්ත්‍ර ආචාරධර්ම හා ධනවාදයේ හරය" (The Protestant Ethics and The Spirit of Capitalism) නම් කෘතියෙන් පැහැදිලි කරන ලද්දේ මේ තත්ත්වය යි. නවීකරණය පෙන්වන දෙවන කාරණය



නොමිලේ බෙදා හැරීම සඳහා ය

ලෙස සමාජ විද්‍යාඥයින් දක්වනු ලබන්නේ 16 වෙනි හා 17 වෙනි සියවස්වල යුරෝපයේ සිදු වූ කාර්මික විප්ලවය යි. කාර්මික විප්ලවය නිසා තාක්ෂණික දියුණුවක් මෙන් ම කාර්මික දියුණුවක් ද සිදු විය. මහා පරිමාණ කර්මාන්ත ශාලා බිහි වූයේ මේ තත්ත්වය නිසා ය. තාක්ෂණය වර්ධනය වීමත් සමඟ නිෂ්පාදනය මෙන් ම ප්‍රවාහනය ද වේගවත් විය; කාර්යක්ෂම විය. නවීකරණයේ බලපෑම මුලු ලෝකය පුරාම ව්‍යාප්ත වූයේ මේ තත්ත්වය මතයි.

1789 දී සිදු වූ ප්‍රංශ ආණ්ඩු විප්ලවය නවීකරණය ප්‍රකට කරන තෙවන සාධකය යි. ප්‍රංශ ආණ්ඩු විප්ලවයේ ප්‍රතිඵලය වූයේ සාම්ප්‍රදායික වැඩවසම් පාලනය බිඳවැටී පෞද්ගලික නිදහසට මුල්තැන දුන් ලිබරල්වාදී දේශපාලන ක්‍රමයක් නිර්මාණය වීම යි. එක් පාලකයෙකු වෙත කේන්ද්‍රගත වී තිබුණු දේශපාලන බලය ආයතන කිහිපයක් අතර බෙදීයාම නිසා සහයෝගීතාව මත ක්‍රියාත්මක වන දේශපාලන බල අධිකාරයන් කිහිපයක් සහිත පාලන ක්‍රමයක් බිහි වූයේ ය.

නවීකරණයේ අංග කිහිපයක් සමාජ විද්‍යාඥයන් විසින් පෙන්වා දී ඇත. ආර්ථික නවීකරණය, දේශපාලන නවීකරණය, අධ්‍යාපන නවීකරණය, ජනමාධ්‍ය නවීකරණය, ප්‍රවාහන නවීකරණය ඒවා අතරින් වැදගත් වේ.

දහසය හා දාහත්වන සියවස්වල එංගලන්තය ප්‍රධාන යුරෝපීය සමාජය තුළ ඇතිවන කාර්මික සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස සාම්ප්‍රදායිකව පැවති කෘෂිකර්මය හා ලුහු කර්මාන්ත පදනමක් මත රැඳී පැවතියා වූ ආර්ථිකය කාර්මීකරණයට ලක්විය. ඒ හේතුවෙන් යන්ත්‍ර සූත්‍ර භාවිතය ඉහළ ගිය අතර මහා පරිමාන කර්මාන්තශාලා ක්‍රමයක් බිහිවිය. එසේ ම කෘෂිකර්මයේ සාම්ප්‍රදයකත්වය වෙනස් වී ව්‍යාපාරික කෘෂිකර්මයක් බවට පත්විය. යන්ත්‍ර සූත්‍ර භාවිතය නිසා නිෂ්පාදන ධාරිතාව ඉහළ ගියේ ය. එසේ ම නගර ආශ්‍රිත ව පුළුල් වෙළඳපොළක් ද බිහිවිය. ප්‍රවාහනය දියුණුවක් සේ ම එහි කාර්යක්ෂමතාව ද වර්ධනය විය. මේ තත්ත්වය හේතුකොට ගෙන ආර්ථිකය සාම්ප්‍රදායික මට්ටමේ සිට දියුණු ව්‍යාපාරික මට්ටමක් දක්වා පරිවර්තනය විය. වෙළෙඳපොළ අන්තර් ජාතික මට්ටමට පත්විය. ලෝක ආර්ථිකයේ සිදු වූ මේ වර්ධනය ආර්ථික නවීකරණය ලෙස හඳුන්වයි.

ප්‍රංශ ආණ්ඩු විප්ලවයේ ආභාසය ලැබූ යුරෝපීය ජාතීන් සාම්ප්‍රදායික රාජාණ්ඩු පාලන ක්‍රමය වෙනුවට ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ගොඩනංවා ගැනීම සඳහා වෙහෙස දැරීය. එහි ප්‍රතිඵලයක් ලෙස පාරම්පරික උරුමයක් ලෙස

සැලකූ පාලන බලය පිළිබඳ සම්ප්‍රදාය වෙනස් වී මහජන පරමාධිපත්‍ය සංකල්පය යටතේ වන පාලන ක්‍රමයක් ස්ථාපනය කෙරිණි. ජනතා නියෝජිතයන් මගින් පාර්ලිමේන්තු ක්‍රමය හරහා පාලන කටයුතු මෙහෙයවීම ආරම්භ වූයේ මේ අනුවයි. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළින් "ව්‍යවස්ථානුකූල වාදය" නැමැති සංකල්පය යටතේ පාලන කටයුතු මෙහෙයවී ය. ඒ අදහස අනුව "නීතියේ ආධිපත්‍යය" පිළිබඳ සංකල්පය ලොව පුරා ව්‍යාප්ත විය. සැමට ඉහළින් නීතිය පවතින බව නීතියේ ආධිපත්‍ය සංකල්පයේ අදහස යි. මෙලෙස සාම්ප්‍රදායික රාජාණ්ඩු පාලන ක්‍රමයක සිට නූතන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය දක්වා දේශපාලන ක්‍රියාදාමයේ සිදු වූ වර්ධනය දේශපාලන නවීකරණය නමින් හඳුන්වා ඇත.

නවීකරණයේ දී අධ්‍යාපන නවීකරණයට ද විශාල වැදගත්කමක් හිමි වේ. පැරණි සාම්ප්‍රදායික අධ්‍යාපනය වෙනුවට නූතන යුගයේ වැදගත් වන විෂය පථයන් හා ක්‍රමවේදයන් ඔස්සේ අධ්‍යාපනය නවීකරණය වී ඇත. නවීකරණය නිසා අධ්‍යාපන අවස්ථා පුළුල් වීමත් සංකීර්ණ වී තිබීමත් දක්නට ලැබේ. පැරණි සාම්ප්‍රදායික සමාජය තුළ පැවති අධ්‍යාපනයේ අගනාකම් පමණක් නොව අධ්‍යාපනයෙන් අවධාරණය කෙරුණු ආකල්පවල ද වෙනසක් සිදු වී ඇත. අධ්‍යාපනය තුළ නූතන තාක්ෂණ විෂයයන්ට වැඩි වැදගත්කමක් ලැබී ඇත. මෙලෙස සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමවේද හා ගුණාංග වෙනස් වී නූතන තාක්ෂණ අධ්‍යාපන ක්‍රමවේද දක්වා අධ්‍යාපනයේ සිදු වූ වෙනස අධ්‍යාපන නවීකරණයෙන් සාකච්ඡා කෙරේ.

පැරණි සමාජය බාහිර සම්බන්ධතා අඩු, හුදකලාව පැවති එකකි. එබැවින් බාහිර තොරතුරු පිළිබඳ ව ද වැඩි උනන්දුවක් නොතිබිණි. අධ්‍යාපන අවශ්‍යතා, සන්නිවේදන අවශ්‍යතා ආදියෙහි ද වැඩි වැදගත් කමක් එම සමාජයට නොවීය. කටකතා, ජනප්‍රවාද, ඕපාදූප ආදිය මගින් තොරතුරු සන්නිවේදනය කරගත් නමුත් සමාජය වෙනස් කරලීමේ ප්‍රබල හැකියාවක් ඒවාට නොවීය. තාක්ෂණය, දැනුම වර්ධනය වෙමින් නව ලොවකට පිය නගන සමාජයක අධ්‍යාපනය ලැබීම, තොරතුරු ලබා ගැනීම, දැනුම සොයා ගැනීම වැනි තත්ත්වයන් නිසා ජනමාධ්‍යයන්හි වැදගත්කම ද වර්ධනය විය. ඒ අවශ්‍යතාව මත පුවත්පත්, ගුවන්විදුලිය, රූපවාහිණිය, සිනමාව පමණක් නොව අන්තර්ජාලය වැනි ජනමාධ්‍ය මෙවලම් භාවිතයට ගැනිණි. මේ ආකාරයෙන් බහු ජනමාධ්‍යකරණයක් නූතන සමාජයේ දක්නට ලැබේ. පැරණි සාම්ප්‍රදායික සමාජය දැනුම තාක්ෂණය හා තොරතුරු සොයා යන සමාජයක්

දක්වා වර්ධනය වනවිට ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ ඇති වූ වර්ධනය ජනමාධ්‍ය නවීකරණය තුළින් පැහැදිලි කෙරේ. අද ලෝකය විශ්ව ගම්මානයක් (Global Village) බවට පත්වීම සඳහා ජනමාධ්‍ය නවීකරණය හේතු විය.

මිනිසාගේ අවශ්‍යතා වර්ධනය වී වානිජ සමාජයක් බවට සාම්ප්‍රදායික සමාජය වෙනස් වීමත් සමග ප්‍රවාහනයේ අවශ්‍යතාව වර්ධනය විය. විශේෂයෙන් වෙළෙඳපොළ ආර්ථිකය බිහිවීමත්, නාගරීකරණයේ බලපෑමත් මත ප්‍රවාහනයේ අවශ්‍යතාව මතු විය. තාක්ෂණයේ වර්ධනය හා කාර්මීකරණයේ බලපෑම මත ප්‍රවාහන උපක්‍රම හා උපකරණවල දියුණුවක් ඇති වේ. දියුණු මාර්ග පද්ධතියක් නිර්මාණය වීමත්, බස්රථ, ලොරි රථ, දුම්රිය, නාවික යාත්‍රා, ගුවන් යානා, වැනි ප්‍රවාහන උපකරණ නිෂ්පාදනය නිසා ප්‍රවාහනයේ වර්ධනයක් මෙන් ම කාර්යක්ෂමතාවක් ඇති වී තිබේ. මේ තත්ත්වය ප්‍රවාහන නවීකරණය ලෙස හැඳින්වෙන අතර ලෝක සමාජයක් නිර්මාණය වීම උදෙසා අලුත් සමාජ සම්බන්ධතා ජාලයක් නිර්මාණය වීම ප්‍රවාහන නවීකරණය මගින් සිදු වී ඇත.

## කාර්මීකරණය

සමාජයක් වෙනස්වීම සඳහා බලපානු ලබන වැදගත් සාධකයක් ලෙස කාර්මීකරණය ද හැඳින්විය හැකි ය. කාර්මීකරණයෙන් ප්‍රකට වන්නේ සමාජයෙහි උසස් තාක්ෂණයක් සහිත යාන්ත්‍රික මෙවලම් භාවිතය වර්ධනය වන ආකාරය යි. කාර්මීකරණය ලොව පුරාම වේගවත් ව පැතිරීයාම මගින් සමාජය වෙනස් වීමට සිදු වූ බලපෑම විශාල ය.

කාර්මීකරණයට පදනම වූයේ නව සොයා ගැනීම් සමුදාය යි. යුරෝපීය සමාජයේ කාර්මික විප්ලවයක් ඇති වන්නේ ද එම සොයා ගැනීම නිසා ය. විශේෂයෙන් වාෂ්පබල යන්ත්‍රය, විදුලිජනකය නිපදවීමත් මානව ශිෂ්ටාචාරය නව මගකට යොමු කිරීමට සමත් විය. උසස් තාක්ෂණයක් සහිත යන්ත්‍රසූත්‍ර භාවිතයෙන් තම කාර්යයන් කාර්යක්ෂම ව ඉටුකර ගැනීමට හැකිවීම නිසා එබඳු උපකරණ භාවිතය ඉහළ ගියේ ය. ඒ මත ලෝක සමාජය වේගයෙන් කාර්මීකරණයට ලක් වන්නට විය.

කාර්මීකරණය තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵලයකි. නිෂ්පාදන ක්‍රියාවලිය තුළ පැවති සාම්ප්‍රදායික බව ඉවත් වී නව තාක්ෂණය ඊට ආදේශ වූ ආකාරය නිදසුනක් ලෙස දැක්විය හැකි ය. සාම්ප්‍රදායික කෘෂිකර්මය ශ්‍රමය උපයෝගී

කරගෙන සිදු කළේ ය. මිනිස් හා සත්ත්ව ශ්‍රමය වෙනුවට යන්ත්‍ර ආදේශ වීම කාර්මීකරණයේ ප්‍රතිඵලයකි. මේ නිසා වඩා පහසුවෙන් තම කාර්යයන් කර ගැනීමට අවකාශය ලැබිණි. එසේම අඩු වියදමකින් වැඩි නිපැයුමක් ලබාගත හැකි විය. මේ තත්ත්වය මත ලාභය වැඩි වූවා සේම කාලය ඉතිරි කර ගැනීමට ද හැකි විය. විවේකය හා විනෝදය වෙනුවෙන් කාලය වැය කිරීමට වැඩි අවස්ථාවක් එයින් ලැබිණි.

කාර්මීකරණයේ ප්‍රතිඵලයක් ලෙස ගෘහස්ත මට්ටමේ පැවති කර්මාන්ත නගර කේන්ද්‍ර කර ගනිමින් මහා පරිමාණ කර්මාන්ත ශාලා බවට පත්වේ. විශාල පුහුණු ශ්‍රම බලකායක අවශ්‍යතාවක් මේ නිසා ජනිත වේ. එවැනි ශ්‍රමිකයන් පිරිසක් ගම්වල සිට පැමිණ කර්මාන්ත ශාලා අවට පදිංචි වීම නිසා අලුත් සමාජ පරිසරයක් නිර්මාණය වන ආකාරය පෙනේ. සමාජයෙහි එතෙක් පැවති පුළුල් සමාජ සම්බන්ධතා සහිත විස්තාරිත පවුල් ඒකකය වෙනුවට දුරස්ථ සම්බන්ධතා සහිත න්‍යෂ්ටික පවුල් ඒකක නාගරික ප්‍රදේශයන්හි නිර්මාණය වී ඇත්තේ විවිධ ප්‍රදේශවලින් නගර කරා පැමිණි මෙවැනි අයගෙනි.

කාර්මීකරණය මහා පරිමාණ කර්මාන්ත ශාලා පද්ධතියක් නිර්මාණය කිරීම හේතුවෙන් ශ්‍රමයේ වටිනාකම අභිභවා ප්‍රාග්ධනය හා ව්‍යවසායයන්හි වැදගත්කම ඉදිරියට පැමිණේ. ලාභය අරමුණු කරගත් නිෂ්පාදන ක්‍රියාවලියක් පැවතීම නිසා මුදලට ඉහළ වටිනාකමක් ලැබුණි. නියමිත වැඩ පැය ගණනක් නිශ්චිත වැටුපක් මත සේවය කරනු ලබන ශ්‍රමිකයන් පිරිසක් කම්කරුවන් ලෙස සේවය කළහ. සේවකයන් වැටුප් වැඩිකර ගැනීම සඳහාත් ව්‍යවසායකයන් ලාභය වැඩිකර ගැනීම සඳහාත් ගත් උත්සාහය තුළ කම්කරු පන්තිය හා ව්‍යවසාය හිමිකරුවන්ගේ පන්තිය අතර අරගලයක් ඉස්මතු විය. මේ වන විට ගොඩනැගී තිබුණු ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ක්‍රියාත්මක වූයේ ජනතා ඡන්දයෙන් පත් වූ නියෝජිතයන් මගින් වීමත්, කම්කරු පන්තියේ සහාය දේශපාලන සංස්ථාවට අවශ්‍ය වූ නිසාත් කම්කරු පන්තිය දේශපාලනීකරණය විය. කම්කරු ව්‍යාපාර සෑම රටකට පාහේ දේශපාලනයේ කැපීපෙනෙන වටිනාකමක් හිමිකරගත් බව පෙනේ.

ශ්‍රම විභජනය හා විශේෂ ප්‍රාගුණ්‍යය කාර්මීකරණයේ තවත් ප්‍රවණතාවකි. වැඩ බෙදාගැනීම නූතන සමාජයේ දක්නට ලැබෙන විශේෂ තත්ත්වයකි. සමස්තය එක් අයෙකු විසින් කරනවාට වඩා එක් අයෙකු විසින් එක් කොටසක් නිම කිරීම ශ්‍රම විභජනයේ ලක්ෂණයයි.

පරිසර දූෂණය කාර්මීකරණයේ ප්‍රතිවිපාකයකි. විශාල ජනගහනයක් කුඩා ප්‍රදේශයක පදිංචිව සිටීම නිසා පරිසර හානිය වඩා තීව්‍ර විය. එය නගරවල පැවැත්මට ද බාධාකාරී වී තිබීමෙන් මේ ප්‍රශ්නයේ ඇති බැරෑරුම් බව වටහා ගත හැකි ය. කාර්මීකරණය නිසා වඩා පහසුවෙන් ලාභදායි ලෙස හා කාර්යක්ෂම ආකාරයෙන් කාර්යයන් කර ගැනීමේ ඉඩකඩ ලැබී තිබේ. එහි ප්‍රතිලාභය නිසා සමස්ත සමාජය ම සුව පහසුව මෙන් ම විවේකයද භුක්ති විඳී. නමුත් අසමබර කාර්මීකරණය හේතුවෙන් මානව වර්ගයාගේ පැවැත්මට තර්ජනයක් ද එල්ල වී ඇති බව පෙන්වා දිය හැකි ය.

## නාගරීකරණය

සමාජය වෙනස් වීම සඳහා බලපානු ලබන සාධකයක් ලෙස නාගරීකරණය සමාජ විද්‍යාඥයින්ගේ සැලකිල්ලට භාජනය වූ සංකල්පයකි. ආර්ථිකයක් ප්‍රාථමික කෘෂිකාර්මික අංශය අභිභවා ද්විතියික අංශය වන කාර්මික අංශයේ වැදගත්කම වැඩිකර ගැනීමට යාමේ ප්‍රතිඵලයක් ලෙස කර්මාන්ත වර්ධනය වේ. එලෙස කර්මාන්ත අංශය ප්‍රබල වීමෙන් මහා පරිමාන කර්මාන්ත ශාලා බිහි වේ. විශාල කර්මාන්ත කේන්ද්‍රගත වන ප්‍රදේශ ආශ්‍රිත ව ඒවායේ සේවාවන් සඳහා විශාල ශ්‍රමිකයන් පිරිසක් සංකේන්ද්‍රගත වේ. ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා වෙළෙඳපොළ, මංමාවත්, පාසල්, රෝහල්, ආදී පොදු පහසුකම් වර්ධනය වේ. එය නගර නිර්මාණය වීම නැතහොත් නාගරීකරණය යනුවෙන් හැඳින්වේ.

නාගරික ප්‍රදේශවල රැකියා සඳහා ග්‍රාමීය ප්‍රදේශවලින් විශාල ශ්‍රමිකයන් පිරිසක් පැමිණීම දක්නට ලැබේ. එම ශ්‍රම සංචලතාව නිසා නාගරික ප්‍රදේශවල වැඩි ජනගහනයක් ඇති වේ. ඒ නිසා නාගරික තදබදය සෑම නගරයකට ම පොදු තත්ත්වයක් වේ. සෑම දෙනාට ම කොටු වුණු සීමා වුණු ජීවිත ඇති වීමට මේ තත්ත්වය හේතු වී ඇත.

නාගරීකරණයෙහි අනිවාර්ය ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකි ය. කර්මාන්තශාලා බහුල වීම එක් ලක්ෂණයකි. නාගරීකරණය ඇති වීම සඳහා මූලික ව බලපානු ලබන සාධකය වන්නේ මහා පරිමාන කර්මාන්ත ශාලා බිහිවීම යි. වැඩි ජනගහනයක් නගර කරා ඇදී එන්නේ කර්මාන්ත ශාලා නිසා ය. එම කර්මාන්ත ශාලාවලත් ඉන් බාහිරවත් දියුණු ශ්‍රම විභජනයන් දක්නට ලැබීම එහි තවත් වැදගත් ලක්ෂණයකි. කර්මාන්තශාලා තුළ වැඩ බෙදාගෙන ඇත්තා සේ ම සමස්ත නාගරික සමාජය තුළ ම එම ලක්ෂණ දක්නට ලැබේ. නාගරික සමාජය තුළ එක් එක් පුද්ගලයා විවිධ කාර්යන් ඉටුකරනු ලබයි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

නාගරීකරණයේ ප්‍රධාන ලක්ෂණය සූක්ෂම ශ්‍රම විභජනයක් පැවතීම බව එමිල් ඩුර්ක්හයිම් සඳහන් කර ඇත.

නාගරීකරණයේ වැදගත් ලක්ෂණයක් ලෙස මුදල් භාවිතය වැඩිවීම හා වානිජත්‍වය ප්‍රබලවීම දැක්විය හැකි ය. නගරය ක්‍රියාත්මක වන්නේ වෙළෙඳපොළ ක්‍රමය මගිනි. ඉල්ලුම සැපයුම මත සිදු කෙරෙන ගනුදෙනු එහි මූලික වෙළෙඳාමට පදනම වේ. වෙළෙඳාමට තැන ලැබීම නිසා මුදල් වැදගත් මාධ්‍යයක් වන අතර මුදලට ඇති ඉල්ලුම හා සැලකිල්ල ද ඉහළ යයි. වෙළෙඳපොළ මත රඳා පවතින නාගරික සමාජයේ සාරධර්ම බිඳවැටී මුදලේ අගය ඉහළට පැමිණ ඇත්තේ ඒ නිසා ය.

කම්කරු පන්තිය, ධනපති පන්තිය වැනි සංකීර්ණ පන්ති පරිසරයක් නගරයේ දක්නට ලැබේ. ඔවුන් අතර ඇති පරතරය විශාල ය. ග්‍රාමීය සමාජයේ ඇති - නැති පරතරයට වඩා විශාල පරතරයක් නාගරික සමාජයේ ඇති - නැති පන්ති අතර තිබේ. මේ නිසා පන්ති විෂමතාව නාගරික සමාජයෙහි වඩා තීව්‍ර බවක් දක්නට ලැබේ.

නාගරීකරණයේ වටිනා ලක්ෂණ කිහිපයක් සමාජ විද්‍යාඥයන් විසින් දක්වා ඇත. දියුණු වෙළෙඳපොළක් පැවතීමත් තරගකාරී බවත් නිසා ගුණාත්මක බවක් නිෂ්පාදනයේ මෙන් ම වෙළෙඳාමේ දී ද දක්නට ලැබේ. නාගරික ප්‍රදේශවල මනා පරිපාලනයක් පැවතීම, පාසල්, රෝහල්, මංමාවත්, ජලය, විදුලිය, සන්නිවේදනය වැනි පොදු පහසුකම් වර්ධනය වී තිබීම, විශේෂයෙන් බහු මාධ්‍ය ක්‍රමයක් පැවතීම නිසා දැනුම විනෝදස්වාදය ලබාගැනීමේ ක්‍රම සුලභ වීම නාගරීකරණයේ වටිනා ලක්ෂණ වේ. නිෂ්පාදනවලට පමණක් හිමි ව තිබුණු ආර්ථිකය තුළට සේවා අංශයන් පැමිණෙනුයේ ද නාගරීකරණයේ ප්‍රතිඵලයක් වශයෙනි. කැළි කසල බැහැර කිරීම, මංමාවත් නඩත්තුව, සෞඛ්‍ය පහසුකම් ආදිය සඳහා සේවා සැපයීම සඳහා නව ව්‍යවසායකත්ව කේන්ද්‍රයන් බිහිවිය.

සමාජ විද්‍යාවේ දී නාගරීකරණය නැමති සංකල්පය වැඩි වශයෙන් ම සාකච්ඡා කෙරෙන්නේ බටහිර සමාජ ආශ්‍රයෙනි. එහෙත් බටහිර දියුණු සමාජවල හා අඩු සංවර්ධනයක් සහිත සමාජයන්හි නාගරීකරණයේ වෙනස්කම් දක්නට ලැබේ. දියුණු රටවල කාර්මික නගර දක්නට ලැබෙන අතර අඩු සංවර්ධනයක් සහිත රටවල වාණිජ නගර වැඩි වශයෙන් දක්නට ලැබේ. වාණිජ නගරවල ලක්ෂණය වන්නේ ද්‍රව්‍ය එක්රැස් කර බෙදගැනීමයි. මේ නිසා නිෂ්පාදකයාට වඩා අතරමැදියා වැඩි ලාභ ලබයි. දියුණු රටවල ඇත්තේ

කාර්මික නගරයි. එහි වැඩිපුර ම අලෙවි වන්නේ කාර්මික ප්‍රාග්ධනය යි. එය ප්‍රති ආයෝජනයක් ලෙස නැවත ලැබීම නිසා කාර්මික සංවර්ධනයක් එම සමාජය තුළ නැවත නැවත සිදු වේ.

නාගරීකරණයේ තවත් වැදගත් ලක්ෂණයක් වන්නේ නාගරික ප්‍රදේශයන් ග්‍රාමීය ප්‍රදේශයන්ට සිදුකරනු ලබන බලපෑම්ය. "මැක්සිම් මැරියම්" නම් සමාජ විද්‍යාඥයාගේ අදහස වන්නේ නාගරීකරණය යනු නගර තම බල ප්‍රදේශ ව්‍යාප්ත කරගැනීමයි. ග්‍රාමීය ප්‍රදේශ අර්ධ නාගරික ප්‍රදේශ බවටත්, අර්ධ නාගරික ප්‍රදේශ නාගරික ප්‍රදේශ බවටත්, පරිවර්තනය වන බව ඔහුගේ අදහස යි.

ග්‍රාමීය ප්‍රදේශ → අර්ධ නාගරික ප්‍රදේශ බවට පත්වීම → නාගරික ප්‍රදේශ බවට පත්වීම

නාගරීකරණයේ බලපෑම මත සංස්කෘතික වෙනස්කම් රැසක් සිදුවේ. සිරිත් විරිත්වල වෙනස් වීම් මෙහිදී කැපී පෙනේ. පොදුබව, සාමූහිකත්වය, පරෝපකාරය වැනි ග්‍රාමීය සමාජයේ පැවති උසස් යැයි සම්මත සංස්කෘතික ලක්ෂණ වෙනස් වී මුදල් මත පවතින සමාජයක් බවට පත්වේ. ආගමික සාරධර්ම හා හැසිරීම් තුළ වූ ශ්‍රද්ධා - භක්තිය වෙනුවට බාහිර සාටෝපකාරී ජනප්‍රිය ලක්ෂණවලට මුල්තැන ලැබේ. භාෂාවේ පවා දක්නට ලැබෙන්නේ සංකර බවකි. බොහෝවිට භාෂා කිහිපයක සම්මිශ්‍රිත ව්‍යවහාරයක් දක්නට ලැබේ. ලාංකික නාගරික සමාජය තුළ ඉංග්‍රිසි භාෂාවේ වචන සම්මිශ්‍රිත බවක් වැඩි වශයෙන් තිබීම නිදසුනක් ලෙස දැක්විය හැකි ය.

**අභ්‍යාසය**

1. සමාජය වෙනස්වීම සඳහා බලපානු ලබන සාධක නම් කරන්න.
2. නවීකරණයේ අංග හතර දක්වන්න.
3. කාර්මීකරණයේ යහපත් හා අයහපත් ලක්ෂණ ලැයිස්තු ගත කරන්න.
4. නාගරීකරණයේ යහපත් හා අයහපත් ලක්ෂණ ලැයිස්තු ගත කරන්න.
5. ශ්‍රී ලාංකික නාගරික සමාජයේ ස්වභාවය යන මාතෘකාව යටතේ පුවත්පතකට ලිපියක් සම්පාදනය කරන්න.

## 2.4 බුදු දහම ඇසුරින් ශ්‍රී ලාංකික සමාජය පරිණාමය වූ ආකාරය

ක්‍රි:පූ: 247 දී පමණ සිදු වූ මිහිඳු හිමියන් ගේ ලංකාගමනය, ශ්‍රී ලාංකික ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකේ. ශ්‍රී ලාංකික ජන සමාජය සුවිසල් වෙනසකට ලක් කරලීම පිණිස මහින්දගමනය හේතු වී තිබීම එවැනි අදහසක් ඇතිවීම කෙරෙහි බලපානු ලැබූ මූලික සාධකයකි. මිහිඳු මහරහතන් වහන්සේ දෙවනපෑතිස් රජු මිස්සක පව්වේ දී පළමු වරට මුණගැසෙන්නේ ඒ රජතුමා මුව දඩයමේ ගොස් සිටිය දී ය. දඩයම් කිරීමේ ඇති වරද රජතුමාට පහදා දුන් මිහිඳු හිමියෝ "මහරජ ඔබ මේ රටේ භාරකරුවා මිස අයිතිකරුවා නොවේ" යනුවෙන් ප්‍රකාශ කළහ. එම වදනින් සංකේතවත් වන්නේ ලාංකික සමාජ පද්ධතියම පරිවර්තනයකට ලක්කිරීම සඳහා මිහිඳු මහ රහතන් වහන්සේ ගේ දේශනා හේතු වූ බවයි. රජතුමා දුනු හී ඉවත දැමීමෙන් හැඟවෙන්නේ සංකල්පීය වශයෙන් සිදු වූ වෙනස සමාජයෙහි තහවුරු වූ ආකාරයයි.

තිස්ස රජතුමාගේ බුද්ධිමත් භාවය විමසීම සඳහා මිහිඳු හිමියන් විමසූ අඹ පැනය හා ඥාති පැනය සමාජමය වශයෙන් වැදගත්කමක් සහිත සංවාදයකි. පුද්ගලයෙකු තමා ජීවත්වන සමාජයේ කොටසක් ලෙස ඊට අනුබද්ධව සිටීමේ වටිනාකම එමගින් අවධාරණය කෙරේ. පුද්ගලයා හා සමාජය අතර ඇති සබඳතාව තහවුරු කෙරෙන මේ පරීක්ෂණයෙන් පුද්ගලයා තුළ ඇති වෙන සදාචාර පරිහානිය සමාජ පරිහානියත් සමග බද්ධවන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා දීමට සමත් වේ.

මිහිඳු මාහිමියෝ මුල්ම ධර්ම දේශනය සඳහා චුල්ල හත්ථි පදෝපම සූත්‍රය තෝරා ගත්හ. එසේ කිරීමට විශේෂ හේතුවක් තිබිණ. බුදුන් වහන්සේ පිළිබඳ ව හෝ ධර්මය පිළිබඳ ව හෝ වැටහීමක් නොමැති ලක් ජනතාවට විමර්ශනාත්මක ව ඒ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා මග පෙන්වීමක් එ මගින් ලබා දීමට උන්වහන්සේ බලාපොරොත්තු වූහ. එහි සඳහන් වන පරිදි ඇතෙකුගේ අඩි සලකුණ අනුව ඇතාගේ ප්‍රමාණය තේරුම් ගැනීමට උත්සාහ දැරීමත්, එම උත්සාහය මත අවසානයේ දී විශාලත ම හස්තිරාජයා හඳුනා ගැනීමට හැකිවන ආකාරයෙන් ධර්මයේ ගැඹුර දකිමින් බුදුරජාණන් වහන්සේ හඳුනා ගැනීමට උත්සුක විය යුතු බව එහි ප්‍රායෝගික අර්ථයයි. විවිධ මිථ්‍යා විශ්වාසයන්හි එල්බගෙන සිටින පිරිසකට තුලනාත්මක අධ්‍යයනයක් තුළින් සත්‍ය අවබෝධ කර ගැනීම සඳහා මගපෙන්වීම මේ දේශනාවෙන් සිදු කළ ආකාරය පෙනේ.

තිස්ස රජතුමා ඇතුලු පිරිසට ධර්මය දේශනා කිරීම සඳහා තෝරාගත් පේතවත්ථු විමානවත්ථු ඇසුරින් පැහැදිලි කරන ලද්දේ හොඳ - නරක, යහපත - අයහපත, නැතහොත් පින් - පව පිළිබඳ සංකල්පය යි. එනම් යහපතෙහි හැසිරෙන්නෝ සුගතියට යන බවත්, අයහපතෙහි නියැලෙන්නෝ දුගතිගාමී වන බවත්ය. ශ්‍රී ලාංකික සමාජය තුළ ප්‍රබල වෙනසක් පින් - පව් පිළිබඳ සංකල්පය නිසා සිදු වූ ආකාරය දැකගත හැකි ය. රජු ඇතුළු පිරිස විනෝදය පිණිස දඩයමේ යාම තුළින් පැහැදිලි වන්නේ පින් - පව් පිළිබඳ අවබෝධයක් නොතිබුණු බව ය. එවන් සමාජයක් මෛත්‍රිය සහිත මානසික තත්ත්වයකට පරිවර්තනය වූයේ මෙවැනි ඉගැන්වීම් නිසා ය.

බුදු දහමේ ආභාසය නිසා ශ්‍රී ලාංකික සමාජයෙහි වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන සංකල්පයක් ගොඩ නැගිණි. මෙම සංකල්පය සමාජ විද්‍යාත්මක පදනමක් මත ඇති වූවකි. වැව ආර්ථික සශ්‍රීකත්වයේ සංකේතය යි. බෞද්ධ සමාජයේ ප්‍රමුඛ ජීවනෝපාය වූ කෘෂිකර්මය වැවේ දියවර මත රඳා පවතී. එබැවින් වැව ස්වයංපෝෂිත ගැමි ආර්ථිකයේ පදනම විය. කිසිවෙකු ගේ පෞද්ගලික වස්තුවක් නොවූ වැව සියලු දෙනාගේ ජීවිත ආරක්ෂා කළේ ය. එය පරාර්ථ චර්යාව පිළිබඳ බෞද්ධ සංකල්පයේ සංකේතයක් වැනි ය. වැව පතුලෙන් කැපුණු පසෙන් තැනුණු ගඩොලින් දාගැබක් නිර්මාණය විය. දාගැබ විමුක්තියේ සංකේතය යි. ලෞකික ජීවිතය වැවෙන් පෝෂණය කරගත් ගැමියාගේ ආධ්‍යාත්මික ජීවිතය පෝෂණය වූයේ දාගැබ මගිනි. නිවන් මග පසක් කරගැනීම පිණිස විහාරස්ථාන කරා යන උපාසක උපාසිකාවන් පළමුව දාගැබ වෙත යන්නේ බුදුන්වහන්සේ වෙත යන ශ්‍රද්ධාසම්පන්න සිතිනි. වැවේ හා දාගැබෙහි රැකවරණය මත පැවති ජනපදය ගමයි. ලෞකික සම්පත්වලින් ද ආධ්‍යාත්මික සන්තුෂ්ටියෙන් ද යුත් නිරවුල් සාමකාමී ජීවිතයක් ගම්වැසියනට ලැබී තිබිණි. එවැනි ජීවිතයක් ඇති කරගැනීම සඳහා මගපෙන්වීම ලැබුණේ ගමේ පන්සලෙනි. පන්සල ගමෙන් අවියෝජනීය වූ සම්බන්ධතා මගින් ශක්තිමත්ව බැඳී පැවතිණි. අද දක්වා ම බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල එම ශක්තිමත් සම්බන්ධතා එලෙසින් ම ආරක්ෂා වී තිබේ.

යටත් විජිත යුගය දක්වා ම ශ්‍රී ලංකාවේ ශක්තිමත් ආර්ථික ක්‍රමයක් පැවතියේ ද බුදු දහමේ මගපෙන්වීම හේතුවෙනි. ගොවිතැන, සාධාරණ වෙළෙඳාම, රාජ්‍ය සේවය වැනි රැකියා උසස් ජීවන වෘත්තීන් ලෙස බුදු දහමෙහි අගය කිරීමට ලක් වී ඇත. ඒ මග ගමන් ගත් ශ්‍රී ලාංකික සමාජය

ද එවැනි වෘත්තීන් මගින් තම ජීවිකාව කර ගැනීම උත්සුක විය. පැරණි රජ දරුවන් පවා වප්මගුල් උත්සව ආදියට සහභාගී වෙමින් කෘෂිකාර්මික ජීවිතය අගය කරන ලද්දේ එම පිළිගැනීම නිසා ය. සාධාරණ මාර්ගවලින් ධනය ඉපැයීමත් අවශ්‍යතා අනුව වැය කිරීමත් ඉතිරි කිරීම පිළිබඳ පණිවිඩයත් බුදු දහමින් ලාංකික සමාජයට ලැබීම සමාජයේ බලවත් වෙනසකට මග පෑදුවේ ය.

> " ඒකෙන භෝගෙ භුඤ්ජෙය්‍ය - ද්වීහි කම්මං පයෝජයේ
> චතුථං ච නිධාපෙය්‍ය - ආපදාසු භවිස්සති "

සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන මෙ වැනි ඉගැන්වීම් ශ්‍රී ලාංකික සමාජයේ ආර්ථික ක්‍රියාදාමය වෙනස් මඟකට යොමු කරලීමට සමත් විය.

කූටදන්ත සූත්‍රයේ දී රටේ පාලකයා විසින් ජනතාවගේ ආර්ථික සංවර්ධනය උදෙසා ක්‍රියා කළ යුතු ආකාරය දක්වා ඇත. හොරකම දූෂණය වැනි අපරාධ අවම කරගැනීම පිණිස රටේ සංවර්ධනයක් ඇති විය යුතු බව පැහැදිලි කෙරේ. මෙවැනි අපරාධවලට මිනිසුන් පෙළඹෙන්නේ දුප්පත්කම නිසා බවත් පාලකයා දුප්පත්කම නැතිකරලීම සඳහා ක්‍රියා කළ යුතු බවත් සඳහන් කර ඇත. වෙළෙඳාම කරනු කැමති අයට මූල ධනය සැපයීමත්, ගොවිතැන සඳහා ජල සම්පාදන කටයුතු කරදීමත්, බීජ හා ඉඩම් ලබාදීමත් පාලකයාගේ වගකීම බවත් දක්වේ. මේ ඉගැන්වීම් ගරුකොට ගත් ලක්දිව රජවරු වැව් අමුණු ඉදි කළහ. ජනතාව ආරක්ෂා කිරීම තම පරම යුතුකම ලෙස සලකා ක්‍රියා කළහ. එම ක්‍රියා කලාපය ශ්‍රී ලාංකික සමාජය උසස් තත්ත්වයට පත්වීමට හේතු විය.

ශ්‍රී ලාංකික දේශපාලන ක්ෂේත්‍රය බුදු දහමේ බලපෑම මත විශාල ලෙස වෙනස් වී ඇත. පාලකයා විසින් තම රටවැසියා දරුවන් සේ සලකා ක්‍රියා කළ යුතු බව බුදු දහමේ සඳහන් ය. එහි දී පාලකයා විසින් දස රාජධර්ම නමින් හඳුන්වා ඇති ධර්මතා දහයක් අනුගමනය කළ යුතු බව දක්වයි. දානය, සීලය, පරිත්‍යාගය, අග්‍ර බව, මැදහත් බව, තපෝ ගුණය, ක්‍රෝධ නොකිරීම, අවිහිංසාවාදී බව, ඉවසීම, අවිරෝධතාව යන කරුණු දහය අනුගමනය කිරීම මත ජනතාවගේ සුභ සිද්ධිය සැලසේ. සතර සංග්‍රහ වස්තු පිළිබඳ අදහස වඩා යහපත් දේශපාලනයක් සඳහා හේතු වේ. දානය, ප්‍රිය වචනය, සමානාත්මතාව, අර්ථචර්යාව යන සිව් ආකාරයෙන් සංග්‍රහ කිරීම මෙහි අදහස වේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

ශ්‍රී ලාංකික සමාජයෙහි විධිමත් දියුණු ලේඛන සම්ප්‍රදායයක් වර්ධනය වන්නේ මහින්දාගමනයෙන් පසුවයි. සම්පූර්ණ අක්ෂර මාලාවක් පවා නොතිබුණ සමාජයක මෙවැනි ලේඛන සම්ප්‍රදායක් වර්ධනය වූයේ බුදු දහමේ බලපෑම නිසා ය. තල්පතේ සිට ලෙන් ලිපි, සෙල් ලිපි දක්වා පැතිරුණ ලේඛන කලාව පසු කාලීනව මහා සාහිත්‍ය සම්ප්‍රදායක් බවට පත් විය. ජාතක පොත, බුත්සරණ, අමාවතුර, සද්ධර්ම රත්නාවලිය ආදි බණකථා සාහිත්‍යයක් මෙන් ම සසදාවත, මුවදෙව්දාවත, කුසදාකව, කව්සිළුමිණ, වැනි මහා කාව්‍ය සම්ප්‍රදායයක් ද වර්ධනය වූයේ බුදු දහමේ මග පෙන්වීම තුළිනි. මිහින්තලයේ "මහා කාල ප්‍රසාද" පිරිවෙනෙන් ආරම්භ වී යුගයෙන් යුගයට රට පුරා ව්‍යාප්ත වූ පිරිවෙන් අධ්‍යාපනය බෞද්ධ සාහිත්‍ය පෝෂණයේ නියමුවා බවට පත් විය. ශ්‍රී ලාංකික සමාජයේ බණ කථා සාහිත්‍ය වර්ධනය කිරීමෙහි මෙන් ම සමාජයේ සාක්ෂරතාව වර්ධනය කරලීම කෙරෙහි ද විශාල මෙහෙයක් පිරිවෙන් අධ්‍යාපනයෙන් සිදු විය. ඒ අනුව බණකථා ඇසීමේ හා කියවීමේ සම්ප්‍රදායක් වර්ධනය වූයේ ය. මේ තත්ත්වය ධර්ම ඥානය වර්ධනය කිරීමට මෙන් ම යහපත් චර්යා සහිත සමාජයක් නිර්මාණය වීමට හේතු විය.

කිසි ලෙසකින් කම්පා නොවීමේ ගුණය යහපත් සම්බන්ධතා ඇති කර ගැනීම පිණිස හේතු වී තිබේ. ශ්‍රී ලාංකික සමාජයේ පුද්ගලයා ලෙහෙසියෙන් කම්පා නොවන, ලෙහෙසියෙන් ප්‍රකෝප කළ නොහැකි, සාමකාමී, ඉවසිලිවන්ත, අයෙකු බවට පත්ව ඇත්තේ බුදු දහමින් ලත් මඟ පෙන්වීම නිසා ය. ශ්‍රී ලාංකික ජන සමාජයේ පවතින උතුම් චර්යා ධර්මයන් වන ආගන්තුක සත්කාරය, පරෝපකාරය වැනි ගුණාංග විදේශිකයන් ගේ පවා ගෞරවයට පාත්‍ර වී ඇත. "එදා හෙළදිව" කෘතිය රචනා කළ රොබට් නොක්ස් ශ්‍රී ලාංකිකයන් අඬ දබර කර නොගත් සමකාමී ජනතාවක් වූ බව දක්වා ඇත. පීඩාවට පත් කවරෙකුට වුව ද උපකාර කිරීම ශ්‍රී ලාංකිකයන්ගේ සිරිත විය. සුනාමි ආපදා අවස්ථාවේ දී ශ්‍රී ලාංකික ජනයා අන්‍යයන් හට උපකාර කිරීමට ඉදිරිපත් වූ ආකාරය දෙස විදේශිකයෝ මවිතයෙන් බලා සිටියහ. එවැනි තත්ත්වයන් බුදු දහම නිසා ශ්‍රී ලාංකික සමාජයේ ස්ථාපනය වී පවතින සමාජ අගනාකම් ලෙස අගය කළ යුතු වේ.

## අභ්‍යාසය

1. කෙටි කාලීන ව සමාජය වෙනස්වීම සඳහා හේතු වන සාධක 03ක් දක්වන්න.
2. කෙටි කාලීන ව සමාජය වෙනස් කරනු ලබන එක් සාධකයක් පිළිබඳ විස්තර කරන්න.
3. දිගු කාලීන ව සමාජය වෙනස් කිරීමට ඉවහල් වන සාධක මොනවාද?
4. එවැනි සාධක දෙකක් තුළින් සමාජයෙහි දිගු කාලීන වෙනසක් සිදුවන ආකාරය පෙන්වා දෙන්න.
5. "බටහිර බලපෑම් මත අපේ රටේ සමාජයෙහි සිදු වූ දිගු කාලීන වෙනස්කම්" පිළිබඳ ශිෂ්‍ය සමිතියේ ඔබ විසින් පවත්වනු ලබන කථාවක පිටපතක් සකස් කරන්න.
6. බුදු දහම ඇසුරින් ලංකා සමාජය තුළ සිදු වූ වෙනස්කම් ලැයිස්තුගත කරන්න.

# 03 සංස්කෘතිය

## 3.1 "සංස්කෘතිය" සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයෙන් නිර්වචන ආශ්‍රිත ව හඳුනා ගැනීම

සංස්කෘතිය Culture යන වචනයෙන් යුරෝපය තුළ ප්‍රචලිත වූ පිරිසුදු බව, සකස්කරන ලද්ද, හැඩගස්වන ලද්ද යන අර්ථ දෙන ''සංස්කෘතිය'' සමාජ හා මානව විද්‍යාඥයින් විසින් එය විද්‍යාත්මක අර්ථයෙන් හඳුන්වා දී තිබේ. කිසියම් ජන සමූහයක සුවිශේෂ ජීවන රටාව සංස්කෘතිය ලෙස හැඳින්විය හැකි ය. මිනිසාගේ සමාජ උරුමය වශයෙන් හැඳින්විය හැකි සංස්කෘතිය, අදීන සිතුවිලි පරම්පරාවක සංකේතය වේ. සංස්කෘතියෙන් තොර සමාජයක් හෝ සමාජයෙන් තොර සංස්කෘතියක් හෝ නොපැවැතිය හැකි බවත්, සංස්කෘතියක් පවත්වා ගෙන යා හැක්කේ මිනිසාට පමණක් බවත් සමාජ හා මානව විද්‍යාඥයෝ සනාථ කරති.

එසේ ම සංස්කෘතියක් තවත් සංස්කෘතියකින් වෙනස් වන්නේ භෞතික ස්වරූප වන කඳුහෙල්, තැනිතලා, දේශගුණය, වෘක්ෂලතා, භාෂාව හා ආගම, ආර්ථික, දේශපාලන වැනි සාධක මත ය. බොහෝ දුරට පාරිසරික සාධක මත මානව සිතුම් පැතුම් ගොඩනැගේ. එක් මිනිසෙකුගේ අදහස් (Ideas) වුව ද සමාජයක පොදු පිළිගැනීමකට ලක්වීමෙන් සංස්කෘතික වටිනාකමක් ඊට ලැබේ. නිදසුන් ලෙස ආහාර අවශ්‍යතාව ඉටුකර ගැනීම සඳහා දඩයම් කිරීම, සත්ත්ව පාලනය, ගොවිතැන් කිරීම ද එසේ ම නව දැනුම ලබා ගැනීම සඳහා යාවජීව අධ්‍යාපනය ද යොදා ගනියි. එසේ ම සංස්කෘතික විවිධත්වය සමාජ හා මානව විද්‍යාව තුළ උසස් පහත් ලෙස වෙන්කර අනුමත නොකරයි. කිසියම් සංස්කෘතියක් ප්‍රබල සංස්කෘතියක් විසින් යටත් කරගැනීමෙන් පසුව මව් සංස්කෘතියේ ලක්ෂණ යටපත් කරගෙන නව සංස්කෘතික ලක්ෂණ එම සංස්කෘතිය තුළට විසරණය වෙයි. ඒ බව බටහිර ජාතීන් විසින් ආසියානු අප්‍රිකානු රටවල් යටත් කර ගැනීමෙන් දායාද කළ මිෂනාරි අධ්‍යාපනයෙන් පැහැදිලි වෙයි. එය පසුව විධිමත් පාසල් අධ්‍යාපනයක් දක්වා ව්‍යාප්ත විය.

සංස්කෘතිය පිළිබඳ ව සමාජ විද්‍යාඥයින්ගේ මතවාද ඇසුරින් විග්‍රහයක් කිරීමේදී බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියාවන ඊ. බී. ටයිලර් E.B. Tylor ගේ නිර්වචනය මූලිකත්වයෙහිලා සැලකේ. ඔහුගේ අදහස අනුව



නොමිලේ බෙදා හැරීම සඳහා ය

යම් කෙනෙකු සමාජයේ සාමාජිකයෙකු වශයෙන් ලබාගන්නා දැනුම, විශ්වාසය, කලාව, සාරධර්ම, නීතිය, සිරිත් හා වෙනත් හැඳියාවන් හා පුරුදු ආදියෙහි එකතුව තම ප්‍රාථමික සංස්කෘතියයි. (Primitive Culture, 1871) මිනිස් ජීවිතයේ සෑම අංශයක් ම මෙම නිර්වචනය තුළින් දැක ඇති බව පෙනේ. සමාජ විද්‍යාත්මක ව දෘෂ්ටි කෝණයෙන් බලන කල අධ්‍යාපන උරුමයන්ට විශේෂ තැනක් හිමි වේ. එනම් මානව සමාජයේ පරපුරින් පරපුරට තම සංස්කෘතික උරුමයන් ගෙන යන්නේ අධ්‍යාපනික දැනුම වාහකයක් ලෙස යොදා ගනිමිනි. කලාව, දැනුම, සාරධර්ම ආදියේ සීමාවක් ද දක්නට නොලැබේ. මෙම නිර්වචනය තුළින් සමාජීය ජීවිතයේ භාවික සබඳතා ක්‍රියාකාරකම් ඒ තුළින් නිපදවා ඇති මෙවලම් උපකරණ ආදිය ද සංස්කෘතියේ නිෂ්පාදිතයන් බවට අරුත් දෙයි. ඊ.බී. ටයිලර්ගේ නිර්වචනයෙහි සිට මේ දක්වා සංස්කෘතිය පිළිබඳ ව නිර්වචන 165ක් පමණ වාර්තා වී තිබේ. මින් පැහැදිලි වන්නේ, මිනිස් චර්යා හෝ සංස්කෘතිය පිළිබඳව නිශ්චිත නිර්වචනයක් එක එල්ලේ දිය නොහැකි බව ය.

රැල්ප් ලින්ටන් පැවැසුවේ, "මිනිසා පරම්පරාවෙන් පරම්පරාවට දායාදයක් වශයෙන් ගෙන යන ජීවන රටා සමුදාය සංස්කෘතිය" වශයෙනි. මැලිනොව්ස්කිට අනුව "මිනිසාගේ මනෝකායික අවශ්‍යතා සපුරා ගැනීමට ඇතිකරගත් දෙය සංස්කෘතියයි." එනම් මානවීය ක්‍රියාකාරිත්වය තුළ උපයෝගී පක්ෂය ඉන් අවධාරණයට ලක් වේ. ඇතිවන අවශ්‍යතා යම්කිසි සමාජ රාමුවක් තුළ ඉටුකර ගැනීමට ප්‍රයත්න දැරීමේ දී ගැටෙන, පැහෙන සියලු දෙය මේ අනුව සංස්කෘතිය බව මැලිනොව්ස්කි ගේ අදහස විය. රේමන්ඩ් ෆර්ත් දැක්වූයේ ''දෙන ලද ජීවන රටාවක් ඇතුළත පුද්ගලයින් සමූහයක් සංවිධානය වී ඇති ආකාරය'' සංස්කෘතිය බව ය. පුද්ගල සමූහයක් යම් ජීවන රටා සමුදයක් ලෙස ආකෘති ගතවීමෙන් සංස්කෘතිය සංකල්පනය වන බව ඔහුගේ අදහස විය. සමූහයක භූගෝලීය සීමාව හෝ පැතිර පවත්නා භූමි ප්‍රදේශය, කාලය වැනි සීමාකාරී සාධකවල බලපෑමට සංස්කෘතිය යටත් වන බව මේ අදහසට ඇතුළත් වේ. එකී සීමා තුළ යම් අනන්‍ය ජීවන රටාවක් අයත් කරගත් සමූහයක ප්‍රකට ලක්ෂණ සමුදය සංස්කෘතිය බව ඔහුගේ අර්ථකථනයට අතුළත් විය.

අප සමාජයේ විසීමෙන් ලබන, කාටත් පොදු වූ, නිතර භාවිත කෙරෙන අනාගත පරම්පරාවට ද භාර දෙන හැසිරීම් මෝස්තර පිටුපසින් ඇති අදහස් සමූහය සංස්කෘතිය බව රැඩ්ක්ලිෆ් බ්‍රවුන් පවසා තිබේ.

එල්වුඩ්ගේ අවධානයට ලක් වූයේ, සංස්කෘතියේ පැතිරීම කෙරෙහි ය. භාෂාව සංස්කෘතිය පැතිරීමේ ප්‍රධාන වාහකයා වේ. විවිධ ලක්ෂණ ඇති සමාජ සම්බන්ධ කරන්නේ සංස්කෘතියෙන් වන අතර මිනිසා තමන් හා බාහිර ලෝකය පිළිබඳ ව ලබා ගන්නා දැනුම හා හැකියාවනුත් අයත් වන්නේ සංස්කෘතියට ය.

සමාජ විද්‍යා විශ්ව කෝෂයට අනුව සංස්කෘතිය "සංකේතානුසාරයෙන් සමාජීය ලෙස හිමිකොට ගත්තා වූත්, රටාවන්ට දිය හැකි සාමූහික නාමය"යි.

සංස්කෘතිය මිනිසාගේ ජීවිතය හා කෙතරම් දුරට බද්ධ වී ඇත්දැයි යන්න, මැලිනොව්ස්කි විසින් සංස්කෘතිය සමාජ ජීවිතයේ යථාර්ථය ස්පර්ශ කරන්නක් ලෙස හඳුන්වාදීම මගින් ම සනාථ කරයි.

## 3.2 සංස්කෘතියට ආවේණික විවිධ ලක්ෂණ

### 3.2.1 සංස්කෘතික ගැටුම - (Culture Conflict)

සංස්කෘතිය පිළිබඳ තවත් වැදගත් කරුණක් නම් සංස්කෘතික ගැටුම හා ව්‍යාප්තියයි. කිසියම් සංස්කෘතියකට වෙනත් සංස්කෘතියක පිළිගත් අංග, නව සම්ප්‍රදායන්, නීති රීති එක් කිරීමට යාමෙන් සංස්කෘතික ගැටුමක් ඇතිවේ. ඇතැම් විට මෙම ගැටුමේ ප්‍රතිඵලය වන්නේ ගැටීමට භාජනය වූ සංස්කෘතීන් දෙකට ම අදාළ නොවන නව සංස්කෘතියක් බිහිවීම යි. යුද්ධ, ආක්‍රමණ, සුහද සංක්‍රමණ මගින් මෙය සිදුවිය හැකි ය. ලංකාවට අධිරාජ්‍යවාදීන්ගේ පැමිණීම නිසා වූ සංස්කෘතික ගැටුම මේ සඳහා නිදසුන් වේ. මිෂනාරී කතෝලික ආගම පතුරුවා හැරීම, මිෂනාරි අධ්‍යාපනය ආදිය මගින් අධිරාජ්‍යවාදීන් විසින් බලහත්කාරයෙන් සිය සංස්කෘතික උරුමයන් ශ්‍රී ලාංකිකයින්ට දායාද කිරීමට උත්සාහ ගන්නා ලදී. එහි ප්‍රතිඵලය වූයේ ඉංග්‍රීසිත් නොවන, සිංහලත් නොවන, මිශ්‍ර ආගන්තුක සංස්කෘතියක් අපට උරුම වීමයි. මහා සංස්කෘතීන් හා උපසංස්කෘතීන් අතර ගැටුම ද, පරම්පරා ගැටුම ද, සංස්කෘතික ගැටුමට හේතුවී ඇත. සංස්කෘතික ව්‍යාප්තිය සංස්කෘතික ගැටුමේ අමතර ප්‍රතිඵලයකි. සංස්කෘතික ගැටුම හා ව්‍යාප්තිය පිළිබඳ සංකල්පය "තොන්ස්ටන් සෙලින්" නම් මානව විද්‍යාඥයාගේ ඉදිරිපත් කිරීමකි.

ගවමස් ආහාරයට ගැනීම හින්දු - දමිළ සංස්කෘතියේ බැහැර කෙරෙන අතර බටහිරට එය වලංගු නොවී ය. විලාසිතා පිළිබඳ පවතින තරුණ - වැඩිහිටි මතවාදී අරගල ආදිය මෙකී සංස්කෘතික ගැටුම්වල ප්‍රකට අවස්ථා ලෙස දැක්විය හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

### 3.2.2 සංස්කෘතික විසරණය. (Cultural Diffiusion)

19 වන සියවසේ දී යටත් විජිතකරණය සමග සංස්කෘතික විසරණය පුළුල් ලෙස සිදුවිය. එය ලෝකය පුරා ව්‍යාප්ත වූයේ ප්‍රංශ, පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන අධිරාජ්‍යවාදී පාලනය සමග ය. නූතනයේ සංස්කෘතික විසරණය සිදුවන්නේ බහුජාතික සමාගම්වල ක්‍රියාකාරිත්වයන්, ජාත්‍යන්තර ආයතන හා ජනමාධ්‍යවල මැදිහත් වීමත් හරහා ය. එය නව යටත් විජිතකරණය යි. කිසියම් සංස්කෘතික බලපෑමක් තවත් සංස්කෘතියකට ව්‍යාප්ත වීමෙන් සංස්කෘතික විසරණය සිදුවෙයි. මෙසේ ආයාසයකින් තොරව සිදුවන නිරායාස ගලා යාම විසරණය නමින් හඳුන්වයි. මෙම සංකල්පය ඉදිරිපත් කරන අය අතර ''ප්‍රාන්ස් බොආස්'' සහ ''රූත් බෙනඩික්ට්'' ප්‍රධාන වේ. රැල්ප් ලින්ටන් නම් මානව විද්‍යාඥයා පවසන ආකාරයට ඕනෑම සංස්කෘතියක සියයට අනූවක් (90%) අංග විසරණය නිසා ලබන ඒවා ය.

ශ්‍රී ලංකා සමාජය ඈත අතීතයේ සිට පෙර අපර දෙදිග සංස්කෘතික විසරණයන්ට ලක්විය. එය පළමුව ප්‍රභූපන්තිය අතර ව්‍යාප්ත වූ අතර ඉන්පසු පහළ ම සමාජ ස්තරයන් දක්වා විසරණය විය. නිදසුන් ලෙස මහින්දාගමනයේ දී සිදු වූ සමාජ පෙරළිය හා නව යටත් විජිතකරණයේ දී ස්වදේශික නාගරික පන්තිය පළමුව සංස්කෘතික විසරණයට අනුව අනුවර්තනය වීමත් සැලකිය හැකි ය.

### 3.2.3 සංස්කෘතික ලැග්ම (Cultural lag)

සංස්කෘතිය වෙනස්වීමට එරෙහි වූ සංස්කෘතික ලැග්ම පිළිබඳ සංකල්පය මුල්වරට හඳුන්වා දුන්නේ ඇමරිකානු ජාතික සමාජ විද්‍යාඥයෙකු වූ W.F. ඔග්බර්න් විසිනි. මෙය න්‍යායක් වශයෙන් ඉදිරිපත් කරන ලද්දේ ද මොහු විසිනි. සංස්කෘතික ලැග්ම සංස්කෘතියේ වෙනස්වීමේ එක්තරා අවස්ථාවකි. සමහර සංස්කෘතික අංග ඉක්මනින් වෙනස් වී වර්ධනය වන අතර තවත් අංග වෙනස් නොවී ඒ ආකාරයෙන් ම පවතී නම් එහි සංස්කෘතික ලැග්මක් ඇතැයි පිළිගැනේ. බලවත් සංස්කෘතික බලපෑම නිසා දුර්වල සංස්කෘතික අංග ඉක්මනින් වෙනස් වන අතර ඇතැම් අංග ඒ ආකාරයෙන් ම පවතී නම් එය සංස්කෘතික ලැග්මකි. නිදසුන් ලෙස දුම්රිය හා රථවාහන ප්‍රවාහනයට එකතු වන වේගයෙන් මාර්ග පද්ධතිය හා මාර්ග සංඥා තාක්ෂණය දියුණු නොවීම නිසා ගමනාගමන කටයුතුවල ප්‍රමාදයක් දක්නට ලැබෙන අතර රිය අනතුරු බහුල ව සිදු වේ. මේ හැර කාලගුණ



නොමිලේ බෙදා හැරීම සඳහා ය

විපර්යාසයන් මෙන් ම අකුණු අනතුරු වළක්වා ගැනීමේ තාක්ෂණික උපකරණ භාවිත නොකිරීම ද සංස්කෘතික ලැග්ම නිසා සිදුවන්නකි. කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර මෙන් ම නවීන ගෘහ උපකරණ භාවිතයට ද නොගෙන මිනිස් ශ්‍රමයෙන් කටයුතු කිරීමෙන් ද සංස්කෘතික ලැග්ම හඳුනාගත හැකි ය. බොහෝ විට සංස්කෘතික ලැග්ම ප්‍රකට වනුයේ භෞතික දියුණුවට සාපේක්ෂ ව අදහස්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර වෙනස් නොවීම නිසා බව පැහැදිලි වේ. එනම් වෙනස්කම්වලට ලක්නොවී සිටීමේ ගතානුගතික චින්තනය සංස්කෘතික ලැග්මට මග සලස්වන බව පැහැදිලි ය.

## 3.2.4 සංස්කෘතිය හා සමාජය

සංස්කෘතියකින් තොරව සමාජයකට පැවතිය නොහැකි ය. සංස්කෘතියක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව මානව සමාජයට පමණක් අයත් වෙයි. ප්‍රාථමික යුගවල ජීවත් වූ පුද්ගලයෝ ද අවට සමාජය සමග සම්බන්ධතා ගොඩනගා ගනිමින් සංස්කෘතිකාංග පවත්වාගෙන ගියහ. අලුත් තාක්ෂණික මෙවලම් භාවිතයට හුරුවීමත් සමඟ එම උපකරණ සංස්කෘතික උපකරණ ලෙස පෙනී සිටි අතර මානව චර්යාවන් සංකේතාත්මක ව චර්යාවක් විය. සංස්කෘතියක් ඇතිවන්නේ ජන සමූහයක් එකට ජීවත් වීමෙන් ය. මේ සඳහා පරසරය බලපායි. මිනිස් ජීවිතය පවත්වා ගෙන යාම සඳහා ආහාර අවශ්‍ය වෙයි. භූගෝලීය සාධක මත සාමූහික ක්‍රියාදාමය මින්පසුව ආහාර නිපදවීම සිදු කරයි. ඇමරිකාවේ තිරිඟු සංස්කෘතියක්, චීනයේ සහල් සංස්කෘතියක් ඇත. ආහාර පාන මෙන් ම ඇඳුම් - පැලඳුම් ද පාරිසරික සාධක මත භාවිත වන බව පෙනේ.

සංස්කෘතිය සමාජය තුළ ස්ථාපිත කිරීමේ දී මානව පවුල මූලික ව ක්‍රියා කරයි. එමගින් පුද්ගලයා සංස්කෘතික සත්ත්වයෙකු ලෙස මානව සමාජයට සම්මත ව බන්ධනය කරයි. ද්විතියික සංස්ථාවන් වන පාසල් අධ්‍යාපනය, නීතිය, ආගම, විවාහය මගින් ඊට අවනත වීමට පුද්ගලයාට සිදුවෙයි. මෙම ක්‍රියා සමූහය පිටු පසින් ඇති බලවේගය සංස්කෘතියයි. අනෙක් අතට සමාජයත් සංස්කෘතියත් අතර පවත්නා දැඩි සම්බන්ධතාව ප්‍රවාහයක් ලෙසින් පරපුරින් පරපුරට සම්බන්ධ වෙයි. මේ නිසා සමකාලීන පරිසරය මෙන් ම ආකල්පයන්ගේ සංවර්ධනයටත් විශාල අනුග්‍රහයක් වෙයි.

ක්ලක්හෝන් (Kluckhohn) නම් සමාජ මානව විද්‍යාඥයාට අනුව සංස්කෘතිය මූලික වශයෙන් සමාජ අවශ්‍යතා (Social Needs) ඉටු කිරීමේ ඒකායන මාර්ගයයි. සමාජයේ සාමාජිකයෙකු ලෙස මිනිසා,

මිනිසා වෙත ඇති මානසික හා භෞතික අවශ්‍යතා ඉටුකර ගැනීමේදී ඒ සමාජයේ සමාජ ලක්ෂණයන්ගේ ප්‍රතිමූර්තියක් බඳු සංස්කෘතිය එහිලා නිශ්චිත මාර්ගෝපදේශකත්වයක් පෙන්වන බව ඔහු විසින් වැඩිදුරටත් පවසා තිබේ.

රූත් බෙනඩික්ට් (Ruth Benedict) නම් සමාජ විද්‍යාඥවරිය පෙන්වා දෙන තවත් වැදගත් කරුණක් වනුයේ සමාජයට යම්කිසි ක්‍රමවත් සැලැස්මක් තිබීමට මෙම සංස්කෘතිය උපකාර වන බවයි. ''ටැල්කොට් පාර්සන්ස්'' නම් සමාජ විද්‍යාඥයා සංස්කෘතිය මූලික වශයෙන් ක්‍රියාකාරකම් පද්ධතියක් බව ප්‍රකාශ කරයි. ඔහු දක්වන අන්දමට සංස්කෘතිය ඇතිවන්නේ ද මිනිසා එකිනෙකා සමඟ පවත්වන අන්තර් ක්‍රියාවල බලපෑමෙනි. එමෙන් ම සංස්කෘතිය හා සමාජය අතර ඇති බැඳීම් තේරුම් ගැනීමට වැදගත් වන අංග තුනකි.

01. අදහස් (Ideas)
02. ධර්මතා (Norms)
03. භෞතික සංස්කෘතිය (Material Culture)

## අදහස් (Ideas)

අදහස් නම් විවිධ සමාජවල මිනිසුන්ගේ සිතුම් පැතුම් ය. මානව විද්‍යාඥයින් පෙන්වා දෙන්නේ සංස්කෘතිය අනුව මිනිසුන් වෙනස්වන බවයි. ප්‍රාථමික සමාජයේ සොබාදහමේ ක්‍රියාකාරිත්වය සැලකුවේ බලගතු දෙවිවරු ලෙසට ය. ඒ සඳහා පුද පූජා පැවැත් වූහ. ගැමි සමාජයේ ද ඊට වඩා වෙනස් ආකාරයට සැළකුහ. සොබාදහමේ ක්‍රියාකාරිත්වය මිනිසාගේ පැවැත්මට උපකාර වන බැවින් තම කෘතවේදීත්වය දක්වූයේ ජලය සමග ගනුදෙනු කිරීමෙන් ය. බෞද්ධ - හින්දු අවුරුදු සමයේ දී කෘෂිකාර්මික කටයුතුවලට උපකාර කළ ගවමහීෂාදීන්ට ප්‍රණීත ආහාර පාන දුන්නේ ය. මල් මාලාවලින් සැරසුවේ ය. නාගරික සමාජයේ අදහස් ප්‍රාථමික සමාජයේ හා ගැමි සමාජයේ ජන විඥානයට වෙනස් විය. ඔවුහු තර්කානුකූලව සිතුහ. බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ආගමික ඉගැන්වීම් අනුව අනුගාමිකයින් දෙව්ලොවත් අපායත් ඇතැයි පිළිගනිති. සුචරිතය හා දුෂ්චරිතය විශ්වාස කරති. දන්දීම, සිල් රැකීම හා භාවනානුයෝගී වීම පිළිබඳ ආධ්‍යාත්මික දැක්මක් තිබේ. මෙම අදහස සංස්කෘතික අදහස් ලෙස පෙන්වාදිය හැකි ය.


නොමිලේ බෙදා හැරීම සඳහා ය

## ධර්මතා (Norms)

සමාජ සංස්කෘතිය පෝෂණය වීමෙහිලා ධර්මතා වැදගත් වෙයි. සමාජයේ ජීවත් වීමේදී සමාජ විඥානයට අනුවර්තනය වන්නේ ධර්මතා මගිනි. මූලික සමාජවල ධර්මතා චාරිත්‍ර හා වාරිත්‍ර ලෙසින් ද නවීන සමාජවල ධර්මතා නීති රීති මගින්ද ක්‍රියාත්මක වෙයි. මෙය විවෘත ව දැකිය හැකි වන අතර සමාජ සම්මත හැසිරීම් සමුදාය දක්විය හැකි ය. නිදසුනක් ලෙස ආගමික පූජනීය ස්ථානයකට ඇතුල්වීමේදී සුදුවතින් සැරසීම, හිස්වැසුම් සහ පාවහන් ගැලවීම හින්දු කෝවිලක දී උඩුකය නිරාවරණය කිරීම උපශාන්ත ව ගමන් කිරීම දක්නට පුළුවන.

එමෙන් ම අවමංගල අවස්ථාවකට වඩාත් සංවේදී මුහුණු ඉරියව් පලවන්නේත්, මංගල අවස්ථාවකට ද විලාසිතා ඇඳුම් - පැළඳුම් තුටුපහටු හැසිරීම් රටාව සමාජ ධර්මතා රඟ දක්වීමකි. මෙම යහපත් ප්‍රමිතීන් සමූහය ''ප්‍රතිමාන'' ,''ධර්මතා'' හෝ ''සංස්කෘතික චර්යා'' යනුවෙන් සමාජ මානව විද්‍යාඥයින් හඳුන්වති. සමාජයේ ධර්මතා බිඳ වැටීම සමාජ අපයෝජනයට හේතුවන අන්දම එමිල් ඩුර්කයිම් සුවිශේෂීව විග්‍රහ කර ඇත.

## භෞතික සංස්කෘතිය (Material Culture)

මානව පරිණාමයේදී ශිලා යුගයේ සිට නූතන අභ්‍යවකාශ යුගය දක්වා පැමිණි ගමන්මගේ දී ශිෂ්ටාචාර ගත වූ මිනිසා තම පහසුව උදෙසා නිර්මාණය කරගත් ද්‍රව්‍ය සියල්ල භෞතික සංස්කෘතියේ අංග වේ. නිදසුනක් ලෙස ඇඳුම් පැළඳුම්, කලා නිර්මාණ, විවිධ අවි ආයුධ, වැව් අමුණු, යන්ත්‍ර සූත්‍ර, යාන වාහන දක්නට පුළුවන. කෞතුකාගාරවල ඇති භෞතික සංස්කෘතික භාණ්ඩද ඒ අතර වෙයි. මේවා ප්‍රකට සංස්කෘතියට අයත් වෙයි. භෞතික නිෂ්පාදිතයන් දෘශ්‍යමානය. ස්පර්ශ කළ හැකි ය. ඕනෑම උපකරණයක් භෞතික සංස්කෘතියට අයත් වන්නේ මිනිසාට අවශ්‍ය ම අංග වන්නේ නම් පමණි. භෞතික සංස්කෘතිය පණගන්වන ආධාරක, උපකරණ හා මෙවලම් වූවා සේ ම ජනවහර, ප්‍රතිමාන, විශ්වාස, ආකල්ප, මතවාද වැනි දේ තුළින් අභෞතික සංස්කෘතිය පණ ගැන්වේ. රැල්ප් ලින්ටන් පවසන්නේ සංස්කෘතිය තුළ ඇත්තේ භෞතික ගුණය නොව මානසික ගුණය බව යි. මෙහිදී භෞතික නිෂ්පාදිතයන් අවස්ථෝචිත පරිදි පරිහරණය කිරීම සඳහා මානසික ගුණය වැදගත් වන බව අවධාරණය කරයි.

සංස්කෘතිය හා සමාජය පිළිබඳ කිව හැකි වන්නේ සමාජයේ ක්‍රියාත්මක වන කිසියම් පිළිවෙලක් හෝ රටාවක් ඇත්ද එය සංස්කෘතිය බවයි. සමාජය සම්මත කරගත් මාර්ගවලින් පිට පැනීම වූ කලී සංස්කෘතියෙන් ද පිට පැනීමකි. සමාජයක පවතින අදහස් ධර්මතා හා භෞතික උපකරණ ද සංස්කෘතිය මගින් අර්ථවත් කර තිබෙන බව ද කිව හැකි ය.

## 3.3 සංස්කෘතිය පුද්ගල හැසිරීම පෝෂණය හා වර්ධනය කෙරෙහි ඇති කරන බලපෑම්

### පුද්ගල පෞරුෂය හා සංස්කෘතිය පවරා දීම

සංස්කෘතිය පරපුරෙන් පරපුරට පවරා දෙන්නකි. මෙකී සංස්කෘතික සම්ප්‍රේෂණයේ මාධ්‍ය වන්නේ අදාළ සමාජ රටාවේ ව්‍යවහාර වන භාෂාව යි. සංස්කෘතික සමාජ ප්‍රයෝජන කාරක වශයෙන් පවුල, පාසල, සම වයස් කණ්ඩායම් වැදගත් වේ. සිග්මන් ප්‍රොයිඩ් නම් මනෝවිද්‍යාඥයා පුද්ගලයාගේ පෞරුෂත්වය මනෝ විශ්ලේෂණවාදය යටතේ ඉදිරිපත් කරයි. ඔහු වඩාත්ම අවධානය යොමු කරන්නේ පෞරුෂත්වය, උපත හා සංවර්ධනය පිළිබඳව ය. ඔහුගේ පර්යේෂණවල මූලික පදනම මනසයි.

එසේම මාග්‍රට් මීඩ්, රූත් බෙනඩික්ට් යන සමාජ හා මානව විද්‍යාඥයින්ගේ දෘෂ්ටි කෝණයට අනුව පුද්ගලයාගේ පෞරුෂ වර්ධනයට සමාජ හා සංස්කෘතීන් බොහෝ දුරට බලපාන බව පෙන්වා දෙයි. ආක්‍රමණශීලී ගති ලක්ෂණ ප්‍රකට වීමෙහි ලා මූලික වශයෙන් ඔහු ජීවත්වන සමාජය හා සංස්කෘතිය වැදගත් වූ බව පෙනේ. ''මුණ්ඩුගුමාර්'' (Mundugumar) හා ඩෝබු (Dobu) - සමාජයේ දරුවන් ආක්‍රමණශීලී පෞරුෂයකිනුත්, ඇරාපේෂ්, සුනී (Arapesh, Zuni) සමාජයේ දරුවන් සමබර පෞරුෂයකිනුත් යුක්ත පුද්ගලයින් පිරිසක් වීමෙන් පෙනෙන්නේ පුද්ගල පෞරුෂත්වය සඳහා සමාජ හා සංස්කෘතික පරිසරය බලපාන බව ය. මෙහිදී මුණ්ඩුගුමාර් වැසියන් දරුවන් සුරතල් කරයි. මව කිරි දෙන්නේ ඉතා ඕනෑකමින් වේ. ඇරාපේෂ් සමාජයේ මව දරුවාට හිටගෙන සිට කිරි දීම සාමාන්‍ය ක්‍රමයකි. කිරි බී අවසන් වීමට පෙර ඉවත් වෙයි. දරුවා වඩාගෙන නොයයි. හඬා වැළපීම නොසලකයි. දරුවා නලවන්නේ හෝ සුරතල් කරන්නේ නැත. මෙවැනි දරුවන් මුඛය සැපත හෙවත් මුඛයෙන් ලබන සැපත අඩු නිසා පසුකාලයේ දී ඇඟිලි උරාබොයි, නිය පොතු කයි. ආහාර ගැනීමේ දී දැඩි ගිජුකමක් දක්වයි. නූතන කාර්මික සමාජයේ දරුවන්ට මවගේ උණුසුම ආදරය නොලැබෙයි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

දිවාසුරැකුම් මධ්‍යස්ථානයක පාලිකාවගේ රැකවරණය ලබයි. මාතෘ විහීනතාව පෞරුෂ වර්ධනයට අයහපත් ලෙස බලපායි. විස්තෘත පවුලේ හැදෙන වැඩෙන දරුවන්ට මෙන් කථා කිරීමට වාග් මාලාවක් නොලබයි. මේ නිසා ඇතැම් දෙමව්පියන් කනස්සල්ලට පත් වෙයි. ද්විතියික සමාජානුයෝජනයේ දී සමවයස් කණ්ඩායම් සමඟ සමාජ විරෝධීව හැසිරෙයි. බිඳුනු පෞරුෂ ලක්ෂණ පෙන්නුම් කරයි. ආක්‍රමණශීලි ගති ලක්ෂණවලින් යුක්ත වෙයි.

මේ නිසා පරිසමාප්ත සමබර පෞරුෂයකින් යුක්ත වීමට නම් කායික මානසික පෝෂණය මෙන් ම සමාජානුයෝජන කාර්යයද වැදගත් වේ. යහපත් සංස්කෘතික පවරා දීම පුද්ගල පෞරුෂය ගොඩනැගීමට හේතු වන අතර මෙය සංස්කෘතිය අභ්‍යන්තරීකරණය කිරීමකි. එය පුද්ගල ඇතුළාන්තය සහ සංස්කෘතික චර්යාධර්ම රටාවේ. කිසියම් පුද්ගලයෙකු විසින් ඇති කරගනු ලබන ක්‍රමානුකූල ලෙස පිළියෙල වූ සාරධර්ම විශ්වාස හා වෙනත් අගනාකම් පිළිබඳ එකතුවක් ලෙස ද පෞරුෂ ගති ලක්ෂණ හැඳින් විය හැකිය.

ඕනෑම පුද්ගලයෙකු සහජයෙන් ම උරුමකරගත් ජීව විද්‍යාත්මක ගති ලක්ෂණවලින් යුක්ත ය. ආත්මාර්ථකාමීත්වය ආක්‍රමණශීලී බව, සමාජ ජීවිතයේ දී සැබෑ ගති ලක්ෂණ නොවීමට සමාජානුයෝජන ක්‍රියාවලියේ දී දඬුවම් මෙන් ම පාරිතෝෂික ලබාදෙයි. ඔහුට ලැබෙන ප්‍රතිචාරය අත්පුඩි ගැසීම හෝ බැණවැදීම විය හැකි ය. මේවා උත්තේජන ලෙස හඳුන්වාදිය හැකි ය. මිනිසා විසින් සංවර්ධනය කොට ගන්නා යහපත් කායික ක්‍රියාත්, මානසික ක්‍රියාත් පෞරුෂය වශයෙන් දක්විය හැකි ය. මේ නිසා පුද්ගලයාගේ කායික හා මානසික ක්‍රියාකාරීත්වය පෞරුෂයේ දී වැදගත් තැනක් ගනියි. සිද්ධාර්ථ කුමාරයා බුදු වන්නට උත්සාහ කළේ මිනිසාත් මිනිස් සිතත් පිළිබඳ ව්‍යාකූල තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් පසුව ය. පුද්ගල පෞරුෂය ක්‍රියාත්මක කරන බලවේගය සිත වන්නා සේම එම සිත නිරන්තරයෙන් ම බාහිර පරිසරය හා සම්බන්ධ වීමෙන් පෞරුෂ වර්ධනය සඳහා වූ මානසික වර්ධනය යහපත් අතට හෝ අයහපත් අතට නැඹුරු කරවයි. එයට හොඳම උදාහරණය වන්නේ සත්තිගුම්භ කථා වස්තුවයි.

එසේ ම ලාංකේය සංස්කෘතිය තුළ සාමූහිකවාදය, ජාතික හා ආගමික, උත්සව මෙන් ම ආපදාපන්න අවස්ථාවල දී එකමුතුකම ඉස්මතු වීම සුවිශේෂ ලක්ෂණ වේ. ලාංකිකයෝ බටහිර ජාතීන් මෙන් මානව කේන්ද්‍රවාදයෙන් මත්වූවන් නොවෙති. බෞද්ධ උත්සවවලට මෙන් ම අන්‍යාගමික උත්සවවලට ජනාධිපතිතුමා ඇතුළු පුරවැසියෝ සහභාගි වෙති. මෙය බෞද්ධ සංස්කෘතියේ එන සහජීවන සංකල්පයයි.

## 3.4 ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියට ඇතිවන බලපෑම්

21 වන සියවස පරිගණකයේ හා අන්තර්ජාලයේ යුගයයි. නූතන ලොව විඥාපන හා ප්‍රතිරූපවලින් පිරී පවතී. මේ සමඟ බිහිවන සන්නිවේදනයේ ජංගමශීලී බව ලොව සියලු සංස්කෘතික සීමා මායිම් අභිභවමින් ඒකීය සංස්කෘතියකට මුළු ලොව ම දිශාගත කිරීමට සමත් වෙයි.

අපි එය විශ්වීයකරණය හා ගෝලීයකරණය යන නම්වලින් හඳුන්වමු. මෙකී සංකල්පය තුළ ලොව කිසිදු සංස්කෘතියකට හුදකලා විය නොහැකි ය. එහි අවසන් ප්‍රතිඵලය මුළු ලොව තුළ ම සමජාතීය සංස්කෘතිය නිර්මාණය වීමයි. මෙකී සංස්කෘතික සමජාතීකරණයේ දී බටහිර ප්‍රබල සංස්කෘතීන්ගේ බලපෑම ඍජුව දක්නට ලැබේ. නූතනත්වය තුළ ශීඝ්‍රයෙන් වෙනස් වන ශ්‍රී ලාංකේය සමාජයේ ගෝලීය සංස්කෘතික ප්‍රවණතාවන්ගේ විවිධ පැතිකඩ හඳුනාගත හැකි ය. රූපවාහිනී වෙළෙඳ දැන්වීම් මගින් අධිපරිභෝජනවාදී සමාජයකට හුරුකර ඇත. වර්තමානයේ ජනප්‍රිය සංකල්පයක් ලෙස ''විශ්ව ගම්මාන'' තේමාව හඳුන්වා දීමට පුළුවන. ගෝලීයකරණය නිසා සිදුවන මෙම සමාජ වෙනස් වීම (Social Mobility) ස්වාභාවික සංසිද්ධියකි. සමාජය යම් විපර්යාසයකට ලක්වන්නේ ද එසේ ම සංස්කෘතිය ද ඊට ගොදුරු වෙයි. එය එකම කාසියක දෙපැත්ත මෙන් පවතී.

සංවර්ධනයේ දියුණුවට පත් වූ ධනවාදී ආර්ථික ක්‍රමය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වෙළෙඳපොළ සකස් කර ගැනීමත්, නව නිෂ්පාදන අලෙවිකර ගැනීමත්, නව යටත් විජිතයන් වෙත එම භාණ්ඩ පුරුදු කිරීමත් ගෝලීයකරණයේ අරමුණු විය.

ක්‍රි.වඃ 1760 - 1830 වර්ෂවල යුරෝපයේ සිදු වූ කාර්මික විප්ලවයේ අතුරු ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ වැඩවසම් සමාජ ක්‍රමය අභාවයට ගියේ ය. ඒ වෙනුවට ධනේශ්වර නව ලිබරල්වාදී සමාජ ආකෘතියක් නිර්මාණය විය. එංගලන්තය මානව කේන්ද්‍රණවාදය අනුව යමින් ඔවුන්ගේ සමාජ සංස්කෘතිය උසස් යැයි උපකල්පනය කරමින් ක්‍රි.වඃ 1815 දී සම්පූර්ණයෙන් ම ශ්‍රී ලංකාව යටත් කරගන්නා ලදී. එතෙක් පැවති ස්වයංපෝෂිත සාම්ප්‍රදායික සරල කෘෂිකර්මාන්තය වෙනුවට අපනයන වැවිලි ආර්ථිකය හඳුන්වා දෙන ලදී. පෘතුගීසීන් හා ලන්දේසීන් ගෙන ගිය වැඩ පිළිවෙළ ඉංග්‍රීසීන් විසින් තවදුරටත් ශක්තිමත් කරන ලදී. සාම්ප්‍රදයික කෘෂිකර්මාන්තය ආර්ථික



නොමිලේ බෙදා හැරීම සඳහා ය

වශයෙන් දුර්වල කරන ලදුව ලාංකිකයින් වතු වගාව සඳහා කම්කරුවන් ලෙස බඳවා ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ මුල් වරට වැටුප් ලබන කම්කරු පංතියක් මේ නිසා බිහිවිය. එය ප්‍රමාණවත් නොවූ විට දී කම්කරුවන් ඉන්දියාවෙන් ගෙන්වන ලදී. මෙම කම්කරුවන්ට අවශ්‍ය කුළුබඩු, රෙදිපිළි, පාන්පිටි, මිලදී ගැනීමට වෙළෙඳ නගර නිර්මාණය විය. භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය මාර්ග හා මහා මාර්ග පද්ධතියක් කොළඹ කේන්ද්‍ර කරගෙන ඉදිවිය. වෙළෙඳ නගර ඉදිවීමත් අපනයන භෝග වගාව නිසා ඉඩම් අහිමි වීමත්, ජල පෝෂක ප්‍රදේශ සිඳීයාමත් නිසා කෘත්‍රිම ආහාර රටාවකට ඇබ්බැහි වීමත්, මත්පැන් හා මත් ද්‍රව්‍යවලට හුරු වීමත් සමඟ ලාංකිකයෝ දිළින්දන් වූහ.

මේ හැර බෞද්ධ විහාරස්ථාන කේන්ද්‍ර කරගත් අධ්‍යාපනය මෙන් ම හින්දු හා ඉස්ලාම් ආගමික ඉගැන්වීම් ද තහනම් කළ බටහිර ජාතීහු කිතුදහම ප්‍රචලිත කිරීමට ක්‍රියා කළහ. ක්‍රි.වඃ 1948 ටොරින්ටන් ආණ්ඩුකාරවරයා ප්‍රකාශ කර සිටියේ ''මිනිසුන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම සඳහා ඉතා හොඳ මාර්ගය නම් අධ්‍යාපනයයි'' ඒ අනුව ක්‍රිස්තියානි පාසල්වලින් අධ්‍යාපනය ලබා බෞතීස්ම ලත් දරුවන්ට පමණක් රජයේ රැකියා ලබා දුන්හ. කෝල්බෲක් - කැමරන් දෙදෙනා ප්‍රකාශ කළේ ''ස්වදේශික පූජ්‍ය පක්ෂය විසින් දෙනු ලබන අධ්‍යාපනය කිසිසේත් ම සැළකිය යුත්තක් නොවන බව ය.''

ඉංග්‍රීසීන්ගෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතියට එල්ල වන අභියෝග තේරුම් ගත් ජාතික නායකයෝ ඊට මුහුණ දිය හැකි අධ්‍යාපනයක් ස්වකීය විහාරස්ථානවල ඇරඹූහ. මෙහි දී හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද නාහිමි, අනගාරික ධර්මපාලතුමා, හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ආදීන් පෙරමුණ ගත්හ. බෞද්ධ විහාරාරාම කේන්ද්‍ර කරගෙන පාඨශාලා 200කට අධික සංඛ්‍යාවක් කුරුණෑගල, රඹුක්කන, නාවලපිටිය, රක්වාන, මාතලේ ආදී ප්‍රදේශවල පවත්වාගෙන ගියහ. කාලීන අවශ්‍යතාවක් ලෙස සලකා ඉංග්‍රීසි අධ්‍යාපනයද ගාල්ලේ මහින්ද, කොළඹ ආනන්ද, මහනුවර ධර්මරාජ, පන්නිපිටියේ ධර්මපාල වැනි ප්‍රධාන විදුහල්වලදී ලබාදෙන ලදි. 1895 ගාල්ලේ විජයානන්ද විහාරස්ථානයේ දී ඕල්කට්තුමාගේ ප්‍රධානත්වයෙන් ඉරුදින දහම් පාසල් ක්‍රමය ඇරඹුණි. සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමා හඳුන්වා දුන් නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති මෙහි දී බොහෝදුරට පිටිවහලක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාල ආරම්භ

විය. 1964 දී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ යෝජනාවක් අනුව පාසල් විෂය මාලාවේ ආගම විෂය ද අනිවාර්ය විෂය මාලාවට එක්වීමෙන් බුද්ධ ධර්මය පාසැල්වල ඉගැන්වීම විධිමත් විය. මේ හැර 2500 සම්බුද්ධත්ව ජයන්තියට සමගාමී ව සෑම විහාරස්ථානයක ම දහම් පාසල් ඇරඹිණ.

ඔගස්ට් කොම්ට් නම් සමාජ විද්‍යාඥයා ඔහු අත්දුටු බටහිර සමාජ විසංවිධානය, සියදිවි නසාගැනීම, දික්කසාද වීම වැනි අපචාර ශ්‍රී ලංකාවේ සිදුවන සිදුවීම්වලින් අත්දකිමින් අපිදු සිටිමු. සමාජ විද්‍යාඥයින් දක්වන ආකාරයට මානව පවුලේ තත්ත්වය හා කාර්යභාරය වෙනස් වෙමින් පවතී. මෙම සමාජ පරිණාමය නිසා සාම්ප්‍රදායික ජාතික උත්සව හා සංස්කෘතික ක්‍රීඩාවන් පවා අභියෝගයට ලක් ව ඇත. අවුරුදු උත්සවයකට ඇති සමාජ විද්‍යාත්මක වටිනාකම පවා ඇගයීමට ලක් නොවේ. ආවාහ විවාහ උත්සව පවා දෑවැදි - මුදල් මත සිදුවෙයි. යුවතිපති දෙදෙනා හා එකිනෙකා සරණ යාම වෙනුවට දේපොළවලින් වන්දි ගෙවති. ගුණදම් නොමැති සමාජයක මංගල චාරිත්‍ර පවා සිදුවන්නේ ආගමික චාරිත්‍රානුකූල ව නොවේ. මෙම ප්‍රවණතාව බෞද්ධයින් අතර බහුල ය. එහෙත් පල්ලියේ, කෝවිලේ තවමත් එම චාරිත්‍ර සිදුවෙයි.

වෙසක් දින ප්‍රතිපත්ති පූජාව පැවැත්වීම වෙනුවට ජනප්‍රිය බුදුසමය අනුව යමින් වෙසක් සුභ පැතුම්, වෙසක් තොරණ, දන්සැල් යනාදියට ප්‍රමුඛතාව දීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. සාරධර්ම පිරි වැඩසටහන්, පුවත් ජනමාධ්‍ය මගින් ප්‍රචාරය වන්නේ යම් ප්‍රමාණයක වාණිජකරණයකට ලක්වීමක් ද සහිතව ය. ටෙලිනාට්‍ය මගින් පවා දෙන පණිවිඩය තුළද බොහෝ විට බිඳ වැටුණු පවුල් පසුබිම්, අනියම් සම්බන්ධතා, දික්කසාද වීම්, දෑවැදි  ප්‍රශ්නය ඉස්මතු කරයි. මෙසේ විමසා බැලීමේ දී ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික දේහයේ මූලය වූ සාරධර්ම හා සාමූහික ලක්ෂණ ගෝලීය ප්‍රවණතා හමුවේ අභියෝගයට, විවිධ විචලනයන්ට ලක්වෙමින් පවතින බව පෙන්වා දිය හැකි ය.

## අභ්‍යාසය

1. සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඇසුරින් එහි ස්වභාවය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

2. කෙටි සටහන් ලියන්න.

- සංස්කෘතික ගැටුම
- සංස්කෘතික විසරණය
- සංස්කෘතික ලැග්ම

3. සංස්කෘතිය හා සමාජය අතර බැඳීම කෙරෙහි බලපාන සාධක 3 කි. එම සාධක අනුව සංස්කෘතිය වෙන්වන ආකාරය ලාංකික සමාජය ඇසුරින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

4. බෞද්ධ සංස්කෘතිය වෙනස්වීම කෙරෙහි නූතන බලපෑම කෙබඳුවේ දැ යි කාලීන කරුණු ඇසුරින් පැහැදිලි කරන්න.

# 04 පුද්ගලයා හා සමාජය

## 4.1 ශ්‍රී ලංකා සමාජය සහ එහි පරිණාමය

ශ්‍රී ලංකා සමාජයේ ප්‍රභවය හා පරිණාමය පිළිබඳ ව විමර්ශනයක යෙදෙන විට පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික සාක්ෂිවලට අනුව මුල් ම ජනාවාස බිහිවූයේ අවුරුදු එක්ලක්ෂ විසිපන්දහසකට පමණ පෙර සිට බව පැවසේ. ලක්දිව පැවති සමාජ ව්‍යුහය ගැන මහාවංශය හා චූල වංශය යන වංශ කථා තොරතුරු ප්‍රධාන තැනක් ගනී. සමන්තපාසාදිකා, රාජරත්නාකරය, බෝධි වංශය, පූජාවලිය සහ ජාතක කතා වැනි දේශීය සාහිත්‍යමය කෘති ද, ලංකාවතාර සූත්‍ර, රාජ තරංගනී වැනි විදේශීය කෘති ද, මේ හැරුණු විට හියුංසියැං හා පාහියන් වැන්නවුන්ගේ දේශාටන වාර්තා ද, සීගිරි ගී, ජන කථා, ජන කවි, හොඳම මූලාශ්‍රය ලෙස පිළිගත හැකි ය.

ශ්‍රී ලංකා සමාජයේ පරිණාමය අපට ප්‍රධාන සංකල්ප දෙකක් ඔස්සේ විස්තර කළ හැකි ය.

1. ප්‍රාග් බෞද්ධ යුගය
2. මහින්දාගමනයට පසු යුගය

යනුවෙන් ය.

අතීත යුගයේ සිට මිනිසුන් ප්‍රාථමික ගති ලක්ෂණ ඇති ම්ලේච්ඡ ජන කොටසක් ලෙස හැඳින්වෙයි. ඔවුහු නිට්ටාවෝ, අසුරයෝ, රාක්ෂයෝ සහ නාගයෝ ලෙස ඉතිහාසඥයෝ හඳුන්වති.

ඓතිහාසික සාක්ෂිවලට අනුව ශ්‍රී ලංකාවේ මුල් ම ශිෂ්ට ජනාවාස පිහිටුවීම කෙරෙහි ද ඉන්දීය බලපෑම සෘජුව ම එල්ල වී ඇත. ඒ අනුව මෙම ජනාවාස පිහිට වූ සාමාජිකයින් වර්තමානයේ බටහිර පකිස්ථානයට අයත් බලුකිස්ථානයේ සිට ලංකාවට සංක්‍රමණය වූ බවට සාක්ෂි ලැබී ඇත. ක්‍රිස්තු පූර්ව යුගවල දී සිට ඉන්දීය ආර්ය ජනයා මෙහි එන්නට පෙළඹෙන්නට ඇතැයි විශ්වාස කරනු ලැබේ. මහාවංශය අනුව ශ්‍රී ලංකාව යක්ෂ ජනයාගෙන් මුදවා ගනු ලැබුවේ විජය කුමරු විසිනි. පසුව සිංහල සමාජය ගොඩනැගුනු අතර පසු කාලයේ රාජ්‍යත්වය තහවුරු කර ගැනීමට මව් රටින් සහය ලැබුණි. විජය රජතුමා විසින් සමුද්‍රාසන්නයේ තම්මැන්නා නුවර සංවර්ධනය කළේ ය. විජය රජතුමාගේ අමාත්‍යවරුන් වන උරුවේල ඇමතියා උරුවේල

නගරය ද උපතිස්ස ඇමති විසින් උපතිස්ස නගරය ද අනුරාධ ඇමති විසින් අනුරාධ නගරය ද ඉදිකළ බව දීපවංශයේ සඳහන් වෙයි.

විජයගේ අභිෂේකය සඳහා මධුරා පුරයෙන් ක්ෂත්‍රිය කන්‍යාවක් එවූ බවත් ශ්‍රී ලංකාව කාර්මික වශයෙන් සංවර්ධනය කිරීම සඳහා ශිල්ප කුල දහ අටක් එවූ බවත් මහාවංශය තහවුරු කරයි. මේ හැරුණු විට භූ විද්‍යාත්මක පර්යේෂණවලට අනුව ඉතිහාසයෙහි මුල් අවධියෙහි ශ්‍රී ලංකාව ඉන්දියාවේ ඩෙකැන් සානුව සමඟ සම්බන්ධතා පැවතියේ යැයි විශ්වාස කරනු ලැබේ. මේ බව පාහියන් "හියුංසියැං" වැනි පෙරදිග දේශගවේෂකයන්ගේ වාර්තාවලින් ද සනාථ වේ. ඔවුන් පවසන ආකාරයට ලංකාව හා ඉන්දියාව අතර යමෙකුට පා ගමනින් යාමට හැකි තත්ත්වයෙන් පටු නොගැඹුරු මුහුදු තීරයක් එම අවධිය වනවිට තිබී ඇත. දෙරට අතර පරතරය වර්තමානයේ කි.මී 32 පමණ වේ. මෙලෙස ලංකාව අසල්වාසී ඉන්දියාවට සමීපව පිහිටීම හේතුවෙන් අතීතයේ පටන් විවිධ සමාජ හා සංස්කෘතික බලපෑම් උරුම වී ඇත. ඒ අනුව ආගම්, සාහිත්‍ය, කලා ශිල්ප, ගෘහ නිර්මාණ, කෘෂි ආර්ථිකය සහ කුල ක්‍රමය යනාදි බොහෝ දෑ අප රටට දායාද විය.

එසේ ම ස්වාභාවික වරායන් කිහිපයක් දිවයිනෙහි විවිධ ප්‍රදේශයන්හි පිහිටා තිබීම තවදුරටත් ලංකාව නාවික නැවතුම්පලක් වීමට තුඩුදුන් වැදගත් සාධකයක් විය. එසේ ම පෙරදිග ලෝකයේ වෙළෙඳ මධ්‍යස්ථානයක් හැටියටද ලංකාව ප්‍රසිද්ධ ව තිබුණු බවට දිවයිනේ විවිධ ප්‍රදේශවලින් හමු වූ කාසි වර්ග මගින් සනාථ වේ. මෙම කාසි චීන, ඉන්දීය, අරාබි, ග්‍රීක සහ රෝම වශයෙන් වර්ග කළ හැකි ය. ක්‍රි.පූ 2 වන සියවසෙන් ටොලමි නැමැති ග්‍රීක ජාතිකයාගේ වාර්තා අනුව ද, ඉතිහාසඥයින්, පුරාවිද්‍යාඥයින් විශ්වාස කරනා පරිදි ද මෙම මුදල් වර්ග මෙරටට පැමිණියේ වෙළෙඳ ගනුදෙනුවල දී බව සනාථ වේ.

ආදිතම ලාංකේය සමාජය අධි ස්වාභාවික බලවේග කෙරෙහි විශ්වාස තබා ලෞකික අපේක්ෂා ඉටුකර ගැනීමේ අපේක්ෂාවන් හිරු - සඳු, අව් - වැසි, ගස්-ගල්, කෙරෙහි බියසැක මුසුව බහුමානයෙන් සැලකූහ. සද්ධර්මාලංකාරයේ එන ශිව-විෂ්ණු ඇදහීම දේවත්වය පිළිබඳ සංකල්පයේ උච්චතම අවස්ථාවයි. පූජාවලියේ කියන පරිදි තණකොළවල පවා දෙවියන් වෙසෙතියි එකල වැසියෝ විශ්වාස කළහ. ගම්බාර, අය්යනායක ආදී ප්‍රදේශවලට අධිගෘහිත දෙවියන්ට ද සකල වැඳුම් පිදුම් කළහ. ක්‍රි.පූ 03 වන ශතවර්ෂයේ දී ඉපැරණි ලංකා සමාජය මීළඟ වෙනසට භාජනය වූයේ බෞද්ධාගම පැමිණීම හා වැඩවසම් කුල ක්‍රමය යටතේ දේශීය අවශ්‍යතාවන්ට අනුව කිසියම්

සමාජමය කෘත්‍යයක් පැවරීම නිසාය. මේ නිසා සමාජයේ පැවැත්මට අවශ්‍ය නිෂ්පාදන හා සේවා කාර්යයන් වියවුලකින් තොර ව සම්පාදනය විය. මේ තත්ත්වය යටතේ ඉපැරණි ලංකා සමාජය ස්වයංපෝෂිත ඒකකයක් ව පැවති බව පෙන්වාදිය හැකි ය. මීට අමතරව 18 කුලයේ ව්‍යුහය පදනම් ව සමාජ සංවිධානද ගොඩ නැගුණි.

අවිහිංසාවාදී බෞද්ධ ආගමික ඉගැන්වීම් අනුව වඩාත් සාමකාමී සහ සාධාරණ සමාජ ක්‍රමයක් සඳහා මං සළකුණු ලැබී ය. එතැන් සිට සිරිත් විරිත් ආදී සියල්ල බෞද්ධාගමික මුහුණුවරකින් සකස් විය. සිංහල සමාජයේ සාම්ප්‍රදායික අධ්‍යාපනය බෞද්ධ භික්ෂුවගේ ප්‍රධානත්වයෙන් සංවර්ධනය වීම ඇරඹුණි. එම තත්ත්වය සමාජයෙහි තවත් වෙනස්වීම් රැසකට මුලපිරීමක් විය. මෙම ප්‍රගමනයට එරෙහි ව එල්ල වූ ප්‍රධානතම බාධකය වූයේ දකුණු ඉන්දීය ආක්‍රමණයන් ය. ඉන්දියානු ආක්‍රමණිකයෝ අනුරාධ ග්‍රාම හා පොළොන්නරු රාජධානිය විනාශ මුඛයට පත් කළහ. හින්දු සභ්‍යත්වයේ ආභාසය අනුව බෞද්ධයා ද දෙවියන් යදින්නෙකු බවට ක්‍රමයෙන් පත්විය.

ශතවර්ෂ 15ක් පමණ පැවති වියළි කලාපයේ ජනාවාසයන් ද, වාරි ශිෂ්ටාචාරයෙන් ස්වයංපෝෂිත සමාජ ක්‍රමය ද, කෘෂිකර්මය, කලාව, දේශපාලනය ආදී වූ සෑම අංශයක ම බිඳවැටීමක් දකුණු ඉන්දීය ආක්‍රමණයන්ගේ ප්‍රතිඵලයක් හැටියට දක්නට ලැබුණි. මහාචාර්ය ලෙස්ලි ගුණවර්ධන මහතා සඳහන් කරන ආකාරයට ආක්‍රමණිකයන්ගේ බලපෑම ප්‍රබල ව එල්ල වූයේ වැව් අමුණු ඇතුළු වාරිමාර්ග පද්ධතියේ ම බිඳ දැමීම කෙරෙහි බව ය. එම නිසා රජු ඇතුළු ජනතාව බෙලහීන වීම රාජධානි බිඳවැටීමට හේතු විය. මෙලෙස රජරට විශාලතම රාජධානිය බිඳ වැටීමත් සමග අනෙක් ප්‍රධානතම ජනාවාස වූ රෝහණ රාජධානිය දේශපාලනමය වශයෙන් විදේශ ආක්‍රමණිකයන්ට එරෙහි ව කටයුතු කිරීම සඳහා සංවිධානය වූ ප්‍රදේශය බවට පත්විය. මෙය දේශපාලනික වශයෙන් සිංහලයා භාවිත කරන ලද උපක්‍රමයක් හැටියට හැඳින්වීමට පුළුවන. මීට අමතර ව පැරණි ලංකාව එහි භූ විෂමතාවන්ට අනුව "රුහුණු" , "මායා" , "පිහිටි" යනුවෙන් කොටස් තුනකට බෙදා තිබූ බව ද දක්නට ලැබේ. මෙයින් මධ්‍ය කඳුකරය හෙවත් මායාරට ඓතිහාසික අවධියේ ද විශාල ජනාවාසයක් නොවීය. එය විදේශීය සතුරු ආක්‍රමණිකයන්ගෙන් සිංහල රජ දරුවන් ආරක්ෂා වීමට භාවිත කරනු ලැබී ය. වර්ෂාව අධික තෙත් කලාපීය දේශගුණයකින් යුක්ත වූ නිසා ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂාවීම සිදුවිය. ලංකාවේ ප්‍රධානත ම ගංගා වන මහවැලි,

කැලණි, කළු, වලවේ යන ගංගා ආරම්භ වන්නේ ශ්‍රී පාද කඳු පන්තිය ඇසුරු කරගෙන ය. වැසි රහිත කාලවල කුඩා දිය පාරවල්වල ජලය අඩු වී හෝ සිඳී යාම නිසා මුල් ම කාලයේ ගම් මට්ටමින් කුඩා වැව් තනා ගැණුනි. මේ සඳහා සිංහලයා අනුගමනය කළේ ස්වාභාවික ජල පාරක් හරස් කර ගැනීම ය. මෙය පසු කාලයේ දී එනම් ක්‍රි.ව. 2 ක්‍රි.ව. 3 වන ශතවර්ෂයෙන් පසුව මහා පරිමාණ වැව් ඉදිකර ගැනීම දක්වා ව්‍යාප්ත විය. කෘෂි කර්මාන්තයට අවශ්‍ය ජලය බෙදා දීමට පත්කළ නිලධාරීන් සිටි බව පැරණි සෙල්ලිපිවල දැක්වේ. ලංකාවේ පැරණි සභ්‍යත්වය තරම් දැනුමකින් යුතු ලෝකයේ වෙනත් ශිෂ්ටාචාරයක් හමු නොවන බව ඉංග්‍රීසි ජාතික ඉතිහාසඥ ටෙන්ට් නැමැත්තා පවසන්නේ එම නිසා විය හැකි ය. වසර දහස් ගණනක් පුරා ලක්වැසියන් විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් බෞද්ධ සමාජ දර්ශනය ඔස්සේ සාමකාමී මෙන් ම තෘප්තිමත් වූද, සමෘද්ධිමත් වූද, දිවිපෙවෙතක් ගත කිරීමට සමත් වූ බව ඉතිහාසය තුළින් පැහැදිලි වෙයි. මෙම තත්ත්වය විශාල වෙනසකට භාජනය වන්නට වූයේ බටහිර ආක්‍රමණ විසින් ශ්‍රී ලංකාව අනුක්‍රමයෙන් උපායශීලී ව යටත් කර ගැනීම ආරම්භ වූ දින සිටය. හෙළ රජකම මුල්කොට ඇති වූ අභ්‍යන්තර ආරවුල් හේතුවෙන් බටහිර ආක්‍රමණිකයන්ට මෙරට තම බලය තහවුරු කර ගන්නට අවස්ථාව උදා වූ බව පැහැදිලි වේ.

පෘතුගීසින් හා ලන්දේසින් අභිබවා ඉංග්‍රීසින් විසින් තම බලය පෙරදිග ලෝකය පුරා තහවුරු කර ගනිද්දී ශ්‍රී ලංකාව ද ක්‍රි.ව 1815 වසරේ දී අවාසනාවන්ත ලෙස ඔවුනට යටත් විය. මෙරට ස්වාධීන කෘෂි ආර්ථිකය විනාශ කොට ඒ වෙනුවට වැවිලි කර්මාන්තය ආරම්භ කරමින් ඒවායෙහි කම්කරුවන් ලෙස විදේශීය ජනතාව සේවයට ගෙන ඔවුන්ගේ වහලුන් බවට පත්කර ගත්හ.

ඔවුන් විසින් බෞද්ධ අධ්‍යාපනය අභියෝගයට ලක් කරමින් මිෂනාරි අධ්‍යාපනය ආරම්භ කරන ලදී. ක්‍රි.ව. 1505 සිට ක්‍රි.ව. 1948 දක්වා පැවති බටහිර ආධිපත්‍යයට යටත් වූ ලංකාව අවුරුදු 450 ට අධික කාලයක් යටත් විජිතයක් ව පැවතුණි. මේ අනුව ලංකා සමාජය විවිධ විපර්යාසයන්ට ලක්වෙමින් බටහිර සංස්කෘතික ලක්ෂණ විසරණයට භාජනය විය.

## 4.2 පැරණි සමාජයේ ව්‍යුහය

පැරණි ශ්‍රී ලාංකේය සමාජයේ ව්‍යුහය සකස් වී තිබුණේ වැව, ගම, පන්සල කේන්ද්‍රය කරගෙන ය. මේ පිළිබඳ ව බොහෝ සමාජ විද්‍යාඥයන්ගේ හා සමාජ මානව විද්‍යාඥයන්ගේ අධ්‍යයන වැදගත් වෙයි. ඔවුන් අතර **ඊ. ආර්. ලීච්, නූර් යාල්මාන්, නිව්ටන් ගුණසිංහ** හා **ගණනාථ ඔබේසේකර** වැනි විද්වතුන් ඉදිරිපත් කළ අදහස් මෙහිදී ප්‍රධාන වෙයි. එම අදහස් පොදුවේ සලකන කල පැරණි ලාංකේය සමාජය සරල සමාජ හා ආගමික පසුබිමක් පැවති, ස්වාධීන වූත් පවුල මත පදනම්වූත් නිෂ්පාදන රටාවක් සහිත ස්වයංපෝෂිත කෘෂිකාර්මික ආර්ථිකයකින් යුක්ත වූ බව පෙන්වා දිය හැකිය.

ලංකා සමාජයේ සමාජ ආර්ථික පසුතලයට අනුව එය ප්‍රාථමික ගැමි සමාජයක් බව ඊ. ආර්. ලීච්, ගණනාථ ඔබේසේකර වැනි මානව විද්‍යාඥයෝ පෙන්වා දෙති. ලංකාව නිදහස ලබන විට ජනගහනයෙන් 53% කගේ ම ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය විය. පැරණි සමාජයේ විස්තාරිත හෝ බද්ධ පවුල් ක්‍රමය ක්‍රියාත්මක වූ අතර වෘත්තිය පාදක කුලය මුල් කොටගත් පවුල් ව්‍යුහයක් පැවතුණි. ආරෝපිත තත්ත්වයන් මත සමාජ පදනම සකස් වී තිබුණි. ගැමි පවුලේ ප්‍රධානියා වැඩිමහලු පිරිමියා වන අතර පිතෘ මූලික පවුල් ක්‍රමයක් වූ බව පැහැදිලි වෙයි.

ශ්‍රී ලංකාවේ ගම පිළිබඳ තොරතුරු සපයන An Historical Relation of Ceylon නම් කෘතියේ රොබට් නොක්ස් විසින් පුරාණ ගම දක්වන්නේ "මෙම දීපයෙහි යම් යහපත් ගමක් ඇතොත් එහි විහාරයක් හා දේවාලයක් ඇත. එම ගම බැඳී යන පරිද්දෙන් ගෙවල් එකිනෙකට යා කොට පෙළට නිර්මාණය කර ඇත්තේ ය." රොබට් නොක්ස් විසින් ඉදිරිපත් කර ඇති කථනයට අනුව පුරාණ ගමක යථා ස්වරූපය අවබෝධ කර ගත හැකි ය. එමගින් පුරාණයේ සිට ගමත් පන්සලත් අතර පැවති අවියෝජනීය සම්බන්ධතාව කෙබඳු දැයි සනාථ වන අතර ආගමානුකූල ජීවිතය මෙන් ම සාම්ප්‍රදායික වෘත්තීය බව සහ සරල සමාජ ජීවිතය ද මෙයින් විවරණය කරයි. පන්සල මුල් කරගෙන ධාර්මික ව ජීවිකාව ගෙන යමින් සාමූහික දිවිපෙවෙතක් අතීත ගැමියා ගත කළේ ය. එකල නිවාසවල පිහිටීම නූතන නිවාස මෙන් සංකීර්ණ නොවූ අතර නිදහස් පරිසරයක සුවය භුක්ති වින්දේ ය. ඒක පුද්ගල ඉඩම් ප්‍රමාණය වර්තමානයට සාපේක්ෂ ව ඉහළ ප්‍රමාණයක් ගත්තේ ය. වර්තමානයේ මෙන් ඉඩම් හිඟය නිසා ඇතිවන සමාජ ප්‍රශ්න එකල නොවී ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

ශ්‍රී ලංකාවේ පුරාණ ග්‍රාමීය සමාජයේ පවුල් ක්‍රමය කෘෂිකර්මයට යෝග්‍ය ආකාරයට සැකසී තිබුණි. එනම් පුරාණ ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ පවුල් ක්‍රමය ජනාවාසයන්හි ඒකකය වූ අතර එවැනි පවුල් කිහිපයකින් සංයුක්ත වූ නිවාස සමූහයක් විය. මේ අනුව සාමූහික ජීවිතය කෘෂිකර්මාන්තයට අවශ්‍ය ශ්‍රමය තම නිවාස මගින් ලබා ගැනීමක් ලෙස මෙය පෙන්වා දිය හැකි ය. ගැමියන් තමන්ගේ සියලු දේ ගොඩනගා ගන්නේ කෘෂිකර්මය හා බැඳි ජීවන රටාවට ගැලපෙන ආකාරයට ය. වැව ආර්ථික සමෘද්ධියේ ප්‍රමාණය තීරණය කරන්නේ කෘෂිකර්මයට අවශ්‍ය ජලය කලට වේලාවට ලැබෙන්නේ වැවේ රැඳි ජල ප්‍රමාණය මත බැවිනි. බොහෝ විට නිවසක අතීතයේ වී බිස්සක් පැවතිණි. එකල ගොවියාගේ අතිරේක ශ්‍රම මූලාශ්‍රය වූයේ ගවයා ය. ගොවිතැන් කිරීමේ දී මුල සිට අග දක්වා ම සත්ත්ව ශ්‍රමය අවශ්‍ය වූ අතර ඒ නිසාම ගව සම්පත වත්කම දැක්වීමේ දර්ශකයක්ද විය. වී ගොවිතැන සමාජ හැසිරීම් රටා විශ්වාස, ඇදහිලි ආදිය ඇසුරින් ද ගැමියා බැඳී තිබිණ. ඒ අනුව සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර අනුව සිංහල සංස්කෘතිය සමගින් තම ජීවිකාවද සාමූහික ව ඉටුකර ගනිමින් සරල ව ජීවත් වූයේ එකිනෙකා සමඟ ළෙන්ගතු සබඳතා ඇතිකර ගනිමිනි. එය බොහෝ දුරට යාන්ත්‍රික ඒකාබද්ධතාවෙන් යුක්ත වූ බව පෙනේ. වී වගාවට අමතර ව තවත් බොහෝ දේ වගා කළහ. එසේ ම ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදයික ගම හඳුනා ගැනීමේ දී ආචාර්ය නන්දදේව විජේසේකරගේ "ලංකා ජනතාව" හා පූජ්‍ය බද්දේගම විමලවංස හිමියන් ලියූ ''අපේ සංස්කෘතිය'' නම් කෘතිවලින් ඉදිරිපත් වන විස්තර ප්‍රයෝජනවත් වෙයි.

එහි දී ග්‍රාමීය සම්බන්ධතා ජාලය මනා ව විග්‍රහ වේ. බොහෝ සෙයින් ගම පිහිටා ඇත්තේ කුඹුරු යායවල් හා ගංගා ඇල දොළ අසල ය. ස්වාභාවික පරිසරය මත පදනම් වූ කෘෂිකාර්මික ආර්ථික රටාවකට අනුව හැඩ ගැසුණු ජන සමූහයකින් ගම සමන්විත ව තිබුණි. අතිශය හුදකලා වූ සරල දිවිපෙවෙතක් ගත කළ ඔවුහු කුඩා ප්‍රමාණයේ මැටියෙන් තැනූ නිවෙස්වල ජීවත් වූහ. ඔවුහු සමාජ සම්බන්ධතා ගොඩනගන්නේ ආර්ථික හා ඥාතිමය පදනමක් සහිතව වූ අතර ස්වකීය වෘත්තීය පදනමට ආවේණික කුල ක්‍රමය තුළ ආවාහ විවාහ චාරිත්‍ර පැවැත්වූ බව ද පෙනේ.

ගමේ පාලනය රජුගේ නියෝජනයක් හරහා සිදුවුවද පන්සලේ වැඩිහිටි භික්ෂූන් වහන්සේ බොහෝ ගැටලුවල දී මැදිහත්කරුවකු හෝ විනිශ්චයකරුවකු ලෙස අගතියෙන් තොර ව කටයුතු කිරීම කැපී පෙනිණි. වෛද්‍ය කර්මය, නක්ෂත්‍රය, භාෂා ශාස්ත්‍රය බොහෝ දුරට සංඝ සමාජය සතු විය.

ගම් තුළ හෝ ගම් කිහිපයකට එකක් වශයෙන් ඒ ඒ වෘත්තීය ප්‍රවණතා සහිත කුළ ක්‍රමයට අනුගත පවුල් කීපයක් ද විය. ශාන්ති කර්ම, ද්වාරකර්ම චාරිත්‍ර, අභිචාරමය කටයුතු ආදියේ දී මෙම කුල පරම්පරාගත දැනුම හා ශ්‍රමය ඉතා වැදගත් විය. අතැම් වෘත්තිය කුලවල ජනතාව කෘෂිකර්මාන්තයේ නොයෙදුණ ද සෙසු ගම්වැසියෝ එම පවුල් පෝෂණයට ප්‍රමාණවත් භවභෝග ඔවුන් වෙත ප්‍රදානය කළහ. ඇතැම් විට රජුගේ සේවාකම්වල නියුතු පවුල්වලට නින්දගම් ප්‍රදානය කිරීම ද කැපී පෙනුණි.

විහාර දේපල ආදියේ පැවැත්මට අවශ්‍ය ආර්ථික සවිය ද මෙම භූමි පැවරුම් මත සිදු වූ අතර එම භූමිය අඳයට වගාකර ඉන් කොටසක් ආයතන වෙත ප්‍රදානය කිරීමට ඔවුහු බැඳී සිටියහ. රාජ්‍යයේ ප්‍රධාන වගකීම් අතරට බුදු සසුන රැකීමත් කෘෂිකර්මාන්තයේ දියුණුව සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත් ඇතුළත් විය. වගා කන්නයෙන් බැහැර කාලය තුළ රාජ්‍ය සේවයට කැඳ වූ අතර එම ශ්‍රමය භාවිත කරමින් වාරි කර්මාන්ත, විහාර කර්මාන්ත ආදිය මහා පරිමාණයෙන් සිදු වීම ද අතීත සමාජයේ කැපී පෙනෙන ලක්‍ෂණ විය.

යටත් විජිත පාලනයත් සමඟ මෙම සරල හා නිෂ්ටාගත සමාජ රටාව බිඳ වැටුණු අතර ගුණාත්මක බව පසෙකලා ආර්ථික අගයයන් මත සියල්ල තීරණය වීමට මග පෑදුනි. වෙහෙර විහාරවලට අයත් දේපල රාජ සන්තක කිරීමෙත් භික්‍ෂූන් වහන්සේලාට ඇති වූ හිරිහැර නිසාත් සශ්‍රික, ස්වයංපෝෂිත සමාජ රටාව බිඳ වැටුණි. පන්සල් ඇසුරේ තිබූ දැවැන්ත ශාස්ත්‍රීය ධනය හිංසාව දරාගත නොහැකි තැන ගිහි බවට පත් යතිවරුන් මගින් ගිහි සමාජය අතට පත්වීම මෙම යුගයේ දී සිදු වූවකි. පංචශීල ප්‍රතිපත්තිය මූලික සමාජ ක්‍රමය බිඳවැටී දැඩි ආර්ථික ඇගයුමකට ලක්වීමත් සමග මානව දයාව, සාමය, සංහිඳියාව උතුරා යමින් පැවති සමාජ ක්‍රමය දැඩි තරගයකට ලක්වීම පසු කාලීනව විශාල සමාජ පෙරළියකට හේතු විය.

## 4.3 ශ්‍රී ලාංකික සමාජයේ නූතන ව්‍යුහය

සමාජය දිනෙන් දින මොහොතින් මොහොත වෙනස් වෙමින් සරල තත්ත්වයේ සිට සංකීර්ණ තත්ත්වයට ගමන් කරයි. සමාජ මානව විද්‍යාඥයින්ගේ අධ්‍යයන අතර සරල අවස්ථාව හා සංකීර්ණ අවස්ථාව යනුවෙන් විග්‍රහ කරමින් ඔවුන් පවසන්නේ මානව සමාජය හා සංස්කෘතිය පවතින්නේ කුමන කාලයක් ද එතෙක් පැවැති තත්ත්වය සරල වන අතර, පවතින තත්ත්වය සංකීර්ණ සමාජ අවස්ථාවක් ලෙස ය. මෙය සමාජ විද්‍යාත්මක විග්‍රහයක් මගින් මෙසේ පෙන්වා දිය හැකි ය. එමිල් ඩුර්කයිම් ගේ යාන්ත්‍රික ඒකාබද්ධතාවයේ සිට ඓන්ද්‍රිය ඒකාබද්ධතාවයත්, ෆර්ඩිනන්ඩ් ටෝනිස්ගේ ප්‍රජාව සහ සමාජය දැක්වීමත් ඒ අතර කැපී පෙනේ.

ශ්‍රී ලාංකික සමාජයේ නූතන සමාජ ව්‍යුහය විග්‍රහ කිරීමේ දී එම සමාජ ව්‍යුහය සෑදී තිබෙන ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සමාජ හා සංස්කෘතික අංගයන්ගේ සංකලනයෙන් බව පෙන්වාදිය හැකි ය. එසේ ම සමාජ සංස්ථාවක, න්‍යෂ්ටික පවුල, ආර්ථිකය, දේශපාලනය, ආගම, අධ්‍යාපනය නීතිය හා රාජ්‍ය නිලබලය යනුවෙන් ද නූතන සමාජ ව්‍යුහය විවිධ විචලනයන්ට ලක්වෙමින් පවතින බව පෙන්වාදිය හැකි ය.

මෙහි දී ජනගහනය වැඩිවීමත් සමග ඉල්ලුම සැපයුම අතර විෂමතාව මත විවිධාකාර වර්ධනයන් හා විෂමතාවන් දක්නට ලැබේ. මෙයට සමගාමී ව නූතන වාණිජ තරගය හේතුවෙන් මෙම ක්‍රියාවලිය වේගවත් වූ අතර විවෘත ආර්ථිකය, ප්‍රවාහනයේ දියුණුව, හරිත විප්ලවය ආදිය හේතු කොට ගෙන සංස්කෘතික සාධක වෙනස් වීමත් සංකීර්ණ භින්න රුචික සමාජ අවශ්‍යතාවන් පදනම් කරගෙන නොයෙක් සමාජ විරෝධී ක්‍රියාවන්ට පෙළඹීමත් දක්නට පුළුවන.

මේ අනුව සමාජ පද්ධතියේ බිඳ වැටීමක් පෙන්නුම් කරන අතර සමාජ ප්‍රශ්න අතර මත් ද්‍රව්‍ය භාවිතය, සියදිවි නසා ගැනීම්, ළමා අපයෝජන, ගණිකා වෘත්තිය ආදිය හිස ඔසවා ඇත. එමිල් ඩුර්ක්හයිම් ගේ න්‍යාය සැලකීමේ දී ජනගහන වර්ධනය, ශ්‍රම විභජනය, සදාචාර පාර්ශ්වයේ වෙනස් වීම් වැදගත් වී ඇති ආකාරය ලාංකික සමාජය ඇසුරෙන් ද පෙන්වා දිය හැකි ය.

මේ ආකාරයෙන් නූතන සමාජ ව්‍යුහය වෙනස් වීම ආරම්භ වන්නේ යටත් විජිත යුගය ආරම්භයත් සමග සාම්ප්‍රදායික ප්‍රාථමික ගැමි සමාජය විවිධ විපර්යාසයන්ට හා බාහිර බලපෑම්වලට හසුවීමත් සමග ය. 1505 දී



නොමිලේ බෙදා හැරීම සඳහා ය

පෘතුගීසීන්ගෙන් ආරම්භ වී ලන්දේසි හා ඉංග්‍රීසි යුගය, එනම් 1815 මුළු රට ම බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට ගොදුරුවීමේ සිට එනම් වසර 2000ක් ඉක්ම වූ සමස්ත සමාජ සංවිධාන ස්වරූපය එතැන් සිට පූර්ණ වාණිජ අර්ථ ක්‍රමයක් දක්වා ද, සංස්කෘතිය බටහිරකරණයට ලක්වීම ද සිදු වූ අතර රාජකාරි ක්‍රමය අහෝසි කොට නිදහස් ශ්‍රම වෙළෙඳපොලක් ඇති විය. වැඩවසම් ආර්ථික ක්‍රමය වෙනුවට ධනවාදී ආර්ථික ක්‍රමය ස්ථාපනය විය. භාණ්ඩ ප්‍රවාහන ක්‍රමය මුදල්මය ආර්ථික ක්‍රමයන් ද වර්ධනය විය. යටත් විජිතකරණය අවස්ථාව වන විට සහ ඉන්පසුව සමාජ වෙනස්කම් සඳහා හේතු කිහිපයක් බලපෑවේ ය.

1. ඉඩම් ප්‍රතිපත්ති
2. සමාජ සුභසාධනය
3. විවෘත ආර්ථික ප්‍රතිපත්ති
4. ග්‍රාමීය සමාජ ව්‍යුහය වෙනස් වීම

අධිරාජ්‍යවාදීන්ගේ ඉඩම් ආධිපත්‍ය නිසා ශ්‍රී ලාංකික සමාජ ඉතිහාසයට දැඩි බලපෑමක් එල්ල විය. මුඩු බිම් පනත මගින් වාණිජ කෘෂි වගා ඉඩම් පිහිට වීය. පොහොර සහ වගාරක්ෂණ ක්‍රම, අස්වනු සඳහා සහතික මිලක් ලබාදීම සහන මිලක් යටතේ යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම නිසා කෘෂිකර්මය තුළ වෙනසක් ඇති විය. සෞඛ්‍ය සේවාව යටතේ රෝහල් පද්ධතිය වර්ධනය විය. මැලේරියා මර්දනය නිසා වියළි කලාපීය ගොවි ජනගහනය පෙරට වඩා දියුණු තත්ත්වයකට පැමිණියේ ය.

එසේ ම 1977 හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තීන්, එතෙක් පැවති ආරක්ෂණවාදී සමාජ ව්‍යුහයත්, කෘෂිකර්මයත් පරිහානියට පත් කරන්නට විය. මෙය සමාජ ආර්ථික සංස්කෘතික වෙනස්වීම් රැසක් ඇති කරන්නට හේතු විය. එසේ ම ග්‍රාමීය - නාගරික සංක්‍රමණ මෙන් ම මැදපෙරදිග සංක්‍රමණ ද සිදු වූ අතර නවීන තාක්ෂණය ජන ජීවිතයට එකතු විය. මේ සමග ම නව ආකල්ප, සිරිත් ආදිය ද සමාජයට එකතු විය. සාම්ප්‍රදායික සමාජ හර පද්ධතිය බිඳ වැටීමට මෙම තත්ත්වය හේතු වූ අතර අපරාධ, මත්පැන් හා මත් ද්‍රව්‍ය භාවිතය, සියදිවි නසා ගැනීම්, තරුණ අසහනය වැනි සමාජ අර්බුද හට ගන්නට ද හේතු විය.

එසේ ම රෝම ලන්දේසි නීතිය සාම්ප්‍රදායික නීතිය යටපත් කළේ ය. දේශපාලනය නැමැති සංකල්පය හඳුන්වා දීමෙන් ග්‍රාමීය ජනතාව අතර බෙදීම් ඇතිවීමක් නොමැති නම් දේශපාලන පිල් බෙදීමක් ඇතිවිය. සාමූහික හැඟීම් හා බැඳියාව කෙමෙන් මැකී ගොස් පුද්ගලයා තම සුබ විහරණයට

අවශ්‍ය දේශපාලන පක්ෂ තෝරා ගැනීමට පෙළඹුණි. පක්ෂ ක්‍රමය ඔස්සේ ඇතැම් අවස්ථාවල දූෂණ, වංචාව, බලහත්කාරය, මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමත් සිදුවිය. මෙවැනි ප්‍රතිසංස්කරණ නිසා සමාජයේ ගැටලු ඇති වී සාමූහික සම්ප්‍රදායට පහරක් එල්ල වූ අතර ගැමියන් දේශපාලනික වශයෙන් බිඳුණු පිරිසක් බවට පත්වීම නිරායාසයෙන් ම සිදුවිය.

වර්තමාන සමාජය වේගයෙන් විකරණය වෙමින් පවතී. එයට දියුණු සන්නිවේදන මාධ්‍ය තාක්ෂණය හේතු වී ඇත. වර්තමානයේ පවතින රටවල් 190ම එක් විශ්ව ගම්මානයක් බවට පත්ව ඇත. ගුවන් විදුලි - රූපවාහිනී - අන්තර්ජාලය වැනි මාධ්‍ය ලාංකික සමාජයට එක්වීම නිසා සාම්ප්‍රදායික සිරිත් - විරිත්, වගා ක්‍රම, ආහාර පාන, ඇඳුම් පැළඳුම් ඇතුළු පුද්ගල හා සමාජ වර්ග රටාවන්ගේ වෙනස් වීමක් දක්නට ලැබේ.

එම වෙනස් වීම් අතර වර්තමාන සමාජ ව්‍යුහයේ මූලිකාංග වන පවුල, විවාහය, ඥාතිත්වය යන සංකල්පයන්ගේද විශාල විපර්යාසයක් ඇති විය. මෙම වෙනස් වීම අඛණ්ඩ ක්‍රියාවලියකි. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපෑවේ බටහිර යටත්විජිත පාලනයයි. විවාහය යනුවෙන් අදහස් කරන්නේ "පවුල නැමැති මූලික සම්බන්ධය ඇතිකර ගැනීම සඳහා සිදු කරනු ලබන ශාරීරික චාරිත්‍රානුකූල නීතිමය ක්‍රියාවලියකි". මෙම උත්තරීතර සංකල්පය වර්තමානය වන විට දික්කසාදය දක්වා වෙනස් වීමට ලක්ව ඇත. සරණ මංගල්‍යය යන උතුම් අර්ථය වෙනුවට දෑවැද්ද මුල් වී ඇත. උගත්කම, ධනවත්කම මූලික වන අතර සමාජ හර පද්ධතිය නොසලකයි. මෙකී ඇගයුම්වල වෙනස්කම ද දික්කසාදයට හේතුවක් ලෙස දැක්විය හැකි ය. ධනවාදි ආර්ථික ක්‍රමය සමාජ සාරධර්ම හා ඇගයීම් රාමුව බිඳ දමා හෝ නොසලකා හැර ඇත.

එමෙන් ම බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දෙන ලද වැවිලි ආර්ථිකය නිසා දකුණු ඉන්දියාවෙන් වතු වගාවට කම්කරුවන් ගෙන ඒමත් සමඟ දමිළ සංස්කෘතියේ ලක්ෂණ ද ශ්‍රී ලාංකේය සමාජයට එකතු විය. වාණිජ භෝග වගාව නිසා පළමුව වාණිජකරණයට ද, එයින් හටගත් නාගරිකකරණය ද මේ වෙනස්වීම්වලට තවත් හේතුවක් විය. මේ ආකාරයෙන් සමාජ සංස්ථා එකිනෙක විපර්යාසයකට භාජනය විය. සමාජ සංවිධාන ලෙස නීතිය, පවුල, අධ්‍යාපනය, ආර්ථික, ආගමික, දේශපාලනමය වශයෙන් සාපේක්ෂව වෙනස් විය. සිරිත් පදනම් කරගත් සංස්කෘතික මතය එකල සියලු දෙනා ගරු කළ පොදු නීතිය විය. මෙම නීතිය උල්ලංඝනය කිරීම දඬුවම් ලැබීමට හේතුවක්

විය. ප්‍රසිද්ධියේ සියලු දෙනාහට පෙනෙන ආකාරයට දඬු දඬුවම් පැමිණවීමේ නීතිය පසුකාලීන ව සමාජ අප්‍රසාදයට ලක්විය.

පවුලේ සංවිධාන ස්වරූපය නූතනයේ න්‍යෂ්ටික පවුල දක්වා වෙනස් වීමත් විස්තෘත පවුල් ක්‍රමය බිඳ වැටීමත් සාරධර්ම බිඳ වැටීමට එක් හේතුවක් ලෙස දැක්විය හැකි ය. විස්තෘත පවුල පරම්පරා තුනකින් පමණ සමන්විත වන අතර ඔවුන්ගේ කාර්යභාරය අලුත උපන් දරුවා සමාජ සත්ත්වයෙකු බවට පත් කිරීමට අවශ්‍ය දැනුම, සාරධර්ම, භාෂා දැනුම ලබා දීමයි. නූතන සමාජයේ පවුලෙන් මෙම කෘත්‍යයන් ඉටු නොවේ. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හෝ ගෘහ සේවිකාවන් යටතේ දරුවෝ පෝෂණය වෙති. මුදල් මත හඹා යන සමාජයක ආධ්‍යාත්මික, නැණවත්, ගුණගරුක, උසස් දරුවෙකු බිහිවීම සැක සහිත ය. මෙම අවාසනාවන්ත පවුල් පරිසරය ඇතිවීමට යටත් විජිත සමයේ සිට ක්‍රමයෙන් ගොඩනැගුණු ධනවාදි ආර්ථික ක්‍රමය හේතු වන්නට ඇති බව කිව හැකි ය.

සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපනය බටහිර අධ්‍යාපන ක්‍රමයට මාරු වීමත් සමග කාන්තාවන්ට අධ්‍යාපන අවස්ථා හිමි විය. මේ නිසා පුරුෂාධිපත්‍ය සමාජයෙන් ක්‍රමයෙන් අහෝසි වන්නට හේතු විය. එමෙන් ම සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය, භාණ්ඩ හුවමාරු ක්‍රමය, මුදල් හුවමාරු ක්‍රමයක් දක්වා වර්ධනය වීමත් සමඟ ඊට සමගාමී ව වර්තමානයේ දී බැංකු, රක්ෂණ සමාගම් බිහි වී ඇත. මුදලේ අගය වැඩි වීමත් සමග ම මුදල් උපයන අයථාක්‍රම බිහිවිය. උදාහරණ ලෙස සූදු ක්‍රීඩා, ක්ෂණික ලොතරැයි, කැසිනෝ වැනි ක්ෂණික මුදල් උපයන ක්‍රමවලට පෙළඹිණි. මෙය සමාජ විසංවිධානයට ද හේතු වී ඇත.

එමෙන් ම 1833 දී නීතියක් මගින් රාජකාරි ක්‍රමය අහෝසි කිරීමත් සමඟ කුල ක්‍රමය බිඳ වැටුණි. මේ නිසා සාම්ප්‍රදායික ග්‍රාමීය සමාජ අනන්‍යතාව අහෝසි වීම සිදුවිය. එමෙන් ම ගොවිජනපද, වගා ගම් හා මහවැලි ව්‍යාපාරය ආශ්‍රිත ව පවුල් වශයෙන් අභ්‍යන්තර සංක්‍රමණයක් සිදුවිය. 1931 ආරම්භ වූ ගොවි ජනපදකරණය නිසා සමාජ මිශ්‍රණය ඇති වූ අතර සාම්ප්‍රදායික තත්ත්වය වෙනස් වීම නොවැලැක්විය හැකි විය. රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය නිසා පරිසර පද්ධතිය අසමතුලිත වූ අතර සාමාන්‍ය කෙම් ක්‍රම ආදිය අහෝසි විය. හරිත විප්ලවයෙන් ගොවියා යාන්ත්‍රීකරණයට හසු වූ අතර කෘෂිකර්මාන්තය ආශ්‍රිත දිවි නසා ගැනීම් ද සිදුවිය. හරිත විප්ලවය සංවර්ධන උපාය මාර්ගයක් වුවද එහි අඳුරු ප්‍රතිඵලයක් ලෙස වකුගඩු රෝගීන් 50,000 පමණ අද වන විට අප සමාජයේ සිටීමෙන් එහි ඇති වූ අතුරු හානි හඳුනා ගත හැකි ය.

සාම්ප්‍රදායික සමාජයේ ගැමි කාන්තාවගේත්, නූතන කාන්තාවගේත් කාර්යභාරය අතර පැහැදිලි වෙනස්වීමක් දක්නට ලැබේ. පුරුෂයින් සාමූහික ව ඉටු කරන කාර්යයන් ස්ත්‍රිය විසින් ඉටු කිරීමත්, පුරුෂයා මෙන් ම භාර්යාවද රාජකාරීවල යෙදී සිටීමත් දක්නට ලැබේ. විශේෂයෙන් ම අධ්‍යාපන තත්ත්වය හේතු කොටගෙන රැකියා ලබා ගැනීමේ නව අවස්ථා කාන්තාවට ලැබී ඇත.

වර්තමානය වන විට ශ්‍රී ලාංකික සමාජය වේගයෙන් නවීකරණය, නාගරීකරණය, වාණිජකරණය, බටහිරකරණය වෙමින් පවතී. 15වන ශතවර්ෂයේ දී ඇරඹි, යටත්විජිත යුගය ශත වර්ෂ පහක් පමණ පැවතීමත් 1948 නිදහසින් පසුව ද එම සංකල්පවලින් මිදීමට නොහැකි වීමත් බටහිර සිරිත් - විරිත්, ආහාර - පාන, ඇඳුම් - පැලඳුම් තදින් වැළඳ ගැනීමත් එයට බලපෑ තවත් හේතු විය. ලෝක වෙළෙඳපොළ හා බැඳුණු ආනයන අපනයන ආර්ථික ක්‍රමයට නැඹුරු වීමත් වර්තමානයේ දක්නට ලැබේ. නූතන සංවර්ධන උපායන්ගේ බලපෑම නිසා වර්තමානය වන විට ගැමි සමාජය ශීඝ්‍ර ලෙස ආර්ථික හා සමාජීය වශයෙන් නවීකරණය වී ඇති ආකාරය පැහැදිලි වේ. මෙය වේගයෙන් විපර්යාසයන්ට භාජනය වන්නාසේම ඉදිරියට ම ගමන් කරන ආකාරය ද අවබෝධ කරගත හැකි ය.

## 4.4 සමාජ සාධාරණත්වය, යුක්තිය සඳහා බෞද්ධ සමාජ විද්‍යාත්මක උපයෝගිතාව

සමාජ විද්‍යාවේ ආරම්භයෙන් අනතුරුව ආගමික ඉගැන්වීම හා සමාජ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව අධ්‍යයන ක්ෂේත්‍රය ආවරණය සඳහා ආගමික සමාජ විද්‍යාව (SOCIOLOGY OF RELIGION) බිහි විය. සමාජ සංස්ථාවක් ලෙස සමාජානුයෝජන ක්‍රියාවලියේ හා සංස්කෘතිය පවරාදීමේ ඒකකයක් ලෙස ආගමික ක්‍රියාකාරිත්ව බලපෑම සමාජ විද්‍යාත්මක ව අධ්‍යයනට ලක් විය. මැක්ස් වේබර්, එමිල් ඩුර්ක්හයිම්, කාල් මාක්ස් වැන්නවුන් මේ ක්ෂේත්‍රයට අදාළ සමාජ විද්‍යාත්මක විවරණ සපයා ඇත.

බුදු දහම සාධාරණත්වය හා යුක්තිය වෙනුවෙන් සමාජය පුහුණු කිරීමට සුවිශේෂී ද්විත්ව ප්‍රවේශයක් භාවිත කර ඇත.

01. දාර්ශනික ප්‍රවේශය - මහා බ්‍රහ්මයාගේ මැවීම පාදක වූ කුල ක්‍රමය පිටු දැකීම.

02. උපයෝගීතාවාදී ප්‍රවේශය - පුද්ගල කෘත්‍ය පදනම් ව සමාජය තුළ පුද්ගලයාගේ පිළිගැනීම තීරණය වන බව.

මෙම ද්විත්ව ප්‍රවේශයක් ඔස්සේ සමාජය තුළ මානව ගරුත්වය තහවුරු කිරීම එවකට පැවති බමුණු මතයට පටහැනි වීමක් විය. කෙසේ වෙතත් වසළ සූත්‍රය ආදියේ සඳහන් වන කෘත්‍ය පදනම් වූ සාධිත තත්ත්වයන් ලෙස සමාජ පිළිගැනීම සකස් විය යුතු බව බුද්ධ දේශනය විය.

සාම්ප්‍රදායික කුල ක්‍රමය වෙනුවට ඉන්ද්‍රිය සංවරය පදනම් වූ සිව්වනක් පිරිසගෙන් සමන්විත ශාසනික සමාජ ස්තරායණය සමාජයට හඳුන්වා දුන්නේ බුදුරජාණන් වහන්සේ විසිනි. එය තත්කාලීන ඉන්දියානු සමාජයේ පැවති දෘඩ කුල ස්තරායණයට නව අර්ථකථනයක් විය. එමගින් පුද්ගලයාට කෘත්‍යාත්මක පදනමකින් යුතුව සමාජ තත්ත්වය හිමිකර ගැනීමට මග පෑදීය. පුද්ගලයා විසින් සමාජය පිළිගත් සදාචාරාත්මක පැවැත්ම අනුව ජීවත්වන්නේ නම් එය ඉහළ පිළිගැනීමකට භාජනය වීමත් එමගින් සිදුවිය. ඒ සමග ම සමාජයේ සදාචාරවත් පැවැත්මත්, සාධාරණත්වයත් එකිනෙකා වෙත ගෞරව සම්පන්න ව ජීවත් වීමත් මහා පිළිගැනීමකට භාජනය විය.

බුදු දහමේ ගිහි ශික්ෂණය විෂයයෙහි ලා පංචශීල ප්‍රතිපත්තිය ඉමහත් සමාජ පාලනයකට මග පෙන්වීය. ජීවිත අයිතිය තහවුරු වීම, හිංසනයට ගොදුරු නොවී සිටීම, පුද්ගලයා හා සාමූහික දේපල හිමිකම තහවුරු වීම, සන්නිවේදනයේ විශ්වසනීයතාව තහවුරු වීම, පවුල් සෞඛ්‍යය, පෝෂණය හා රැකවරණය තහවුරු වීම සමාජ ස්ථාවර භාවයට ඉමහත් පිටිවහලක් විය. පංචශීල ප්‍රතිපත්තිය ගිහි ජීවිතයේ හරයාත්මක පාලනයකටත් එය ඉක්මවා ගිය දශ ශීල, සාමණේර ශීල, ප්‍රව්‍රජ්‍යා ශීලය ආදිය මගින් පූජ්‍ය පක්ෂයත් හික්මවීමට භාජනය විය.

භාරතීය සමාජයේ පැවති පුරුෂාධිපත්‍යය බැහැර කරමින් භික්ෂුණී ශාසනය ස්ථාපනය කිරීමත් සමග කාන්තාවගේ සමාජ අයිතිවාසිකම් සුරක්ෂිත වීමේ නව ප්‍රබෝධයක් ඇතිවිය. පුරුෂයා සේ ම කාන්තාව ද බුද්ධියෙන් හා කුසලතාවෙන් සමාන බවට ප්‍රායෝගික පිළිගැනීමක් ලබාදීමෙන් උත්තරීතර නිර්වාණය අවබෝධය දක්වා ඇයට පැමිණීමට හැකි බව ප්‍රත්‍යක්ෂ කිරීමෙන් ද කාන්තා නිදහස සමාජ සුභාවිතයක් බවට පත්කළේ බුදු දහම මගිනි. එසේම කාන්තාවට නිරතුරුව පුරුෂ පාර්ශ්වය විසින් ගෞරවය, රැකවරණය ලබාදිය යුතු බව ද බුදු දහම උගන්වයි.

සතර බ්‍රහ්ම විහරණ සමාජයේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයේ යථා පැවැත්ම තහවුරු කරයි. මෛත්‍රිය, කරුණාව, මුදිතාව, උපේක්ඛාව යන ගුණාංග වඩවාලීමෙන් පුද්ගලාන්තර සබඳතා තුළින් ඇති වන ප්‍රකෝපකාරී

බව, අවපීඩනය, හිංසාව වැනි ප්‍රතිශේධාත්මක චර්යාවන් පිටු දැකීම, සංහිඳියාව, සහකම්පනය, සංතුෂ්ටිය වැනි ප්‍රතිජනනාත්මක චර්යාවන් ප්‍රවර්ධනය වීමක් සිදු වේ.

රාජ්‍ය පාලනයේ දී සමාජ සාධාරණත්වය තහවුරු කිරීමට අවශ්‍ය උපදේශ රාශියක් ද බෞද්ධ ඉගැන්වීම් තුළ අන්තර්ගත වේ. සප්ත අපරිහානිය ධර්ම මගින් සාමූහික සමාජ චර්යා වඩාත් සමාජ හිතකර ලෙස සමූහය තුළ ක්‍රියාත්මක කිරීමට මග පෙන්වයි. එම ධර්මතා පිළිපදින සමාජය නොපිරිහෙන බව බුද්ධ දේශනයේ දැක්වේ. රාජ්‍ය පාලනයේදී පිළිපැදිය යුතු අවවාද අනුශාසනා රාශියක් චක්කවත්ති සීහනාද සූත්‍රයේ දැක්වේ. සමාජ පීඩනයක් ඇති කිරීමෙන් තොරව රාජ්‍ය පාලනය ඇති කිරීමටත් පාලකයා සහ පුරවැසියන් අතර සාධාරණත්වය සපිරි සමාජ රටාවක් පවත්වා ගැනීමටත් එමගින් මග පෑදේ.

මේ අයුරින් බලන විට සාධාරණත්වය හා යුක්තිය රජයන සමාජ රටාවක් බිහි කිරීමට අදාළ මගපෙන්වීම හා අනුශාසනා රාශියක් බෞද්ධ ඉගැන්වීම් තුළ තිබේ. මෙම පණිවිඩය සමාජය වෙත නිවැරදි ව රැගෙන යාමත් එය පුරුදු පුහුණු කිරීමත් දිරි ගැන්වීමත් සංඝ සමාජයේ ප්‍රමුඛ වගකීමක් වේ.

බුදු දහමේ ඉගැන්වෙන පංචශීල ප්‍රතිපත්තිය පුද්ගලයාට හා සමාජයට ඍජුව ම බලපාන සමාජ ගැටලු අවම කරන සමාජ ක්‍රම පහකි. තමා උපමා කර ජීවිත දානය දීමෙන්, තැතිගෙන බියෙන් සැකෙන් ජීවත් වන සියලු සත්ත්වයන්ට පූර්ණ නිදහස උදා කිරීමක් වේ. සොරකම් කිරීම අපායේ උපදීමට හේතුවන බව ධනඤ්ජානි සූත්‍රයේ දී සැරියුත් හිමියන් පැහැදිලි කරයි. තමාට අයත් නොවන සියල්ල අන්සතු ය. එය නොදන්වා ගැනීම සොරකමකි. තමා නිසා හෝ අනුන් නිසා හෝ අදැහැමි ව මිච්ඡා ආජීවයෙන් ජීවත් වීම නිග්‍රහ සහගත බව බෞද්ධ පිළිගැනීමයි. සත්‍යවාදියා නොපිරිහෙන බවත් සත්‍යය පාරමිතාවක් බවත් වචන අමාවක් බව දැන දැනත් උම්මත්තක බව, සිහිමුලා බව නොදරුවෙකු බවට පත්වීම, මත්වතුර මත් ද්‍රව්‍ය භාවිතය නිසා සිදුවෙයි. මත් උවදුර වැනි අපචාරයන්ට පෙළඹීමට පෙර ඉන් සමාජය මුදවා ගැනීම බෞද්ධ සමාජ දර්ශනය යි. එසේ ම ශීලය මානව සමාජයේ පදනම බවත් ගැටලු විසඳිය හැක්කේ දූරදර්ශීව ක්‍රියා කිරීමෙන් බවත් දැක්වේ. එම නිසා ත්‍රිවිධ ශික්ෂාවෙන් සීලයට ප්‍රමුඛතාව දෙන අතර එහි දී සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන මාර්ගාංග යෝජනා කර ඇත. පුද්ගලයකු වැරදි කිරීමට පෙළඹෙන්නේ ඡන්දය, ද්වේශය, බිය, මෝහය නිසා ය. සතර සංග්‍රහ

වස්තු වන දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව සහ සමානාත්මතාව එකිනෙක සමායෝජනය වීමෙන් පුද්ගලයා තුළ කිසියම් ශික්ෂණයක් පිළිබිඹු කරයි.

බෞද්ධ ඉගැන්වීම්වල මූලික හරය වන්නේ මානව කේන්ද්‍රවාදය ප්‍රතික්ෂේප කිරීමයි. තමා කරන රැකියාව, අධ්‍යාපනය, ධාර්මික බව, හික්මීම හා උත්තම පුරුෂාර්ථ මත කෙනෙකු අගය කරන අතර කිසිවිටෙක ගෝත්‍රය, කුලය සහ ධනය මත උසස් නොවන බව බුදු දහමේ අවධාරණය කරයි. වසල සූත්‍රයේ දී කෝපය, වෛරය, පව්ටු ඇසුර, වැරදි දෘෂ්ටිය යනාදිය නිසා සාමකාමී සමාජය ඉදිරියේ වසලයකු ලෙස අර්ථ නිරූපණය වන බව දක්වේ. ඉන්දීය වේද සාහිත්‍යයේ බමුණන්ගේ බෙදීම චතුර් වර්ණ ධර්ම අනුව සිදු වූ අතර දේව නිර්මාණය මත පිහිටා සමාජය උසස් පහත් ලෙස වර්ග කිරීම සිදුවිය. පහළ ස්තරය වූ ක්ෂුද්‍ර කුලයට මානව නිදහස අහිමි විය.

බුදුරජාණන් වහන්සේ බමුණු මතය බිඳ දමා යුක්තිය, සාධාරණය උදෙසා ප්‍රගතිශීලී සත්‍ය ඉගැන්වීමක් කළේ ය. එහි පදනම තාර්කික ප්‍රවේශයක් ඔස්සේ විවරණය කළ හැකි ය.

වසල සූත්‍රයේ දී පෙන්වා දෙන්නේ පුද්ගලයෙකු ආරෝපිත තත්ත්ව මත නොව සාධිත තත්ත්ව මත සමාජ පිළිගැනීමට ලක් විය යුතු බවයි. එනම් උපත, ආර්ථික තත්ත්වය, වෘත්තීය හෝ වෙනත් සාධක මත නොව පුද්ගලයා විසින් දක්වන සමාජ චර්යාවේ අගයන් අනුව එය තීරණය වන බවයි. එතෙක් පැවති සම්ප්‍රදායන්, කුල ක්‍රමය පදනම් වුණේ උපතින් අත්පත් කරගත් සාධක මත ය. එය අසාධාරණ බෙදීමක් ලෙස පිළිකෙව් කළ බුදු දහම පුද්ගල කායික හා මානසික සංවර්ධන පදනම් වූ නව බෙදීමක් ලෙස භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා යන සිව්වනක් පිරිසෙන් යුතු ශාසනික සමාජ විභේදනය ඉදිරිපත් කළේ ය.

අග්ගඤ්ඤ සූත්‍රය, චක්කවත්ති සීහනාද සූත්‍රය ආදියේ දී රාජ්‍ය පාලනය පිළිබඳ නූතන ප්‍රජාතාන්ත්‍රවාදී සංකල්ප රාශියක් ඉතා පැහැදිලි ව හඳුනා ගත හැකි ය. ජන සම්මතයෙන් රාජ්‍ය පාලකයෙකු වෙන්කර ගැනීම හා රාජ්‍යය විසින් මහජනයා උදෙසා යහ පාලනයක් පවත්වා ගැනීමට අදාළ වූ කරුණු රාශියක් එහි දක්වා ඇත.

බුදු දහම භාරතීය සමාජයේ ඉතා සීමා සහිත ව තැබූ කාන්තා විමුක්තිය ගෞරාන්විත පිළිගැනීමක් සහිත ව පුලුල් කරන ලදී. එවකට පැවති පුරුෂ මූලික සමාජය තුළ ස්ත්‍රියටද පුහුණුව ඔස්සේ ඉහළට ම පැමිණිය හැකි බව

මෙහෙණි සස්න ඇරඹීමෙන් පසක් කරන ලදී. එසේ වුවද අෂ්ට ගරුධර්ම පැනවීම මගින් නැවතත් කාන්තාව පුරුෂයන්ගේ රැකවරණය හා සැලකිල්ලට යටත් කරවීම කාන්තාව කෙරෙහි පුරුෂ ගෞරවය ස්ථාපනය කිරීමට ඉහවල් විය.

සප්ත අපරිහානිය ධර්ම ඔස්සේ සමාජගත ඇගයුම් හා සාරධර්ම පද්ධතීන් රැකගැනීම සඳහා සිදුකළ යුතු සම්ප්‍රදායන් රැකීම ද, සමාජය තුළ සංස්කෘතික අනන්‍යතාව රැක ගැනීම ද, සාධාරණත්වය තහවුරු කිරීමට වැදගත් විය.

මේ අනුව බුදු දහම ඉතා පැහැදිලි ලෙස සමාජ සාධාරණත්වය හා යුක්තිය උදෙසා වන සමාජ දර්ශනයක් බව දැක්විය හැකි ය.

**අභ්‍යාසය**

1. ප්‍රාග් බෞද්ධ යුගය හා බෞද්ධ යුගය අතර පැවති සමාජ වෙනස්කම් පැහැදිලි කරන්න.

2. පැරණි සමාජයේ පැවති කෘෂිකාර්මික ජීවන රටාව මූලික වූ සමාජ වාතාවරණය එහි ස්වයංපෝෂිත පැවැත්මට හිතකර වූ අන්දම පැහැදිලි කරන්න.

3. පැරණි සමාජය තුළ පවුල් සබඳතා හා දේපල පරිහරණය පිළිබඳ පැවති තත්ත්වය සැකෙවින් දක්වන්න.

4. පැරණි සමාජයත් නූතන සමාජයත් අතර පවතින සමවිසමතා දක්වමින් එහි හිතකර හා අහිතකර බලපෑම් පැහැදිලි කරන්න.

# 05 සමාජ පාලනය

## 5.1 සමාජ පාලනයක අවශ්‍යතාව හා එහි ඓතිහාසික විකාශනය

ලතින් භාෂාවේ "Socius" යන වචනයෙන් බිඳී ආවක් ලෙස සලකා Society යන ඉංග්‍රීසි වචනය සිංහල භාෂාවේ දී "සමාජය" යනුවෙන් භාවිත වේ. එකතු වී සහයෝගයෙන්, මිත්‍රත්වයෙන් කටයුතු කිරීම යන අරුත් එහි ගැබ්වී ඇත. එය හුදු සාමාජිකයන් පිරිසකගේ එක්වීමක් පමණක් නොව අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වයන් සහිත පොදු ලැදියාවක්, පොදු එකඟතාවක් සහිත ගොනුවකි.

මානව ශිෂ්ටාචාරයේ එදා මෙදාතුර කුඩා ම ඒකකය පවුල ලෙස සමාජ විද්‍යාඥයෝ තර්ක විරහිත ව පිළිගනිති. මව, පියා, දරුවන් හා බන්ධූන්ගෙන් සමන්විත මෙම කුඩා ව්‍යුහය සමස්ත සමාජයේ තැනුම් ඒකකය වේ. අතීතයේ පැවති මහ පවුල හෙවත් විස්තාරිත පවුල නූතන තිරීක්ෂණය හා ආර්ථික ව්‍යුහය තුළ න්‍යෂ්ටික පවුලක් ලෙස සංකෝචනය වී ඇත. විස්තාරිත පවුල තුළ පැවති ළමා, වැඩිහිටි සමීපතාව නිසා දරුවන් නිරායාසයෙන් ම සමාජ සේවයට විවෘත ව පැවතිණි. මෙම පවුල තුළ වගකීම්, බැඳීම්, යුතුකම්, සම්ප්‍රදායන්, නීතිරීති, චාරිත්‍ර වාරිත්‍ර, සාරධර්ම ආදි අතිමහත් සංකල්ප සමුදායකින් හැඳින්වෙන ක්‍රියාදාම රැසක් පැවතියේ ය. මේවා මගින් සාමාජිකයන් නිරතුරු ව බැඳී සිටි අතර අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත් පාලනයක් තුළට නොදැනුවත් ව අන්තර්ග්‍රහණය විය. ළමයින් කායික, මානසික, පෝෂණයත් චිත්තවේගී සමතුලිතතාවත් පුහුණු කිරීමට වැඩිහිටියන් උනන්දු වූ අතර, ආර්ථික කෘත්‍ය උදෙසා වැඩිහිටියන් වගකීම භාරගත්හ. පවුල තුළ පැවති යාන්ත්‍රික ඒකාබද්ධතාව හා ශ්‍රම විභජනය එය තුළ මනා සංවිධානාත්මක පාලනයක් පවත්වා ගැනීමට ඉවහල් විය.

පවුල් කිහිපයක් එකතු වූ කුඩා සමාජ ඒකකයන් ඔවුන්ට අනන්‍ය ස්වරූපය ඔස්සේ පුලුල්වත් ම එය තුළ වූ යාන්ත්‍රික ඒකාබද්ධතාව ක්‍රමයෙන් දුර්වල බැවින් ඓන්ද්‍රීය ඒකාබද්ධතාවක් කරා වෙන් විය. මෙහිදී සමාජයේ සාමාජිකයන් අතර වගකීම හා බැඳීම හුදු නාම මාත්‍රික මෙන් ම නිල සම්බන්ධතාවලින් නැවත සකස් විය. ඒ සමඟ ම එතෙක් තම පාලන බලවේගය වී පැවති සමීප බලපෑම් දාමය තුනී වූ අතර විධානගත පාලන ක්‍රියාදාමයකින් එය ප්‍රතිස්ථාපනය විය. එය නූතන නිලබලවාදී පාලන රාමුව ලොවට දායාද කළේ ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

## අතීත සමාජයේ පැවති පාලන ක්‍රමය

අතීත සමාජයේ පාලන ක්‍රම පිළිබඳ තොරතුරු රැසක් ජාතක කතා සාහිත්‍යයෙන්ද මහාවංශයෙන්ද ගම්‍යමාන වේ. උතුරු ඉන්දියාවේ පැවති පාලන රටාව මහින්දාගමනයෙන් පසුව ලංකාව තුළද ස්ථාපනය විය. පුරුෂ මූලික සමාජයක් වූ භාරතීය සමාජය තුළ පාලන තන්ත්‍රයට කාන්තා දායකත්වය ඉතා අවම විය. විශේෂයෙන් බ්‍රාහ්මණ වංශිකයන් ස්ත්‍රිය සම්බන්ධයෙන් දැරුවේ උසස් ආකල්පයක් නොවේ. අතීත ගමක පාලකයා වූයේ පුරුෂයෙකි. ඔහු මනා අත්දැකීම් සම්භාරයකින් යුතු උසස් පෞරුෂ ලක්ෂණවලින් හෙබි පුද්ගලයෙකු විය. ගමේ පොදු පිළිගැනීම තුළින් ඉහළ සමාජ තත්ත්වයකින් යුතු ඔහු ''ගාමණී'' යනුවෙන් හැඳින්වූ බව ඉතිහාසඥයෝ දක්වති.

මෙවැනි ගම්නායකවරු ක්‍රමයෙන් තම බලය හා ආධිපත්‍ය පතුරුවා ගැනීමත් සමඟ ප්‍රදේශීය නායකයා වූ අතර ඇතැම් විට ඔව්හු රාජ්‍යත්වය කරාද ළගා වූ බව ඉතිහාසයේ දැක්වේ.

තම සහෝදර ජනතාවගේ නායකත්වය දැරීම පමණක් නොව ඔවුන්ගේ ආර්ථික, සාමාජික හා ආගමික කටයුතුවලදී මගපෙන්වීමද නායකයෙකුගේ කාර්යභාරයට ඇතුළත් විය. ජනතාව අතර සාමය පවත්වා ගෙන යාමට අවශ්‍ය විධිවිධාන යෙදීම, නීති කඩකරන්නන් විෂයෙහි දණ්ඩනයද මෙම ග්‍රාම නායකයාගේ බල අධිකාරියට ඇතුළත් විය. රාජ්‍යත්වය වැඩිදෙනාගේ කැමැත්ත මත "මහ සම්මත" යනුවෙන් මුලදී ඇරඹියද පසුකාලීනව ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් ඥාතිත්වය පදනම් වු හිමිකමක් ලෙස එය පැවති බව පෙනේ. මෙම දෙරටේම රාජ්‍යත්වය සඳහා ලිඛිත නීති පද්ධතියක් නොවීම විශේෂත්වයකි. එහෙත් ආගමික මතවාද පෙරදැරි වූ සම්මත ශික්ෂණය රාජ්‍ය පාලකයා සතු විය.

විධායක බලය රාජ්‍යත්වය සතුවුවද ව්‍යවස්ථාදයක ක්‍රියාකාරිත්වය අතිශය ප්‍රජාතන්ත්‍රවාදි ලක්ෂණ සහිත විය. විශේෂයෙන් අමාත්‍ය මණ්ඩලය, පුරෝහිත හෙවත් ප්‍රධාන උපදේශක සහිත රාජ්‍ය සභාවක් පැවති අතර එහිදී බොහෝ රාජ්‍යත්වයට අදළ කරුණු සාකච්ඡා වූ බව වංශකථා සාහිත්‍යයෙන් මොනවට පැහැදිලි වේ. එසේ ම ප්‍රාදේශීය පාලනය විසින් පැන වූ යම් නි-යෝගයක අසාධාරණත්වයට එරෙහි ව රජු වෙත අභියාචනා කිරිමේ හැකිය-ාවක් රට වැසියාට විය. මෙය නූතන අධිකරණයේ ද පිළිගත් සිද්ධාන්තයකි.

තත්කාලීන ආගමික දර්ශන සියල්ලක ම පාහේ රාජ්‍යත්වය මෙහෙයවීමට අදාළ බොහෝ මගපෙන්වීම් සහිතය. ඒ අතුරින් බෞද්ධ දර්ශනය රාජ්‍ය පාලනය පිළිබඳ සුවිශේෂී ධර්මතා ගණනක් ඉස්මතු කරන ලදී. එහි දී දසරාජ ධර්මයට මුල් තැනක් හිමි වේ.

දසරාජධර්ම :-

1. දානය
2. ශීලය
3. පරිත්‍යාගය
4. අවංක බව
5. මෘදු බව
6. අක්‍රෝධය
7. අවිහිංසාව
8. ඉවසීම
9. අවිරෝධතාව
10. තපස

මෙම ගුණධර්ම වැඩීමත් සමග පාලකයා යහපත් පුද්ගලයකු වන අතර එය සෙසු පුරවැසියන්ට ආදර්ශයක් ද වේ. එමගින් සමස්ත සමාජයම භාව සුබනම්‍ය හර පද්ධතියක් ඔස්සේ ශික්ෂණයට ලක්වේ. පැරණි ග්‍රාමීය සමාජය තුළ ප්‍රාදේශීය පාලකයන්ටද යම් යම් දණ්ඩන බලතල තිබූ බව පෙනේ. දඩ පැනවීම, සුළු දඬුවම් පැනවීම, දඬුකඳේ ගැසීම, වත්කම් දේපල තහනම් කිරීම, ශ්‍රමය පොදු කටයුතු සඳහා වැය කිරීම ඒ අතර ප්‍රමුඛ විය. රාජාධිකරණය මගින් බරපතල අධිකරණ කටයුතු විමසීමට ලක් කළ අතර කස පහර දීම සිට හිස ගසා දැමීම දක්වා වූ විවිධ දඬුවම් ක්‍රියාත්මක විය. සොරකම, පූජනීය දේපලවලට සිදු කරන හානි, රාජ්‍ය විරෝධී කටයුතු ආදිය බරපතල අපරාධ ගණයට සලකනු ලැබී ය.

රාජ්‍ය ආඥාව අඬබෙර මගින් ප්‍රසිද්ධ කළ අතර එය කඩ කරන්නවුන් සෙවීම සඳහා මුර භටයන් යොදවනු ලැබී ය. ලංකාවේ ඇතැම් ස්ථානවල රාජ්‍ය ආඥාවන් ඇතුළත් සෙල්ලිපි කරවා පිහිටුවන ලදී. අයබදු රැස්කිරීම් ආදී ආර්ථික කටයුතු පිළිබඳ ප්‍රකට සෙල්ලිපිය ලෙස බදුලු සෙල්ලිපිය හඳුන්වා දිය හැකි ය. මේ ආකාරයෙන් අතීත සාමාන්‍ය ජන ජීවිතය විනයානුකූල පාලනයකට යටත් කර තිබූ බව මැනවින් පැහැදිලි වේ.

අතීත ඉන්දියාවේ පැවති තවත් පාලන ක්‍රමයක් ලෙස සමූහාණ්ඩු පාලන ක්‍රමය හඳුන්වා දිය හැකි ය. මල්ල රට ලිච්ඡවි රජදරුවන් පවත්වාගෙන ගියේ

මෙවැනි රාජ්‍ය ක්‍රමයකි. එම රාජ්‍ය ක්‍රමය බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ අතර ඔවුන් අතර පැවති ඇතැම් වයජී සප්ත අපරිහානිය ධර්ම ලෙස උපුටා දක්වන ලදී.

1. නිතර රැස්ව සාකච්ඡා කිරීම.
2. සමගිව රැස්ව, සාමූහිකව කටයුතු කර සමගිව විසිරයාම.
3. පනවා ඇති නීති නොකඩවා අනුගමනය කිරීම හා කලින් නොපැනවූ නීති අලුතින් නොපැනවීම.
4. වැඩිහිටියන්ට ගරුබුහුමන් කිරීම ඔවුන්ගේ අවවාද පිළිපැදීම.
5. කාන්තාවන්ට හිරිහැර හෝ බලහත්කාරකම් නොකිරීම.
6. පූජනීය ස්ථානවලට ගරු කිරීම හා ආරක්‍ෂා කිරීම.
7. ආගමික පූජකවරුන්ට ගරු සැලකිලි දැක්වීම, පහසුකම් සැපයීම, රාජ්‍යයට නොපැමිණි පූජක වරුන් ගෙන්වා ගැනීම.

බෞද්ධ මගපෙන්වීම ඔස්සේ වඩාත් මානවහිතවාදීව විකාශනය වූ භාරතයේ හා ශ්‍රී ලංකාවේ සමාජ පාලන රටාව විවිධ ආක්‍රමණයන්ගෙන් සිදු වූ බලපෑම නිසා වෙනස් විය. විශේෂයෙන් පෘතුගීසි ආක්‍රමණයත් සමඟ එකල පැවති බෞද්ධ ආකල්ප මූලික පාලන රටාව දෙදරා යන්නට විය. විශේෂයෙන් පංචශීල ප්‍රතිපදාව මූලිකව පැවති සමාජ ආගමික රටාව ඉක්මවා අබෞද්ධ ඉගැන්වීම් පැතිරයාමත් මත් පැන් පානය ආදි දුසිරිත් සමාජගත වීමත් මෙයට දැඩි බලපෑමක් සිදු කළේ ය. ඇතැම් අමනෝඥ ලාංකික පාලකයන් බටහිර සිරිත් විරිත් හිස් මුදුනින් පිළිගැනීමත් එමගින් බටහිර ජාතිකයන්ගෙන් වරප්‍රසාද ලැබීමත් නිසා එතෙක් මැනවින් පැවති බොදු සිරිත් මූලික සමාජය දෙදරා ගියේ ය. සංස්කෘතික වශයෙන් තාඩන පීඩනවලට ලක්වීමත් ඝාතන නිසා බොදු අනුශාසනයට වට පිරිස් නැතිව සසුන අතුරුදන් වීමේ අනතුරක් ද පැන නැගිණි.

බටහිර පාලනය බොහෝදුරට ස්වයං විනයට වඩා බලාත්මක නීතිරීති සමුදායක් ලෙස ක්‍රියාත්මක විය. ඉහළ ම හමුදා නිලධාරියා හෝ ආණ්ඩුකාරවරයා විසින් ස්වකීය මව්රටේ නීතිය මෙහිදී ක්‍රියාත්මක කරන ලදී. සිංහලයේ අග රජු රටින් පිටුවහල් කිරීමත් සමග එතෙක් පැවති ආණ්ඩුක්‍රමය මුලුමනින් බිඳ වැටුණ අතර අසමගි වූ ලාංකික ජනතාව පාලනයට බ්‍රිතාන්‍යයන් ස්වකීය පාලන ක්‍රමය මෙහිද ස්ථාපනය කරන ලදී. මුලදී බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි වූවන්ට දයා විරහිත පාලනයක් ගෙන ගියද යුරෝපයේ ඇතිවූ ලිබරල්වාදී කැළඹීම්වල බලපෑම නිසා වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් කරා එය පැමිණියේ ය.

රෝම ලන්දෙසි නීතිය ලංකාවේ ප්‍රධාන නීති ආකෘතිය වශයෙන් ක්‍රියාත්මක වන අතර ප්‍රාදේශීය නීතිරීති වන තේසවලාමෙ නීතිය උතුරුකරයේ ඇතැම් නීති කෘත්‍ය සඳහා භාවිත වේ.

වර්තමාන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදි ජනරජයේ ක්‍රියාත්මක වන්නේ ජනතා පරමාධිපත්‍යයයි. ජනතාවගේ ව්‍යවස්ථාදයක බලය පාර්ලිමේන්තුව විසින් ද බලය විධායක ජනාධිපති විසින් ද, නීතිය අධිකරණය විසින් ද, ක්‍රියාත්මක කෙරේ. 1948 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයත්, 1985 ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ආදියට අත්සන් තැබීමත් සමඟ ලංකාවේ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිය තුළ ළමා හා මානව හිමිකම් ස්ථාපනය කිරීමට රජය බැඳී සිටී.

## 5.2 නීති පද්ධතිය මගින් කරන සමාජ පාලනය

පුද්ගලයන් එක්වී සමාජය නිර්මාණය වීමත් සමග ඒ අයගේ අභිලාෂයන් මුලුමනින් සන්තර්පණය කිරීමට යාම සෙසු අය අපහසුතාවට පත්කරයි. එවිට ඇතිවන ගැටලු තත්ත්වය සීමා කිරීමට සමාජ පාලනයක් අවශ්‍ය වන බව අපි උගත්තෙමු. චාරිත්‍ර වාරිත්‍ර, සාරධර්ම, ආගම, අධ්‍යාපනය ආදී සාධක රාශියක් ඊට ඉවහල් වේ. එනයින් නූතන සමාජ ක්‍රමය තුළ වඩාත් බලපවත්වන, ස්ථාපිත සමාජ පාලන ක්‍රමය නීති පද්ධතිය ලෙස හැඳින්විය හැකි ය. නීතිරීති පද්ධතීන්ගේ බලපෑම රහිත ජන සමාජයක් අද වන විට හඳුනාගත නොහැකි තරමට පුළුල්ව එය ලොවපුරා ස්ථාපනය වී ඇත.

මැක්ස් වේබර් සමාජය තුළ ආධිපත්‍යය පිළිබඳ සිය අදහස්වලදී අවධි 3 ක් දක්වීය. ඔහු සමාජය තුළ ආධිපත්‍යය, සම්ප්‍රදයික ආධිපත්‍යය, අනුභාසාත්මක (කැරිස්මා) ආධිපත්‍යය, නීත්‍යනුකූල ආධිපත්‍යය යනුවෙන් වර්ග කරයි.

### සාම්ප්‍රදයික ආධිපත්‍යය

සාම්ප්‍රදයික ආධිපත්‍ය පාලකයා විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේ අතීතය විසින් මෙහෙවනු ලැබූ අතීතයේ පැවති සමාජ නීතිරීති සම්ප්‍රදයයි. මෙහිදී සාම්ප්‍රදයික නායකයා දෙනු ලබන තීරණවලට සියලු දෙනා අවනත විය යුතු ය. පාලකයාගේ තීරණය සැකසී ඇත්තේ අතීතයේ සිට පැවත එන සාම්ප්‍රදයික හා සිරිත්වලින් බැඳ රාමුවක් ලෙස ය. නායකයා තෝරා ගැනීමද සාම්ප්‍රදයික ක්‍රමයටම සිදුවන අතර, එය සීමිත පිරිසක් අතුරින් සිදු කෙරේ.

### අනුභාසාත්මක ආධිපත්‍යය (කැරිස්මා ආධිපත්‍යය)

පුද්ගලයකු සතු පෞද්ගලික ගුණාංග රැසක් මත ඔහුගේ පෞරුෂත්වය හා සම්බන්ධ වී ඔහු වටා ගොඩනැගෙන ආධිපත්‍යවාදී බලවේග අනුභාසාත්මක ආධිපත්‍යය ලෙස හඳුන්වයි. බොහෝවිට "කැරිස්මා" නායකයා ගනු ලබන තීරණ ඔහුගේ පෞද්ගලික පෞරුෂය විසින් ඉදිරිපත් කරන ඒවා ය. කැරිස්මා ආධිපත්‍ය බොහෝවිට අතීතයේ පැවති සමාජ ප්‍රතිමාන ප්‍රතික්ෂේප කරන අතර ඔහුට ම ආවේණික නව විශ්වාස හා සම්ප්‍රදය ගොඩනගයි. බොහෝවිට ග්‍රාමීය සමාජවල කැපී පෙනෙන නායකයන් වටා මෙවැනි කැරිස්මා ගොඩනැගී පවතිනු දැකිය හැකි ය.

## නීත්‍යනුකූල ආධිපත්‍ය

වේබර් දක්වන පරිදි සමාජය තාර්කිකකරණයේ අවසන් අදියර නීත්‍යනුකූල ආධිපත්‍යයයි. අභිචාර, සම්ප්‍රදාය, කැරිස්මාවන් ගෙන් මිදෙන සමාජය අවසානයේ දී පිළිගත්තේ තාර්කික වූ මෙම අධිපත්‍ය පමණි. නෛතික ආධිපත්‍යය බල ධූරාවලියක් ඔස්සේ ස්ථරීභවනය වී ඇත. වෙබර් එය නිල - බල වාදය ලෙස හඳුන්වා දුනි.

ජන වර්ග හා ගණචර්යා කඩවීම පිළිබඳ ඇත්තේ සෘජු ප්‍රතිරෝධයන් පමණක් වුවද ඒවා පදනම්ව සැකසූ නීති පද්ධතිය ඒවායින් වෙනස් වේ. නීති ප්‍රධාන ලක්ෂණ 5 කි.

1. නීතිය රාජ්‍යය විසින් පවතා නිල වශයෙන් ප්‍රකාශයට පත්කර තිබීම.
2. නීතිය ලිඛිත ව ඇති අතර එය නිශ්චිතව විවරණය කර අර්ථ ගන්වා තිබීම.
3. නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන ව්‍යූහයක් ක්‍රියාත්මක වීම.
4. නීතිය අපක්ෂපාතී හා අපෞද්ගලික බව.
5. නීතිය කැඩීමකදී ඒ ඒ වැරදි සඳහා කලින් තීරණ කර සම්මත කරන ලද දඬුවම් තිබීම.

ප්‍රකට නිතීවේදියකු වූ රොස්කෝ පවුන්ඩ් (Roscoe Pound) දක්වන්නේ දේශපාලනික වශයෙන් සංවිධානය වූ සමාජයක සංවරතාව ආරක්ෂා කරන්නේ නීතිය විසින් බව ය. එය ඓන්ද්‍රිය ඒකාබද්ධතාවෙන් බැඳී පවතී. නූතන සමාජය සඳහා උචිතම පාලන ක්‍රමය නීතියේ පාලනය යි.

නිතීය රාජ්‍යය විසින් පනවන ලද්දකි. ජනතාවගේ බහුතර කැමැත්ත ලැබූ ජනතා නියෝජිතයන් විසින් ජනතාවගේ සුබසිද්ධිය උදෙසා නීති පනවනු ලබන බව සමාජ සම්මතයයි. එය ජනතාවගේ ව්‍යවස්ථාදයක බලය ලෙසද හඳුන්වනු ලැබේ. ප්‍රජාතන්ත්‍රවාදී රටාවකදී එය පාර්ලිමේන්තුව විසින් සිදු කරනු ලැබේ. ජනතාව විසින් තෝරා පත්කළ නියෝජිතයන් ජනතා හිතසුව පිණිස මෙකී නීතිරීති පනවන අතර විධායකය විසින් එම නීති රීති ක්‍රියාත්මක කිරීමේ බලය පවරයි. පාර්ලිමේන්තුවේ දී යම් පනතක් පළමුවර දෙවැනිවර හා තෙවැනිවර කියවා සම්මත කර කථානායක ඊට අත්සන් තැබීමත් සමඟ එය රටේ නීතිය බවට පත්වේ. නීතිය සියලු පුරවැසියන් විෂයෙහි අපෞද්ගලිකව ක්‍රියාත්මක වීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

නීතියේ වරදක් ලෙස ලේඛනගත නොවූ යමක් වරදක් ලෙස නීතිය නොසලකයි. එ බැවින් කලින් කල නීති සංශෝධනය වෙමින් අලුතින්

කොටස් එකතු කිරීම සිදුකෙරේ. නීතියේ සියල්ල එක එකක් වෙන වෙනම විවරණය කර ඇත. වරදෙහි තරාතිරම අනුව ඊට පැනවෙන දඬුවමද වෙන් වෙන්ව සඳහන් කර ඇත. එය ඉක්මවා දඬුවම් තීරණය කළ නොහැකි ය.

නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික ව්‍යූහයන් ක්‍රියාත්මක වේ. පොලීසිය, අධිකරණය, බන්ධනාගාර ඒ අතරින් සුවිශේෂී වේ. නීතිය හා සාමය ආරක්ෂා කිරීම පොලීසියේ ප්‍රධාන වගකීම වන අතර එයට එරෙහි වන්නන් අධිකරණය හමුවට පැමිණිවීමද ඔවුන්ගේ වගකීමකි. අධිකරණය හමුවේ දී එය යුක්ති සහගතව සනාථ කළ යුතු අතර එය අපක්ෂපාතීව හා අපෞද්ගලික ව සිදු කෙරේ. සියලු පුරවැසියන් නීතිය දත යුතු ය යන උපකල්පනය මත එය ක්‍රියාත්මක කරන අතර වරදක් බව නොදැන සිටීම නිදහසට කරුණක් ලෙස නීතිය නොපිළිගනී. නීති කෘත්‍යයේ තවත් විශේෂතාවක් වන්නේ, දඬුවම් ක්‍රියාත්මක කිරීමේ අපෞද්ගලික ස්වභාවයයි. එනම් අගතියට ගත් පාර්ශ්වය විසින් ම දඬුවම් ක්‍රියාත්මක කිරීමට ඉඩක් නොමැති අතර බන්ධනාගාරය විසින් එය ක්‍රියාත්මක කරනු ඇත.

ශ්‍රී ලාංකික අධිකරණ ක්‍රමය විවිධ වර්ගයේ උසාවිවලින් සමන්විත ය. මහේස්ත්‍රාත් අධිකරණය, දිස්ත්‍රික් අධිකරණය, මහාධිකරණය, අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය ආදි වශයෙන් විවිධ නඩු කටයුතු සඳහා පත්කළ උසාවි ක්‍රමයක් පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන මූලික අයිතීන් උල්ලංඝනය වීමක දී ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ එය විමසිය යුතු අතර, පහළ උසාවිවල තීන්දුවකට එරෙහිව අභියාචනා කිරීමේ බලයද ඇත. විනිශ්චය කටයුතුවලට සහාය වීමට නීතිපති දෙපර්තමේන්තුව, රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වැනි සහායක දෙපාර්තමේන්තු ද පිහිටුවා ඇත. අධිකරණ කටයුතු මෙහෙයවීමට විවිධ අණ, පනත්, ආඥා ආදිය භාවිත වේ.

නීතිය ක්‍රියාත්මක වීමේ නිමිති අනුව ප්‍රධාන කාණ්ඩ දෙකකි.

01. සිවිල් නීතිය
02. අපරාධ නීතිය

නීතිය විසින් ම අපරාධ යටතේ වර්ගීකරණය කර ඇති වැරදි සම්බන්ධයෙන් අපරාධ නීතිය ක්‍රියාත්මක වන අතර සෙසු ලසු නඩු කටයුතු බොහොමයක් සිවිල් නීතිය යටතේ ක්‍රියාත්මක කෙරේ. අපරාධවල ස්වභාවය අනුව ද වර්ග කිරීමක් ඇත.

01. පුද්ගලයාට එරෙහිව සිදුකරන අපරාධ
02. දේපලවලට සිදුකරන අපරාධ
03. සමාජයට එරෙහි අපරාධ

සමාජයට එරෙහිව සිදුවන අපරාධ පිළිබඳ සලකන්නේ රජයට එරෙහිව සිදුකරනු ලබන අපරාධයන් ලෙස ය. සියලු ම අපරාධ නැවත කොටස් දෙකකට බෙදිය හැකි ය.

01. ලඝු අපරාධ
02. අධිචෝදනීය අපරාධ

ලඝු අපරාධ මහේස්ත්‍රාත් උසාවියකින් විභාග කර සුලු දඬුවමක් හෝ දඩයක් පැනවිය හැකි ඒවා ය. දිස්ත්‍රික් උසාවිය හෝ ඊට ඉහළ උසාවියෙන් විභාග කළ යුතු වරද අධිචෝදනීය වැරදි ලෙස හඳුන්වයි.

මේ අනුව පැහැදිලි වන්නේ නීතියේ ආධිපත්‍යය සමාජ පාලනය සඳහා සෑම සමාජ ක්‍රියාකාරකමක් ම අභිභවා ක්‍රියාත්මක වන බවයි. තාර්කික සමාජයක් ගොඩ නැගීමත් සමඟ ලෝකයේ සෑම බිම් අඟලක් ම නීතියේ ආධිපත්‍යයට ලැබී ඇත. ජාත්‍යන්තර වශයෙන් ද සාමූහිකව නීතිරීති ක්‍රියාත්මක වේ. ගෝලීයකරණයේ බලපෑමත් සමඟ දේශසීමා ඉක්මවා ගිය නීති පද්ධතියක අවශ්‍යතාව වඩවඩාත් ඉස්මතු වේ. නීතිය ද සමාජ පරිණාමයත් සමඟ පරිණාමයට බඳුන් වන අතර මානව ක්‍රියාකාරිත්වය පුළුල් වෙද්දී නීති කෘත්‍යය ද ක්‍රමයෙන් පුළුල් වනු දැකිය හැකි ය.


නොමිලේ බෙදා හැරීම සඳහා ය

## ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය

සුරාබදු දෙපාර්තමේන්තුව, වන ජීවි දෙපාර්තමේන්තුව, පොලීසිය හා මත්ද්‍රව්‍ය නාශක අංශය යන ආයතන මගින් සැකකරුවකු වශයෙන් පුද්ගලයෙකු ඉදිරිපත් කරන්නේ අධිකරණයට නැතහොත් උසාවියටයි.

දැනට ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ මට්ටම් පහක් ක්‍රියාත්මක වෙයි.

1. මහේස්ත්‍රාත් අධිකරණය
2. දිසා අධිකරණය
3. මහාධිකරණය
4. අභියාචනාධිකරණය
5. ශ්‍රේෂ්ඨාධිකරණය

### මහේස්ත්‍රාත් අධිකරණය :-

පොලිස් උසාවි ලෙස හැඳින්වෙන මෙම උසාවි සෑම අධිකරණ කොට්ඨාසයක් තුළම පිහිටුවා ඇත. දණ්ඩ නීති සංග්‍රහය 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහ පනත සහ වෙනත් පනත් මාර්ගයෙන් නියම කරනු ලබන නඩු සම්බන්ධ බලතල හා අධිකරණ බලය මහේස්ත්‍රාත් අධිකරණය සතුවෙයි. ප්‍රධාන වශයෙන් ම පැමිණිලි පාර්ශ්වය ලෙස පොලීසිය කටයුතු කරන මෙම අධිකරණය මගින් එම බල ප්‍රදේශය තුළ සිදුවන ආරවුල් සහ අපරාධ සම්බන්ධ මූලික පරීක්ෂණ මෙහෙයවීම, මහජන සෞඛ්‍ය, ආරක්ෂාව, සදාචාරය පිළිබඳ, වැරදි සොරකම් හා මංකොල්ල කෑම්, දේපලවලට හානි කිරීම, මිනී මැරීම සහ මිනී මැරීමට තැත් කිරීම හා සම්බන්ධ මූලික නඩු විග්‍රහ කිරීම මෙහිදි සිදු කෙරේ.

### දිසා අධිකරණය :-

සෑම අධිකරණ දිස්ත්‍රික්කයක ම දිසා අධිකරණයක් පිහිටුවා ඇත. දිස්ත්‍රික්කයට අදාළ සිවිල් නඩු විසඳීමේ බලය මේවාට පැවරී ඇත. දිසා අධිකරණයකින් විභාග කොට තීන්දු දිය හැකි නඩු රාශියක් ඇත. පහත දැක්වෙන්නේ ඒවායින් කිහිපයකි.

1. දික්කසාද නඩු
2. විවාහ පොරොන්දු කඩ කිරීම සම්බන්ධ නඩු
3. ස්ත්‍රී දූෂණ සම්බන්ධ නඩු
4. මුදල් නඩු

5. අලාභය ඉල්ලීම සම්බන්ධ සියලු මුදල් නඩු
6. බෙදුම් නඩු
7. සියලුම ඉඩම් නඩු හා ගෙවල්කුලී නඩු
8. සමාගම් පනත යටතේ පැවරෙන නඩු ආදියයි.

### මහාධිකරණය :-

ශ්‍රී ලංකාවේ සිදුවන සියලු ම අපරාධ පිළිබඳ අධිකරණ බලතල හිමිව ඇත්තේ මහාධිකරණයටයි. එම බලය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii(1) වගන්තියට අනුව හිමිව ඇති අතර 1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනතේ 9 වන වගන්තියේ මහාධිකරණය සතු බලතල සඳහන් වෙයි. එක් විනිශ්චයකාරවරයකු ඉදිරියේ ජූරි සභාවක් ඇතිව හෝ නැතිව නඩු විසඳිය හැකි ය. මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, මිනී මැරීමට තැත් කිරීම, රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ සහ විශාල මංකොල්ලකෑම් වැනි සමහර අපරාධ සම්බන්ධ නඩු මහාධිකරණයේ දී විභාග කරනු ලැබේ.

මෙයට අමතර ශ්‍රී ලාංකිකයෙක් පිටරටක දී සිදු කරන ලද වරද ශ්‍රී ලංකා අහස් තීරයේ හෝ දේශීය ජල තීරයේ සිදු කෙරෙන වරද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි නැවක දී හෝ ගුවන් යානයක දී සිදු කරන වරද ආදිය හා සම්බන්ධ නඩු ද විසඳීමේ බලතල මහාධිකරණය සතු වේ.

### පළාත්බද මහාධිකරණය :-

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය අනුව එක් එක් පළාත් සභාව සඳහා පළාත්බද මහාධිකරණ පිහිටුවා ඇත. වාණිජ ආරවුල් විසඳීම ප්‍රාථමික මහේස්ත්‍රාත් හා දිසා අධිකරණවල අභියාචනා විසඳීම පළාත් සභාව තුළ "රිට්" ආඥා නිකුත් කිරීම, නීති විරෝධීව රඳවා ගෙන සිටින්නන් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා හබයාස් කෝපූස් අඥා ලබාදීම ආදී බලතල ආදිය පළාත්බද මහාධිකරණය සතුවෙයි. මෙම අධිකරණවල විනිශ්චයකාරවරුන් පත් කිරීමේ බලතල ඇත්තේ අග්‍ර විනිශ්චයකාරවරයාට ය.

### අභියාචනා අධිකරණය :-

ප්‍රාථමික මහේස්ත්‍රාත්, දිස්ත්‍රික් සහ මහාධිකරණය වැනි අධිකරණ මඟින් දෙන ලද තීන්දුවලට එරෙහිව ගොනු කරන පෙත්සම්, මැතිවරණ පෙත්සම් සියලු විනිශ්චය අධිකරණ හා ආයතනවල අභියාචනා පිළිබඳ බලය මෙන් ම පහළ උසාවි විමර්ශනය කිරීමේ බලය ද අභියාචනා අධිකරණය සතු වෙයි.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සභාපතිවරයෙකු සහ හය දෙනෙකුට නොඅඩු එකොළොස් දෙනෙකුට නොවැඩි විනිසුරු මඬුල්ලක් සිටිය යුතු ය. එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම 17 වැනි සංශෝධනයට අනුව විනිසුරුවරුන්ගේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඉදිරිපත් කළයුතු අතර එම සභාවෙන් අනුමත වුවහොත් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ.

### ශ්‍රේෂ්ඨාධිකරණය :-

උපරිමාධිකරණය ලෙසද මෙය හඳුන්වයි. ශ්‍රී ලංකාවේ උත්තරීතර අධිකරණ ආයතනය වන මෙය කොළඹ නගරයේ ස්ථාපිත කොට ඇත. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වැනි වගන්තියට අනුව පිහිටුවා ඇති මෙය අභියාචනා කිරීමේ අවසරය ඇති අවසාන අධිකරණ බලය හිමි ආයතනය වෙයි. අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු දහදෙනෙකුට නොඅඩු දහසය දෙනෙකුට නොවැඩි ප්‍රවීණ විනිශ්චයකාර මණ්ඩලයකින් මෙම ආයතනය සමන්විත වෙයි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි පරිච්ඡේදය 118 වැනි වගන්තියට අනුව ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලය මෙසේ දැක්විය හැකි ය.

1. පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලතාව සම්බන්ධ අධිකරණ බලය
2. මූලික අයිතිවාසිකම් ආරක්ෂාකාරීම සඳහා වූ අධිකරණ බලය
3. අවසාන අභියාචනා අධිකරණ බලය
4. උපදේශන අධිකරණ බලය
5. ඡන්ද පෙත්සම් සම්බන්ධ අධිකරණ බලය
6. පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩකිරීම හා සම්බන්ධ වූ අධිකරණ බලය
7. පාර්ලිමේන්තුව විසින් පවරනු ලබන හෝ නියම කරනු ලබන වෙනත් කාරණා සම්බන්ධ අධිකරණ බලය එවා අතර ප්‍රධාන වේ

මෙයට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ එකම හා පූර්ණ බලය ඇත්තේ ද ශ්‍රේෂ්ඨාධිකරණයටයි.

### බන්ධනාගාරය :-

සුරා බදු දෙපාර්තමේන්තුව, වනජීවි දෙපාර්තමේන්තුව, පොලීසිය, මත්ද්‍රව්‍යනාශක අංශය යන ආයතන මගින් සැකකරුවෙකු වශයෙන් ගෙන මහේස්ත්‍රාත් වරයෙකු වෙත ඉදිරිපත් කරන්නෙකු වරදකරුවෙකු බවට පත්වුවහොත් ඔහු බන්ධනාගාර ගත කරයි. ඊට අමතරව නඩු කටයුතු ඉටු කෙරෙන අතරතුර රඳවා ගැනීම සඳහා "රක්ෂිතභාරය" යටතට පත්කළ යුතු අයද බන්ධනාගාරයේ රඳවනු ලැබේ.

බන්ධනාගාරයක් යනු උස්ව තාප්පයකින් වටවූ මැදිරි හා වාට්ටු සහිත ගොඩනැගිලිවලින් යුක්ත ආයතනයකි. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු විශේෂිත බන්ධනාගාර ආයතන කිහිපයක් දිවයින පුරා පිහිටුවා ඇත.

මෙම ස්ථානවල සිටින සිරකරුවන්ට පුනරුත්ථාපන වැඩ මූලික කරගත් වෘත්තීය පුහුණුවක් ලබා දෙන අතර බන්ධනාගාරයේ සියලුම වැඩ කටයුතු සිරකරුවන් මගින් ම කරගනු ලැබේ. තවද මරණීය දණ්ඩනයට නියම වූවන් වැලිකඩ හෝ බෝගම්බර බන්ධනාගාරවල පමණක් රඳවනු ලබයි. එහෙත් 2014 වර්ෂයේ දී බෝගම්බර බන්ධනාගාරය අහෝසි කරන ලද අතර ඒ වෙනුවට බන්ධනාගාරවල සිරකරුවන් මාරුකර යැවිණි.

ඉහත දක්වා ඇති ප්‍රධාන බන්ධනාගාරවලට අමතරව දිවයිනේ ප්‍රධාන නගරයකම පාහේ බන්ධනාගාර පිහිටුවා තිබේ. (උදා :- බදුල්ල, අනුරාධපුර, යාපනය, ගාල්ල, මාතර, මඩකලපුව, මොණරාගල)

දඬුවම් ලත් සිරකරුවන් මෙසේ වර්ග කළ හැකි ය.

1. බාලවයස්කාර සිරකරුවන්
2. තරුණ වරදකරුවන්
3. සාමාන්‍ය සිරකරුවන්
4. මරණීය දණ්ඩනයට ලක් වන සිරකරුවන්
5. ජීවිතාන්තය දක්වා දඬුවම් ලත් සිරකරුවන්

බන්ධනාගාර ගත කරන වරදකරුවන් එහි රඳවන්නේ ප්‍රධාන අරමුණු දෙකක් පදනම් කරගෙනයි.

1. පුනරුත්ථාපනය
2. දණ්ඩනය

පුනරුත්ථාපනය තුළින් අදහස් වන්නේ බන්ධනාගාරයෙන් නිදහස් වීමේ දී යහපත් පුරවැසියෙකු ලෙස ඔහු සමාජයට දයාද කිරීමයි. පුනරුත්ථාපනය තුළින් සාරධර්ම පිළිබඳ වැටහීමක් ලබා දෙයි. තවද ස්වයං රැකියාවකට අවශ්‍ය පුහුණුවක් ද ඔහුට ලැබේ. පුනරුත්ථාපනය සමග දන්ඩනයටද යටත් වීමට සිදුවෙයි. මරණීය දණ්ඩනයට සහ ජීවිතාන්තය දක්වා දඬුවමට ලක්වූ වරදකරුවෝ හා සෙසු වරදකරුවෝ පුනරුත්ථාපනය සහ දණ්ඩනයට හිමිකරුවෝ වෙති.

## රක්ෂිත බන්ධනාගාරය :-

මේවායේ රඳවා තබන්නේ ප්‍රධාන වශයෙන් ම සැකකරුවන් ය. ඔවුන්ගේ වැඩ ගැනීමක් නොකරන අතර බන්ධනාගාරයේ වැඩ කටයුතු කෙරෙන්නේ වෙනත් බන්ධනාගාරවලින් ගෙන්වා ගත් සිරකරුවන් සහ ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන සිරකරුවන් ගෙනි. රක්ෂිත බන්ධනාගාරයක මූලිකම කාර්ය වන්නේ සැකකරුවන් උසාවියට ඉදිරිපත් කිරීමයි.

## තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය :-

වැටකින් සීමාකොට ඇති මෙම ආයතනයට ඇතුළත් කරගනු ලබන්නේ වයස අවුරුදු 16-21 දක්වා වයසේ තරුණ වරදකරුවන් වන අතර වසර දෙකක චරිත ශෝධනයක් සඳහා මොවුනට විධිමත් අධ්‍යාපනයක් ලබා දෙන අතර ප්‍රසිද්ධ විභාග සඳහා පෙනී සිටීමට ද අවස්ථාවන් ලබා දෙයි. මෙහි නේවාසිකයින්ට කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය හා අනෙකුත් කර්මාන්ත පිළිබඳ ව පුහුණුවක් ලබා දෙයි. වතුපිටිවල පිහිටා ඇති තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය මෙවැනි ආයතනයකි. මෙම ආයතනයේ සිටින නේවාසිකයින් සිර දඬුවම් ලැබුවන් සේ නොසැලකෙයි.

## තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන :-

වයස අවුරුදු 22න් පහළ තරුණ වරදකරුවන් ඇතුළත් කරගන්නා මෙවැනි මධ්‍යස්ථාන 02ක් පිහිටා ඇත.

1. බදුල්ල තල්දෙන ත.ව.වි. මධ්‍යස්ථානය
2. අම්පාර වල්ලන්සේන ත.ව.වි. මධ්‍යස්ථානය

කෘෂිකාර්මික කටයුතු සහ සත්ත්ව පාලනයට වැඩි අවධානයක් යොමු කරණ මෙම මධ්‍යස්ථානවල සිරකරුවන් දණ්ඩනයට වඩා පුනරුත්ථාපනයට යොමු කිරීමක් දක්නට ලැබේ. එසේ ම බන්ධනාගාරවල නොමැති නමුත් සීමාසහිත නිදහසක් මේවායෙහි ඇත.

සිර දඬුවම් විඳින්නන්ට ඔවුන්ගේ යහපත් කල් ක්‍රියාව මත සිර දඬුවම් ලැබීමේ කාලය අඩුකර ගත හැකි ය. මෙම සමා කාලය ඔහුගේ මුළු සිර දඬුවමින් 1/3 කට සීමා වෙයි. මෙහි දී ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබූවකුට යම් දෙයකින් සමාව ලැබුණ හොත් ඔහුගේ සිර දඬුවම් කාලය අවුරුදු 20 කට සීමා වෙයි.

සාමාන්‍ය සිර සමාවට අමතර ව වරදකරුවකුට නිදහස් වීම සඳහා ජනාධිපතිවරයාගේ විශේෂ අනුමැතිය යටතේද සමාව ලැබිය හැකි ය. ජාතික හෝ ආගමික වශයෙන් විශේෂ වැදගත් වූ දිනයක් හෝ අරමුණක් මත මෙම සමාව ලබා දෙනු ඇත.

## 5.3. ශ්‍රී ලංකාවේ නූතන සමාජ පාලන ව්‍යුහ

තාර්කික සමාජයක් කරා සමාජ පරිණාමය සිදු වූ විට සමාජ පාලනය සඳහා නීතියේ ආධිපත්‍යය පිළිබඳ පෙරදී අප විමසා බලන ලදී. එහිදී නීතිය ක්‍රියාත්මක කිරීම උදෙසා සමාජය විසින්ම පිහිටුවා ගත් ආයතන රාශියක් අපට හඳුනාගත හැකිවිය. ඒවා අතරින් පොලීසිය, බන්ධනාගාරය, අධිකරණය ආදි ආයතනික ව්‍යුහ ඉතා පෘථුල කාර්යයක් ඉටුකරයි.

### පොලීසිය

වර්ෂ 1785 දි බ්‍රිතාන්‍යයන් එළිදැක්වූ වෙස්ට්මිනිස්ටර් පනතට අනුව වර්ෂ 1829 දි The Metropolitan act පනත මගින් ස්ථාපනය කරන ලද වැටුප් ගෙවනු ලබන "අපරාධ වැළැක්වීමේ දෙපාර්තමේන්තුව" වර්තමානයේදී ක්‍රියාත්මක "පොලිසියේ" ආරම්භක අවස්ථාව ලෙස සැලකිය හැකි ය.

1806 දී ලංකාවේ පොලිස් සේවය මුර සංචාරක සේවයක් වශයෙන් ස්ථාපනය විය. ඉංග්‍රීසි යුගයේ දී පොලිසියේ කාර්යභාරය ලෙස සැලකූයේ පාලක ප්‍රභූ පන්තියේ වාණිජමය අවශ්‍යතා ඉටුකර ගැනීමට අවශ්‍ය පසුබිම සැකසීමයි. එනම් පාලක පක්ෂයේ ආත්මාර්ථයයන් දයා විරහිතව ඉටුකර දීම ය. එත් පසුකාලීන පොලිසියේ ක්‍රියාකාරිත්වය වඩාත් මහජන ක්‍රියාශීලි සේවයක් බවට නැඹුරු කෙරිණි.

| | | | | |
|---|---|---|---|---|
| P | - | Politeness | - | ආචාරසම්පන්න බව |
| O | - | Obedient | - | කීකරු බව |
| L | - | Legal | - | නීත්‍යානුකූල බව |
| I | - | Intelligent | - | බුද්ධිමත් බව |
| C | - | Courtsey | - | ගෞරවසම්පන්න බව |
| E | - | Efficeincy | - | කාර්යක්ෂම බව |

පොලීසියේ කාර්යභාරය මූලික වශයෙන් කොටස් 4 කට බෙදිය හැකි ය.

01. අපරාධ හා අනෙකුත් නීතිවිරෝධී කටයුතු වැළැක්වීම, ඒ පිළිබඳ විමසිලිමත් වීම හා නීතිය කඩ කරන්නන් අධිකරණයට ඉදිරිපත් කිරීම.
02. නීතිය හා සමාජය සුරැකීම හා සමාජ ආරක්ෂාව පැවැත්වීම.
03. අපරාධ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම.
04. නීත්‍යනුකූල ලෙස බලයට පත් රාජ්‍යය ආරක්ෂා කිරීම.

මෙම කටයුතු ඉටුකිරීම සඳහා නීතිය මගින් එක් එක් ආයතනවලට විවිධ බලතල පවරා ඇත. මෙම බලතල පොදු මහජනතාවගේ පහසුව සඳහා හේතුවන අයුරින් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කරයි. මෙම කෘත්‍යාත්මක බලතල පහත සඳහන් අයුරින් සංක්ෂිප්ත ව දැක්විය හැකි ය.

01. අත්අඩංගුවට ගැනීමේ බලතල
02. සෝදිසි කිරීමේ බලතල
03. පුද්ගලික ආරක්ෂාව පිළිබඳ බලතල
04. පරීක්ෂණ පැවැත්වීමේ බලතල
05. බලය පාලනය කිරීමේ බලතල
06. කලහකාරී පිරිස් විසුරුවා හැරීමේ බලතල
07. රථවාහන පාලන බලතල

පොලිසිය අධිකරණයට සහාය වීම එහි ප්‍රබලත ම කාර්යයක් ලෙස දැක්විය හැකි ය. විශේෂයෙන් විමර්ශන කිරීම මගින් රැස්කරගන්නා තොරතුරු සාධාරණව සැකයේ වාසිය අවම කරමින් ඉදිරිපත් කිරීමේ වගකීම පැවරී ඇත්තේ පොලීසිය මතය. පොලිසියේ ප්‍රමුඛ කාර්යභාරය සාමය පවත්වා ගැනීම වන අතර වර්තමානයේ බොහෝ රටවල්වල පොලිසිය යුධ පුහුණුවකින් ද සමන්විත වේ. ත්‍රස්තවාදී තර්ජනයට ලක්ව ඇති රටවල මෙම යුධ පුහුණුව ලත් පොලිස් නිලධාරීන් බහුලව දැකිය හැකි ය.

ඇතැම් රටවල ආගමික පාලනය පිළිබඳ කටයුතු කිරීම ආගමික කටයුතු පිළිබඳ පොලීසි ද කර ඇත. සවුදි ආරාබිය, ඉරානය, ඉන්දුනීසියාව ආදි රටවල්වල එවැනි ආගමික නීති ක්‍රියාත්මක වේ. මේ අනුව බලන කල සාමය පවත්වා ගැනීමෙහිලා පොලිසිය අතිවිශිෂ්ට කාර්යභාරයක නියැලෙන බව ඉඳුරා ම සැලකිය හැකි ය.

## 5.4 සමාජ පාලනය කෙරෙහි බෞද්ධ ඉගැන්වීම්වලින් දැක්වෙන ස්වයං පාලනයේ වැදගත්කම

සත්ත්ව ශරීරය තුළ "මනස" යනුවෙන් වෙන් වූ වස්තුවක් හෝ ඉන්ද්‍රියක් දක්නට නොලැබෙයි. එසේ වුවත් සියලු ම සත්ත්ව සමූහයා කිසියම් දෙයක් කිරීමට පෙර සිතීමට පුරුදුව සිටිති. මෙසේ සිතීමේ ක්‍රියාවලියේ දී අනෙකුත් සත්ත්ව සමූහයාට වඩා ප්‍රමුඛත්වයක් හිමි කර ගන්නේ මිනිස් සත්ත්වයා ය.

ආදි යුගයේ සිට ම මිනිසා කල්පනා කළේ මිනිස් චින්තනයට මුල් තැන දෙමින් මිනිස් මනස පදනම් කර ගෙනයි. මෙම මිනිස් මනස ඉතා සංකීර්ණ වූ ගුප්ත දෙයක් ලෙස සලකා තිබේ. පෙර කලෙක ආත්මය යනුවෙන් ද සමහර විටක විඥානය යනුවෙන් ද භාවිත කළේ මේ මිනිස් මනස ම ය.

මනස සහ සිත යනු එකක්ම වුවත් එහි ගතික ස්වභාවයේ වෙනසක් දක්නට පුළුවන. මනස ලෙස අප සලකන්නේ පංච නීවරණයන්ගෙන් කිළිටි නොවූ සිතෙහි මූලික ස්වරූපයයි. උදාහරණ ලෙස කිසිදු පැහැයක්, ගඳක් හෝ සුවඳක් නොගත් ඉතා පිරිසුදු ජලයට මනස සමාන කළ හැකි ය. 'සිත' යනු පංච නීවරණයන්ගෙන් කිළිටි වූ ඒකකයක් වන අතර එය විවිධ පැහැය ගත් හෝ විවිධ ගඳ හෝ සුවඳින් යුක්ත අපවිත්‍ර ජලය හා සමාන කොට දැක්විය හැකි ය. මේ මගින් මනස හා සිත පිළිබඳ ව කිසියම් අවබෝධයක් ලබා ගත හැකි වේ.

බෞද්ධ ඉගැන්වීම්වලින් දැක්වෙන්නේ සුපහන් තත්ත්වයට පත් නොවූ කිළිටි වූ සිතෙහි පාලනය සිදු කර ගත හැක්කේ කෙසේ ද යන්න පිළිබඳ ව යි. බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය වන ධම්මපදයෙහි චිත්ත වග්ගයෙන් මෙන්ම යමක වග්ගයේ පළමු ගාථා දෙක තුළින් ද සිතෙහි ස්වභාවය පැහැදිලි කරයි.

"මනෝ පුබ්බංගමා ධම්මා
මනෝ සෙට්ඨා මනෝමයා"

"සෑම ක්‍රියාවලියකට ම මූලික වන්නේ මනසම ය. ශ්‍රේෂ්ඨ වන්නේ ද මනසම ය" යන පාඨය තුළින් කියවෙන්නේ මනසෙහි කාර්යභාරය හෙවත් ක්‍රියාවලිය යි. සිතෙහි සුපිරිසුදු බව හෝ අපිරිසිදු බව තීරණය කරන්නේ මනස යි. මේ මනස නිතරම පංච නීවරණ ධර්මයන්ගෙන් අපිරිසිදු වෙයි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය

i. කාමච්ඡන්ද - (කාමයන්ගේ ඇලීම)
ii. ව්‍යාපාද - (තරහව,නුරුස්සනා ගතිය)
iii. ථීනමිද්ධ - (සිතේ අලස බව)
iv. උද්ධච්ච කුක්කුච්ච - (සිතෙහි නොසන්සුන් බව)
v. විචිකිච්ඡා - (සිතෙහි සැක සහිත බව)

අපිරිසුදු වූ සිත නිතරම මේ නීවරණ ධර්ම තුළ ඇලී ගැලී කටයුතු කරන අතර පිරිසුදු වූ සිත හැකිතාක් මේ නීවරණ ධර්ම බැහැර කරයි.

බෞද්ධ ඉගැන්වීම්වලට අනුව සමාජ පාලනයක් සිදු කළ යුත්තේ මෙම පංච නීවරණ ධර්මයන්ගේ ඇලුනා වූ සිත් ඇත්තන් සඳහා ම ය. පංච නීවරණ ධර්ම බැහැර කළා වූ සමාජයක් තුළට සමාජ පාලනයක් අවශ්‍ය නොවේ.

බෞද්ධ මානසික ශික්ෂණ විධි පිළිබඳ ව කථා කිරීමේ දී භාවනාවට හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. "භාවනා" යන්නෙහි වාච්‍යාර්ථය වන්නේ "වැඩීම" යන්නයි. මෙහි දී වඩනු ලබන්නේ කුසල ධර්මයන් ය. ඒ අනුව භාවනා යනු කුසල දහම් වැඩීම යි. කාමච්ඡන්ද ව්‍යාපාද ආදී චෛතසික ධර්මයන්ගේ සිතෙහි නිශ්චලතාව හෙවත් ඒකාග්‍රතාව ඇති කිරීමක් එහි දී සිදු වේ.

ස්වයං පාලනය සඳහා බෞද්ධ භාවනා ක්‍රම මගින් විශාල මෙහෙයක් සිදු වන බව මේ තුළින් පැහැදිලි වෙයි. භාවනාව තුළින් සිත සුපහන් කරනු ලබයි. සිතේ සන්සුන් බව ඇති කිරීම මගින් සමාජ විරෝධී සියලු ක්‍රියාවන්ගෙන් බැහැර විය හැකි බව ප්‍රකාශ කළ යුතු ය. බුදු දහමට අනුව භාවනා ක්‍රම දෙකකි.

i. සමථ භාවනාව
ii. විදර්ශනා භාවනාව

සමථ භාවනාව පංච නීවරණ ධර්මයන්ගෙන් බැහැර වීම පිළිබඳ ව උගන්වනු ලබයි. පංච නීවරණ ධර්මයන් තුනී කර ගැනීම හෙවත් සමනය කර ගැනීමට උපකාරී වන භාවනා ක්‍රමය ලෙස මෙම භාවනා ක්‍රමය දැක්විය හැකි ය.

i. බුද්ධානුස්සති භාවනාව
ii. මෛත්තානුස්සති භාවනාව
iii. අසුභානුස්සති භාවනාව
iv. මරණානුස්සති භාවනාව

බුද්ධානුස්සති භාවනාව සිදු කරන්නේ නව අරහාදි බුදු ගුණ සිහි කරමිනි.

මේ තුළින් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය තම මනසට ළඟා කර ගනී. ඒ තුළින් චර්යාවන් සකස් කර ගනී. නොමගට ගොස් තිබෙන සිත සුමගට ළඟා කර ගැනීමට හැකියාව ඇත. පුද්ගල සමාජය ම මෙසේ බුද්ධානුස්සති භාවනාව සමඟ සම්බන්ධ වන්නේ නම් සමාජයේ ස්වයං පාලනයක් නිරායාසයෙන් බිහි වේ.

මෙත්තානුස්සතිය යනු සියලු ම දෙනා කෙරෙහි මෛත්‍රිය වැඩීමයි. සමාජයේ මිත්‍ර අමිත්‍ර දෙපිරිසට ම මෙත් වැඩීම තුළින් ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය සහ පළිගැනීම සමාජයෙන් දුරස් වෙයි.

අසුභානුස්සති භාවනාව තුළින් සිදු වන්නේ දෙතිස් කුණප කොට්ඨාස තුළ පවතින නිසරු බව මෙනෙහි කිරීමයි. ඒවා කිසිදු හරයක් නැති දෑ ලෙස සලකා භාවනා කිරීම තුළින් සිරුර පිළිබඳ ව පවතින ඇල්ම දුරස් වෙයි. මේ නිසා රාගය, කාමය, තෘෂ්ණාව, පුද්ගලයාගේ සිතින් බැහැර වෙයි.

ඉපදීමත් සමඟ මරණය ද අනිවාර්ය බව සිහි කිරීම මරණානුස්සති භාවනාව තුළින් සිදු කරයි. ජීවිතය පිළිබඳ ඇල්ම ආශාව ඒ තුළින් දුරස් වෙයි. සමාජයේ සෑම දෙයකම ස්වභාවය අනියත බව මෙයින් තේරුම් ගනී.

සමස්තයක් ලෙස භාවනාව පුද්ගල සන්තානය සුවපත් කිරීමට මහෝපකාරී වෙයි. බෞද්ධාගමෙහි උගන්වන ස්වයං පාලනය පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ විවිධ අවස්ථාවල දී කර තිබෙන දේශනා අදාළ කර ගත හැකි වෙයි.

> "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි
> චේතයිත්වා කම්මං කරෝති
> කායේන වාචාය මනසා"

මෙම දේශනාව තුළින් ගම්‍ය වන්නේ චේතනාව ම කර්මය වන බවත්, චේතනාව තුළින් යම් යම් ක්‍රියාවන් කිරීමට පෙළඹෙන බවත් සහ සිත කය වචනය යන තිදොර එම ක්‍රියාවන් කිරීමට මූලික වන බවත් ය.

සිතෙන් යහපත් දෙයක් සිතා එම යහපත් සිතිවිල්ල ක්‍රියාවට නැංවීමට කය හෝ වචනය උපයෝගී කර ගනී. එවන් සමාජයක් ස්වයං පාලනයක් සහිත සමාජයක් වෙයි. එසේම සිතෙන් අකටයුත්තක් අයහපත් සිතිවිල්ලක් සිතා එම සිතිවිල්ල කයෙන් හෝ වචනයෙන් ක්‍රියාවට පරිවර්තනය කරයි නම් එම සමාජය හෝ පුද්ගලයා පාලනය කිරීමට වෙනත් බලවේගයක් පැවැතිය යුතු ය. එබැවින් මෙම ස්වයං පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම මුළුමනින් ම මනස මුල් කර ගෙන සිදු කරන ක්‍රියාවලියක් බව පෙන්විය හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

සමස්ත සමාජයේ සිදුවන සෑම ක්‍රියාවලියක්ම සිත කය වචනය පදනම් කර ගෙන සිදු වන බැවින් එම තිදොර සංවර කර ගැනීම තුළින් ස්වයං පාලනයක් සිදු වන බව බුදුරජාණන් වහන්සේ මෙසේ අනු දැන වදාරා ඇත.

"කායෙන සංවරෝ සාධු
සාධු වාචාය සංවරෝ
මනසා සංවරෝ සාධු
සාධු සබ්බත්ථ සංවරෝ"

කය සංවර කිරීම, වචනය සංවර කිරීම සහ මනස සංවර කිරීම මගින් පුද්ගලයාගේ (කායික, වාචසික, මානසික) පාලනයක් සිදු වන බව ප්‍රකාශ කරයි. සමාජ පාලනයට ඉතාම වැදගත් දේශනයක් ලෙස මෙය දැක්විය හැකි ය.

බුදුරජාණන් වහන්සේ තම දහම තුළින් පුද්ගල ස්වයං පාලනයට අදාළව දේශනා කළ වටින දහම වූයේ පංච ශීලයයි. බෞද්ධයකු වන සෑම අයෙකුම මැනවින් පිළිපැදිය යුතු දහමක් ලෙස සැලකෙන පංච ශීලය පුද්ගල කායික හා ආධ්‍යාත්මික සංවරය සඳහාම දේශනා කරන ලද්දකි.

ආටානාටිය සූත්‍රයෙහි සඳහන් වන අන්දමට උසස් මධ්‍යම සහ පහත් බොහෝ අමනුෂ්‍යයෝ බුදුරජාණන් වහන්සේට ප්‍රිය බවක් නොදක්වති. ඊට හේතුව උන්වහන්සේ පංච ශීලය ආරක්ෂා කරන්නැයි උගන්වන බැවිනි.

පංච ශීල ප්‍රතිපදාවට ප්‍රිය නොකරන අය ඇත්තේ අමනුෂ්‍යයන් අතර බව ඉන් පැහැදිලි වෙයි. පන්සිල් නොරකින මිනිසා වැටෙන්නේ ද ඒ ගණයටයි. පංච ශීලය යනු ආගමික වශයෙන් බෞද්ධ සංකල්පයක් වුවද සමාජමය වශයෙන් සාර්ව සදාචාරාත්මක ඉගැන්වීමක් වීම ඊට හේතුවයි.

බුදුරාජාණන් වහන්සේ බෞද්ධයකු විසින් නිරන්තරව ම පංච ශීලය රැකිය යුතු බව දේශනා කළ අතර විශේෂ අවස්ථාවක දී ශික්ෂා පද අටක් හෝ දහයක් ආරක්ෂා කිරීම වැදගත් වන බව දේශනා කර තිබේ.

"සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේ භායන්ති මච්චුනෝ
අත්ථානං උපමං කත්වා
න හනෙය්‍ය නඝාතයෙ"

සියලුම සත්ත්වයෝ දඬුවමට බිය බවත්, එසේම මරණයට බිය බවත් එනිසා කිසිදු සත්ත්වයකුට තමාට තමා උපමාකර දඬුවම් නොකළ යුතු ය. කිසිදු සත්ත්වයකු මරණයට පත් නොකළ යුතු ය.

අද ලෝකයේ සියලු ම අපරාධ අතර ප්‍රාණඝාතය තරම් අකුසලයක් වන අපරාධයක් නොමැත. පුද්ගලයකුගේ ජීවිතය අහිමි වීම හෙවත් ජීවත් වීමේ අයිතිය තහවුරු වීමක් නොමැති වීම නිසා එයින් සමස්ත සමාජ පද්ධතියටම සිදු වන පාඩුව අති මහත් ය. මේ නිසා අභය දානය දීම තරම් තවත් කුසල කර්මයක් නැත.

පංච ශීලයේ අඩංගු මෙම ශික්ෂා පද ආරක්ෂා කරන සමාජයක් දැහැමි සමාජයක් වේ. එවැනි සමාජයකින් මානව සංහතියටම සේවයක් මිස අහිතක් සිදු නොවේ. සමස්ත සමාජයට එසේ ක්‍රියාත්මක වීමේ දී සමාජ ස්වයං පාලනයක් තුළින් දැහැමි සමාජයක් ගොඩ නැගෙනු ඇත. සැපසේ ජීවත්වීමේ අයිතිය තහවුරු වීමත්, සත්‍යවාදී වීමත් නිසා සමාජයේ යථාවත් පැවැත්ම තහවුරු වන අතර තමාට සාපේක්ෂව සිතා අනුන් වෙත යහපත උදා කිරීමට පසුබිම සැකසේ.

කෙනෙකු දුකට හෝ වේදනාවට පත් කිරීම සදාචාරාත්මක ලෝකයේ දී ඉතා බරපතල ලෙස ප්‍රතික්ෂේප කරයි. නූතන මානව හිමිකම් ලෙස නීතිගත වන්නේ අතීතයේ බුද්ධ දේශනාවෙන් ඇති වූ මානවීය උත්තරීතර පැවැත්මයි.

බෞද්ධ සමාජය තුළ ශ්‍රාවක සමූහයා ප්‍රධාන කාණ්ඩ දෙකකට වෙන් කර තිබෙන බව අපි දනිමු.

i. පැවිදි ශ්‍රාවක පිරිස
ii. ගිහි ශ්‍රාවක පිරිස

භික්ෂු භික්ෂුණී දෙපිරිස ඇතුළත් පැවිදි ශ්‍රාවක පිරිස බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කරන බැවින් මෙම පංචශීල ශික්ෂා පද උන්වහන්සේලාට අදාළ නොවේ. එහෙත් උපාසක උපාසිකා වශයෙන් හඳුන්වන ගිහි ශ්‍රාවක පිරිස විසින් මනා ලෙස සුරැකිය යුතු ශික්ෂා ලෙස පංචශීලය නම් කළ හැකි ය.

පුද්ගලයා වැරදි කාමයෙහි යෙදීමෙන් පුද්ගල විසංවිධානයට වඩා සමාජ විසංවිධානයක් සිදු වන බව අවබෝධ කර ගත යුතු වෙයි. ස්වාමි-භාර්යා විශ්වාසය බිඳවැටීම නිසා පවුලේ සමගිය, සෞඛ්‍යය බිඳ වැටේ. අන්‍යෝන්‍ය සුහදතාව බිඳ වැටේ. සමස්ත සමාජ පද්ධතිය ම අවුල් වියවුල්කාරී තත්ත්වයකට පත් වේ.

වර්තමාන ලෝකයේ පවුල් විසංවිධානයට හා බරපතල කාම අපරාධ හා ගැටුම්වලටත් මූලික හේතුව කාම මිථ්‍යාචාරය යි. බොහෝ පවුල් බිඳ වැටීම නිසා දූ දරුවන් අනාථ භාවයට පත් වීම මෙන් ම සමස්ත සමාජයේ සදාචාර රාමුව බිඳ වැටීම ද කාම මිථ්‍යාචාරය නිසා ඇති වී තිබෙන බරපතල සමාජ ව්‍යසනයකි. සමාජයක් චිරාත් කාලයක් පැවැත්මට අවශ්‍ය මූලික


නොමිලේ බෙදා හැරීම සඳහා ය

අඩිතාලම වැටී ඇත්තේ මූලිකව ම පවුල හා සම්බන්ධ වූ පති පතිනියන්ගේ සදාචාරය හා සම්බන්ධ ක්‍රියා කලාපය මත ය. යුවතිපති විශ්වාසය බිඳ වැටීම තුළින් සමාජ විසංවිධානයක් නිර්මාණය වෙයි. ඒ නිසා සදාචාරාත්මක බෞද්ධ සමාජයක් සඳහා පංචශීලයේ තෙවැනි ශික්ෂා පදය රැකීම අතිශයින් ම මහෝපකාරී වෙයි. ඒ තුළින් ස්වයං විනයක් සමාජයේ නිර්මාණය වන අතර සමාජය තුළ ද ස්වයං චර්යා පාලනයක් නිරායාසයෙන් ගොඩ නැගෙනු ඇත.

භාෂාව හා කථනය සම්බන්ධ සිව්වැනි ශික්ෂා පදය ද මනාව ආරක්ෂා කළ යුත්තකි. මිනිස් සබඳතා විනාශ කරන භාෂාමය ක්‍රියාවලිය මුසාවාදය වන බැවින් මුසාවාදයෙන් වැළකීම සමාජ සත්ත්වයකුට අත්‍යවශ්‍ය ම කාරණයක් බව පෙන්වා දිය හැකි ය.

බොරුව යනු නිර්මාණශීලී භාෂාමය ප්‍රකාශනයකි. "මිනිස් සබඳතා විනාශ කරන භාෂාමය ක්‍රියාවලිය මුසාවාදය" ලෙස ද මෙය නිර්වචනය කළ හැකි ය. බොරු කියන්නාට නොකළ හැක්කක් නොමැත. පංචශීලයේ අඩංගු අනෙකුත් සිල්පද හතරම පහසුවෙන් ඛණ්ඩනය කළ හැක්කේ බොරු කියන්නාට පමණි. බොරුවක් ප්‍රකාශ කිරීම යනු අනිවාර්යයෙන් ම තමන් නොකරන හෝ සිදු නොවූ දෙයක් සත්‍යයක් ලෙසින් වචනයෙන් එළිදැක්වීම යි.

පන්සිය පනස් ජාතක පොතේ දැක්වෙන්නේ බුදුරජාණන් වහන්සේගේ පෙර ආත්මභවයන් පිළිබඳ විමසීමකි. උන්වහන්සේගේ බෝධිසත්ව ජීවිතයේ යහපත් වූ ගති පැවැතුම් මෙහි විස්තර වශයෙන් දක්වා ඇත. ඒවා පුද්ගල ජීවිතයට සම්බන්ධ කර ගැනීම තුළින් හොඳ සමාජ පාලනයකට මග හෙළිකර දෙයි. ජාතක පොතේ එන සෑම ජාතක කථාවක්ම මේ සඳහා නිදසුන් ලෙස ගත හැකි ය.

විමානවත්ථුප්පකරණය තුළින් කියවෙන්නේ හොඳ වැඩ කර මිය ගිය අය දිව්‍ය ලෝකයේ ඉපදී සිටින ආකාරය පිළිබඳවත්, ඔවුන් දිව්‍ය ලෝකයේ ඉපදීම සඳහා හේතු වූ කුසල කර්ම පිළිබඳවත් පැහැදිලි කිරීමකි. එසේ ම පේතවත්ථුප්පකරණය තුළින් දක්වා තිබෙන්නේ අපායගාමී අකුසල කර්ම කළ අය තමන් කරන ලද අකුසල කර්මය නිසා අපායගාමී වූ ආකාරය පිළිබඳව යි.

මෙසේ බෞද්ධ සාහිත්‍ය අධ්‍යයනය කිරීමෙන් සමාජයේ පුද්ගලයන් ඒවායේ අඩංගු යහ චර්යා තමාගේ ජීවිතයට සම්බන්ධ කර ගත යුතු වෙයි. ඒ තුළින් සමාජය දුශ්චරිතවලින් බැහැර වී යහපත් චරිත සකස් කර ගනී. මේ අනුව බෞද්ධ සාහිත්‍ය අධ්‍යයනය කිරීමෙන් ස්වයං පාලනයකට මඟ හෙළි කර දෙයි.

බෞද්ධ සිද්ධස්ථානවල දක්නට ලැබෙන චිත්‍ර මූර්ති සහ කැටයම්වලින් ද සමාජ පාලනය සඳහා කිසියම් පිටිවහලක් ලැබී ඇත. මේ සඳහා දැක්විය හැකි උදාහරණ නම් විහාර මන්දිරවල නිර්මාණය කර ඇති අපාය සහ දිව්‍ය ලෝක දක්වෙන නිර්මාණයන් ය. මාතලේ අළුවිහාරය, මාතලේ කවටයාමුන විහාරය, මාතර වැවුරුකන්නල විහාරය යන ස්ථානයන්හි අපාය මූර්තිමත් කර ඇත.

මෙම විහාරස්ථානවල විහාර මන්දිරයන්හි ඇඳ තිබෙන අපාය දක්වෙන සිතුවම් නැරඹීමෙන් දුශ්චරිතයෙන් පුද්ගලයා දුරස් වෙයි. එසේම දිව්‍යලෝකවල ස්වභාවය නැරඹීමත් සමඟ සුචරිත ගැමි පිරිසක් සමාජයේ බිහි විය හැකිය. එය පුද්ගල ස්වයං පාලනයට ඉවහල් වේ.

හොඳ නරක පිළිබඳ ව බෞද්ධ නිර්ණායක ද අපි මෙහි දී අවධාරණයට යොමු කරමු. පස්පව්වලින් සහ දස අකුසල්වලින් වෙන් වන්නා හොඳ පුද්ගලයකු ලෙස ද පස් පව්වල හා දස අකුසලේ නියලෙන්නා පාපී නරක පුද්ගලයකු ලෙස ද පිළිගනී. බුදු දහමට අනුව 'කුසල්' ලෙස සලකන්නේ කිසියම් දක්ෂතාවකින් යුක්ත යහපත් ක්‍රියාවන් ය. හොඳ යහපත් දේ කිරීමට යම් දක්ෂතාවක් පැවැතීම අවශ්‍ය වෙයි. නරක අයහපත් යමක් කිරීමට දක්ෂතාවක් අවශ්‍ය නොවේ. එවැනි ක්‍රියාවක් කිරීමට පහසු ය. බුදුරජාණන් වහන්සේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දී රාහුල හිමියන්ට ක්‍රියාවක ප්‍රතිඵල දෙස බලා හොඳ නරක තීරණය කරන ලෙස මෙසේ දේශනා කළ සේක. "මගේ ක්‍රියාව මට දුක් පිණිස ද මටත් අනුන්ටත් දුක් පිණිස ද වේ නම් එය අකුසල් දුක් විපාක ලැබෙන නිසා එය නොකළ යුතු ය." කයින් වචනයෙන් සිතින් ක්‍රියාවක් කිරීමට පෙර කරන අවස්ථාවේ දී ද එයින් පසුව ද මේ අයුරින් සිතා බලා කුසලයේ යෙදිය යුතු ය, අකුසලින් වෙන් විය යුතු ය, යනුවෙන් ඉන් කියැවේ. රාහුල හිමියන්ට බුදුරජාණන් වහන්සේ කැඩපතක් උපමා කොට කැඩපත දෙස බලා තම මුහුණේ අඩු පාඩු සකසා ගන්නා මෙන් තමා නිරත ක්‍රියා පිළිබඳ ව ද එසේ ම සිතිය යුතු යයි පැවසූ හ.

අංගුත්තර නිකායේ ආධිපත්‍යය සූත්‍රයේ දී ආධිපත්‍ය 3ක් දේශනා කළේ ද හොඳ නරක පිළිබඳ ව දැනුවත් කිරීමට ය.

i. අත්තාධිපතෙය්‍යය - යමක් කිරීමට පෙර තමන්ගේ අදහස් හා ගැලපේ දැයි යන්න විමසා බැලීම.

ii. ලෝකාධිපතෙය්‍යය - යමක් කිරීමට පෙර ලෝකයාට අනුව එම ක්‍රියාව කොතරම් ගැලපේ ද යන්න විමසා බැලීම.

iii. ධර්මාධිපතෙය්‍ය - සමාජ ධර්මවලට අනුව තමා කරන ක්‍රියාව කොතරම් ගැලපේ දැයි විමසා බැලීම.

මේ අනුව සූත්‍ර දේශනාවල වැඩිපුර දක්නට ලැබෙන්නේ පුද්ගලයින් ස්වයං පාලනයට අදාළ ධර්මය ඇතුළත් අනුශාසනාවන් ය. තවත් එක් අවස්ථාවක දී උන්වහන්සේ ස්වයං පාලනයක් ඇති වීම සඳහා තමා තුළ පිහිටුවා ගත යුතු ධර්ම කොටස් 4ක් දේශනා කර ඇත. ඒවා ඉතා කෙටියෙන් මෙසේ දැක්විය හැකි ය.

i. අප්පකිච්චතා - (මඳ අවශ්‍යතාවන් ඇති බව)
ii. සන්තුලිතා - (ලද දෙයින් සතුටු වීම)
iii. සල්ලෙකතා - (සැහැල්ලු ගතිපැවතුම් ඇති බව)
iv. සුභරතා - (පහසුවෙන් පෝෂණය කළ හැකි බව)

වසළ සූත්‍රයේ දී පුද්ගලයා වසළයෙක් වන ආකාරයත් පරාභව සූත්‍රයේ දී පුද්ගලයාගේ පිරිහීම සිදු වන ආකාරයත් සහ සිගාලෝවාද සූත්‍රයේ දී අපාය මුඛ හය සහ භෝග විනාශ මුඛ හය ආදී කරුණු සවිස්තරාත්මක ව අධ්‍යයනය කළ විට සමාජයේ ස්වයං පාලනයක් නිරන්තරවම ගොඩ නැගෙයි.

සියලු බුදුවරයන් වහන්සේලාගේ ප්‍රධානතම අනුශාසනාව පිළිබඳ ව ධම්ම පදයේ සඳහන් වේ.

"සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධානසාසනං"

එනම් සියලු පව් නොකිරීම ද කුසල් ඉපිද වීම ද තම සිත දමනය කිරීම ද සියලු බුදුවරුන්ගේ අනුශාසනය බවයි. සමාජයේ ස්වයං පාලනය ඒ මගින් ගොඩනැගෙන බව දක්නට පුළුවන.

බුදු සමයේ ඇති සුවිශේෂී බව වන්නේ බාහිර පාලනයකට වඩා තත්ත්වාබෝධයෙන් යුක්තව තමා විසින්ම ඇති කර ගන්නා ස්වයං පාලන අධිකාරය ඇගයීම යි. ඉන් ලැබෙන සංයත පැවැත්ම සියලු බාධක ජය ගනිමින් ලබා ගන්නා පුළුල් තත්ත්වාවබෝධය වෙත පුද්ගලයා යොමු කරන බවයි.

## අභ්‍යාසය

1. ''අතීත සමාජ පාලන ක්‍රම සාර්ථක වීමට දසරාජ ධර්මය ඉමහත් බලපෑමක් සිදු කරන ලදී '' මෙම අදහස විචාරයට භාජනය කරමින් එහි යහපත් අංශ අගයන්න.

2. අතීත සමාජ පාලන රටාව නෛතික ආධිපත්‍යය දක්වා පරිණාමය වූ ආකාරය විස්තර කරන්න.

3. ලංකාවේ ක්‍රියාත්මක එක් එක් අධිකරණ ආයතන නම් කර ඒවායේ අධිකාරි බලයේ සීමා පැහැදිලි කරන්න.

4. භාවනාව තුළින් සිදුවන සිත පාලනය නිරායාසයෙන්ම මනා සමාජ පාලනයට මග සලසයි. මෙම ප්‍රකාශය නූතන සමාජ වාතාවරණ ඇසුරින් පැහැදිලි කරන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය

# 06 සමාජ ප්‍රශ්න

## 6.1 සමාජ ප්‍රශ්න හඳුනා ගැනීම

සමාජයක් යනු පුද්ගල සමූහ තුළින් සුසංහිත වූ මානව පරිසරයකි. එක් පුද්ගලයෙකු යනු සමාජයක් නොවේ. පුද්ගලිකත්වය සමාජය තුළ විවිධ ලෙස ඉස්මතු වන විට ඒවා සමාජගත ප්‍රශ්න දක්වා ම වර්ධනය වීමේ ඉඩකඩක් ද පවතී. ප්‍රශ්න දෙයාකාර ය. එනම් පුද්ගලික සහ සාමාජයීය වශයෙනි. සමාජීය ප්‍රශ්න සමාජයක් තුළ වර්ධනය වී සමාජයට බලපෑම් කරන අතර පුද්ගලික ප්‍රශ්න පුද්ගලයෙකුට පමණක් බලපායි. සමාජය තුළින් පැන නැඟී සමාජයට බලපෑම් කරන ප්‍රශ්න මොනවා ද යි අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ.

සමාජ ප්‍රශ්නයක් ලෙස අප හඳුන්වන දෙය ඇත්තට ම ගැටලුවක් විය යුතුය. එම ගැටලුව ජන සහභාගිත්වයෙන් විසඳා ගත හැකි විය යුතු ය. ඒ සඳහා සමාජයීය එකතුවක් තිබීම වැදගත් කොට සලකයි. මත් උවදුර, රැකියා වියුක්තිය, ජන වාර්ගික අර්බුදය, අපරාධ, ආත්ම ඝාතනය, ගණිකා වෘත්තිය, ළමා ලිංගික අපචාරය, ප්‍රබල සමාජ ප්‍රශ්න බව හඳුනාගෙන ඇත. මෙම සමාජ ප්‍රශ්න ප්‍රචලිත වෙද්දී ඒ හා බැඳුණු අතුරු ප්‍රතිඵල ද සාමාජීය ප්‍රශ්න ලෙස විද්‍යමාන වේ. රැකියා වියුක්තියේ අතුරුඵල ලෙස ඌණ ආර්ථික රටාවක්, රජයට විරුද්ධ ව කැරලි ගැසීම්, විනාශකාරී ක්‍රියා ද පසුව ප්‍රබල ලෙස වර්ධනය වී සදකාලික ප්‍රශ්න බවට පත්වේ.

සමාජ ප්‍රශ්නයක් ඇතිවන්නා වූ ආකාර කිහිපයක් හඳුනාගෙන ඇත. හොඳ නරක දෙක ම නිසා ප්‍රශ්න ඇතිවේ. නිදසුනක් ලෙස උසස් අධ්‍යාපනය ලැබීම හොඳ ක්‍රියාවකි. නමුත් එයින් ජනිත වන ප්‍රතිඵල ලෙස රැකියා වියුක්තිය සමාජ ප්‍රශ්නයකි. මත්ද්‍රව්‍ය නිසා ඇතිවන්නා වූ සමාජ ප්‍රශ්න ද බොහොමයකි.

පොල් බී.හෝර්ටන් (Paul B. Horton) මේ පිළිබඳ ව දක්වන අදහස සමාජ ප්‍රශ්නයක් යනු සාමාජීය තත්ත්වයක් හෝ සමාජ අවස්ථාවක් බවයි. එසේ ම එය සාමූහික ක්‍රියාකාරිත්වයේ එක්තරා අවස්ථාවකි. එමිල් ඩුර්ක්හයිම් ද සමාජ ප්‍රශ්න පිළිබඳ ව නිර්වචන ඉදිරිපත් කර ඇත. ඔහු අවධාරණය කරන්නේ සමාජ ප්‍රශ්නයක් යනු සමාජ පර්යාය බිඳ වැටීමක් ලෙසිනි. සමාජ ප්‍රශ්නයක ස්වභාවය පිළිබඳ ව අවබෝධ කර ගැනීමේ දී එහි ප්‍රධාන අවස්ථා කිහිපයක් දැකිය හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය


එනම් ප්‍රශ්නයක් යනු සාමාන්‍ය තත්ත්වයෙන් බැහැර වීමකි. මේ නිසා ඇත්තට ම පවතින තත්ත්වය තුළ වෙනසක් ඇතිවිය හැකි ය. මෙම වෙනස ප්‍රබල ව හෝ සාමාන්‍ය ලෙස දැකිය හැකි ය. මෙම තත්ත්වයේ වෙනස නිසා පුද්ගලයාට හෝ සමූහයට බාධාවීම් ආදිය සිදුවේ.

සමාජ ප්‍රශ්න පිළිබඳ ව ප්‍රචලිත නිර්වචනයක් දෙස අවධානය යොමු කරමු. එය මෙසේ ය.

''සාමූහික සමාජ ක්‍රියා මාර්ගයක් මගින් පිළියම් යෙදිය යුතු බවට හැඟී යන්නා වූ සමාජයේ සැලකිය යුතු මිනිසුන් ගණනකට අප්‍රසන්න හා හානිකර ලෙස බලපවත්වන්නා වූ තත්ත්වයක් අවස්ථාවක්'' සමාජ ප්‍රශ්නයකි. මෙම නිර්වචනයේ ප්‍රධාන අර්ථ හතරක් ගැබ් වී ඇත.

1. සමාජයේ සැලකිය යුතු මිනිසුන් ගණනාවකට බලපෑම.
2. බොහෝ අංශවලින් මිනිසුන්ගේ සාමාන්‍ය පැවැත්ම උදෙසා අහිතකර අප්‍රසන්න හානිකර හා අකමැති තත්ත්වය.
3. ඒ පිළිබඳ යම්කිසි ක්‍රියාමාර්ගයක් ගතයුතු බව.
4. ඒ ක්‍රියා මාර්ග ගත හැක්කේ සාමූහික සමාජ ක්‍රියාකාරීත්වය ඇසුරෙන්ය යන්න ය.

සමාජ ප්‍රශ්නයක් දක්වා වර්ධනය විය හැකි අර්බුදකාරි තත්ත්ව පහත සඳහන් සටහන තුළින් හඳුනා ගනිමු.






නොමිලේ බෙදා හැරීම සඳහා ය

සමාජයක් යනුවෙන් විග්‍රහ වන්නේ සම්බන්ධතා ජාලයකි. මෙම සම්බන්ධතා ජාලය ඔස්සේ සමාජය නිරන්තරයෙන් ම වෙනස්වීම්වලට ලක්වෙමින් ඉදිරියට ගමන් කරයි. එහිදී කෙටි කාලීන හා දිගු කාලීන වෙනස්වීම් හා ගැටුම් සිදුවන්නේ ය. මෙම ගැටුම් පුද්ගලයන් අතර මෙන් ම සමූහයන් අතර ද නොයෙකුත් ආකාරයේ අර්බුද ලෙස පැන නැගිය හැකි ය. පුද්ගලයෙකු හා තවත් එවැනි ම පුද්ගලයෙකු අතර සිදුවන සමාජ ක්‍රියාකාරකම එම දෙදෙනාට පමණක් සීමාවේ. එය සමාජ ප්‍රශ්නයක් ලෙස සැලකිය නොහැකිය. නමුත් සමූහයක් සහ තවත් එවැනි ම සමූහයක් අතර සිදුවන්නාවූ සංකීර්ණ ගැටුම් මගින් මුළු මහත් සමාජයට ම බලපෑමක් සිදුවන්නේ ය. උදාහරණයක් ලෙසට ශ්‍රී ලංකාවේ තිස් වසරකට ආසන්න කාලයක් පැවති ජනවාර්ගික පසුබිමක් සහිත යුද්ධය හේතුවෙන් එක් පුද්ගලයකුට හෝ එක් එක් ජන කොටස්වලට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවාසී සමාජයට ම බලපෑමක් සිදුවිය.

කාන්තාවන් වැන්දඹුවන් වීමටත් ඒ හේතුවෙන් විසංවිධානය වූ පවුල් බිහිවීමත්, අපරාධකාරී ක්‍රියා වැඩි වීමත්, යුද අනතුරු හේතුවෙන් ආබාධ ඇති පුද්ගලයන් සමාජයට එකතුවීමත් නිසා යුද්ධය මුළුමහත් සමාජයට ම අහිතකර ලෙස බලපෑ බව සඳහන් කළ යුතු ය.

සමාජයක් තුළ සිදුවන්නා වූ යම්කිසි අර්බුදකාරී ක්‍රියාකාරකමක් හේතුවෙන් සමාජ ප්‍රශ්නයක් නිර්මාණය වන්නේ ය. එලෙස නිර්මාණය වූ සමාජ ප්‍රශ්න සමාජයේ ජීවත් වන සාමාජිකයන් වැඩි දෙනෙකු හට අහිතකර ලෙස බලපානු ලබන බව ඉහත තොරතුරුවලින් පැහැදිලි වේ.

සමාජ ප්‍රශ්න පැවැතීම සමාජයට කිහිප ආකාරයෙන් ම අවාසිදයක අයුරින් බලපානු ලබයි. සමාජයේ සාමාජිකයන් එම සමාජ ප්‍රශ්න හේතුවෙන් නොයෙකුත් දුෂ්කරතාවන්ට ගොදුරු වන්නේ ය. ශ්‍රී ලංකාව ආශ්‍රිතව මෙය සලකා බැලීමේ දී යුද්ධය නිසා නිරායුධ සාමාන්‍ය ජනතාව අනතුරට පත්විය. රටේ ආර්ථික සංවර්ධනයට වැය කළ යුතු මුදල් ප්‍රමාණය අඩු වූ අතර යුද්ධය සඳහා වැය කිරීමට සිදුවන මුදල් ප්‍රමාණය අධික විය. එම තත්ත්වය නිසා රටේ ආර්ථික හා සාමාජීය වර්ධනය ඇණහිට තිබූ අතර සාමාන්‍ය ජන ජීවිතය අවුලට පත්විය. ඒ සමගම බැඳුණු අතුරුඵල විපාක රැසක් රටේ හා සමාජයේ උන්නතියට අහිතකර ලෙස බලපෑවේය. මේ ඕනෑම රටක සමාජ ප්‍රශ්නයක් ඇතිවීම හේතුවෙන් බරපතල අතුරු ප්‍රශ්න රාශියක්ද එම සමාජය තුළ ජනිත වේ. එබැවින් එම සමාජ ප්‍රශ්න

හරියාකාර ව හඳුනාගෙන එයට විසඳුම් සපයා දීම තුළින් එම ප්‍රශ්නය මගින් ඇතිවන්නා වූ අනෙකුත් අතුරු සමාජ ප්‍රශ්න උද්ගත වීම වළක්වාලිය හැකි ය. එයට හේතු වන්නේ සමාජ ප්‍රශ්න ද එකිනෙක ඇඳුණු සංයුක්ත නිර්මාණයන් වීම නිසා ය.

එමිල් ඩුර්ක්හයිම් නම් සමාජ විද්‍යාඥයා සමාජ ප්‍රශ්න ගැන ප්‍රකාශ කරන්නේ "යාන්ත්‍රික ව ඒකාබද්ධ සමාජය තුළ සමාජයේ කලින් පැවති සාරධර්මවල බිඳ වැටීමක් ලෙසට සමාජ ප්‍රශ්න හිස ඔසවන බවයි. අනෝමිය සංකල්පය මේ යටතේ වැදගත් වේ. ප්‍රතිමාන බිඳවැටීම හෙවත් සාරධර්ම බිඳවැටීම මත වෙනස්වන සමාජයේ පැවැත්ම ව්‍යාකූල වන්නේ ය. සාමූහික පැවැත්ම පළුදු වීම මෙයට හේතු වන්නේ ය. ඒ අනුව එමිල් ඩුර්ක්හයිම් ප්‍රකාශ කරන්නේ අපරාධකරුවෙකුට දඬුවම් කළ යුතු වන්නේ එය පුද්ගලයෙකුට දෙන දඬුවමක් වශයෙන් නොව එමඟින් සමාජ විඥ්ඥාණය වඩවාලීමට ද හැකියාවක් ඇතිවන නිසා ය.

ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යා විෂය ප්‍රචලිත කිරීම සඳහා මහඟු මෙහෙවරක නිරත වූ මහාචාර්ය නන්දසේන රත්නපාල සමාජ ගැටලුවක් යන්න මෙසේ විග්‍රහ කර ඇත. "සමාජය පිළිගත් සාමාජීය විශිෂ්ටාර්ථයන්ගෙන් පිටව යාම සමාජ ගැටලුවකි." යම්කිසි සමාජයක් විසින් මෙන්න මේ ආකාරයෙන් අප පැවතිය යුතුයැයි කරන ලද සම්මතය, ඒ සමූහය හෝ සමාජයේ ම ජීවත් වන වැඩි පිරිසක් විසින් උල්ලංඝණය කරනු ලැබේ ද සමාජ ප්‍රශ්නයක් එතැන මතුවේ යැයි මහාචාර්ය නන්දසේන රත්නපාල තව දුරටත් විග්‍රහ කර තිබේ.

සමාජ විද්‍යා විශ්වකෝෂයෙහි සමාජ ප්‍රශ්න පිළිබඳ ව හඳුන්වා දී ඇත්තේ මානව සමාජයේ ක්‍රියාකාරිත්වයන් අවුල් සහගත තත්ත්වයට පත්කිරීමක් ලෙසට යි. නැතහොත් මානව සමාජයේ අරමුණු දියකර හැරීමක් ලෙසට යි. සමාජ විද්‍යාඥයින් එවැනි ප්‍රශ්න පැහැදිලි ලෙස මාතෘකාවලට බෙදා විවිධ අංශ ඔස්සේ අධ්‍යයනය කර මත ප්‍රකාශ කර තිබෙන බව එහි සඳහන් කර ඇත.

එබැවින් ඉහත සඳහන් සියලු ම ආකාරයේ නිර්වචන අනුව පැහැදිලි වන්නේ සමාජය තුළින් පැනනගින්නා වූ ද, සමාජයේ පොදු ක්‍රියාකාරිත්වයට බාධාකරන්නා වූද, ඒ පිළිබඳ පොදු අවබෝධයක් ඇත්තා වූද, පාලනය කරගැනීමට සාමූහික උත්සාහයක් පවතින්නා වූද සමාජ සංසිද්ධි සමාජ ප්‍රශ්න ලෙස හඳුන්වා දිය හැකි බවයි.

## 6.2 අපරාධ පිළිබඳ ගැටලුව සමාජ ප්‍රශ්නයක් ලෙස හඳුනා ගැනීම.

සමාජ විද්‍යාඥයන්ගේ විග්‍රහයන්ට අනුව අපරාධ යනුවෙන් අදහස් කරනු ලබන්නේ පුද්ගලයා තුළ ඇති වන සමාජ සහ සංස්කෘතික හිස්බවේ බලපෑමකි. එසේ නම් අපරාධකරුවා යම් යම් සමාජ සංස්කෘතික අවශ්‍යතා පූර්ණ නොවන අසමතුලිත පෞරුෂයකින් හෙබි පුද්ගලයෙකි.

සමාජයක සම්මත නීති කැඩීම පෙරළා සමාජයට ම අහිතකර අයුරින් බලපාන බැවින් එම සමාජ විරෝධී චර්යාව අපරාධයක් ලෙසට පවතින නීතිය මඟින් සලකනු ලබන බව "ටැෆ්ට්" (Taft) විසින් රචිත "අපරාධ විද්‍යාව" (Criminology) නම් ග්‍රන්ථයෙන් ප්‍රකාශ කර ඇත.

"අපරාධය" යන්න සමාජයෙන් ම අර්ථකථනය වී ඇති ආකාරය සලකා බැලීමේ දී එය සමාජයේ වැඩි දෙනා විසින් හොඳ හෝ නරක ලෙසින් නිර්වචනය කර ඇති ඇගයුම් මත පාදක වී ඇති දෙයක් බව පෙනේ. "යම් ක්‍රියාවක් හොඳ හෝ නරක වන්නේ එම ක්‍රියාවේ අභිප්‍රාය නිසා ද නොවේ. එම ක්‍රියාවේ ප්‍රතිඵලය නිසා ද නොවේ. ප්‍රතිඵලය හොඳ වුවත් අභිප්‍රාය නරක විය හැකි ය. අභිප්‍රාය හොඳ වුවත් ප්‍රතිඵලය නරක විය හැකි ය. එබැවින් අපරාධයක් තීරණය වන්නේ එම ක්‍රියාව හා චේතනාව යන දෙක ම සාපරාධී වීම මතය."

යම් සමාජයක අපේක්ෂිත හැසිරීම් රටාවෙන් අපගමනය වන්නා වූ අයෙක් අපරාධකරුවෙක් ලෙස පිළිගනු ලැබිණි.

සමාජයක යම් සම්මත හැසිරීමක් කඩා බිඳ දැමීම කාරුණික බව, අවංකභාවය ආදී මානුෂික හැඟීම්වලට විරුද්ධ වූ ද, එහෙයින් සමාජයට ද අහිතකර ක්‍රියා අපරාධ ගණයේ ලා සැලකූ අතර ඒවා ස්වභාවිකව ම වන අපරාධ ලෙසට අපරාධ විද්‍යාවේ න්‍යායාචාර්යවරයෙකු ලෙස සලකනු ලබන්නා වූ ''ගරා පෝල්'' නම් අපරාධ විද්‍යාඥයා විසින් අර්ථකථනය කර ඇත.

මෙම නිර්වචනය තුළ පවතින අඩුපාඩු පැහැදිලි කරන පසුකාලීන චින්තකයන් අපරාධයෙහි ඇති නිශ්චිත මනුෂ්‍ය ස්වභාවයන් හෝ අනුභූතිමය සත්‍යයක් මෙහි දක්නට නොලැබෙන බව පෙන්වාදෙන ලදී. එනම් සමාජයෙන් සමාජයට සංස්කෘතියෙන් සංස්කෘතියට ප්‍රතිවිපාක සහ සාරධර්ම විවිධ වූ ස්වරූපයක් උසුලනු ලබන බවයි. අපරාධයක් යනුවෙන් අදහස් කරනු ලබන්නේ පොදුවේ සදාචාරයට පටහැනි ව කෙරෙන ක්‍රියාවකි. අපරාධ නීතිය උල්ලංඝනය කරන ක්‍රියාවක් ලෙසට ද අපරාධ යන්න හඳුනාගත හැකි ය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

ඒ ඒ සමාජ හා සමූහ විසින් සදාචාරය අපරාධ නීතිය පිළිබඳ ව ඇති කරගෙන ඇති සීමාවන් හා සම්මතයන්ට අනුව අපරාධකාරී චර්යාව හඳුනාගත හැකි ය.

අපරාධයක් යනු නීතියෙන් නම් කළ නොකළ යුතු යමක් සිදුකිරීම හෝ සිදු කළ යුතු යමක් පැහැර හැරීමක් ලෙසද දැක්විය හැකි ය. විශේෂයෙන් වර්තමාන නීති පද්ධතිය ක්‍රියාත්මක වනුයේ මෙම පදනමට අනුකූලව ය.

සමාජ විද්‍යා ශබ්ද කෝෂයට අනුව අපරාධයක් යනු නීතියෙන් තහනම් කළ හා දඬුවමට යටත් කළ ඕනෑම ක්‍රියාවකි.

අපරාධ පිළිබඳ නොයෙක් විද්‍යාඥයින් නිර්වචන ඉදිරිපත් කර ඇත. සමාජ විද්‍යාවට අනුව අපරාධ විග්‍රහ කර ඇත්තේ සමාජ සාධක පදනම් කර ගෙනයි. ඒ අනුව අපරාධයක් සිදු කිරීමට බලපාන හේතු ගණනාවක් පවතියි. අපරාධ සිදුකිරීමට කායික හේතු මුල් වී ඇති බව ඉතාලි ජාතික සිසාරෝ ලොම්බ්‍රෝසෝ (Cessaro Lombroso) නම් ජීව විද්‍යාඥයා පෙන්වා දී ඇත. ඒ බව සනාථ කිරීමට ඉතාලි බන්ධනාගාර ගත වී සිටි සිරකරුවන් ගණනාවක් පරීක්‍ෂා කිරීමේ දී සිසාරෝට පැහැදිලි වී ඇත්තේ එම සිරකරුවන්ගේ කායික විකෘතිතා හා අස්වාභාවික කායික ලක්‍ෂණ දක්නට තිබූ බව යි. මෙම සිද්ධාන්තය පසුව ප්‍රතික්ෂේප විය.

කායික හේතු පාරිසරික හේතු නිසා පමණක් නොව මනෝ විද්‍යාත්මක සාධක මත ද පුද්ගලයා අපරාධවලට යොමුවන බව මනෝ විද්‍යාඥයින් පෙන්වා දී ඇත. ජෝන් ඩොලාඩ් හා මිලර් යන මනෝ විද්‍යාඥයින් පෙන්වා දී ඇත්තේ මානසික වශයෙන් බලපාන හේතු නිසා අපරාධ කිරීමට පෙළඹෙන බව යි. යමෙකුට ඉච්ඡාභංගත්වය හෙවත් තමන් බලාපොරොත්තුවන අරමුණු සාර්ථක නොවීමෙන් ඇතිවන මානසික පීඩනය හේතුවෙන් ඔහු තුළ ගොඩනැගෙන ආක්‍රමණික, මානසික පෙළඹවීම අපරාධ සිදු කිරීමට හේතුවෙන බව පෙන්වා දී ඇත.

ඉහත තොරතුරු පිළිබඳ ව සලකා බැලීමේදී අපරාධ සිදුවීමට එක් හේතුවක් නොව හේතු ගණනාවක් ම බලපාන අයුරු දැකිය හැකි ය. නූතන සමාජය සංකීර්ණවත් ම සමාජය තුළ එතෙක් පැවති ආචාර ධර්ම සෘණාත්මක ලෙස වෙනස් වීමට පටන් ගනී. මේ හේතුවෙන් සමාජය තුළ අනෝමීය තත්ත්වයක් ගොඩනැගේ. අනෝමීය තත්ත්වයක් යනු ධර්මතා බිඳවැටීමයි. නූතනයේ නවීකරණය, නාගරීකරණය හා කාර්මීකරණය නිසා සාමාජීය වශයෙන් සිදු වී ඇති වෙනස්වීම් බොහෝ විට සමාජ අපගමනතාවන්ට හේතු වී තිබේ.

ඩබ්ලිව්. ඒ. බොන්ගර් (W.A. Bonger) අපරාධ පිළිබඳ මෙසේ වර්ගීකරණය කර දක්වා ඇත.

1. ආර්ථික අපරාධ
2. ලිංගික අපරාධ
3. දේශපාලන අපරාධ
4. විවිධ අපරාධ

මේ හැරුන විට විවිධ සමාජ විද්‍යාඥයන් විවිධ වර්ගීකරණ මේ සඳහා ඉදිරිපත් කර ඇත.

අපරාධයක් හුදකලාව සිදු වුවද එය සමාජ ගැටලුවක් ලෙස සැලකිය යුතු වන්නේ එයින් සමාජයට ඇතිවන බලපෑම් නිසා ය. මහජන දේපල හෝ රජයට එරෙහි ව සිදුකරන අපරාධ සමස්ත සමාජයට ම පීඩාකාරී බලපෑම් ඇති කරයි. විශේෂයෙන් මහා පරිමාණ දූෂණ, වංචා නිසා ඇතැම් විට රටක් බරපතල ආර්ථික අර්බුදයකට ද පාත්‍ර විය හැකි ය.

අපරාධ චර්යාවන් නිසා සමාජය තුළ ඇතිවන මානසික, ආර්ථික හා සමාජ පීඩනය නිසාවෙන් දිගුකාලීන අයහපත් ප්‍රතිඵල ඇතිවිය හැකි ය. විශේෂයෙන් බාලවයස්කරුවන්ට එරෙහි අපරාධ පසුකාලීන ව අයහපත් පෞරුෂ ලක්ෂණ ඇතිවීමට හේතු වේ. අපරාධ නිසා සමාජය තුළ භීතියක් මෙන් ම අසමතුලිතතාවක් ඇතිවේ. එය සාමාන්‍ය ජන ජීවිතය අවුල් කරන අතර ම රටේ ආර්ථිකයට ද අයහපත් ලෙස බලපායි.

අපරාධ වැළැක්වීම සාමූහික ක්‍රියාවලියකි. ඒ සඳහා මහජන සහයෝගය නීතිය ක්‍රියාත්මක කරන පාර්ශ්වවලට ලැබීම අත්‍යවශ්‍ය ය. අපරාධ පිළිබඳ තොරතුරු වසන් කිරීම ද අපරාධයක් ලෙස නීතිය සලකනු ලබන්නේ එහෙයිනි. එබැවින් සමාජයේ යථා පැවැත්මට සියලු පුරවැසියන් අපරාධ වැළැක්වීමට තනිතනිවත් සාමූහිකවත් ක්‍රියාත්මක විය යුතු ය.

වර්තමානය වනවිට දියුණු රටවලත් දියුණු වෙමින් පවතින රටවලත් අපරාධ ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී ඇත. මෙම වර්ධනයට හේතු වශයෙන් දේශපාලන ත්‍රස්තවාදය හා යුදමය ත්‍රස්තවාදය හඳුන්වා දීමට හැකි ය. මෙසේ සිදුවන කුමන ආකාරයේ අපරාධයක් වුවද සමාජ පරිහානියට හේතුවන බව කිව යුතු ය.

## 6.3 ජනවාර්ගික අර්බුදය සමාජ ප්‍රශ්නයක් ලෙස විග්‍රහ කිරීම

### ජනවාර්ගික අර්බුදය යනු කුමක්ද?

සමාජ ප්‍රශ්න අතර තවත් එක් ප්‍රධාන ගැටලුවක් වශයෙන් ජනවාර්ගික අර්බුදය පිළිබඳ ගැටලුව සඳහන් කළ හැකි ය. මීට පෙර සඳහන් කළ පරිදි සමාජය සංකීර්ණ වූවකි. ජනවාර්ගික අර්බුදය පිළිබඳ ගැටලුව පැන නගින්නේ මෙවැනි පරිසරයක් තුළ ය. එක් ජන කොටසක් අනුමත කරන කිසිවක් තවත් ජන කොටසක් විසින් ප්‍රතික්ෂේප කරයි. මෙය එක් එක් ජන සමාජයන් තුළ පවතින ඔවුන්ට ආවේණික වූ අගනාකම් හා ධර්මතාවන්ගේ විෂමතාව නිසා සිදු විය හැකි ය. එසේත් නොමැති නම් ජන කොටස් අතර පවතින සදාකාලික විරෝධතාව විය හැකි ය. මේ නිසා යම් යම් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ බාධා මතු කරයි. රටක යහපැවැත්ම ඇත්තේ සියලු ම ජනයාගේ සහජීවනය මතයි. නමුත් මේ තත්ත්වය බිඳ වැටීම සමාජ ප්‍රශ්නයකි. රටේ සංවර්ධනයට බාධාවකි. යම්කිසි රටක ප්‍රතිරූපයට වන හානියකි. ලෝකයේ රටවල් රාශියක අද ත්‍රස්තවාදය පවතින්නේ මෙම ජනවාර්ගික අර්බුදය පාදක කර ගනිමිනි.

ජීවන රටාව අනුව ජන වර්ගයක් හඳුනා ගත හැකි ය. නැතහොත් සෙසු ජන කණ්ඩායම්වලින් වෙන් කිරීමට පිළිවන. ජනවාර්ගික කණ්ඩායම් මානව වර්ග මෙන් ශරීරයේ පවත්නා බාහිර පෙනුම මත වෙන් නොකෙරේ. ඒ සඳහා ඉදිරිපත් කර ඇති නිර්වචන අනුව ජනවර්ග යන වචනයේ අන්තර්ගතය මානව වර්ග යන වචනයේ අන්තර්ගතයට ඉඳුරා ම වෙනස් ලෙස දක්වා ඇත.

ජන වර්ගයක් යනු භාෂාව, ආගම, පාරම්පරික භූමි අයිතිය හා ඊට සම්බන්ධ ව කාලයක් තිස්සේ අඛණ්ඩ ව පවත්වා ගෙන එන ලද සංස්කෘතිය නිසා තමන් අනෙකුත් කණ්ඩායම්වලට වෙනස් කණ්ඩායමක් බව නිරතුරුවම සිතන හා ඒ අනුව කටයුතු කරන ජන කණ්ඩායමකි. යම් කණ්ඩායමක් විසින් අපි වෙන ම ජන වර්ගයක් යැයි සිතන්නේ නම් එය ම ජන වර්ගයක් හඳුනාගැනීමට ප්‍රමාණවත් සාධකයක් බව ද මිල්ටන් ඉන්ගර් (Milton Yinger) විසින් පෙන්වා දී ඇත. මෙම ජනවර්ග කණ්ඩායම් වෙනත් කණ්ඩායමකට සාපේක්ෂ ව බලන විට භාෂාවෙන්, ආගමෙන්, සංස්කෘතියෙන් හා තවත් බොහෝ අංශවලින් වෙනස් බව පෙන්නුම් කරති.

ජනවර්ග පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී ජෝන් රිචඩ්සන් (John Richardson) 1990 විසින් ඉදිරිපත් කර ඇති අදහස් ද සලකා බැලිය හැකි ය. මිනිසුන් බෙදා වෙන් කරන්නේ "මානව වර්ග", "සුදු කළු" මිනිසුන් හා



නොමිලේ බෙදා හැරීම සඳහා ය

"ජන වර්ග" යනුවෙනි. ආසියාවේ සිටින ජනතාව තමන් කළු මිනිසුන් කියා හඳුනාගන්නේ නැත. ඔහුගේ මතයට අනුව ජනවර්ග බෙදා වෙන් කිරීමට විවිධ පදනම් සොයා ගත හැකි බව පෙන්වා දී ඇත. භූගෝලීය වශයෙන් පැහැදිලිව ම සීමා වෙන් කළ හැකි ප්‍රදේශයක් තුළ බහුල වශයෙන් පදිංචි ව සිටීමත් ඒ තුළ කැපී පෙනෙන සංස්කෘතික ලක්ෂණ සංකලනයක් දක්නට ලැබීමත් ජනවර්ගයක් හඳුනා ගැනීමේ දී සැලකිල්ලට ගත යුතු බව ජෝන් රිච්ඩ්සන් විසින් පෙන්වා දී ඇත. ජනවර්ග තුළ ද තවත් ජනවර්ග අතුරු බෙදීම් පවතින බව ද ඔහු පෙන්වා දී ඇත. ජන වර්ග බෙදා ගැනීම සඳහා නිර්ණායක ලෙස භාෂාව, ආගම, යනාදිය යොදා ගැනීමට හැකි බව බොහෝ දෙනා පිළිගන්නා බව ද ජෝන් රිච්ඩ්සන් පෙන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ "දෙමළ ජනතාව හා මුස්ලිම් ජනතාව" යනු හඳුනා ගෙන ඇති ජනවර්ග දෙකකි. මෙම දෙපිරිස දැනට බහුල ව පදිංචි වී සිටින භූගෝලීය ප්‍රදේශවලට මුලින් ම පැමිණියේ කවරදා ද, කොපමණ පිරිසක් ද ඔවුන් පැමිණි මුල් ප්‍රදේශ සමඟ ඔවුන් සම්බන්ධතා පැවැත්වූයේ කෙසේද, යනාදිය පිළිබඳ ව තිබෙන තොරතුරු අල්ප ය.

ජනවාර්ගිකත්වයට කිසිදු ආකාරයක ස්වභාවික පදනමක් නොමැත. ඒ හා බැඳුණු සදාචාරාත්මක පදනමක් ද නොපවතී.

ජනවාර්ගික කණ්ඩායමක් නිර්මාණය කර ගැනීමෙන් එයට ඇතුළත් පිරිසට ලබාගත හැකි වාසිදායක තත්ත්වයන් නිසා කණ්ඩායම් නිර්මාණය කරගනු ලැබේ. මෙබඳු කණ්ඩායමකට යමකු ඇතුළත් වීම නිසා ඇතැම් විට මානසික වින්දනයක් ද ලබා ගැනීමට අවස්ථාව උදා වෙයි. සමහර ජනවාර්ගික කණ්ඩායම් මෙහෙයවන්නේ ආගමික හෝ දේශපාලන මතයකිනි. එහි සාමාජිකයන්ට සිය ආධ්‍යාත්මික හැඟීම් පසෙක තබා එම වෙළෙඳපොළ තත්ත්වයට අනුව කටයුතු කරන්නට සිදු වී ඇත. සමහර රටවල පන්ති අතර ගැටුමට වඩා වැදගත් වන්නේ ජනවර්ග අතර තිබෙන ගැටුමයි. තවත් සමහර සමාජවල ජන වර්ගය වෙනුවෙන් සටන්කාමී ව කටයුතු කරන පිරිස් ද වෙති. මොවුහු විටෙක සිය ජන වර්ගය පවත්වා ගැනීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරති.

ජෝන් රෙක්ස් (John Rex) නැමැති සමාජ විද්‍යාඥයා විසින් පෙන්වා දෙනු ලැබුයේ කණ්ඩායම් අතර පවත්නා වෙනස හා මෙම වෙනසට කැමැති වීම හෝ අකමැති වීම මත හෝ ප්‍රියමනාප වීම මත හෝ මෙම ජන වර්ග පිළිබඳ අදහස් පවතින බවයි.

මේ අනුව ජනවාර්ගික අර්බුදයක් යනුවෙන් විග්‍රහ කර ඇත්තේ මානව කණ්ඩායම් දෙකක් අතර පවතින ගැටුම්කාරි තත්ත්වයකි. ජනවාර්ගික ප්‍රශ්න හා ගැටුම් විග්‍රහ කිරිමේ දී එක්තරා අන්දමකින් ජාත්‍යන්තර දේශපාලන තත්ත්වයන් රට අභ්‍යන්තරයේ පවත්නා රජයේ ප්‍රතිපත්ති හා කාර්යක්‍ෂමතාව, අනෙකුත් ජනවර්ග පිළිබඳ දක්වන ආකල්ප, ජන වර්ග කණ්ඩායම් ඔවුනොවුන් දෙස බලන හා සලකන ආකාරයේ තිබෙන සමීප බව හා දුරස්ථ බව ආදී හේතු ඊට බලපාන බව පෙනීයයි. ජනවර්ගවල පවත්නා විවිධ ලක්‍ෂණ ගැටුම්වලට හේතු වන ආකාරය නිසා සමාජයට සහ ආර්ථිකයට සිදුවන බලපෑම් රාශියකි. එම බලපෑම් සමාජ ප්‍රශ්න වශයෙන් සමාජ විද්‍යාත්මක ව අධ්‍යයනය කළ හැකි ය.

රටක ජනවාර්ගික අර්බුදයක් උග්‍රව පවතින බොහෝ විට යුදමය තත්ත්වයක් ද ගොඩනැගේ. ඒ තුළින් රට ව්‍යාකූල භාවයට පත්වීම නොවැළැක්විය හැක්කකි. එමගින් රට අභ්‍යන්තරයේ නොයෙකුත් අතුරු සමාජ ප්‍රශ්න රාශියක් හට ගැනේ. මෙම සමාජ ප්‍රශ්නවල අවසාන ප්‍රතිඵලය වන්නේ එම රටේ සමාජ දේහය බොහෝ සෙයින් විසංවිධානයට ලක්වීමයි. එම සමාජය තුළ රටේ අපරාධ රැල්ලක් සහ බිහිසුණු, ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් හට ගැනේ. සොරකම්, මනුෂ්‍ය ඝාතන, ස්ත්‍රී දූෂණ, මංකොල්ලකෑම සුලභ දේවල් බවට පත්වේ. ලිංගික අපයෝජනය, ගණිකා වෘත්තිය වැනි සමාජ ප්‍රශ්න අතුරුඵල ලෙස හට ගැනේ.

රටක පවතින ජනවාර්ගික අර්බුද හේතුවෙන් ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ස්වරූපය බිඳීගිය පසුව එම සමාජය තුළින් සාරධර්ම බිඳ වැටීමක් ප්‍රදර්ශනය වන්නේ ය. සාරධර්ම බිඳ වැටුණු සමාජයක් මුහුණ දෙන ප්‍රශ්න රැසක් ඇත. එයින් ප්‍රධාන කරුණක් වන්නේ සාරධර්ම බිඳ වැටී ගිය සමාජයක යහපත් ගුණ ධර්ම පිළි නොගැනීමයි. වැඩිහිටියන්ට ගරු කිරීම, මනුෂ්‍යයින්ට ආදරය ගෞරවය දැක්වීම වැනි යහපත් ගුණධර්ම පිරිහී යනු ඇත.

ජනවාර්ගික ගැටුම් ලෝකය පුරා ම සුලබ ව දැකිය හැකි ය. යම් ජනවර්ගයකට හිමි විය යුතු මානව අයිතිවාසිකම් අහිමි කිරීම මත ජනවාර්ගික ගැටුම් ඇති වන බව පැහැදිලි ය. එසේම යම් ජනවර්ගයක් අනාරක්ෂිත වන විට සහ අසාධාරණකම්වලට ලක් වූ විට ද ජනවාර්ගික ගැටුම් ඇතිවේ. එමෙන් ම ජනවාර්ගික කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය සුහදත්වය පළුදු වී අවිශ්වාසය වර්ධනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජනවාර්ගික ගැටුම්වලට අවශ්‍ය පසුබිම නිර්මාණය වේ. ශ්‍රී ලංකාවේ සිංහල දෙමළ ගැටුම එවන් තත්ත්වයක් තුළ ඇති වූවක් යැයි සැලකිය හැකිවේ. එම ජනවාර්ගික අර්බුදය පසුකාලීන ව මහා විනාශකාරී යුද්ධයක් බවට පත් විය.

සමහර ජනවර්ග සිය ජීවිතය සමඟ ආගමික බැඳීම ඉතා තදින් තබා ගනිති. ජනවර්ග වෙනස සමඟ ආගමික විශ්වාසවල වෙනසක් පවතින බවට ස්ටීව් බෲස් (Steve Bruce) විසින් අදහස් ඉදිරිපත් කර ඇත. යම් සමාජයක ජනවර්ගයක් පාරම්පරික ව පිළිගෙන තිබෙන ඇදහීම පවත්වා ගනිද්දී තවත් ඇදහීමක් එතැනට පැමිණි විට ඒ දෙකෙහි සම්මිශ්‍රණය පිළිගන්නා ජන වර්ගයක් ඇති විය හැකි ය. එහෙත් මේ තත්ත්වය ඇති වීමට දීර්ඝ කාලයක් ගත වේ. ජාති දෙකක් ඉතා පැහැදිලි ව ගැටෙන පසුබිමක දී ඒ දෙපැත්තේ ම ඇත්තේ ඇදහිලි දෙකක් වන විට මේ අංශ දෙක පැහැදිලි ව ම වෙන් වෙන් ව පවත්වා ගැනීමට එම ජන සමූහය තුළ යම් යම් ක්‍රියාමාර්ග ඇති වේ.

### ජනවාර්ගික අර්බුදය සහ ශ්‍රී ලංකාව

ජනවර්ග ලෙසට සලකන්නේ මනුෂ්‍ය කණ්ඩායමක හෝ කණ්ඩායම් කිහිපයක් එක් වී යම් සංස්කෘතික ලක්ෂණයක් හෝ ලක්ෂණ මත සමාජ ආර්ථික ක්‍රියා පවත්වා ගන්නා ජන සමූහයකි. ස්වාභාවික හෝ ස්ථිර ජීව විද්‍යාත්මක පදනමක් ජනවාර්ගික විවිධත්වයට පදනම් වී නැත. එය සාමාන්‍ය සදාචාර සීමාවක් යටතේ ද විභේදනයක් නොදක්වයි. පුද්ගලයින් විසින් ජනවාර්ගික වටිනාකම් මවා ගන්නවා පමණක් නොව දැනට තිබෙන ජන වාර්ගික ලක්ෂණ වර්ධනය කිරිමක් ද කරනු ලබයි. ඒ අනුව සෑම ජන වර්ග කණ්ඩායමකට ම පැහැදිලි ඉලක්ක නැත. එසේ ඇත්තේ අතළොස්සකට පමණි. සමහර රටවල පන්ති අතර ගැටුමට වඩා වැදගත් වන්නේ ජන වර්ග අතර තිබෙන ගැටුමයි.

ඇතැම් සමාජවල ජන වර්ගය වෙනුවෙන් සටන්කාමී ව කටයුතු කරන පිරිස් ද වෙති. මොවිහු විටෙක සිය ජන වර්ගය පවත්වා ගැනීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරති. ජන වර්ගවල පවත්නා විවිධ ලක්ෂණ ගැටුම්වලට හේතු වන ආකාරය, එයින් සමාජයට සහ ආර්ථිකයට සිදුවන බලපෑම් යනාදිය පිළිබඳ ව සමාජ විද්‍යාත්මක අධ්‍යයන සිදු කිරීම වැදගත් වේ.

මේ කරුණු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය තුළින් ආර්ථිකයට හා සමාජයට ඇති කළ බලපෑම් පිළිබඳ ව සාකච්ඡා කළ හැකිය. ශ්‍රී ලංකාවේ සිංහල දෙමළ ජන කොටස් දෙක අතර අවුරුදු 30කට ආසන්න කාලයක් කුරිරු ගැටුමක් යුද්ධයක් පැවතිණි. ඒ තුළින් සමස්ත සමාජයට බරපතල හානි සිදු විය. ජනවාර්ගික අර්බුදය පසුකාලීනව යුද්ධයක් බවට පත් විය. "යුද්ධයක් යනු ස්වාධීන දේශපාලන ඒකකයන් අතර සංවිධානාත්මක සටනක දී හමුදා මගින් කරගෙන යන ගැටුමක් යැයි බ්‍රෝනිස්ලෝ කැස්පර් (1884 - 1942) නම් මානව විද්‍යාඥයාගේ මතයයි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය

නමුත් සෑම විටම යුද්ධයකට සම්බන්ධ වන්නේ ස්වාධීන කණ්ඩායම් දෙකක් ම පමණක් නොවන්නේ ය. සිවිල් යුද්ධයක දී එක් පක්ෂයක් සෑම විටම නීතියෙන් පිටපැන්න කණ්ඩායමක් වන අතර එම පක්ෂයට නීත්‍යානුකූල තත්ත්වයක් ලැබෙනුයේ ජයග්‍රහණය කළහොත් පමණකි. ශ්‍රී ලංකාවේ එල්.ටී.ටී.ඊ සංවිධානය ස්වාධීන කණ්ඩායමක් නොව නීතියෙන් පිටස්තර කණ්ඩායමක් වන්නේ ය.

ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල හමුදාවක් සමඟ නීතියෙන් පිටස්තර කණ්ඩායමක් වූ එල්.ටී.ටී.ඊ සංවිධානය අවුරුදු 30 කට ආසන්න කාලයක් කළ යුද්ධයේ දී ශ්‍රී ලංකාවේ පවුල් සංස්ථාව විසංවිධානකාරී තත්ත්වයකට පත් වී ඇත. ශ්‍රී ලංකාවේ පැවති ජනවාර්ගික අර්බුදය නිසා වැන්දඹුවන් වූ බිරින්දෑවරුන්ගේ සංඛ්‍යාව 40,000 ට අධික බව සංඛ්‍යා ලේඛන කරුණු දක්වා ඇත. ඒ තුළින් ද පැහැදිලි වන්නේ ශ්‍රී ලංකා සමාජයේ පවුල් සංස්ථාව ජනවාර්ගික අර්බුදය හේතුවෙන් පීඩාවට පත් වී ඇති ආකාරයයි.

යුද්ධයක් පවතින ඕනෑම සමාජයක ප්‍රතිපාර්ශ්වය දුර්වල කිරීමට සතුරා විසින් එරටේ ආර්ථික මධ්‍යස්ථාන දුර්වල කිරීමට දැඩි උත්සහයක් ගනී. එයට හොඳ ම උදාහරණ ශ්‍රී ලංකාවේ ගැටුම් තුළ මනාව පිළිබිඹු වේ. ශ්‍රී ලංකාවේ යුද්ධය ආරම්භ වීමත් සමඟ ම මහ බැංකුවට එල්ල කරන ලද දරුණු ප්‍රහාරය, හිල්ටන් හෝටලය, කටුනායක ගුවන් තොටුපොළ වැනි ආර්ථික මධ්‍යස්ථාන වෙත එල්ල කරන ලද දරුණු ප්‍රහාර ප්‍රමුඛ වශයෙන් දැක්විය හැකි ය.

මේ අයුරින් රටේ ආර්ථික මධ්‍යස්ථාන වෙත එල්ල කළ දරුණු ප්‍රහාර නිසා රටේ සංවර්ධනයට බලවත් සේ බලපෑම් සිදු විය. යුද්ධය වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් දැරීමට සිදු විය. රටේ තරුණ පිරිසට රැකියාව ලබා දීමට ඇති මුදල් යුද්ධයට යෙදවීම හේතුවෙන් තරුණ අසහනය ඉස්මතු විය. එහි අතුරු ඵල වශයෙන් මංකොල්ලකෑම්, සොරකම්, සීඝ්‍ර වැඩීමක් දක්නට ලැබුණි. එයට හේතුව වූයේ ද ආර්ථික සංස්ථාවේ ක්‍රියාකාරකම් හරියාකාර ව සිදු නොවීම යි.

යුද්ධය පැවැති සමයේ ආණ්ඩුවේ වියදම් පිළිබඳව සලකා බැලීමේ දී ආරක්ෂක වැය, සමාජ වැය (සෞඛ්‍ය, සමාජ සේවා, අධ්‍යාපන, දුගීභාවය දුරලීමේ ජනසවිය, සමෘද්ධි වැඩසටහන්) අභිබවා ගොස් ඇති බව පෙනේ. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය ලේඛනය මගින් පෙන්නුම් කෙරෙනුයේ යුද්ධය සඳහා ඉතා විශාල වියදමක් දරන බවයි. රටේ ජාතික ආදායමෙන් 25% ක් පමණ යුද්ධය සඳහා වැය කර ඇත.

ශ්‍රී ලංකාව තුළ ඇති වූ ජනවාර්ගික අර්බුදය හේතුවෙන් ඇති වූ යුදමය තත්ත්වය නිසා ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළට ද බාධා ඇති වූ බව නොරහසකි. ව්‍යාපාරික ක්ෂේත්‍රය ප්‍රසාරණය නොවීම හේතුවෙන් කර්මාන්ත පුළුල් වීමක් දියුණු වීමක් දක්නට නොලැබිණි. ඒ හේතුවෙන් ආදායම සීමා විය. සේවක වැටුප්, සුභ සාධක කටයුතු ඉහළ නැංවීමට නොහැකි විය. මේ හේතුවෙන් සේවකයින්ගේ ආර්ථික තත්ත්වය දුර්වල වන්නේ ය. මේ සියලු හේතූන් නිසා පවුලේ ආර්ථිකය පහත වැටීම මත විවිධාකාර වූ ප්‍රශ්න සමූහයකට පවුල් සංස්ථාව මුහුණ දීමට සිදු වේ.

රටේ පැවති යුදමය වතාවරණය හේතුවෙන් දේශීය හා විදේශීය ආයෝජකයන් ශ්‍රී ලංකාව තුළ ආයෝජනයට බිය පළ කෙරිණි. මේ හේතුවෙන් විරැකියාව ඉහළ යෑම නිසා එය ප්‍රබල සමාජ ප්‍රශ්නයක් බවට පත් විණි. මේ සියළු කරුණුවලින් කියැවෙන අවසාන ප්‍රතිඵලය වූයේ රටේ සංවර්ධනයට ප්‍රබල සාධකයක් වන රටේ තරුණ පරපුරෙන් නිසි ප්‍රයෝජන ගැනීමට නොහැකි වීමයි.

රටේ පැවැති යුදමය වාතාවරණය හේතුවෙන් ආගමික සංස්ථාවේ කාර්ය භාරයට ද බලපෑම් එල්ල වීම වැළැක්විය නොහැකි විය. සමාජ පාලනයේ දී හා සමාජ සංවර්ධනයේ දී ප්‍රබල දායකත්වයක් ලබා දෙන්නේ ආගමික සංස්ථාවෙනි. ශ්‍රී ලාංකික සමාජයේ බෞද්ධ සංස්කෘතියට අනුව හැඩ ගැසුණු බහුතර පිරිසක් ජීවත් වෙති. ශ්‍රී ලංකාවේ පැවැති ජනවාර්ගික යුධමය තත්ත්වය හේතුවෙන් බෞද්ධ ආගමට දැඩි ලෙස බලපෑම් එල්ල විය. අරංතලාවේ භික්ෂු ඝාතනයේ සිට ශ්‍රී දළදා මාළිගාවට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම දක්වා කරුණු මෙහි ලා ඉදිරිපත් කළ හැකි ය. එසේම ජය ශ්‍රී බෝ සමිඳුන් අභියස උපාසක උපාසිකාවන් ඝාතනයට ලක් කිරීම, ප්‍රධාන ආගමික ස්ථානවලට දැඩි ආරක්ෂාව යෙද වීම නිසා බැතිමතුන්ට එම ස්ථාන වන්දනා කිරීම සඳහා ඇති වූ අපහසුතාවන් හේතුවෙන් ආගමික සංස්ථාවේ සාමාජික කාර්ය භාරය යුදමය වාතාවරණය හේතු කොටගෙන විපර්යාසවලට භාජනය වී ඇත. මිනිසාගේ හෝ සමාජයේ යහපත උදෙසා සහ සමාජ පාලනය උදෙසා පිහිටුවා තිබෙන ආගමික, පූජනීය ස්ථාන යුද්ධය නිසා විනාශ වීම මත සමාජයේ යහපත් පාලනයට බාධා එල්ල විය. ආධ්‍යාත්මික ගුණ වගාවෙන් අඩු, පවට බිය නොවන, චිත්තවේග අසමතුළිත වූ ජනතාවක් ඇති සමාජ ක්‍රමයක් ශ්‍රී ලංකාවේ වර්ධනය වීම ආගමික සංස්ථාවට සමාජය පාලනය කිරීමට නොහැකි වීමට බලපා ඇත.

ශ්‍රී ලංකාවේ පැවැති ජනවාර්ගික අර්බුදය හමුවේ සමාජයේ ප්‍රබල සංස්ථාවක් වශයෙන් හඳුන්වන දේශපාලන සංස්ථාව පිළිබඳව ද සාකච්ඡාවට බඳුන් විය යුතු වේ. අප රටේ යුද්ධය ආරම්භ වූ දින සිට 20 වන සියවසේ අවසාන දිනය දක්වා ම ශ්‍රී ලංකාවේ දේශපාලන නායකයින් සිය ගණනක් යුද්ධය හේතු කොට ගෙන ත්‍රස්තවාදීන්ගේ බෝම්බ ප්‍රහාර නිසා මරුමුවට පත්ව ඇත. මෙහි භයානක තත්ත්වය වන්නේ දේශපාලකයින් සහ ඔවුන්ගේ අනුගාමිකයින් වන සිවිල් ජනතාව ද ඒ හේතුවෙන් මරණයට පත්වීමයි. රටේ පැවැති යුදමය වතාවරණය නිසා 20 වන සියවසේ ශ්‍රී ලාංකික දේශපාලඥයාට සිරකරුවෙකුගේ තත්ත්වයට පත් වී සිටීමට සිදු විය. මේ කරුණු නිසා දේශපාලන සංස්ථාව ද අස්ථාවර තත්ත්වයකට පත් විය. එහි සමස්තය පිළිබඳ ව සැලකීමේ දී ජනතාවගේ ඡන්ද අයිතිය, මූලික අයිතිවාසිකම්, පරමාධිපත්‍ය, ස්වෛරීභාවය වැනි ප්‍රජාතන්ත්‍රවාදයේ අංග අභියෝගයට ලක් වීමට ද යුද්ධය හේතු සාධකයක් විය. යුද්ධය නිසා ලංකාවේ ජනගහන ව්‍යාප්තිය ද බරපතල විෂමතාවයට ලක්විය. විශේෂයෙන් ප්‍රජනක වයසේ තරුණ පිරිස් රටට අහිමි වීමත් පවුල් සංස්ථාව දෙදරායාමත් නිසා වයස් සීමා අනුව ජනගහන ව්‍යාප්තිය විකෘති වී වයස්ගත සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින බව ජන සංඛ්‍යාලේඛන අනුව පැහැදිලි වී ඇත.

මේ අනුව සලකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ පැවැති ජනවාර්ගික අර්බුදයේ උච්චත ම අවස්ථාව යුදමය තත්ත්වයයි. එහි බලපෑම් දේශපාලන, ආගමික, අධ්‍යාපනික, පාරිසරික, පවුල් වැනි සමාජ සංස්ථාවලට බරපතල ලෙස සිදු වූ බව පැහැදිලි ය.

ඉහත විස්තර කර ඇති යුද්ධය නිසා ශ්‍රී ලංකාවට වී ඇති බලපෑම් තුළින් ශ්‍රී ලංකා සමාජය වී සංවිධානයට සහ සමාජ ව්‍යුහය කෙටි කාලීන මෙන් ම දීර්ඝ කාලීනව ද වන බලපෑම් සමූහයකට ලක් වීම ද සිදු වී ඇත. එබැවින් අවසාන වශයෙන් සඳහන් කළ හැක්කේ ශ්‍රී ලංකා සමාජ සංවිධානය ආශ්‍රිත ව පැන නැගී ඇති ප්‍රශ්න සමාජ ව්‍යුහයට ඇතුළත් වීමට ඉඩ නොදී ඒවා විවිධ උපක්‍රම භාවිත කරමින් අවම කිරීමට වැඩසටහන් සංවිධානය කිරීම මෙකල රට තුළ සිටින සමාජ විද්‍යාඥයින්ගේ හා බුද්ධිමතුන්ගේ යුතුකම හා වගකීම වන බව යි.

## 6.4 අපරාධ හා ජනවාර්ගික අර්බුදය ලාංකික සමාජය තුළ උද්ගතව ඇති මට්ටම් හා නිවාරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම

අපරාධ හා ජනවාර්ගික අර්බුදය ශ්‍රී ලංකා සමාජයට බලපාන බරපතල සමාජ ප්‍රශ්න දෙකකි. මෙම සමාජ ප්‍රශ්න නිසා ශ්‍රී ලංකා සමාජය තුළ අතුරු ප්‍රශ්න රාශියක් ද හටගෙන ඇත. සමාජ විද්‍යාඥයින්ගේ නිර්වචන ඔස්සේ අපරාධ හා ජනවාර්ගික අර්බුදය විග්‍රහ කිරීමේ දී එම අතුරු ප්‍රශ්න ද ඉස්මතු කර දැක්විය හැකි ය. ජෙරමි බෙන්තම් නම් සමාජ විද්‍යාඥයා අපරාධයක් යන්න අර්ථකතනය කළේ මෙලෙසට ය. "යම් ක්‍රියාවක් අපරාධයක් ලෙසට නිර්වචනය කළ යුත්තේ ක්‍රියාවේ ප්‍රතිඵලය වෙතින් මිස ක්‍රියාවට තුඩුදුන් ප්‍රේරණය මතින් නොවන්නේය" යයි ඔහු පවසයි.

අපරාධ පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ලාංකීය සමාජය තුළ අපරාධ වර්ධනය වීමට බලපෑ හේතු පිළිබඳ ව විමසිය යුතුවේ. මේ පිළිබඳව කරුණු පෙළ ගැස්වීමේ දී විසිවන සියවසේ 50 දශකයේ සිට 70 දශකය දක්වා ම ශ්‍රී ලංකාවේ අපරාධ සිදුවුවත් ඒවා එතරම් බිහිසුණු ප්‍රචණ්ඩ බවක් හා සංවිධානාත්මක ස්වරූපයක් දක්නට නොලැබුණි. එම තත්ත්වය 20 වන සියවස අවසානය දක්වා ද පොලිස් වාර්තා සනාථ කර ඇත. එහෙත් 20 වන සියවසේ අවසාන භාගයේ තරමක සංවිධානාත්මක අපරාධ වාර්තා වීමට පටන්ගෙන ඇත. එහි වර්ධන අවස්ථාව 1971 කැරැල්ල හැඳින්විය හැකි වේ. එම කැරැල්ල ආරම්භ වීමත් සමඟ ම ලංකාවේ එතෙක් පැවැති සමාජ සංවිධාන රටාව බරපතල ව්‍යාකූලතාවකට පත් විය. සමස්ත ශ්‍රී ලංකාව තුළ පැවැතියා වූ සාමකාමී සහජීවන ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාව ඒ හේතුවෙන් බිඳවැටීමකට ලක් වූ අතර එමගින් ශ්‍රී ලාංකීය සමාජය පසුබෑමකට ද ලක් විය. එම සිදුවීමත් සමඟ ප්‍රචණ්ඩත්වයේ වර්ධනයන් ඇති කරලීමට මග පාදන ලද සිද්ධි දාමයක ආරම්භය ශ්‍රී ලාංකීය සමාජය තුළ සනිටුහන් කළේ ය.

1980 න් පසුව විශේෂයෙන් 1983 වර්ෂයේ දී මහා පරිමාණයෙන් ශ්‍රී ලංකාව වෙලාගත් කළු ජූලියේ ප්‍රචණ්ඩකාරී සිද්ධිදාමය නිසා ද ශ්‍රී ලංකා සමාජය තුළ පැවැති සාමකාමී සහජීවන රටාව ක්‍රමක්‍රමයෙන් බිඳ වැටීමට ලක් විය. රට තුළ වර්ධනය වූ යුදමය තත්ත්වයට මුහුණ දීම සඳහා ත්‍රිවිධ හමුදාවට පිරිස් බඳවා ගැනීම සිදු විය. උද්ගත වී තිබූ තත්ත්වයන් මර්ධනය කරලීමේ අරමුණ ඇතිව පිරිස් බඳවා ගැනීම වේගවත් වුවත් ආරක්ෂක සේවයට උචිත ගැලපෙන පුද්ගලයන් විශේෂිත ව බඳවා ගැනීමක්

සිදු නොවීය. එබැවින් කල්යෑමේ දී දරා ගැනීමේ හැකියාව දැනුම, ඉවසීම වැනි ආරක්ෂක සේවයට අවශ්‍ය කරන ගුණාංග නොමැති පුද්ගලයන් ආරක්ෂක සේවයෙන් පලා යන්නට විය. එසේ පලා ආ අවි පුහුණුව ලත් අය පාතාල කණ්ඩායම් සමඟ සම්බන්ධතා පවත්වන බව හෙළි වී ඇත. එබැවින් එය ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩකාරී අපරාධ වර්ධනය වීමට හේතුවක් වී ඇති බව පොලිස් වාර්තාවලින් සනාථ වී ඇත. නූතන ශ්‍රී ලංකාවේ විසිවන සියවස අවසානය වන විට දී පවුල් සංස්ථාවේ කාර්යභාරය විපර්යාසයකට ලක්වීම ද ශ්‍රී ලංකාව තුළ අපරාධ වර්ධනය වීමට බලපා ඇතැයි කියැවේ. පවුල් සංස්ථාව තුළින් ඉටුවිය යුතු යැයි මර්ඩොක් විසින් ප්‍රකාශ කර ඇති කෘත්‍යයන් වන පොදු වාසය, සමාජානුයෝජනය සහ අධ්‍යාපන කෘත්‍යය, ආර්ථික සහයෝගීතාව, ලිංගික සහ ප්‍රජනන කෘත්‍ය, පෝෂණය යන කරුණු පවුල් සංස්ථාව තුළ යථා ආකාරයෙන් සිදුනොවීම ද ශ්‍රී ලංකා සමාජය තුළ අපරාධ වර්ධනය වීමට බලපා ඇත. පවුලේ සාමාජිකයන් එකිනෙකාට ගෞරවය, සෙනෙහස සහ ආදරය දැක්වීම නවීන සමාජයේ බොහෝ පවුල් ආශ්‍රයෙන් දැකගත නොහැකි ය. එවැන්නක් දැකිය හැකි වුවත් ඒවා හෘදයාංගම, උණුසුම් ප්‍රතිචාරවලට වඩා යාන්ත්‍රික ව සිදුවන්නක් වීම කණගාටුදායක වේ.

ශ්‍රී ලංකා සමාජය තුළ පවතින ආර්ථික ප්‍රශ්න උග්‍රවීම, දුප්පත්කම සහ විරැකියාව අපරාධ වැඩිවීමට තවත් හේතු වශයෙන් දැක්විය හැකි ය. මේ ප්‍රශ්නවලින් මිදෙන්නට අනියම් මාර්ගයෙන් හෝ මුදල් උපයා ගැනීමට ජනතාව සොරකම්, කොල්ලකෑම්, මහා පරිමාණ වංචා, දූෂණ, මිනිස් ඝාතන යන අපරාධ බහුල ව සිදු කරනු ලබන්නේ ය.

නව තාක්ෂණය සහ විද්‍යාව දියුණුවීම ද ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවල්වල අපරාධ වර්ධනය වීමට බලපා ඇතැයි පැවැසිය හැකි ය. තාක්ෂණික උපකරණවල දියුණුව වැඩිවීමත් සමඟ ශ්‍රී ලංකාව තුළ විවිධ ගණයේ අපරාධ ද කරලියට පැමිණ ඇත. පරිගණක ආශ්‍රයෙන් ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය කරලීම, රජයේ ආරක්ෂක හමුදාව සතු නොවන නවීනතම අවි ආයුධ සමාජයට පැමිණීම, ව්‍යාජ ලියකිවිලි මුද්‍රණය සහ අසභ්‍ය ඡායාරූප නිෂ්පාදනය කරලීම තුළින් පෙන්නුම් කරන්නේ නවීන තාක්ෂණය භාවිතයෙන් කරලියට පැමිණි අපරාධවලින් කොටසකි.

අපරාධ වර්ධනය සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට ශ්‍රී ලංකාවේ බිහිසුණු අපරාධ මර්ධනය කරලීමට නවීන තාක්ෂණය භාවිත කිරීම ඇරඹුණේ ද විසිවන සියවසේ අවසාන කාලවකවානුව තුළදී ය. එනම් අපරාධ සම්බන්ධ

නඩු කටයුත්තකදී එම අපරාධයට සම්බන්ධ සාක්ෂි ලබා ගැනීම DNA පරීක්ෂණය භාවිත කරලීමයි. DNA පරීක්ෂණය මගින් ස්ත්‍රී දූෂණ, මිනීමැරුම් වැනි අපරාධ කළ පුද්ගලයන් පැහැදිලි ව හඳුනා ගැනීමට හැකියාව ඇත. අපරාධ ක්ෂේත්‍රයට අලුතින් ම එක් වී ඇති අංගය අන්තර්ජාලය ආශ්‍රිත අපරාධ වේ. (Cyber Crimes) ඒවාට සම්බන්ධ වූවන් බොහොමයකට උසස් පරිගණක සාක්ෂරතාවක් සහිත වීම කැපී පෙනෙන කරුණකි.

මේ අනුව කරුණු විමර්ශනයේ දී අපරාධ සම්බන්ධ සංසිද්ධීන් ඇති වීමට බලපෑ හේතු සොයා ඒ නිගමන සහ නිර්දේශයන් රජයට බාර දී ප්‍රතිපත්ති සකස් කරලීමෙන් සහ එම ප්‍රතිපත්තීන් මත සමාජය පාදක කොටගත් විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරලීමට හැකිවේ නම් ශ්‍රී ලංකා සමාජය තුළ පවතින අපරාධ මැඩපැවැත්වීමට හැකියාව ඇතැයි විශ්වාස කෙරේ.

පොදුවේ ගත්කල අපරාධ හා ජනවාර්ගික ගැටලුව අතර අවියෝජනීය සබඳතාවක් ඇතිබව පෙනේ. විශේෂයෙන් ආයුධ පුහුණුව ලත් පිරිස් බහුලවීම, නීතිවිරෝධී බලය , ආයුධ සමාජගත වීම හා යුධ තත්ත්වය නිසා විසංවිධානය වූ පවුල් පරිසරය තුළින් අසමතුලිත පෞරුෂ ලක්ෂණ සහිත දුස්සමායෝජනයට ලක්වූවන් බිහිවීමත් එකිනෙක ඈඳුන ව්‍යාකුලතාවන් බවට පත්වී ඇත. මෙම සමාජ ගතිකත්වය සාම්ප්‍රදායික ලාංකික සමාජ පර්යායන් වෙනස් වීමට දැඩිලෙස හේතු වී ඇත. තොරතුරු තාක්ෂණයේ අසීමිත දියුණුව, ජංගම දුරකථන ආදිය නූතන ලාංකික සමාජයේ තරුණ ජනගහනයේ ආකල්ප, ක්‍රියාකාරකම් හා ඇගයුම් වෙනස් කිරීමට දැඩි ලෙස බලපා ඇත. මේ අයුරින් බලන කල අපරාධ රැල්ල හා ජනවාර්ගික අර්බුදය අන්‍යොන්‍ය වශයෙන් ලාංකික සමාජයේ අගනාකම් හා සමාජ සංහිඳියාව විතැන් කිරීමට බලපා ඇති බව පැහැදිලි වේ.

සමාජයේ අපරාධ චර්යා ඇතිවීම පාලනය කිරීමට බෞද්ධ ඉගැන්වීම් සමුදායක් ඔස්සේ ඉඩප්‍රස්ථා එමට හමු වේ. විශේෂයෙන් ගිහි ශීලය ලෙස අනුමත කළ පංචශීල ප්‍රතිපත්තිය මෙහිදී මුල් තැනක් ගනී. පුද්ගල ගෞරවය, හිංසා වැලැකීම, සත්‍යවාදී බව, චර්යා පාරිශුද්ධත්වය ආදී ගුණාංග තහවුරු වීම ඔස්සේ සමාජය තුළ අපරාධ චර්යා ජනිත වීමට අවශ්‍ය පෙළඹවීම් සමුදාය වළකාලීමට හැකියාව ලැබේ.

> සබ්බේ තසන්ති දණ්ඩස්ස
> සබ්බේසං ජීවිතං පියං
> අත්තානං උපමං කත්වා
> නහනෙය්‍ය න ඝාතයේ

සියල්ලෝ දඬුවමට බිය වන්නාහ.
සියල්ලෝ තම ජීවිතයට ප්‍රිය වන්නාහ.
තමා උපමා කර
අනුන් නොමරන්න, නොමරවන්න.

සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේ භායන්ති මච්චුනෝ
අත්තානං උපමං කත්වා
නහනෙය්‍ය න ඝාතයේ

සියල්ලෝ දඬුවමට බිය වන්නාහ
සියල්ලෝ මරණයට බියවන්නාහ
තමා උපමා කර
අනුන් නොමරන්න, නොමරවන්න..

පාලකයා හා පාලිතයන් දෙපාර්ශ්වය ම ඒකාබද්ධ ව කටයුතු කිරීම සමාජය තුළ අපරාධ චර්යා වළකාලීමට උපකාරී වන බව ධර්මය තුළ දක්වේ. සමාජය තුළ සෑම පාර්ශ්වයක් ම එකිනෙකා වෙත යුතුකම් ඉටුකිරීමත් ගෞරව කිරීමත් පාලකයෝ ස්වකීය රටවැසියන් කෙරෙහි දසරාජ ධර්මය මූලික ව පාලනය ගෙනයාමත් එහි අවධාරණය කර ඇත. සිගාලෝවාද සූත්‍රය, චක්කවත්ති සීහනාද සූත්‍රය, කාලාම සූත්‍රය, පරාභව සූත්‍රය, ආදී සූත්‍ර දේශනා මෙකී ධර්ම කරුණු රාශියකින් සමන්විත වේ.

එමෙන් ම බෞද්ධ සමාජ ක්‍රමය තුළ අපරාධ සඳහා මූලික වන සිතුවිලි දාමය පාලනය කිරීමට ද සුවිශේෂී අවධානය යොමුවී පවතී. විශේෂයෙන් තිදොරින් සිදුවන කර්ම සැලකීමේ දී ''සිතින්'' සිදුවන අයහපත් සිතුවිලි මාත්‍රයක් ම පාපයක් ලෙස සමාජ ගතවීමෙන් අපරාධ චර්යාවකට මූලික වන සිතුවිලි සමුදාය වළකාලීමට බුදු දහම දක්වන සැලකිල්ල පැහැදිලි වේ. එමෙන් ම භාවනාව මගින් සිත සන්සුන් කර ගැනීමත්, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම ආදිය තුළින් චර්යාමය සුපසන් බව ඇති කිරීමත් මෙහිදී අතිශයින් වැදගත් වේ.

අපරාධවලට මූලික වන සමාජ වටපිටාවක් ඇතිවීම වැළැක්වීමෙන් අපරාධ අඩු කිරීමට හැකිවන බව බෞද්ධ ඉගැන්වීම යි. අපරාධ මර්ධනයට වඩා නිවාරණයට විශාල මගපෙන්වීමක් බෞද්ධ ඉගැන්වීම් පදනම් වූ සමාජ දර්ශනය තුළ පුලුල් ව භාවිත කළ හැකි බව පැහැදිලි ව දක්විය හැකි ය.

පුද්ගලයන් වාර්ගික කණ්ඩායමක් වශයෙන් ක්‍රියාත්මක වන ප්‍රධාන කරුණු 4 ක් ඉටුවීම පිළිබඳ තත්ත්වය සමාජ ඒකාබද්ධතාවට හේතුවන බව ජේන් ජෙන්සන් (2010) දක්වා ඇත.

01. මූලික අවශ්‍යතා සපිරෙන බව
02. ප්‍රගතිය සඳහා ඇති ඉඩකඩ
03. සුරක්ෂිතව හා නෛතික අයිතිවාසිකම්
04. අභිමානවත් භාවය හා විශ්වාසනීය වටපිටාව

යන කරුණු වාර්ගික විභේදන සහිත සමාජයක ඒකාබද්ධතාව කෙරේ බලපාන බව ඔහු විසින් පෙන්වා දෙන ලදී. මෙම ක්ෂේත්‍රවල පවතින අසමතුලිත බෙදීයාම් හෝ සැලකිල්ල ජනවර්ග අතර සැකය, අවිශ්වාසය හා අනෙකුත් ප්‍රතිශෝධනාත්මක ආකල්ප ජනනයට හේතුවේ.

බෞද්ධ ඉගැන්වීම් අනුව කුලය, වර්ගය ආදී සමාජ ප්‍රභේදයන් ඇතුළත් ආරෝපිත තත්ත්වයට වඩා සාධිත තත්ත්වයන් උසස් ලෙස දක්වයි. එනම් පුද්ගලයන්ගේ උස් පහත් බව ඔවුන්ගේ ක්‍රියාකාරකම් පදනම්ව තීරණය වන බව එහිදී පැහැදිලි කරයි.

ඒ අනුව සියලු ජනවර්ගයන්ට ගෞරව කිරීම, ඔවුන්ගේ සංස්කෘතික අනන්‍යතාව පවත්වා ගෙන යාමට බාධා නොකිරීම, සම අවස්ථා සැලසීම මගින් ජනවාර්ගික අර්බුදයක් ඇතිවීම වැළැක්විය හැකි බව බුදු දහම අනුවද මැනවින් පැහැදිලි වේ.

## අභ්‍යාසය

1. සමාජ ප්‍රශ්නයක් හඳුනාගැනීමේ මූලික ලක්ෂණ මොනවාද?

2. ''සමාජ ප්‍රශ්නයක් හුදෙකලාව පවතින්නේ කලාතුරකිනි'' සමාජ ප්‍රශ්නවල අන්තර් සබඳතා උදාහරණයට ගනිමින් මෙම ප්‍රකාශ සනාථ කරන්න.

3. ජනවාර්ගික අර්බුදයේ අතුරු ප්‍රතිඵල අපරාධ චර්යා වැඩිවීම කෙරෙහි ඇති කරන බලපෑම කෙබඳුදැයි දක්වන්න.

4. බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් ඉහත දක්වූ සමාජ ප්‍රශ්න සටහන් කරගත හැක්කේ කෙසේද?



නොමිලේ බෙදා හැරීම සඳහා ය

# 07 සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක්

## 7.1 සමාජ විද්‍යා පර්යේෂණයක් සැලසුම් කිරීම

සමාජ විද්‍යා පර්යේෂණයක් සැලසුම් කිරීම යනු විද්‍යාත්මක ක්‍රම අනුගමනය කරමින් නව ගැටළුවකට පිළිතුරු සෙවීම යි. අප ජීවත් වන මෙම සමාජයේ විවිධ සමාජ, සංස්කෘතික, දේශපාලනික, ආර්ථික ප්‍රශ්න ඇත. උදාහරණ ලෙස සමාජයේ බාල අපරාධ වැඩි වීමට හේතුව කුමක් ද? බිඳුණු පවුල එයට හේතු වන්නේ ද? දික් කසාද වන්නේ ඇයි? වෙළෙඳ ද්‍රව්‍ය විකිණීම උදෙසා ජන මාධ්‍ය මඟින් කෙරෙන ප්‍රචාර සාර්ථක ද? යනා දී ප්‍රශ්නවලට විද්‍යාත්මක පිළිතුරු සෙවීම ගවේෂණාත්මක අධ්‍යයනයක දී සිදුවේ. මේ ආකාරයේ සමාජ ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමෙන් විශාල ප්‍රයෝජනයක් ලැබේ. එය සමාජයේ දියුණුවට ප්‍රධාන මාර්ගය යි. රජයට හෝ යම් සමාජ සංස්ථාවකට යම් නීතියක් හෝ නීති පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ විට එය ක්‍රියාවේ යෙදවීමට පෙර සමාජයේ ඇතිවන ප්‍රතික්‍රියා ගැන කලින් කරන පර්යේෂණයකින් හෙළිදරව් කර ගත හැකි ය. එමෙන් ම එය ක්‍රියාත්මක වූවාට පසු නැවත ද එහි ප්‍රතිඵල හා සමාජීය ප්‍රතික්‍රියා පර්යේෂණ තුළින් දැන ගැනීමට ඉඩක් ලැබේ.

පර්යේෂණයක් සිදු කරන්නේ යම් ප්‍රශ්නයක් පිළිබඳ බුද්ධිමය කුතුහලයකින් පෙළෙන විට ය. මෙම බුද්ධිමය කුතුහලය නිසා ප්‍රශ්නයට පිළිතුරු සෙවීමට පෙළඹෙයි. මෙහි ප්‍රතිඵල අපට ප්‍රායෝගික ජීවිතයට යොදා ගැනීම ප්‍රයෝජනවත් වේ. ඒ අනුව පර්යේෂණයක ප්‍රතිඵල ප්‍රයෝජනයට ගතහැකි ආකාරය අපට දෙයාකාරයකින් දැක්විය හැකි ය.

01. බුද්ධිමය වශයෙන්
02. ව්‍යවහාරත්මක වශයෙන්

මෙසේ පර්යේෂකයන්ගේ ප්‍රයෝජන ලබා ගන්නා අපට එය ප්‍රධාන කොටස් තුනකට වර්ග කර දැක්විය හැකි ය. එනම්,

- ඓතිහාසික ගවේෂණය - Historical Research
- විස්තරාත්මක ගවේෂණය - Descriptive Research
- අත්හදා බැලීමේ ගවේෂණය - Experimental Research

මෙයින් පළමු වැන්නෙන් අතීතයේ සිදුවූ දෙයක් ද (what was), දෙවැන්නෙන් වර්තමානයේ සිදුවන දේ පිළිබඳ ව ද (what is) තෙවැන්නෙන් අනාගතයේ සිදුවන දේ පිළිබඳ ව ද (what will be) අවධාරණය කෙරේ.

පර්යේෂණ හෝ ගවේෂණ සමාජයේ ඉදිරි පැවැත්ම සඳහා අවශ්‍යය. සාමාජීය ලෙස පිළිගත් බොහෝ සාම්ප්‍රදයික කරුණු සමාජයන්හි පවතී. මේවා අපට හේතු සාධක රහිත ව සත්‍යයයි හෝ අසත්‍යයයි හෝ බැහැර කළ නොහැකි ය. උදාහරණයක් ලෙස අපේ සාම්ප්‍රදයික පිළිගැනීම් සමුදායක් ඇත. ඉන් එකක් නම් සූර්යෝද්ගමනය පිළිබඳ අතීත පිළිගැනීමයි. එහෙත් සිදුවන්නේ එයම ද? නූතන විද්‍යාත්මක පරීක්ෂණයන් ගෙන් සොයා ගෙන ඇති පරිදි නම් පෘථිවිය, චන්ද්‍රයා, බුද වැනි ග්‍රහ වස්තූන් තමා වටේ ද කැරකී සූර්යයා වටේ යන බවයි. මේ අනුව අපට පෙනීයන්නේ අප සම්ප්‍රදායික ව මෙතෙක් පිළිගත් මතයන්ගේ සත්‍ය අසත්‍ය පර්යේෂණ හෝ ගවේෂණ ඇසුරින් හෙළි කර ගත හැකි බව යි.

යම් සැලැස්මකට පූර්වාංගම වන්නේ අරමුණ ය. එහෙත් අරමුණ තිබුණු පමණින් ම සැලැස්මක් ක්‍රියාත්මක කළ නොහැකි ය. අපට අවශ්‍ය සම්පත් පිළිබඳ ව ද අවධානය යොමු කිරීම අවශ්‍ය ය. එහෙත් අරමුණු, සම්පත් හා සැලැස්ම තිබූ පමණින් ම එය ක්‍රියාත්මක කළ හැකි ද? ඒ පිළිබඳ ව ඇති යම් යම් සීමා කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. වර්තමානයේ දී ද අදාළ පරිසරය පිළිබඳ අවධානයෙන් තොර ව ඇත දුෂ්කර ප්‍රදේශයන්හි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සැලසුම් සම්පාදනය කරයි. මෙහි දී එයට අවශ්‍ය සම්පත් පදනම් සීමාවන් සහ මානව ආකල්ප පිළිබඳ අවබෝධයකින් තොර ව සැලසුම් සකස් කිරීමෙන් එම ව්‍යාපෘතිය අසාර්ථක වීමට ද හැකි ය. විශේෂයෙන් ම ඒ ඒ ප්‍රදේශානුගත මානව ආකල්ප ගැන දැන සිටීම ඉතාමත් වැදගත් වේ. එම ආකල්පවලට පටහැනි යමක් හඳුන්වා දීමේ දී එය ප්‍රතික්ෂේප වන ආකාරය නිරතුරු ව අපට දැකිය හැකි ය. සැලසුමක ප්‍රධාන වශයෙන් කොටස් 02 කි. එනම්,

01. සාමාන්‍ය සැලසුම් - General Planing
02. උපක්‍රමික සැලසුම් - Strategic Planing

යම් පර්යේෂණයක් සැලැසුමකින් තොර ව ක්‍රියාත්මක කිරීම සාර්ථක වේ යැයි සිතීමත් අපහසු ය. අප යම් නිශ්චිත පරමාර්ථ ඔස්සේ සැලැසුමක් කිරීමේ දී එය සාර්ථක කර ගැනීම සඳහා පාරිසරික විශ්ලේෂණය පිළිබඳ මනා වැටහීමක් ද අවශ්‍ය ය. එය නොමැති වුවහොත් සැලැසුමේ ප්‍රතිඵල හීන වී යයි. අපි උදාහරණයක් ලෙස පන්සල සංවර්ධනය කිරීමේලා අපේ සැලැසුම් ක්‍රියාත්මක කිරීමේ දී බාහිර සහ අභ්‍යන්තරික සාධක පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. අභ්‍යන්තර සාධකවල දී අවධානය යොමු කිරීමට

අවශ්‍ය කරන සැලැස්මට ඇති බාධාවන් පිළිබඳවත් සේවක ප්‍රමාණය, ඔවුන් වැඩ කරන කාල සීමාව, ඉඩ අවකාශය, ඔවුන්ගේ මානසික හා කායික තත්ත්වයන්, නිෂ්පාදන ප්‍රමාණයන් පිළිබඳ අවධානයත්, බාහිර සාධක ලෙස සමාජ, සංස්කෘතික, දේශපාලනික, ආර්ථික තත්ත්වයන්, හැකියා සාධක (එය ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව), එය ක්‍රියාත්මක කිරීමට ඇති නොහැකිකම් හා එහි අතර ඇති පරතරය පිළිබඳ ව මනා දැනුමක් ද අවශ්‍ය වේ. මෙම දැනුම ඉබේ ම අපට ලබා ගැනීම අපහසු ය. ඒ පිළිබඳ ව පූර්ව පර්යේෂණයකින් ලබාගත් දත්ත අනුසාරයෙන් සැලැස්ම සම්පාදනය හෝ ඉදිරිපත් කිරීම සිදු කරන්නේ නම් එහි දී අප බලාපොරොත්තු වන ප්‍රතිඵල ළඟා කර ගැනීමේ හැකියාව ඇති බව පෙනේ.

මේ තුළින් හැඟෙන්නේ සැලැසුමක් ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය වන පූර්ව දැනුම පර්යේෂණයක් තුළින් ලබාගත හැකි බව නොවේ ද?

තවද පර්යේෂණ පිළිබඳ වැදගත්කම අවධාරණය කිරීමේ දී භෞතික සම්පත් හා සමාජ සම්පත් නූතන අවශ්‍යතාවලට අනුව භාවිත කිරීමේ යෝග්‍යතාව හෝ අයෝග්‍යතාව පිළිබඳ පර්යේෂණාත්මක තහවුරු කිරීමක් ලබා ගත හැකි ය. උදාහරණයක් ලෙස වර්තමාන ලෝකයේ වානිජ පදනමින් ආහාර කල්තබා ගැනීම සඳහා නොයෙකුත් උපක්‍රම යොදා ගනිමින් සෞඛ්‍ය සංරක්ෂණ විධිවලට පටහැනි අයුරින් ආහාර නිෂ්පාදනය දැකිය හැකි ය. එම නිසා ආහාර වර්ගවල භෞතික නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ කෙරෙන පුළුල් පර්යේෂණයක් තුළින් සමාජයට සිදුවිය හැකි අහිතකර බලපෑම්වලින් ආරක්ෂා කර ගත හැකිවන්නේ ය.

සමාජය පිළිබඳ පර්යේෂණාත්මක දෘෂ්ටි කෝණයෙන් අතීතයේ සිට වර්තමානය දක්වා නිරීක්ෂණය කර ගෙන ඒ මේ දී සාමාජීය සාරධර්මවල පිරිහීමත්, මිනිසුන්ගේ යාන්ත්‍රීකරණයත්, සපුරාගත නොහැකි අපේක්ෂාවන් පසුපස ගමන් කිරීමත් අපට දැකිය හැකි ය. මේ පිළිබඳ ව ජනමාධ්‍ය තුළින් විශාල බලපෑමක් කරන බව පෙනේ. ජනමාධ්‍ය අතර රූපවාහිනිය මේ පිළිබඳ විශේෂ ය. සමාජය පිළිබඳ ව කෙරෙන පුළුල් පර්යේෂණයක දී විශේෂයෙන් රූපවාහිනිය වෙළෙඳ දැන්වීම් හා නොයෙකුත් වැඩසටහන් මඟින් සමාජය වෙනතකට යොමු කරන බව පෙනේ. විශේෂයෙන් ඇතැම් රූපවාහිනී වෙළෙඳ දැන්වීම් පහත් පෙළේ සංස්කෘතික ලක්ෂණ උද්දීපනය කරයි.

තවදුරටත් මේ පිළිබඳ ව සලකා බලන විට අපට මෙසේ ද පෙන්වා දිය හැකි ය. එනම් ඵලදායී ව්‍යාපෘතියක් සම්පාදනය කිරීමෙහිලා

පර්යේෂණ පැවැත්වීම ඉතා වැදගත් බවයි. උදාහරණයක් ලෙස කටුනායක නිදහස් වෙළෙඳ කලාපය ගත හැකි ය. එහි දී එම ප්‍රදේශයට කොපමණ ජන සංඛ්‍යාවක් ඔරොත්තු දෙන්නේ ද? එම මිනිස් බලය ලබා ගන්නේ කුමන ආයතනද? කොහෙන් ද? එය එම ප්‍රදේශයේ ජනතාවට කොතෙක් දුරට බලපාන්නේ ද? ඔවුන්ගේ ආරක්ෂාව, ආහාර සහ චර්යා රටාවන් කෙබඳු වේ ද? නැවත ඔවුන් ගමට ගිය පසු එහි දී ඇති වන සමාජානුයෝජනයේ දී බාල පරපුරෙහි අනාගතය කෙබඳු වේද යන ප්‍රශ්නවලට පිළිතුරු පර්යේෂණයකින් ම අප විසින් සොයා ගත යුතු ය. පර්යේෂණයකින් තොර ව එම ප්‍රදේශයේ ජනතාවට ඔරොත්තු නොදෙන අයුරින් මෙම රැකියා අවස්ථා උදාකර දෙන්නේ නම් එහි දී හිතකර ප්‍රතිඵලවලට වඩා අහිතකර ප්‍රතිඵල ලැබෙන බව අපට පෙනේ.

සංචාරක ව්‍යාපාරය ද ක්‍රමානුකූල පර්යේෂණයකින් හා සැලැස්මකින් තොර ව සිදුවන නිසා එහි භයානක ප්‍රතිඵල අප දැනටමත් ලබා ඇත්තෙමු.

පර්යේෂණයක ඇති වැදගත්කම මෙන් ම අවශ්‍යතාව ද අපට මෙසේ කෙටියෙන් දැක්විය හැකි ය. එනම්,

- මෙතෙක් සිදු කරන ලද පර්යේෂණවලට හසු නොවූ අංශ පිළිබඳ ව අවධානය යොමු කිරීම සඳහා
- මානව චර්යාව පිළිබඳ පවත්නා රටාව තේරුම් ගැනීම සඳහා
- නූතන චින්තනය පිළිබඳ කරුණු තාර්කික කිරීම සඳහා
- සමාජ ව්‍යුහය අවබෝධ කර ගැනීම සඳහා
- නිෂ්පාදනයක් හඳුන්වා දීමේ දී එයට ලැබෙන මහජන ප්‍රතිචාර පිළිබඳ අවබෝධය ඇති කර ගැනීම සඳහා
- ජාතික සංවර්ධනය අරභයා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා
- රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා
- ඓතිහාසික තොරතුරු පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා
- ඕනෑම ක්ෂේත්‍රයක අපේක්ෂිත හා පවත්නා තත්ත්වය අතර පරතරය හඳුනා ගැනීම සඳහා

මෙම අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා පර්යේෂණයක් සැළසුම් කිරීමේදී අනුගමනය කළ යුතු මූලික අදියර කිහිපයක් හඳුනාගත හැකි ය.

01. මූලික අධ්‍යයනය/ හැදෑරීම
02. ගැටලුව/අධ්‍යයන අවශ්‍යතාව හඳුනා ගැනීම
03. කල්පිත/අභ්‍යුපගමන ගොඩනැගීම
04. කල්පිත පරීක්ෂාව
05. කල්පිත පිළිගැනීම හෝ බැහැර කිරීම
06. වාර්තාකරණය

මෙම එක් එක් පියවරක් තවදුරටත් සුවිශේෂී ව ක්‍රියාකාරකම්වලට වෙන් කර ගත හැකි වේ. ශුද්ධ විද්‍යාවන්හි දී මෙන් නොව සමාජීය විද්‍යාවන්හි දී පර්යේෂණාගාරය වනුයේ සමාජය යි. අනෙක් පසින් පර්යේෂකයා ද සමාජයේ සාමාජිකයෙකු වේ. මේ නිසා ශුද්ධ විද්‍යාවන්ට වඩා පර්යේෂකයාගේ සිතුවිලි, ආකල්ප ආදිය සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රියාවලියට බලපෑම් එල්ල කිරීමට පුළුල් ඉඩකඩක් පවතී. එමෙන් ම සමාජ විද්‍යා පර්යේෂණවල දී සහභාගිකයන් ද්‍රව්‍ය නොව මිනිසුන් වීම නිසා රැස් කරන තොරතුරු කෘත්‍රිම ව ජනනය කළ දෙයක් වීමේ සම්භාවිතාව ද සැලකිල්ලට ගත යුතු ය. එබැවින් ශුද්ධ විද්‍යාවන්හි දී මෙන් නොව සමාජ විද්‍යා පර්යේෂණ සැලසුම් කිරීම අතිශය දුෂ්කර කටයුත්තක් බව පැහැදිලි වේ.

## 7.2 මූලාශ්‍ර භාවිතය

පර්යේෂකයාට අවැසි තොරතුරු රැස් කර ගැනීම සඳහා භාවිත කෙරෙන ලිපි ලේඛන, ග්‍රන්ථ, පුද්ගල අදහස්, ද්‍රව්‍ය, නිර්මිත, පුරාකෘත හෝ වෙනත් එවැනි ඕනෑම දෙයක් මූලාශ්‍ර ලෙස හැඳින්විය හැකි ය.
මූලාශ්‍ර කාණ්ඩ දෙකකට වෙන්කළ හැකි ය.

1. ලිඛිත මූලාශ්‍ර
2. අලිඛිත මූලාශ්‍ර

විවිධ සමාජ විද්‍යා පර්යේෂණ සඳහා මෙම මූලාශ්‍ර කාණ්ඩ දෙක ම ඒකාකාර ව වැදගත් විය හැකි ය. ලිඛිත යනු ලියන ලද යන්න යි. මෙහි දී අක්ෂර පමණක් නොව යම් යම් සංකේත මගින් හැඟීම් ඉදිරිපත් කර ඇත්නම් ඒවා ද ලිඛිත ගණයට වැටේ. මේවා අපට ප්‍රධාන වශයෙන් ආකාර කිහිපයකින් දැක්විය හැකි ය. එනම්,

- සෙල්ලිපි, සන්නස් ආදී මූලාශ්‍ර
- චිත්‍ර කලා, ප්‍රතිමා ආදී මූලාශ්‍ර
- සාහිත්‍ය මූලාශ්‍ර (ගද්‍ය, පද්‍ය)
- දේශාටන හා චාරිකා සටහන්
- ලියුම්, සංදේශ, චරිත කතා
- විවිධ මුද්‍රිත ප්‍රකාශන

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, විදේශීය ආයතන මගින් මේ රටේ පවත්වා ගෙන යන පුස්තකාල හා ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පුස්තකාලය වැනි ආයතනවල පවතින ග්‍රන්ථ හා ප්‍රකාශන, පර්යේෂණ වාර්තා ලිඛිත මූලාශ්‍ර ලෙස පරිශීලනය කිරීමට පුළුවන. එමෙන් ම විවිධ මාතෘකා යටතේ නිර්මාණය කර ඇති උපාධි නිබන්ධනයන් ද මේ ගණයට ඇතුළත් වේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතුව පවතින උෂ්ණත්ව, වර්ෂාපතනය, ආර්ද්‍රතාව, පීඩනය වැනි දත්ත, මැනුම් දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත භූමි පරිභෝග දත්ත හා සිතියම්, විවිධ පරිමාණවලින් යුක්ත සිතියම්, භූ විද්‍යා සිතියම් ද ගුවන් ඡායාරූප, භූගෝල විද්‍යා තොරතුරු පද්ධතිය ඇසුරින් නිර්මිත සිතියම් ද මේ සඳහා තව දුරටත් යොදාගත හැකි ය.

පර්යේෂණයක් යනු පුළුල් විෂය ධාරාවක් අඩංගු ක්ෂේත්‍රයකි. ඒ නිසා පර්යේෂණයක නිරත වීමට පෙර ඒ හා බැඳුණු මූලාශ්‍ර පිළිබඳ ව පුළුල් දැනුමක් ලබා ගැනීම අපේක්ෂා කෙරේ. මෙහි දී ලිඛිත මූලාශ්‍ර පරිශීලනය කිරීම


නොමිලේ බෙදා හැරීම සඳහා ය

වඩා වැදගත් වන අතර එය පර්යේෂණයේ අගය ද වැඩි කරයි. ලංකාවේ යාචකයන්ගේ ශීඝ්‍ර වර්ධනයක් ඇති වන්නේ ඇයි ද යන්න පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ඒ පිළිබඳ ව ලිඛිත මූලාශ්‍ර සොයා යාමට සිදුවේ. විශේෂයෙන් ම මෙහි දී මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා විසින් රචිත, "The Begger in Sri Lanka" යන ග්‍රන්ථය පිළිබඳවත් ඒ හා බැඳුණු ලිඛිත පුවත්, සඟරා ලිපි ලේඛන ආදියත් පිළිබඳ ව අවධානය යොමු කිරීමට සිදුවේ. එමෙන් ම අතීත සංඛ්‍යා ලේඛන සහ වර්තමාන සංඛ්‍යා ලේඛන දෙස සංසන්දනාත්මක විමර්ශනයක් අවශ්‍ය වේ.

අපට ලැබෙන මූලාශ්‍ර අතර සංස්කෘතික සංදර්ශන ද ප්‍රධාන තැනක් ගනී. එයින් එකකි නුවර පෙරහැර. එහි පත්තේරු නැටුම් හා හේවිසි කණ්ඩායම් පිළිබඳ පර්යේෂණයක නියැලෙන විට ඔවුන් උඩු කය නොවසන්නේ මන්ද? ඔවුනට පෙරහැරේ කුමන ස්ථානයක් හිමි වන්නේ ද? යන්න පිළිබඳ අවධානය වැදගත් ය. මෙම කරුණු අනාවරණය කර ගැනීමේ දී ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රවල සරණ සොයා යා යුතු ය. ප්‍රාථමික මූලාශ්‍ර යනු අදාළ මුල් නිර්මිතය යි. ද්විතියික මූලාශ්‍ර යනු ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනය කිරීමෙන් අනතුරුව වෙනත් අයෙකු විසින් ඒ පිළිබඳ ව කරන ලද ප්‍රතිනිර්මාණයන් වේ. උදාහරණයක් ලෙස, තමන් විසින් ම පුස්කොළ පොත් කියවා බැලීම, ප්‍රාථමික මූලාශ්‍ර පරිහරණයක් වන අතර අදාළ පුස්කොළ පොත් පිළිබඳ ව වෙනත් පර්යේෂකයෙකු කර ඇති පර්යේෂණයක තොරතුරු ලබාගැනීම ද්විතියික මූලාශ්‍ර පරිහරණයකි.

මෙසේ අප මූලාශ්‍ර භාවිත කරන්නේ නම් ඒ අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ව පුළුල් දැනුමක් ලබාගත හැකි ය. පර්යේෂණයට ලක් නොවූ හිදැස් පිළිබඳ ව හා අනවශ්‍ය කරුණු ඇතුළු වීම හා මගහැරීයාම එමගින් සිදු වේ. අප යම් පර්යේෂණයක් කරන්නේ නම් එයට අදාළ ගැටළුව පිළිබඳ ව අවබෝධයක් ලබාගත හැක්කේ ද මූලාශ්‍ර පරිශීලනයෙනි. එමෙන් ම කරන ලද පර්යේෂණයක් නැවතත් කිරීමෙන් එහි අගය සහ වටිනාකම අඩු වේ. එසේ නම් එය දැනගන්නේ කෙසේ ද? එම පර්යේෂණ මාතෘකාව අදාළ මූලාශ්‍ර පරිශීලනයේ දී කිනම් දිසානතියක් ඔස්සේ ගමන් කළ යුතු ද යි අවබෝධ වේ. එය කරන ලද පර්යේෂණයන්ගෙන් මිදී අලුත් දෙයක් පිළිබඳ ව අධ්‍යයනය කිරීමට හැකියාව ලැබේ.

එසේ ම පර්යේෂණවලදී වඩාත් වැදගත් වන මූලාශ්‍ර වශයෙන් නිල වාර්තා ද පෙන්වා දිය හැකි ය. රාජ්‍ය උවමනාවන් හා වෙනත් උවමනාවන්

සඳහා ඇති නිල වාර්තා රාශියකි. විශේෂයෙන් ම පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාව මින් එකකි. එමෙන් ම දෙපාර්තමේන්තුවලින් පළ කරන නිල වාර්තා රාශියකි. දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වාර්තා, ජන ලේඛන විස්තර, පොලිස් වාර්තා, රාජ්‍ය කොමිසන් වාර්තා, උසාවි වාර්තා, මේවා අතර වැදගත් තැනක් ගනී.

තවද ලියුම් හා දිනපොත් ද ඉතා වැදගත් මූලාශ්‍රයක් වේ. අපට පුවත්පත් ලේඛනවලින් සොයාගත නොහැකි දේවල් ලියුම් තුළින් දැනගත හැකි ය. පසුගිය කාල පරිච්ඡේදය තුළ සිදුවුණු යම් යම් දේ පිළිබඳ ව අපේ අවබෝධය පුළුල් කිරීමට එදා හුවමාරු වුණු ලියුම් ඔවුන් නොසිතුව ද අද වැදගත් මූලාශ්‍රයක් වීමට බැරි නැත. සමාජ විද්‍යා ක්ෂේත්‍රය ගැන කතාකරන විට එබඳු පුද්ගලික ලියුම් මූලාශ්‍ර කරගත් වැදගත් ගවේශණ ද ඇත. යුරෝපයට හා ඇමරිකාවට පදිංචියට ගිය පෝලන්ත ගොවියන් පිළිබඳ ව තෝමස් හා ස්නැනික් පර්යේෂණයක් සිදුකළ අතර මෙය එම කාලයේ ගොවියන් යැවූ පෞද්ගලික ලිපි 764 ක් විමර්ශනයට බඳුන් කිරීමෙකි. ඔවුන් මෙම පර්යේෂණය කළේ යුරෝපයට හා ඇමරිකාවට සංක්‍රමණය වීමෙන් පසු ඇති වූ නාගරීකරණය වැනි ප්‍රශ්න සොයා බැලීම සඳහා ය.

සමාජ ඉතිහාසය පිළිබඳ ව කරුණු සෙවීමේ දී වැදගත් වන තවත් මූලාශ්‍රයකි, චාරිකා සටහන්; විවිධ විදේශිකයෝ ලංකාවට පැමිණියහ. ඔවුන් අතර පාහියන් භික්ෂුව, හියුං සාං භික්ෂුව, රොබට් නොක්ස්, ඇස්. මහින්ද හිමි වැන්නන් ප්‍රධානත්වයෙහිලා සැලකිය හැකි ය. මොවුන් ලංකාවේ සමාජමය පසුබිම හදාරා සිංහල භාෂාව පිළිබඳ ව පුළුල් අවබෝධයක් ද ලබා පුළුල් වූ එම දැනුම ලේඛන ගත කළේ ය. එමෙන් ම රොබට් නොක්ස් ලංකාවේ සිරකරුවෙකු ලෙස දිගු කලක් ජීවත් විය. මොහු සිංහල ඉගෙන ගෙන සිංහල ජීවිතය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත්තේ ය. සිංහල චාරිත්‍ර වාරිත්‍ර ආගම පිළිබඳ ව හැසිරීම් රටාවන් වෙද හෙදකම් ආදිය පිළිබඳ පුළුල් දැනුම ලේඛන ගත කළේ ය. ඒ තුළින් එකල සමාජමය පසුබිම පිළිබඳ ව පුළුල් දැනුමක් අපට ලබාගත හැකි ය.

ඉතිහාසයේ පාවිච්චි කර ඇති වචන ද සමාජ විද්‍යා මූලාශ්‍රයන් ලෙස අපට පිළිගැනීමට සිදුවේ. ''පිරිවෙන'' යන වචනය වර්තමානයේ පාවිච්චි වන අර්ථයට වඩා පුළුල් අර්ථයකින් අතීතයේ දී පාවිච්චි වූ බව පෙනේ. එනම්, ''පිරිවෙන'' යන නාමය සාමාන්‍යයෙන් භික්ෂූන් රැස්ව හිඳ සාකච්ඡා පවත්වන ස්ථානයට ද, එසේ ම සාමාන්‍ය ස්ථානයට ද යනුවෙන් ව්‍යවහාර වනු බව පැරණි ලියවිලිවලින් ගම්‍ය වේ. විහාර යනු සාමාන්‍යයෙන් භික්ෂූන්ගේ

වාසස්ථානයට ව්‍යවහාර නාමයකි. අප පෙර බෞද්ධ සිද්ධස්ථාන ආදිය පිළිබඳ ව කතා කිරීමේ දී වර්තමානයට වඩා පුළුල් තේරුමක් ඔස්සේ සමාජ විද්‍යාත්මක ව එදෙස බැලිය හැකි ය.

සමාජ විද්‍යාව යනු සමාජය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීම නම් ඒ කාලවකවානුව තුළ ඒ ඒ සමාජ චර්යාවන් කෙබඳු වීද ඒ ඒ සීමාවන් තුළ වර්තමාන සමාජ තත්ත්වයන් කෙබඳුවන්නේ ද යන්න පිළිබඳ ව සොයා බැලීමේ දී අපට මූලාශ්‍රවල උපයෝගිතාව පැහැදිලි වේ. මෙම මූලාශ්‍ර අතර වඩාත් වැදගත් වන්නේ ලිඛිත මූලාශ්‍ර ය. ඒ නිසා සමාජ විද්‍යා පර්යේෂණ තුළ දී ලිඛිත මූලාශ්‍රවලින් ලැබෙන පිටිවහල මනාව ගම්‍යමාන වේ.

## 7.3 දත්ත රැස් කිරීම

පර්යේෂණයකට අවශ්‍ය දත්ත අපට ඉබේ නොලැබේ. ඒවා පර්යේෂකයා විසින් එකතු කර ගත යුතු ය. විවිධ උපකරණ භාවිත කර දත්ත රැස් කිරීම අවශ්‍ය ය. දත්ත රැස් කිරීම සංකීර්ණ ක්‍රියාවලියක් වේ. අවශ්‍ය දත්ත හඳුනා ගැනීම, ඒ සඳහා අවශ්‍ය උපකරණ පිළියෙළ කිරීම, එම උපකරණ ක්‍රියාත්මක කොට අවශ්‍ය දත්ත රැස් කිරීම, තොරතුරු බවට ඒවා පත් කිරීම, වාර්තා කිරීම ආදිය දත්ත රැස් කිරීමේ ක්‍රියාවලියට අයත් වේ. මෙම සමස්ත ක්‍රියාවලිය උපකරණකරණය (Instrumentation) ලෙස ෆැන්කෙල් හා වොලන් (Fraenkel,Wallen, 1993) ප්‍රකාශ කරයි. ගුප්තාගේ (Gupta 1993) අදහසට අනුව දත්ත රැස් කිරීම යනු අධ්‍යයනය කරනු ලබන ගැටලු පිළිබඳ ව ඊට අදාළ ව තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලියයි. පර්යේෂණයට අදාළ දත්ත එකතු කර ගැනීම සඳහා පර්යේෂකයා අනුගමනය කරන ක්‍රම ශිල්ප දත්ත රැස් කිරීමේ ක්‍රම ලෙස (ගුණසේකර 1996) විසින් පෙන්වා දේ.

මෙම අදහස්වලට අනුව දත්ත රැස් කරන උපකරණ සැලසුම් කිරීම, තෝරා ගැනීම හා පරිපාලනය ඇතුළත් ක්‍රියාවලිය දත්ත රැස් කිරීම ලෙස සඳහන් කළ හැකි ය. යම්කිසි ගැටළුවක් අධ්‍යයනය කිරීමට අවශ්‍ය විවිධාකාර තොරතුරු අදාළ ක්‍රම උපයෝගී කරගෙන නිවැරදි ව සපයා ගැනීම දත්ත රැස් කිරීම වේ.

## දත්ත රැස් කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු

අධ්‍යයනයක දී තම අධ්‍යයන අරමුණට අදාළ තොරතුරු පමණක් රැස් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. එසේ ම අවශ්‍ය දත්ත රැස් නොකිරීම මෙන් ම අනවශ්‍ය දත්ත එකතු කිරීම ද අධ්‍යයනයෙන් ලබාගන්නා නිගමන සාධාරණීයකරණය කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපානු ලැබේ.

දත්ත රැස් කිරීමේ දී මූලික වශයෙන් අවධානය යොමු කළ යුතු කරුණු තුනක් සේනාධීර හා වනසිංහ පෙන්වා දී තිබේ.

i. ප්‍රමාණවත් දත්ත තිබේ ද යි නිගමනය කිරීම
ii. දැන සිටි දත්ත පිළිබඳ ව සොයා බැලීම
iii. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර ගැඹුරින් හැදෑරීම

(සේනාධීර, වනසිංහ, 2004:74)

ගැටලුවේ ස්වභාවය හා අරමුණට අදාළ ව දත්ත රැස් කිරීම සැලසුම් නොකළහොත්, ඇතැම්විට පර්යේෂකයාට දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය නීරස එකක් වීමට ද පුළුවන. ඒ තමාට අවශ්‍ය දත්ත ලබා ගැනීමට අපහසු වීම යි.

පර්යේෂණයේ ස්වභාවය අනුව ද දත්ත රැස් කිරීම විවිධ වේ. එම නිසා දත්ත රැස් කිරීමේ දී තමා අනුගමනය කරන පර්යේෂණ ප්‍රවේශය කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. උදහරණ ලෙස සමීක්ෂණ ක්‍රියාවලියක දී ප්‍රශ්නාවලී, නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා වැනි ක්‍රම දත්ත රැස් කිරීමට යොදා ගත හැකි වුව ද ඓතිහාසික පර්යේෂණවල දී ලේඛන පරීක්ෂාව හා ප්‍රාථමික මූලාශ්‍ර ඇසුරින් දත්ත රැස් කිරීමට සිදු වේ.

දත්ත රැස් කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු පිළිබඳ විග්‍රහයක් පහත වගුවෙන් දැක්වේ.

## දත්ත රැස් කිරීමේ දී සැලකිය යුතු කරුණු

| කරුණු | අවධානය යොමු කළ යුතු ආකාරය |
|---|---|
| 1. පර්යේෂණ ගැටලුවට අදාළ රැස් කිරීම | පර්යේෂණයෙන් අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වන ගැටලුවලට අදාළ කරුණු පමණක් රැස් කිරීම අවශ්‍ය ය. උදා:- ශ්‍රී ලංකාවේ පාසල්වල ශිෂ්‍ය විනය පිරිහීම අධ්‍යයනය කරන්නේ නම් පාසල්වල පවතින වෙනත් ගැටලුවලට අදාළ තොරතුරු එකතු නොකිරීමට වග බලාගත යුතු ය. |
| 2. දත්ත රැස් කරන උපකරණවලට අදාළ උපදෙස් පැහැදිලි ව හා නිශ්චිත ව ඉදිරිපත් නොකිරීම. | ප්‍රශ්නාවලී, නිරීක්ෂණ පත්‍රිකා, සැලසුම් ලැයිස්තු වැනි උපකරණවල දී ප්‍රතිචාරකයාට පැහැදිලි ව උපදෙස් ලබාදීම අවශ්‍ය ය. ප්‍රශ්නාවලියට පිළිතුරු ලබා දෙන ආකාරය පැහැදිලි නොමැති වුවහොත් ලැබෙන ප්‍රතිචාර අසම්පූර්ණ විය හැකි ය. |
| 3. දත්ත රැස් කරන උපකරණ නිරවුල් ව හා පැහැදිලි ව විය යුතු ය. | දත්ත රැස් කිරීමට ලබා දෙන උපකරණ සකස් කිරීමේ දී පැහැදිලි ව ඉදිරිපත් කිරීම කෙරෙහි ද සැළකිලිමත් විය යුතු ය. ප්‍රශ්නාවලියක් සකස් කිරීමේ දී කෙටි සරල මෙන් ම අවශ්‍ය කරුණු පමණක් ලබා ගත හැකි වන සේ සකස් කිරීම අවශ්‍ය ය. |
| 4. භාවිත කරන භාෂාව ව්‍යාකූල නොවීම. | දත්ත රැස් කිරීමේ දී භාවිත කරන වචන සරල හා පැහැදිලි වීම ද අවශ්‍ය ය. ප්‍රතිචාර ලබාදීමට අපහසු, දෙබිඩි තේරුම් සහිත අර්ථ විරහිත වචන නොයෙදීමට සැලකිලිමත් විය යුතු ය. |
| 5. ප්‍රතිචාරකයන්ගේ වයස හා අධ්‍යාපන මට්ටම | දත්ත රැස් කිරීමේ දී ප්‍රතිචාරකයන්ගේ වයස හා අධ්‍යාපන මට්ටම කෙරෙහි ද සැලකිලිමත් විය යුතු ය. වැඩිහිටියෙකුගෙන් ලබා ගන්නා තොරතුරු අවුරුදු 10 ක ළමයෙකුගෙන් ලබා ගත නොහැකි ය. |

| | |
|---|---|
| 6. ප්‍රතිචාර ලබා ගත හැකි විකල්ප ක්‍රම | තමා අපේක්ෂා කරන ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවහොත් ඒ සඳහා ගතහැකි විකල්ප ක්‍රියා මාර්ග කෙරෙහි ද දත්ත රැස් කිරීමට ප්‍රථම අවධානය යොමු කළ යුතු ය. උදහරණ ලෙස සම්මුඛ සාකච්ඡා මගින් දත්ත ලබා ගැනීමට සැලසුම් කළ ද, එය නොහැකි වූ විට ප්‍රශ්නාවලි මගින් දත්ත රැස් කිරීම. |

දත්ත රැස් කිරීමේ දී පර්යේෂකයා අනුගමනය කරන උපකරණයේ ස්වාභාවය, ලබා ගත යුතු දත්තවල ස්වභාවය, දත්ත ලබා ගන්නා නියැදියේ ප්‍රමාණය හා එහි විසිරීම අනුගමනය කළ හැකි විකල්ප ක්‍රම ශිල්ප, දත්ත රැස් කිරීමේදී මතුවිය හැකි බාධාවන් හා සීමා, දත්ත විශ්ලේෂණයකරණ ආකාරය, ලබා ගන්නා නිගමන, සාමාන්‍යකරණය, ජනගහනයේ ස්වභාවය ආදී වශයෙන් කරුණු රැසක් පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බව පැහැදිලි ය. එසේ මූලික සැලසුමේ දී ක්‍රමවත් ව කටයුතු නොකිරීමෙන් පර්යේෂණය අතරමග ඇණහිටීම පවා සිදුවිය හැකි ය.

## දත්ත රැස් කිරීමේ දී මතුවිය හැකි ගැටලු

දත්ත රැස් කිරීම සැලසුම් කරන අවස්ථාවේ දී ම පර්යේෂකයා මතුවිය හැකි ගැටලු කෙරෙහි ද සැලකිලිමත් විය යුතු බව ඉහත දක්වා ඇත. ඇතැම්විට අපේක්ෂිත ප්‍රතිචාර ලබා ගත නොහැකි වීම මෙහි දී මුහුණදීමට සිදුවන ප්‍රධාන ගැටලුවක් වේ. එසේ ම හිතාමතාම වැරදි ප්‍රතිචාර ලබාදීම ද තවත් ගැටලුවකි. උදහරණ ලෙස ප්‍රතිචාරකයන්ගේ ආදායම් මට්ටම් විමසීමක දී අසත්‍ය ප්‍රතිචාර ලබා දෙන බව දැකිය හැකි ය.

පර්යේෂණ ක්‍රියාවලියේ දී පර්යේෂකයන් දත්ත රැස් කිරීම ආශ්‍රිත ව මුහුණ දෙන ගැටලු 2.1 රූප සටහනෙන් දැක්වේ.


2.1 රූප සටහන - දත්ත රැස් කිරීමේදී මතුවිය හැකි ගැටලු

**දත්ත රැස් කිරීමේ ගැටලු**

- නියැදිය විශාල ප්‍රදේශයක පැතිර සිටීම
- අධ්‍යයනයට අවශ්‍ය නියැදිය ලබා ගැනීමේ අපහසුව උදා:- යුද ප්‍රදේශවලට ඇතුළු විය නොහැකි වීම
- ගැටලුවට අදළ නොවන තොරතුරු ඉදිරිපත් කිරීම
- හිතාමතා ම අසත්‍ය තොරතුරු ලබා දීම
- නිරීක්ෂණය කරන බව දැනගත් විට ආරූඪ කර ගත් චර්යාවන් ප්‍රදර්ශනය කිරීම
- ප්‍රතිචාර ලබාදීම ප්‍රතික්ෂේප කිරීම
- අවසර ලබා ගැනීමේ අපහසුතා
- ඇතැම් තොරතුරු විනාශ වී තිබීම උදා:- සෙල්ලිපි වැනි දේ
- තොරතුරු බහුල වීම හෝ හිඟවීම
- දෙන ලද උපදෙස් ප්‍රතිචාරකයන්ට නොවැටහීම
- නියැදියේ අධ්‍යාපන මට්ටම
- වැඩි කාලයක් ගත විය හැකි වීම උදා:- නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා

දත්ත රැස් කිරීම සැලසුම් කිරීමේ දී මතුවිය හැකි බාධක පිළිබඳව උපකල්පනය කොට ඒ සඳහා විකල්ප ක්‍රියා මාර්ග සැලසුම් කිරීම ද අවශ්‍ය වේ. උදහරණ ලෙස සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගත් නියැදියක් ඒ සඳහා යොදා ගත නොහැකි වුවහොත් තැපැල් ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් තොරතුරු ලබාගැනීමට කටයුතු කිරීම දැක්විය හැකි ය.

දත්ත රැස් කිරීම ආරම්භයේ දී පැන නඟින ප්‍රශ්න කිහිපයක් වේ.





(ගුණසේකර 1996)

පර්යේෂකයෙකුට ඉහත සඳහන් ගැටලු පිළිබඳ ව නිරවුල් හා පැහැදිලි අවබෝධයක් නොතිබීම මගින් ලබා ගන්නා දත්ත තුළින් අදාළ පර්යේෂණයට අහිතකර බලපෑම් ඇතිවිය හැකි ය. එම නිසා ලබා ගන්නා දත්ත ඉතාම නිවැරදි යෝග්‍ය උපකරණ ආශ්‍රිත ව ලබා ගැනීමටත් අධ්‍යයන ගැටලුවට අදාළ නියැදියේ හැකියාව, ගුණාංග, ආකල්ප ආදී ලෙස ලබා ගත යුතු තොරතුරු නිවැරදි ව ලබා ගැනීමටත් පර්යේෂකයා උනන්දුවිය යුතු ය.

## 2.3 දත්ත රැස් කිරීමේ උපකරණවල ගුණාංග

දත්ත රැස් කිරීමේ දී ප්‍රශ්නාවලි, නිරීක්ෂණ පත්‍රිකා, සම්මුඛ සාකච්ඡා සැලසුම්, පරිමාණ දර්ශක ආදී විවිධ උපකරණ භාවිත කළ හැකි ය. මෙම උපකරණ භාවිතයට පෙර ඒවායේ ගුණාංග විමසීම ද අවශ්‍ය වේ. දෝෂ සහිත උපකරණයකින් ගන්නා මිනුම් ද දෝෂ සහිත බව අමුතුවෙන් කිව යුතු නොවේ. දත්ත රැස් කිරීමේ උපකරණවල ප්‍රධාන ගුණාංග 04 ක් තිබිය යුතු බව ෆ්‍රැන්කෙල් හා වොලන් පෙන්වා දෙයි.




### වලංගුතාව

වලංගුතාව යනු අදාළ වීම ලෙස ද හැඳින්විය හැකි ය. යොදා ගන්නා උපකරණ හා ඒ තුළින් ලබා ගන්නා දත්ත ගැටලුවට අදාළ විය යුතු ය. උදාහරණ ලෙස මානව වංශ අධ්‍යයනය යටතේ කරනු ලබන අධ්‍යයනයක දී පර්යේෂකයා ම පර්යේෂණ භූමියේ රැඳී සිට නිරීක්ෂණය කිරීම අවශ්‍ය ය. එවැනි නිරීක්ෂණයේ දී තමාට අවශ්‍ය කරුණු පමණක් නිරීක්ෂණය කළ යුතු ය. පුද්ගල ආකල්ප පිළිබඳ සමීක්ෂණයක දී ආකල්පවලට පරිබාහිර කරුණු ලබා ගැනීම වලංගුභාවය අඩුවීමට හේතු විය හැකි ය. එසේ ම විෂයයක සාධන මට්ටම් පරීක්ෂාව පිළිබඳ ව සාධාරණ නිගමනවලට එළඹිය නොහැකි වේ නම් එහිදී ද වලංගුතාවක් ඇතැයි පිළිගත නොහැකි ය.

### විශ්වසනීයතාව

එක් වරක් ලබා ගන්නා මිනුම් තවත් අවස්ථාවක එම මිනුම ම ලබා ගැනීමේ දී ඒ සෑම අවස්ථාවක දී ම සමාන ප්‍රතිඵල ලැබේ නම් එහි දී



නොමිලේ බෙදා හැරීම සඳහා ය

විස්වාසනීයත්වයක් ඇතැයි කිව හැකි ය. උදහරණ ලෙස ප්‍රශ්නාවලියක් දී එක පාසලක ශිෂ්‍යයින්ගෙන් ලබා ගන්නා තොරතුරු තවත් පාසලකට එම ප්‍රශ්නාවලිය ම දුන්විට පළමු තොරතුරුවලට සමානතාවක් දක්වීම ගත හැකි ය. එහිදී එම ප්‍රශ්නාවලිය මෙන්ම ලබා ගත් දත්ත ද විශ්වසනීයතාවකින් යුක්ත යැයි සඳහන් කළ හැකි ය.

## වාස්තවික බව

පුද්ගල බද්ධ බවින් තොර ව විෂයානුබද්ධ වීම වාස්තවික බව ලෙස සඳහන් කළ හැකි ය. දත්ත ලබා ගැනීමේ දී පූර්ව විනිශ්චයන්ගෙන් තොර ව කටයුතු කළ යුතු ය. යම් පාසලක් පිළිබඳ ව පර්යේෂකයා තුළ අපැහැදීමක් ඇතිවිට එම ආයතනය පිළිබඳ ව පර්යේෂකයා කරන නිරීක්ෂණ හා ඒ ආශ්‍රිත ව ලබා ගන්නා දත්ත අගතිගාමී වේ. එසේ අගතිගාමි නොවී අධ්‍යයනය කරන ගැටලුවට විෂයයට අරමුණට අදාළ ව මධ්‍යස්ථ ව දත්ත රැස් කිරීම වාස්තවික බව වේ.

## ප්‍රායෝගික බව

අධ්‍යයනයක් සඳහා දත්ත රැස් කිරීමේ දී භාවිත කරන මිනුම් උපකරණවල ප්‍රායෝගික බව කෙරෙහි ද සැලකිලිමත් වීම අවශ්‍ය ය. තමන් පිළියෙල කරන ප්‍රශ්නාවලි හෝ නිරීක්ෂණ පත්‍රිකාව ක්‍රියාත්මක කළ නොහැකි නම් එහි දී ප්‍රායෝගික බවක් ඇතැයි ප්‍රකාශ කළ නොහැකි ය. උදහරණ ලෙස අධික වියදමක් දරා සකස් කරන ප්‍රශ්නාවලියකට අධ්‍යයන නියැදියට පිළිතුරු දීමට අපහසු නම් එහි ප්‍රායෝගික බවක් නොමැත. දුෂ්කර ගමක ගැමියන් උදෙසා ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කරන ප්‍රශ්නාවලියක් මීට නිදසුන් වේ. එම නිසා දත්ත රැස් කිරීමේ දී නියැදියේ ස්වභාවය, මිනුම් උපකරණ බෙදා හැරීමේ පහසුව, ගතවන කාලය, වැයවන වියදම, ඉන් සිදුවන අවාසිදයක තත්ත්වයන්, නිගමනවලට එළඹීමට ඇති හැකියාව ආදී කරුණු පිළිබඳ ව අවධානය යොමු කළ යුතු වේ.

දත්ත රැස් කිරීමේ දී එක් උපකරණයක් මඟින් පමණක් දත්ත ලබා ගැනීමෙන් විශ්වසනීයතාව හා වලංගුතාව හීන වීමට ඉඩකඩ තිබේ. එම නිසා එකම කාරණය පිළිබඳ දෘෂ්ටිකෝණ කිහිපයකින් දත්ත ලබා ගැනීම වැදගත් වේ. උදහරණ ලෙස පාසලක ප්‍රචණ්ඩකාරී ශිෂ්‍යයෙකු පිළිබඳ ව කරන ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක දී ගුරුවරයාගෙන් ලබා ගන්නා වාර්තාවලින් පමණක් සෑහීමට පත් නොවී, නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, ආකල්ප, පරිමාණ වැනි ක්‍රම ශිල්ප ද භාවිත කිරීම ප්‍රයෝජනවත් වේ. එය ත්‍රිකෝණකරණය ලෙස පර්යේෂණ සාහිත්‍යයේ දී හැඳින්වේ.

## සමාලෝචනය

දත්ත රැස් කිරීම හෙවත් උපකරණකරණය පිළිබඳ ව මෙම පරිච්ඡේදයේ දී සාකච්ඡා කරන ලදී. එහිදී දත්ත ලබා ගැනීමට උපකරණ සැලසුම් කිරීම, තෝරා ගැනීම, පරිපාලනය, වාර්තා තබා ගැනීම ඇතුළත් සමස්ත ක්‍රියාවලිය දත්ත රැස් කිරීම ලෙස හඳුනා ගන්නා ලදී. දත්ත රැස් කිරීමේ දී ගැටලුවට අදාළ දත්ත පමණක් රැස් කිරීම උපකරණ සඳහා පැහැදිලි හා නිශ්චිත උපදෙස් ලබා දීම, භාවිත කරන භාෂාව ව්‍යාකූල නොවීම, ප්‍රතිචාරකයන්ගේ ස්වභාවය සැලකීම, ප්‍රතිචාර ලබා ගත හැකි විකල්ප ක්‍රම භාවිතා කිරීම, ජනගහනයේ හෝ නියැදියේ විසිරීම වැනි සාධක කෙරෙහි අවධානය යොමු කළ යුතු බව ද අනාවරණය විය.

දත්ත රැස් කිරීමේ දී විවිධ ගැටලුවලට මුහුණ දීමට පර්යේෂකයාට සිදුවිය හැකි අතර ඒ සඳහා පූර්ව සූදානමක් තිබීම ද අවශ්‍යය. කාලය, ස්ථානය, පුද්ගලයන් ලබා ගන්නා තොරතුරු වැනි ක්ෂේත්‍ර තුළින් බාධක මතුවිය හැකි ය. දත්ත රැස් කිරීමේ උපකරණ වලංගුතාව විශ්වසනීයතාව වාස්තවික බව හා ප්‍රායෝගික බව යන ගුණාංගවලින් සමන්විත විය යුතු බව ද දක්නට ලැබුණි.

### ඉගනුම් ක්‍රියාකාරකම්

01. "දත්ත රැස් කිරීම යනු ක්‍රියාවන් රැසක එකතුවකි" සාකච්ඡා කරන්න.
02. දත්ත රැස් කිරීමේ දී පර්යේෂකයෙකු අවධානය යොමු කළ යුතු කරුණු ලැයිස්තුගත කරන්න.
03. දත්ත රැස් කිරීමේ දී මතුවිය හැකි ගැටලු සාකච්ඡා කරන්න.
04. දත්ත රැස් කිරීමේ දී මතුවිය හැකි ගැටලු 3ක් සඳහා විසඳුම් යෝජනා කරන්න.
05. දත්ත රැස් කිරීමේ දී උපකරණවල තිබිය යුතු ගුණාංග උදාහරණ ඇසුරින් විග්‍රහ කරන්න.

## 7.4 සරල සමාජ විද්‍යා පර්යේෂණයක නිරත ව වාර්තාවක් ඉදිරිපත් කිරීම

මෙහි දී පළමුව ඔබ විසින් කළ යුතු වන්නේ අධ්‍යයනයට අභිප්‍රේරිත ක්ෂේත්‍රය පිළිබඳ විමසා බැලීම ය. එනම් මාතෘකා සෙවීමට පෙර ලියා පළ කොට ඇති පර්යේෂණ පොත පත පිළිබඳ ව කියවා කිසියම් දැනුමක් ඇති කර ගැනීමයි. පර්යේෂණ පොතපත කියවීම තුළින් අදාළ පර්යේෂණ කාර්යය පිළිබඳ උගත් දැනුමක් ගොඩනඟා ගත හැකි ය. ඒ සඳහා පුස්තකාලය මනා පිටිවහලක් වේ. දිනපතා පුස්තකාලයට ගොස් පත පොත පරිශීලනය ඒ සඳහා වැදගත් ය. කියවීමෙන් බුද්ධිය පිබිදෙන අතර එමගින් සිතන්නට පෙළඹේ.

සිතන්නට බැරි අයට පර්යේෂණ කිරීම අපහසු ය. සාමාන්‍යයෙන් අධ්‍යාපන ක්‍රියාවලිය මගින් ප්‍රධාන සේවා 03 ක් සිදුවේ. එනම්,

1. අධ්‍යයනය
2. පර්යේෂණවල නිරත වීම
3. ඉන් ලබා ගන්නා දැනුම රටට හා ලෝකයාට දායාද කිරීම

යනුවෙනි.

ජීවක වෛද්‍ය චරිත කථාවේ ද සරල පර්යේෂණාත්මක ප්‍රවේශයක් දක්වේ. ජීවකගේ ගුරුවරයා ඔහුට වෛද්‍ය විද්‍යාව උගන්වා මෙසේ පවසන ලදී. මේ නුවර වටා ඇවිද ඖෂධයකට නොගන්නා ගසක්, මුලක්, පැළයක්, කොළයක් ඇත්නම් අරගෙන එන්න. ඒ අනුව ජීවක සෑම තැන ම සොයා බැලුවද නමුත් බෙහෙතකට නොගන්නා දෙයක් ඔහුට හමුවුණේ නැත. ජීවකට ඔහුගේ ගුරුවරයා මේ දුන්නේ ප්‍රායෝගික අභ්‍යාසයකි. එනම් උගත් දේ ප්‍රායෝගික ව යොදා ගන්න හැකි ද කියා බැලීම යි. ඒ අනුව ඔබ සිදු කිරීමට අපේක්ෂිත සරල සමාජ විද්‍යා පර්යේෂණ කාර්යය ද එබඳු දෙයකි. ඔබ උගත් දේ ප්‍රායෝගික ව ප්‍රයෝජනයට ගත හැකි ද යන්න මෙම පර්යේෂණ කාර්යයෙන් විමසා බලනු ලැබේ.

ඒ අනුව මෙහි දී සරල සමාජ විද්‍යා පර්යේෂණයක නියැලීම සඳහා අනුගමනය කළ යුතු පියවර කිහිපයක් විමසා බලමු.

- ගැටළුව හඳුනා ගැනීම
- ගැටළුව විග්‍රහ කිරීම
- උපන්‍යාස (උපකල්පන) ගොඩනැගීම
- පර්යේෂණ අරමුණු හඳුනා ගැනීම
- නියැදිය හඳුනා ගැනීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය

- ක්‍රමවේදය යෝජනා කිරීම
- වඩා සුදුසු ක්‍රමවේදයක් තෝරා ගෙන එය ක්‍රියාත්මක කිරීම
- දත්ත රැස් කිරීම
- දත්ත විශ්ලේෂණය
- කාල රාමුව
- නිගමනය හා යෝජනා

මෙහි දී ඔබගේ පර්යේෂණ කාර්යය සඳහා උපයෝගී කර ගත හැකි සරල මාතෘකා කිහිපයක් උදාහරණ ලෙස දැක්විය හැකි ය.

1. දහම් පාසලට මල් රැගෙන එන ළමුන් ගේ ආර්ථික තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්
2. ප්‍රාචීන අධ්‍යාපනයට යොමුවන භික්ෂූන් වහන්සේගේ අනාගත අපේක්ෂාව පිළිබඳ අධ්‍යයනයක්
3. පෝදා සිල් සමාදන් වීම සඳහා විහාරයට පැමිණෙන පිරිසගේ සමාජ තත්ත්වය පිළිබඳ අධ්‍යයනය
4. ගම් ප්‍රදේශය පිළිබඳ සඳහන් වන පුරාවෘත පිළිබඳ අධ්‍යයනයක්
5. පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ පිරිවෙන් භික්ෂූන් දක්වන ආකල්පය පිළිබඳ අධ්‍යයනයක්

මෙහි දී විශේෂ අවධානයක් යොමු කළ යුතු කාරණයක් සම්බන්ධයෙන් කරුණු විමසා බැලීම ද වැදගත් වේ. එනම් පර්යේෂණයට අදාල කාල රාමුව, සකසා ගැනීම සම්බන්ධව යි.

පර්යේෂණ යෝජනාවක් ක්‍රියාත්මක කිරීමේ දී කාල තීරණය කිරීම අනිවාර්යයෙන් ම විය යුත්තකි. පර්යේෂණයට අදාළ සාහිත්‍යය සමාලෝචනයේ පටන් වාර්තාව ඉදිරිපත් කිරීම දක්වා වූ සියලු ක්‍රියාකාරකම් සම්පිණ්ඩනය කොට කාලවකවානුව සහිත ව ඉදිරිපත් කිරීම කළ යුතු ය. මෙවැනි කාල සටහනක් භාවිත කිරීම මගින් යෝජිත අධ්‍යයනය ක්‍රමානුකූලවත්, අඛණ්ඩවත්, නිවැරදිවත් කර ගෙන යා හැකි අතර පර්යේෂණ වාර්තාව අපේක්ෂිත කාලයට ඉදිරිපත් කිරීමට හැකි ය. කාල සටහන සැකසීමේ දී සිරස් තීරුවලින් කාල

පරාසය ද තිරස් තීරුවලින් කාර්යකොටස් ද දැක්වීමට පුළුවන. කාල සටහනේ අන්තර්ගත කාර්ය කොටස් සෑම පර්යේෂණයකට ම සමාන නොවේ. පර්යේෂණ සඳහා ක්‍ෂේත්‍ර සමීක්ෂණ පැවතිය හැකි අතර ම ඇතැම් ඒවාට එසේ නොවිය හැකි ය. ඒ නිසා පර්යේෂකයා විසින් කිරීමට අපේක්ෂිත අධ්‍යයනයේ සැකැස්ම නිරවුල් ව ඉදිරිපත් කළ යුතු ය. පහත දැක්වෙන කාල සටහන සමාජීය විද්‍යා විෂයයන් සඳහා යොදා ගත හැකි කාල සටහනකි.

## පර්යේෂණ කාල සටහන

| | 2014.................................... | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
| 1. සාහිත්‍ය ගවේෂණය | ■ | ■ | | | | | | | | | | |
| 2. පර්යේෂණ සැලැස්ම සැකසීම, සංශෝධනය හා අනුමත කර ගැනීම | | | ■ | | | | | | | | | |
| 3. රැස් කිරීම සඳහා සුදුසු දත්ත හඳුනා ගැනීම | | | | ■ | | | | | | | | |
| 4. නියැදි තෝරා ගැනීම හා නියමුකරණය | | | | | ■ | | | | | | | |
| 5. ක්ෂේත්‍ර සමීක්ෂණය | | | | | | ■ | ■ | | | | | |
| 6. දත්ත ගොනු කිරීම හා විශ්ලේෂණය | | | | | | | | ■ | ■ | | | |
| 7. වාර්තාවක් සැකසීම | | | | | | | | | | ■ | ■ | ■ |

## පර්යේෂණ වාර්තා සැකසීම

වාර්තාවක් ඉදිරිපත් නොකරන්නේ නම් පර්යේෂණ සිදු නොකළාක් මෙන් සැලකිය හැකි බව පර්යේෂකයන්ගේ පොදු අදහස වේ. පර්යේෂණ වාර්තාව එපමණටම වැදගත් අංගයකි.

වාර්තා සැකසීමේ දී යොමු කළ යුතු කරුණු කීපයකි.

- භාෂා විලාසය
- පැටලිලි රහිත වඩා දිගු නොවූ වාක්‍ය භාවිතය
- අනවශ්‍ය පිරවුම් පද රහිත බව
- පුද්ගලික හැඟීම් නොව පර්යේෂණ අනාවරණ පදනම් වූ තාර්කිකත්වය
- වර්ණනා විරහිත බව
- වගු, රූප සටහන්, ප්‍රස්තාරවල නිවැරදි ස්ථානගත කිරීම

පර්යේෂණ නිබන්ධය හෙවත් වාර්තාවක් සකස් කිරීමෙන් අනතුරු ව එය ඵලදායි ව භාවිත කළ හැකි පාර්ශ්වවල අවධානයට යොමු කිරීම ද ඉතා වැදගත් කර්තව්‍යයකි. නොඑසේ නම් පර්යේෂණ අනාවරණයෙන් සිදුවන සමාජ මෙහෙවරක් නොමැති වේ. එමෙන් ම බොහෝවිට එක් පර්යේෂණයක් නිසා තවදුරටත් ගැඹුරින් අධ්‍යයනයට ලක්විය යුතු නව පර්යේෂණ ගැටලු හෝ හිදැස් අනාවරණය වීම බොහෝවිට සිදුවන්නකි. තම පර්යේෂණ වාර්තාවෙන් ද එවැනි නව ඉසව් පිළිබඳ පරිශීලක අවධානය යොමු කිරීම ද නිබන්ධයේ අවසාන නිගමන මගින් සිදු කළ හැකි ය.

සමාජ විද්‍යා පර්යේෂණවල නිරත වීම තරමක් දුෂ්කර ලෙස පෙනී ගිය ද එය ඉතා රසවත් නව දැනුම් අනාවරණය වන අගනා ක්‍රියාන්විතයක් බව මේ අනුව පැහැදිලි වේ. එමෙන් ම වාර්තාවක එළිනොදැක් වූ පර්යේෂණයක් සමාජයට ඵලදායි දෙයක් නොවන බවද මෙහිදී වටහා ගත යුතු ය.

**අභ්‍යාසය**

1. සමාජ පර්යේෂණයක ප්‍රධාන පියවර නම් කරන්න.
2. ඔබ අධ්‍යයනයට කැමති සමාජ විද්‍යාත්මක විෂය ක්ෂේත්‍රයක් නම් කර එයට අදාළ තොරතුරු මූලාශ්‍ර හඳුන්වා දෙන්න.
3. පර්යේෂණ දත්ත රැස් කිරීමේදී සැලකිලිමත් විය යුතු මූලික කරුණු මොනවාද?
4. ඔබගේ පිරිවෙන/පන්සල ආශ්‍රිතව සිදුකළ හැකි සමාජ විද්‍යා පර්යේෂණයක නිරතව වාර්තාවක් ඉදිරිපත් කරන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය